# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

**12 වන ශ්‍රේණිය**

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

සිංහල දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
2009

මුද්‍රණය හා බෙදාහැරීම: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සම්පාදක මණ්ඩලය

අධීක්ෂණය
මහාචාර්ය ලාල් පෙරේරා, අධ්‍යක්ෂ ජනරාල්, ජා.අ.ආ.

උපදේශනය
ශාස්ත්‍රපති විමල් සියඹලාගොඩ, සහකාර අධ්‍යක්ෂ ජනරාල් (භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා) ජා.අ.ආ

මෙහෙයවීම
අධ්‍යාපනපති බන්දුල පී.දයාරත්න. මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘති ප්‍රධානී, ජා.අ.ආ.

සහය
ශාස්ත්‍රවේදී පී.ටී.එම්.රත්නායක, සහකාර ව්‍යාපෘති නිලධාරි, ජා.අ.ආ

සම්පත් දායකත්වය
මහාචාර්ය චන්ද්‍රසිරි රාජපක්ෂ, ජනසන්නිවේදන අධ්‍යයනාංශයාධිපති, කැලණිය විශ්ව විද්‍යාලය
සම්මානිත මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර, ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය
මහාචාර්ය දම්මික ගංගානාත් දිසානායක, සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර වි.වි.
ආචාර්ය ටියුඩර් වීරසිංහ , මණ්ඩපාධිපති, ශ්‍රීපාලි මණ්ඩපය, කොළඹ විශ්ව විද්‍යාලය
ආචාර්ය මාපා තිලකරත්න , ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනසන්නිවේදන අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය
ශාස්ත්‍රපති කමල් වලේබොඩ , ජනමාධ්‍ය අංශයාධිපති, කොළඹ විශ්ව විද්‍යාලය
ආචාර්ය අජන්තා හපුආරච්චි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජනමාධ්‍ය අංශය, කොළඹ විශ්ව විද්‍යාලය

ලේඛක මණ්ඩලය
ශාස්ත්‍රපති ආනන්ද බණ්ඩාර අබේසිංහ, කයිකාවල ම.ම.වි. මාතලේ
ශාස්ත්‍රපති කේ.එම්.ඩී.බී.දිසානායක, මහසෙන් ජාතික පාසල, නිකවැරටිය
ශාස්ත්‍රපති ගංගා හරෝෂිණී සමරසේකර, කුරුවිට ම.ම.වි., කුරුවිට
ශාස්ත්‍රපති රේණුකා ප්‍රියදර්ශනී, කඩුගන්නාව ජාතික පාසල, කඩුගන්නාව
ශාස්ත්‍රපති වාසනා ප්‍රියංගනී, ශුද්ධ වූ කුරුස බාලිකා වි. බද්දේගම
ශාස්ත්‍රවේදී අරෝෂා මලලසේකර, කිරිල්ලවල ම.ම.වි. , කිරිල්ලවල

සම්පාදනය
මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය,
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

පරිගණක සැලසුම
ශාස්ත්‍රවේදී තිලක් ඉන්දික සෙනෙවිරත්න

---

ප්‍රථම මුද්‍රණය 2009
ISBN

© ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය කරවා බෙදාහැරීම : අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

මුද්‍රණය:

## හැඳින්වීම

වර්ෂ 2007 දී 6 සහ 10 ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් - ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 9 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර, 2009 වසරේදී එය අ.පො.ස.(උසස් පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එම නිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළ යුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේදී ගුරුවරුන්ට මහත් සේ ප්‍රයෝජනවත් වනු ඇත.

අ.පො.ස.(උසස් පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී, විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ට ද්විතීයික විෂය මාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10, 11 ශ්‍රේණි) විෂය මාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6,7,8,9,10 හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළ යුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත්, අ.පො.ස.(උසස් පෙළ) විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියා කිරීමටත්, ප්‍රශස්ථ නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්තාව සලසා තිබේ. මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂය ඒකකයට හෝ පාඩමට හෝ නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීමය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතුය. මෙම නිදහස ගුරුවරුන්ට ලබාදීමට තීරණය කරන ලද්දේ අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලුම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන්හට මාහැඟි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන්හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

*මහාචාර්ය ලාල් පෙරේරා*
අධ්‍යක්ෂ ජනරාල්

## සංඥාපනය

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 2009 වර්ෂයේ සිට 12 වන ශ්‍රේණියේ ඉගෙනුම් -- ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීම සඳහා ගුරු භවතුන්ට ප්‍රයෝජනවත් වේ.

මෙම පොත සම්පාදනය කිරීමට පාදක කර ගත් විෂය නිර්දේශය මෙතෙක් පැවති විෂය නිර්දේශවලට වඩා වෙනස් වූවකි. එම වෙනස හඳුනා ගැනීමට යොමුවන ඔබට එය නිපුණතා පාදක විෂය නිර්දේශයක් බව දැකිය හැකිය. මෙහි දක්වෙන නිපුණතාවක් එම ශ්‍රේණිය තුළදීම සාක්ෂාත් කර ගත යුතුයැයි අපේක්ෂා නොකෙරේ. ඇතැම් විට ඒ සඳහා බොහෝ කලක් ගත විය හැකිය. එහෙත් නිපුණතා මට්ටම හා එක් එක් නිපුණතා මට්ටම් යටතේ දක්වෙන ඉගෙනුම් ඵල එම ශ්‍රේණිය තුළදීම අත්පත් කර ගත යුතු වේ. එබැවින් ශ්‍රේණියට අදාළ පාඩම් සැලසුම් කර ගැනීමේ දී එම නිපුණතා මට්ටම් හා ඉගෙනුම් ඵල ඔබට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම ඉගෙනුම් ඵල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී එක් එක් අරමුණු සකසා ගැනීමට මෙන්ම පන්ති කාමරයේදී සිදු කෙරෙන ඇගයීම් උපකරණ සකස් කර ගැනීමේ දී නිර්ණායක ලෙස යොදා ගැනීම කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ. මෙම විෂය හැදෑරීමේදී පරිශීලනය කළ යුතු අතිරේක පොත් පත් මෙන්ම වෙබ් අඩවි පිළිබඳ සිසුන් දැනුවත් කිරීමට ද මෙම ගුරු මාර්ගෝපදේශය ඔබට ප්‍රයෝජනවත් වේ.

මෙහි යෝජිත ක්‍රියාකාරකම් ඔබ නිර්මාණශීලී ගුරුවරයකු වශයෙන් ක්‍රියා කිරීමේ අපේක්ෂා සහිතව ආදර්ශවත් ලෙස ඉදිරිපත් කළ ඒවා වශයෙන් සලකන්න. ගුරු කේන්ද්‍රීය පන්ති කාමර ක්‍රියාවලිය වෙනස් කර ශිෂ්‍ය කේන්ද්‍රීය බවක් ඇති කිරීම විශේෂයෙන් අපේක්ෂා කෙරේ. එබැවින් සිසුන් විවිධ පොත් පත් පරිශීලනයට අන්තර්ජාල භාවිතය වැනි ගවේෂණයට යොමු කෙරෙන ඉගෙනුම් අවස්ථා හැකි හැමවිටම උදා කළ යුතු වේ. ඉගැන්වීමේ දී සම්ප්‍රදායික ලෙස සටහන් ඉදිරිපත් කිරීම වෙනුවට ආකර්ෂණීය ලෙස නව දැනුම් මූලධර්ම ආදිය ඉදිරිපත් කළ යුතු වේ. ඒ සඳහා තාක්ෂණය හැකිතාක් දුරට යොදා ගත් සන්නිවේදන උපක්‍රම භාවිත කිරීම නව පන්ති කාමරය තුළ දී උනන්දු විය යුතු වේ. ඒ සඳහා නව තාක්ෂණික උපකරණ හැකිතාක් දුරට භාවිත කිරීමට නිර්මාණශීලීවීම අවශ්‍ය වේ.

12 වන ශ්‍රේණියේ දී මෙම විෂය ඉගැනීම අරඹන ඔබගේ සිසුන්ට විෂය නිර්දේශය මනාව පැහැදිලි කර දෙන්න. වර්ෂය පුරා ක්‍රියාත්මක කරන ඔබගේ ඉගැන්වීමේ සැලැස්ම හඳුන්වා දෙන්නේ නම් එය සිසුන් තුළ පෙළඹවීමක් වනු ඇත. මුළු විෂය නිර්දේශය ආවරණය කර ගැනීමට සිසුන් පාසල වෙත ආකර්ශනය වේ. මෙම විෂය මාලා ප්‍රතිසංස්කරණ රටට දැනෙන පන්ති කාමර ඉගෙනුම් -- ඉගැන්වීම් ක්‍රියාවලියේ වෙනසක් ඇති කරනු සඳහා විෂය නිර්දේශය මෙන්ම මෙහි යෝජිත ක්‍රියාවලී ඇසුරෙන් ඔබගේ නිර්මාණශීලී හැකියා පුබුදුවා ගන්නා මෙන් ඉල්ලමි.

මෙම මාර්ගෝපදේශ සැකසීමේදී දායක වූ විද්වත් සැමට, ගුරු භවතුන්ට සහ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපනඥයන්ට මගේ ස්තුතිය හිමි වේ. මේ කාර්යය සඳහා මග පෙන්වූ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ලාල් පෙරේරා මහත්මාණන් මෙන්ම, මුද්‍රණ කටයුතු සිදු කර පාසල්වලට ලබා දීමේ වගකීම භාරගෙන කටයුතු කළ අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ඇතුළු කාර්ය මණ්ඩලයට මගේ විශේෂ ස්තුතිය පුද කරමි. මෙහි ඇතුළත් කරුණු පිළිබඳව සංවර්ධනාත්මක යෝජනා ඇතොත් මා වෙත ලබා දෙන්නේ නම් කෘතඥ වෙමි.

*විමල් සියඹලාගොඩ*
සහකාර අධ්‍යක්ෂ ජනරාල්
(භාෂා. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය)

# හැඳින්වීම

12 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය නිර්දේශයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා ගුරු භවතුන්ට නිසි මග පෙන්වීමක් ලබා දීම මෙම කෘතියේ අරමුණයි. එය නිසි ලෙස පරිහරණය කිරීම සඳහා පහත සඳහන් මූලිකාංග පිළිබඳ මනා අවබෝධයක් සෑම ගුරු භවතකු තුළම තිබිය යුතු ය.

(1.) 12 / 13 වන ශ්‍රේණි සඳහා වූ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය නිර්දේශය පාසලට හඳුන්වා දෙනු ලැබුවේ 2008 වර්ෂයේ දී ය. එයට පෙර 2006 වර්ෂයේ දී එය 10 වන ශ්‍රේණියට ද, 2007 වර්ෂයේ දී 11 වන ශ්‍රේණියට ද හඳුන්වා දී ඇත. එසේ වුවත් උසස් පෙළ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හැදෑරීමට සාමාන්‍ය පෙළ විෂයයක් වශයෙන් එම විෂයය හදාරා සමත් වී තිබීම අත්‍යවශ්‍ය නොවේ. කෙසේ වුවත් 12 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය හදාරන සිසු දරු දැරියනට 10 හා 11 වන ශ්‍රේණි සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පෙළ පොත් දෙක අධ්‍යයනය කරන්නට අවකාශ සලසා දීම ප්‍රයෝජනවත්ය.

(2.) 12 / 13 වන ශ්‍රේණි සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය සමාජීය විද්‍යා විෂයයකි. ඉගැන්වීම් කාල සටහන් සකස් කිරීමේ දී එය සමාජීය විද්‍යා විෂය ගණයට අයත් කලා විෂයයන් සමග සමගාමීව තිබිය යුතු ය. කෙසේ වුව ද මෙම විෂයය සෞන්දර්ය විෂයයන්, වාණිජ විෂයයන් හා කලා විෂයයන් සමග එක්ව ඉගෙන ගැනීමට අවශ්‍ය අවකාශය චක්‍රලේඛය මගින් සලසා ඇත.

(3.) 12 / 13 සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයන විෂය නිර්දේශය සම්පාදනය කර ඇත්තේ හරස් විෂය මාලා තේමා හතරක් පදනම් කර ගනිමිනි. එනම් සහජීවනය, සංවර්ධනය, මාධ්‍ය සාක්ෂරතාව හා සන්නිවේදන නිපුණතා ය. ඒ අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම තේමාවලට අදාළ ව උදාහරණ , ආදර්ශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, පැවරුම් ආදිය ගොඩ නැංවීම මගින් මෙම තේමාවන්හි අන්තර්ගතය සාක්ෂාත් කර ගැනීම ගුරු භවතාගේ වගකීමකි.

(4) අපේක්ෂිත දැනුම් මට්ටමට සිසු දරු දැරියන් රැගෙන යාමත්, සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය නිර්දේශයේ අපේක්ෂිත නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා අවශ්‍ය ආකල්ප සංවර්ධනයත්, ජීවත් වීම සඳහා සන්නිවේදනය හා මාධ්‍ය නිපුණතා සංවර්ධනය කර ගැනීමට උපකාර කිරීමත් ගුරු භවතා වෙතින් අපේක්ෂා කරනු ලැබේ. විෂය නිර්දේශයේ සමස්ත නිපුණතාව අත්පත් කර ගත හැක්කේ ඒ ආකාරයෙන් නිසි දැනුම ලබා ගැනීමත්, නිසි ආකල්ප සංවර්ධනයත්, නිසි කුසලතා සංවර්ධනයත් මගිනි.

(5) සිසු දරු දැරියන් ගේ සමස්ත සංවර්ධනයට ළඟ විය හැක්කේ, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් පන්ති කාමරය තුළ හා පන්ති කාමරයෙන් බැහැර ව සංවිධානය කිරීමෙනි. එසේම පන්ති කාමරය තුළ හා පන්ති කාමරයෙන් බැහැර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යෝග්‍ය බාහිර සම්පත් දායකයන් යොදවා ගැනීම මගින් , සැබෑ ඵලදායී අත්දැකීම් හුවමාරු කර ගන්නට අවකාශය සලසා ගත හැකි ය. එය ගුරු භවතාට ලැබෙන අතිරේක පහසුවක් ද වේ.

(6) ඒ ඒ දවසේ පන්ති කාමරයට ගුරු භවතා යා යුත්තේ පෙර සූදානම් කර ගන්නා ලද ප්‍රායෝගික ඉගෙනුම් - ඉගැන්වීම් ප්‍රවේශයක් සහිත ව ය. සිසු දරුවන් ගුරු භවතා පන්ති කාමරයට එන තෙක් මග බලා සිටින තත්ත්වයක් නිර්මාණය කර ගත යුතු ය. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය ඉගෙන ගැනීම දරුවන්ට ඉතා නැවුම් අත්දැකීමක් බවට පත් කරන්නට ගුරු භවතා විශේෂ අවධානයකින් හා නිර්මාණශීලීභාවයකින් යුතුව කටයුතු කළ යුතුය. ඒ ඒ දවසේ පාඩම අවසාන වන විට එදින තමන් භාවිත කරන ලද නිර්මාණශීලී ක්‍රම - විධි පිළිබඳ වාර්තාවක් තබා ගැනීමෙන් එය ඊ ළඟ වර්ෂයේ දී ද වඩාත් නිර්මාණශීලී ව යොදා ගන්නට පුළුවන.

(7) විෂයයට අදාළව සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සඳහා පාසල් මාධ්‍ය සමාජයක් පවත්වා ගෙන යා යුතුය. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන පරිදි විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර අත්දැකීම් ලබා ගන්නට දරුවන්ට උපකාර කිරීම ගුරු භවතාගේ කාර්යයකි.

(8) විශේෂයෙන් මාධ්‍ය අධ්‍යාපන සතිය වැඩ සටහන පැවැත්වීමත්, මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන සඳහා සිසු දරු දැරියන් සහභාගි කරවීමත් අත්‍යවශ්‍ය ය. ඒ සඳහා අවශ්‍ය උපදෙස් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ අවසානයේ දක්වා ඇත.

සමස්තයක් වශයෙන් ගුරු භවතුන්ගේ අවධානය යොමු විය යුත්තේ, නැවුම් හා ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීමක් තම සිසු දරු දැරියන්ට ලබා දීමට ය.

*බන්දුල පී. දයාරත්න*

මාධ්‍ය අධ්‍යාපන ව්‍යාපෘති ප්‍රධානී

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
12 වන ශ්‍රේණිය

| විෂය ක්ෂේත්‍රය | නිපුණතාව |
|---|---|
| 1. සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය | 1.0 සන්නිවේදනයේ ස්වභාවය, ක්‍රියාවලිය, වර්ග හා විධි සංසන්දනාත්මකව විග්‍රහ කරයි. |
| 2. සන්නිවේදනය හා සමාජය | 2.0 සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතා හා සමාජ භූමිකාව ද, නූතන ගෝලීයකරණ සමාජය තුළ සන්නිවේදන ප්‍රවණතා ද තාර්කිකව විග්‍රහ කරයි. |
| 3. සන්නිවේදන කුසලතා හා නිපුණතා | 3.0 අන්තර්වර්ති, අන්තර් පුද්ගල, සමූහ හා උපකරණාධාර සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි. |
| 4. භාෂාව හා ජනමාධ්‍ය භාවිතය | 4.0 භාෂාවේ ස්වභාව පිළිබඳව විග්‍රහ කරමින්, විවිධ මාධ්‍යයන්හි දී භාෂාව භාවිතයට ගන්නා ආකාරය සංසන්දනාත්මකව විශ්ලේෂණය කරයි. |
| 5. මහජන සම්බන්ධතාව | 5.0 මහජන සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මෙවලම් හා ක්‍රම යොදා ගැනීම අත්හදා බලයි. |
| 6. මාධ්‍ය සංස්කෘතිය | 6.0 මාධ්‍ය සංස්කෘතියේ ස්වභාව, ව්‍යාප්තිය හා බලපෑම ද වෙළඳ පොළ සමග ඇති සම්බන්ධතා ද විග්‍රහ කරයි. |

## හරස් විෂයමාලා තේමා
## Cross - Curricular Themes



# අපේක්ෂිත වර්ධනයන්

**දැනුම**

1. සන්නිවේදනයේ හා මාධ්‍යයේ මූලික ක්‍රියාවලිය හා සබැඳි විවිධ විෂය කරුණු දැන ගැනීම
2. සහජීවනයෙන් යුතුව ජීවත්වීම හා සබැඳි විවිධ විෂය කරුණු දැන ගැනීම
3. සන්නිවේදනය හා මාධ්‍ය භාවිතය හා සබැඳි විවිධ විෂය කරුණු දැන ගැනීම
4. සංවර්ධනය සඳහා සන්නිවේදනය යොදා ගැනීම සම්බන්ධ විවිධ විෂය කරුණු දැන ගැනීම
5. සන්නිවේදනය හා මාධ්‍ය කුසලතා හා සම්බන්ධ විවිධ විෂය කරුණු දැන ගැනීම

**ආකල්ප**

1. සන්නිවේදනයේ හා මාධ්‍යයේ ක්‍රියාවලිය නිසි ලෙස දැන ගැනීම සැම කෙනෙකුටම අවශ්‍ය බව
2. සහජීවනයෙන් යුතුව ජීවත්වීම සඳහා සන්නිවේදන නිපුණතා සැම කෙනෙකුටම අවශ්‍ය බව
3. සන්නිවේදනය හා මාධ්‍ය භාවිතය සඳහා මාධ්‍ය  සාක්ෂරතාව අවශ්‍ය බව
4. සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිත කිරීම අභියෝගාත්මක කාර්යයක් බව
5. සන්නිවේදනය හා මාධ්‍ය කුසලතා සංවර්ධනය පෞද්ගලික කාර්යයක් බව

**කුසලතා**

1. ජීවත්වීම සඳහා අවශ්‍ය මූලික සන්නිවේදන කුසලතා
2. අන්‍යයන් සමග සහජීවනයෙන් යුතුව ජීවත්වීමට අවශ්‍ය ක්‍රම විධි පිළිබඳ කුසලතා
3. සන්නිවේදනය හා මාධ්‍ය විනිවිද දැකීමේ හා තෝරා ගැනීමේ කුසලතා
4. සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිත කිරීමේ නිර්මාණශීලී කුසලතා
5. සන්නිවේදනය හා මාධ්‍ය කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ පෞද්ගලික කුසලතා

**විෂය නිර්දේශයේ ප්‍රධාන අරමුණු**

1. ජාතික සංවර්ධන ක්‍රියාවලියට සක්‍රීයව සහභාගිවීමට අවශ්‍ය සංවර්ධනය පාදක කොට ගත් සන්නිවේදන හා මාධ්‍ය නිපුණතා ගැටවර වියේ දරු දැරියන් තුළ සංවර්ධනය

2. අනාගත පුරවැසියන් බවට පත් වන වර්තමාන ගැටවර පිරිස තුළ මාධ්‍ය හා තොරතුරු සාක්ෂරතාව පෝෂණය

3. ඵලදායී පවුල් ඒකකයක් හා සමාජ පද්ධතියක් තුළ සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය සන්නිවේදන හා මාධ්‍ය නිපුණතා සංවර්ධනය

4. සමස්තයක් ලෙස උසස් සන්නිවේදන හා මාධ්‍ය නිපුණතාවන්ගෙන් හෙබි මානව හිතවාදී , සක්‍රීය පුද්ගලයන් පාසල තුළින් සමාජගත කිරීමට අවශ්‍ය පදනම නිර්මාණය

## පාසල් ප්‍රතිපත්තිය හා වැඩ සටහන්

01. පාසල් මාධ්‍ය සමාජයක් (School Media Club) ක්‍රියාකාරී ව පවත්වා ගෙන යාම
02. සංවර්ධන මූලික මාධ්‍ය වැඩ හුරුව වැඩ සටහනකට (Development oriented Media Work - Experience Programme) සහභාගි වීම
03. පාසල් මාධ්‍ය අධ්‍යාපන සතියක් (Media Education Week) වාර්ෂික ව පැවැත්වීම
04. වාර්ෂික ව අප්‍රේල් 23 වන දින මුල් කර ගෙන යුනෙස්කෝ ලෝක පොත් දිනය (UNESCO World Book Day) සැමරුම් වැඩ සටහනක් පැවැත්වීම
05. හරස් විෂය මාලා තේමා පාදක කර ගත් මාසික දේශන / සම්මන්ත්‍රණ / විවාද ආදී විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
06. සංවර්ධන ව්‍යාපෘතියක් අධ්‍යයනය කිරීමේ චාරිකාවක් යාම
07. පොලිස් ස්ථානය සමග ඒකාබද්ධව සමාජීය හා ගෘහස්ථ සාමය හා සහජීවනය පවත්වා ගෙන යාම පිළිබඳ යථා තත්ත්වය අධ්‍යයනය කිරීම
08. පාසල තුළ අපේ උරුමය පාසල් මධ්‍යස්ථානයක් (Our Herritage School Centre) ගොඩ නැංවීම
09. තෝරා ගත් සංවර්ධන තේමාවන් ඔස්සේ සංදේශ නිර්මාණ හා ප්‍රවර්ධන වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
10. පාසල් පුස්තකාලය තුළ, මාධ්‍ය සම්බන්ධ පොත් පත් /ලේඛන / කියවීමේ ද්‍රව්‍ය / බහුමාධ්‍ය උපකරණ රැස් කිරීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
11. ගෘහස්ථ පුස්තකාල පිහිටුවීමේ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
12. උසස් පෙළ මාධ්‍ය පුවත් / තොරතුරු ඇතුළත් බිත්ති පුවත්පතක් අවම වශයෙන් දෙසතියකට වරක් ප්‍රකාශයට පත් කිරීම
13. වෙනත් පාසල් සමග අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
14. ජන වාර්ගික සහජීවනය පදනම් කර ගත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
15. මාධ්‍ය අධ්‍යාපන සතිය තුළ එක් දිනක් පාසල් සිනහ දිනය (Schoool Smile Day) යනුවෙන් සන්නිවේදන ප්‍රවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
16. ජනමාධ්‍යයට ලිපි / නිර්මාණ / චිත්‍ර / ඡායාරූප ආදිය ඉදිරිපත් කිරීම
17. මාධ්‍ය විචාර වැඩ සටහනක් මාසික ව / වාරික ව පැවැත්වීම
18. මාධ්‍ය වෙත ප්‍රතිචාර දන්වා යැවීමේ ක්‍රියාවලියක් පාසල තුළ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
19. ප්‍රාථමික අධ්‍යාපන දෙමාපියන් සඳහා මාධ්‍ය සාක්ෂරතාව (මාධ්‍ය භාවිතය) තේමා කර ගත් වැඩ සටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම
20. ස්ව - ශක්තිය පදනම් කර ගෙන, ස්වයං ජයග්‍රහණය සඳහා කටයුතු කිරීම පිළිබඳ විවිධ සන්නිවේදන වැඩ සටහන් අත්හදා බැලීම
21. මාධ්‍ය මගින් සන්නිවේදනය වන විවිධ සංවර්ධන සංදේශ පිළිබඳ අධ්‍යයනයක් කිරීම
22. විෂයය යටතේ ක්‍රියාත්මක කරන සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති සාරාංශයක් ඇතුළත් වන සේ වාර්ෂික ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම

**ඒකකය:** 1.0 සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව:** සන්නිවේදන ස්වභාව, ක්‍රියාවලිය, වර්ග හා විධි සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 1.1 සන්නිවේදනය අධ්‍යයනය කිරීම සඳහා එහි විකාශනය, ස්වභාවය, නිර්වචන හා සංකල්ප විග්‍රහ කරයි.

**කාලච්ඡේද ගණන:** 8

**විෂය අන්තර්ගතය:** සන්නිවේදන ප්‍රවේශය

1. සන්නිවේදනය හැඳින්වීම
2. සන්නිවේදනයේ විකාශනය
3. සන්නිවේදන සංකල්ප හා නිර්වචන
4. සන්නිවේදනයේ ස්වභාව

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:**

1. සන්නිවේදනය යනු කුමක්දැයි අර්ථකථනය කරයි.
2. සන්නිවේදනයේ විකාශනය කාලානුරූපව විශ්ලේෂණය කරයි.
3. සන්නිවේදන සංකල්ප හා නිර්වචන විග්‍රහ කරයි.
4. සන්නිවේදනයේ ස්වභාවය කෙබඳුදැයි ඉදිරිපත් කරයි.

**හැඳින්වීම:**

සන්නිවේදනය ආරම්භ වූයේ කවදාදැයි නිශ්චිත ව කිව නොහැකි ය. එහෙත් මානවයා සිතන්නට පටන් ගත් දිනයේ සිට සන්නිවේදනය ආරම්භ වන්නට ඇතැයි කිව හැකිය. ඒ අනුව අවුරුදු දස දහස් ගණනක් තිස්සේ සන්නිවේදනය වැඩී ඇති බව පෙනේ. මානවයාට තනිව ජීවත් විය නොහැකි වීම නිසා, සමූහයක් ලෙස ජීවත්වීමට සිදු විය. ඔවුනොවුන් අතර සම්බන්ධය ගොඩ නංවන ලද්දේ හා පවත්වා ගෙන යන ලද්දේ සන්නිවේදනය මගිනි. ඉතා ප්‍රාථමික සන්නිවේදන ක්‍රමවල සිට නවීන අධි තාක්ෂණික සන්නිවේදන ක්‍රම දක්වා සන්නිවේදනය විකාශනය විය.

පසු කාලීනව සන්නිවේදනය යනු කුමක්දැයි සමාජ විද්‍යාඥයන්, අධ්‍යාපනඥයන්, දේශපාලනඥයන්, විද්‍යාඥයන් හා වෙනත් විද්වතුන් විමසන්නට පටන් ගත් අතර, ඒ පිළිබඳ විවිධ සංකල්ප හා නිර්වචන ගොඩ නංවන්නට ඔවුහු සමත් වූහ. ඒ අනුව සන්නිවේදනය යනු කෙබඳු දෙයක්දැයි තේරුම් ගන්නට හැකි විය.

වර්තමානයේ දී සන්නිවේදනය යනු හුදෙක් තොරතුරු හුවමාරු කර ගැනීම යන්නෙන් ඉදිරියට ගොස් ඇත. සමාජයක් හසුරුවා ලීමට අද සන්නිවේදනය යොදා ගන්නේ උපකරණයක් ලෙසිනි. ජනයාගේ සිතුම් පැතුම්, අදහස් හා ආකල්ප, ජන මතයන් හා සංස්කෘතීන් වෙනස් කරන්නට, සංවර්ධනය කරන්නට හා බිඳ දමන්නට අද සන්නිවේදනය යොදා ගනු පෙනේ. මේ අනුව සන්නිවේදනය යන්න ගැඹුරින් අධ්‍යයනය කරන්නට අත්තිවාරමක් දැමීම ඉතා වැදගත්ය. මෙම ආරම්භක පාඩමෙන් සිදු වන්නේ ඒ ආකාරයේ අත්තිවාරමක් සන්නිවේදන අධ්‍යයනය සඳහා ගොඩ නැංවීමය. ඒ මත සිට සන්නිවේදනය පිළිබඳව පුළුල් ලෙස අධ්‍යයනය කරන්නට අවස්ථාව සැලසේ.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

**1. සන්නිවේදනය හැඳින්වීම**

- සන්නිවේදන කාර්යයට පුද්ගලයා ගේ පංචේන්ද්‍රියයම යොදා ගැනෙන බව
- සන්නිවේදනය සම්බන්ධ විවිධ නිර්වචන ඇති බව
- මානවයා මෙන්ම සත්ත්වයා ද සන්නිවේදනයෙහි යෙදෙන බව
- සන්නිවේදනය මානව සමාජයෙහි පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයක් වන බව
- මූලික වශයෙන් සන්නිවේදනය මගින් අදහස් හා තොරතුරු හුවමාරු වන බව
- සන්නිවේදනය පිළිබඳ විවිධ නිර්වචන ඇති බව

**2. සන්නිවේදනයේ ඓතිහාසික විකාශනය**

- ආරම්භක යුගයේ දී සංඥා, සංකේත, ඉඟි හා කට හඬ සන්නිවේදනය සඳහා යොදා ගත් බව
- දෙවනු ව ගින්දර, දුම, අණබෙරය, වර්ණ ආදිය සන්නිවේදනය සඳහා යොදා ගත් බව

- මුලින් භාෂාව ද, දෙවනුව හෝඩිය ද, තුන් වෙනුව අකුරු ද නිර්මාණය කර ගත් බව
- මුලින් කතා කිරීම ද, දෙවනු ව ලිවීම ද කළ බව
- මේ හා සමගාමී ව චිත්‍ර හා රූප සටහන් ඇඳීම ද ආරම්භ වූ බව
- ලේඛනය සඳහා ගල් පතුරු, මැටි පුවරු, තල් පත්, පැපිරස් පත්, සම් කඩ, රෙදි හා ගස්වල පොතු ආදිය යොදා ගත් බව
- පසු කාලයේ දී කඩදාසි නිර්මාණය කරන ලද බව
- මුද්‍රණ ශිල්පය සොයා ගැනීම සන්නිවේදන ඉතිහාසයේ විශේෂ කඩඉමක් බව
- පසු කාලයේ දී මුද්‍රණ තාක්ෂණය දියුණු වීම, දුරකථන ක්‍රම, රැහැන් සහිතව හා රහිතව ශබ්ද සන්නිවේදනය, රූපවාහිනිය හා නව මාධ්‍ය බිහි වීම මගින් සන්නිවේදනය ඉතා දියුණු වූ බව

## 3. සන්නිවේදන සංකල්ප හා නිර්වචන

- සන්නිවේදන සංකල්ප හා නිර්වචන බටහිර සොයා ගැනීමක් නොවන බව
- සන්නිවේදනය පිළිබඳ සංකල්ප හයක් ගොඩ නංවා ඇති බව
- අධිපතිවාදී සන්නිවේදන සංකල්පය මගින් කියැවෙන්නේ සමාජවල නායකයන් / පාලකයන් විසින් සන්නිවේදන කටයුතු හා ජන මාධ්‍ය ක්‍රියාවලිය පාලනය කර ඇති බව
- නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය මගින් කියවෙන්නේ සන්නිවේදනය හා මාධ්‍ය ක්‍රියාවලියට නිදහසේ හැසිරෙන්නට ඉඩ දිය යුතු බව
- සෝවියට් සමාජවාදී සන්නිවේදන සංකල්පය මගින් කියවෙනුයේ පොදු සුභ සිද්ධිය අරමුණු කර ගෙන සන්නිවේදන හා මාධ්‍ය නිදහස සහ වගකීම රජය විසින් පාලනය කළ යුතු බව
- සමාජ වගකීම පිළිබඳ සන්නිවේදන සංකලපය මගින් කියැවෙනුයේ රජය මෙන් ම මාධ්‍ය ද සමාජය කෙරෙහි වගකීමකින් යුතු ව සන්නිවේදනය හා මාධ්‍ය හැසිරවිය යුතු බව
- සංවර්ධන සන්නිවේදනය මගින් කියවෙනුයේ ජාතික සංවර්ධනය අරමුණු කර ගෙන සන්නිවේදනය හා මාධ්‍ය හැසිරවිය යුතු බව
- ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය මගින් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පොදු මහජනතාවගේ නියෝජනය සහිතව සන්නිවේදනය හා මාධ්‍ය හැසිරවීම රජය හා මාධ්‍ය විසින් කළ යුතු බව
- (සන්නිවේදන සංකල්පවල මූලික ස්වභාව පිළිබඳව හැදෑරීම පමණක් ප්‍රමාණවත් වන බව)
- හැරල්ඩ් ලැස්වෙල්, ෂැනන් වීවර්, විල්බර් ශ්‍රාම් හා එඩ්වඩ් ෂැපී විසින් සන්නිවේදන නිර්වචන ගොඩ නංවා ඇති බව ( වෙනත් නිර්වචන තිබෙන බව දක්වන්න. එහෙත් මෙම නිර්වචන හතර පමණක් මෙහි දී ප්‍රමාණවත් වේ. )

## 4. සන්නිවේදනයේ ස්වභාවය

- ඒක මාර්ගිකව හෝ ද්වි මාර්ගිකව සිදු විය හැකි බව
- ස්වාභාවික ක්‍රියාවලියක් බව
- සන්නිවේදනය සඳහා තාක්ෂණික මෙවලම් භාවිත කළත් ස්වභාවය වෙනස් නොවන බව
- රටාවන් පුද්ගලබද්ධ බව
- අවස්ථානුකූල ක්‍රියාවලියක් වන බව
- සමාජීය සාමූහිකත්වය හා සහජීවනය පවත්වා ගත හැකි බව
- පුද්ගලයකුගේ දුක්ඛ දෝමනස්සයන් බැහැර කිරීමට යොදා ගත හැකි බව
- පුද්ගලයකුගේ සිට සමස්ත සමාජයක හැසිරීම තීරණය කිරීමේ සාධකයක් බව
- විවිධ බාධකයන් නිසා සන්නිවේදන ක්‍රියාවලිය අසාර්ථක විය හැකි බව
- සන්නිවේදකයා මෙන්ම ග්‍රාහකයා ද සන්නිවේදනයේ දී අත්‍යවශ්‍ය පාර්ශ්වයන් බව
- සන්නිවේදනය යම් යම් වාරණයන්ට යටත් වන බව
- වාරණ ක්‍රියාවලියේ දී දොරටුපාලක යනුවෙන් සංකල්පයක් බිහිව ඇති බව
- දොරටුපාලක විසින් සන්නිවේදනය වාරණය කිරීම විවිධාකාරයෙන් සිදු වන බව
- දොරටුපාලක සංකල්පය සන්නිවේදනයේ දී ස්වාභාවික සංසිද්ධියක් වන බව

**ඒකකය:** 1.0 සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව:** සන්නිවේදන ස්වභාව, ක්‍රියාවලිය, වර්ග හා විධි සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 1.2 සන්නිවේදනයේ මූලිකාංග, ආකෘති හා කාර්යයන් විග්‍රහ කරයි.

**කාලච්ඡේද ගණන:** හයයි.

**විෂය අන්තර්ගතය:** සන්නිවේදන ක්‍රියාවලිය

1. සන්නිවේදන මූලිකාංග
2. සන්නිවේදන ආකෘති
3. සන්නිවේදනයේ කාර්යයන්

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:**

1. සන්නිවේදනයේ මූලිකාංග විස්තර කරයි.
2. සන්නිවේදන ආකෘති අර්ථකථනය කරයි.
3. සන්නිවේදනයේ කාර්යයන් තුලනාත්මකව විග්‍රහ කරයි.

**හැඳින්වීම:**

සන්නිවේදනය යනු ක්‍රියාවලියකි. එය සුමට ලෙස ක්‍රියාත්මක වන්නේ එයට අයත් මූලික අංග සියල්ල නිසි ලෙස සම්බන්ධ වී ක්‍රියාත්මක වුවහොත් පමණි. එක් අන්තයක සන්නිවේදකයා ද, අනෙක් අන්තයෙහි ග්‍රාහකයා ද සිටින අතර, සන්නිවේදනය ද්වි මාර්ගිකව ක්‍රියාත්මක වන විට, සන්නිවේදකයා හා ග්‍රාහකයා යන භූමිකාවන් ද ඒ අනුව මාරු වේ. මෙයින් පෙනී යන්නේ සන්නිවේදකයා හා ග්‍රාහකයා යනු අවස්ථානුකූලව හඳුනා ගත යුතු පාර්ශ්වයන් වන බවය. කෙසේ වුවත් මෙම පාර්ශ්වයන් දෙක අතර සංදේශ හුවමාරු වීම අනිවාර්යයෙන් සිදු වේ. සංදේශ ගමනාන්තයට යාම සඳහා මාධ්‍යයක් අවශ්‍ය වේ. එසේම මෙම ක්‍රියාවලියට මූලික වශයෙන් ශබ්ද බාධා හා අර්ථ බාධා ඇති වේ.

මෙම ස්වරූපය ආකෘතියක් වශයෙන් ගොඩ නංවන්නට පසුකාලීනව සන්නිවේදන පර්යේෂකයෝ සමත් වූහ. ඒ අනුව සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් පහසුවෙන් තේරුම් ගන්නට පුළුවන. එක් එක් පර්යේෂකයෝ එක් එක් ආකාරයෙන් මෙම සන්නිවේදන ක්‍රියාවලිය ආකෘති ගත කර ඇත. එයින් සමහර ඒවා ඉතා සංකීර්ණ වේ. ඒ අනුව සරල ආකෘති කිහිපයක් මගින් සන්නිවේදන ක්‍රියාවලිය තේරුම් ගැනීම පහසුය. සන්නිවේදනයේ කාර්යයන් කෙබඳුදැයි නිශ්චිතව දක්වන්නට නොහැකිය. එයට හේතුව සමාජයේ ප්‍රගමනයත් සමග සන්නිවේදනයේ කාර්යයන් වෙනස් වෙමින් හා පුළුල් වෙමින් පැවතීමය. එසේ වුවත් මූලික කාර්යයන් හතරක් සන්නිවේදනයෙන් අපේක්ෂා කරන බව ඉගෙන ගැනීම මෙහි දී ප්‍රමාණවත්ය.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

**1. සන්නිවේදන මූලිකාංග**

- සන්නිවේදන ක්‍රියාවලිය මූලික අංගවලින් සමන්විත වන බව
- සංදේශ මූලාශ්‍රය මගින් සංදේශය සඳහා තොරතුරු ලැබෙන බව
- සන්නිවේදකයා විසින් සංදේශය සම්පාදනය කරනු ලබන බව
- සංදේශය හෝ පණිවුඩය හෝ නමින් අදහස් වන්නේ ඉදිරිපත් කරනු ලබන තොරතුරු බව
- සංදේශය ගෙන යාම සඳහා නාලිකාවක් හෝ මාධ්‍යයක් හෝ අවශ්‍ය බව
- සංදේශය ග්‍රහණය කරනු ලබන්නේ ග්‍රාහකයා විසින් බව
- ග්‍රාහකයා විසින් තමන් ලබා ගන්නා සංදේශයට ප්‍රතික්‍රියා දක්වන බව
- මෙම ප්‍රතික්‍රියා දැක්වීම සන්නිවේදකයාට කෙරෙන ප්‍රතිපෝෂණයක් බව
- සන්නිවේදන මූලිකාංගවල ක්‍රියාකාරිත්වයට බාධා ඇති වන බව
- මෙම එක් එක් අංග පිළිබඳ ව වෙන් වෙන්ව විධිමත් ව හැදෑරිය යුතු බව

**2. සන්නිවේදන ආකෘති**

- සන්නිවේදන මූලිකාංග, එහි ක්‍රියාකාරිත්වය අනුව පෙළ ගස්වා සම්බන්ධ කිරීම මගින් ආකෘතියක් නිර්මාණය කළ හැකි වන බව
- විවිධ පර්යේෂකයන් විසින් විවිධ ආකාරයේ ආකෘති නිර්මාණය කර ඇති බව
- සමහර ආකෘති රේඛීය වන අතර, සමහර ඒවා රේඛීය නොවන බව

- සමහර ආකෘති ව්‍යුහය දක්වන අතර, සමහර ආකෘති සන්නිවේදන ක්‍රියා පද්ධතිය දක්වන බව
- හැරල්ඩ් ලැස්වෙල් (1948) , ෂැනන් සහ වීවර් (1949) , ඔස්ගුඩ් සහ ශ්‍රාම් (1954) , බර්ලෝ (1960) විසින් සම්පාදිත සන්නිවේදන ආකෘති පමණක් හැදෑරීම මෙහි දී ප්‍රමාණවත් වන බව (තවත් බොහෝ ආකෘති ඇතත් මෙම ආකෘති හතර පමණක් හැදෑරීම ප්‍රමාණවත් වන බව)

**3. සන්නිවේදනයේ කාර්යයන්**

- සන්නිවේදනය මානව ශිෂ්ටාචාරය තුළ විශිෂ්ට කාර්යයන් ඉටු කරන බව
- හුදෙක් තොරතුරු හා අදහස් හුවමාරු කිරීම සන්නිවේදනයේ කාර්යය නොවන බව
- සන්නිවේදනය මගින් විවිධ අරමුණු ඉටු කර ගැනීමට අපේක්ෂිත බව
- සන්නිවේදනයේ කාර්යයන් බොහෝ ඇති නමුත්, එයින් ප්‍රධාන කාර්යයන් කිහිපයක් පමණක් ඉගෙනීම ප්‍රමාණවත් වන බව
    - තොරතුරු සම්පාදනය
    - අධ්‍යාපනය
    - සංස්කෘතික කාර්යය
    - මතවාදී කාර්යය
    - සමාජ සංවිධානමය කාර්යය
    - ප්‍රතිෂ්ඨාපනය කිරීම්
    - පෙළඹවීම්
- තොරතුරු සම්පාදනය මගින් ජනයාට නිරන්තරයෙන් පරිසරය පිළිබඳව අවදියෙන් සිටින්නට අවකාශ ලැබෙන බව
- සමාජයට පොදුවේ ද, පුද්ගලයන්ට වෙන් වෙන්ව ද අධ්‍යාපනය ලබා දීම සන්නිවේදනයේ ඉතා වැදගත් කාර්යයක් වන බව
- සංස්කෘතිය පවත්වා ගෙන යාම ද, එය ඊ ළඟ පරම්පරාවට සම්ප්‍රේෂනය කිරීම ද සන්නිවේදනයේ කාර්යයක් වන බව
- සමාජය තුළ විවිධ මතවාදයන් ගොඩ නැංවීම සමාජයේ පැවැත්මට අත්‍යවශ්‍ය වන අතර, එය සන්නිවේදනයේ කාර්යයක් වන බව
- විවිධ නවීකරණයන් සඳහා සමාජය සංවිධානය කිරීම සන්නිවේදනයේ කාර්යයක් වන බව
- සමාජය පොදු වශයෙන් ද, පුද්ගලයා වෙන් වෙන්ව ද, ප්‍රතිෂ්ඨාපනය කිරීම සන්නිවේදනයේ කාර්යයක් වන බව
- ප්‍රතිෂ්ඨාපන කාර්යයේ දී ප්‍රඥා උත්පාදක විනෝදයක් ද, සරල විනෝදයක් ද ලබා දිය හැකි බව
- ජනයා වෙන් වෙන්ව ද, සමාජයක් වශයෙන් ද නව තත්ත්වයන්ට අනුගත වීමට පෙළඹවීම සන්නිවේදනයේ කාර්යයක් වන බව
- පෙළඹවීමේ කාර්යයෙහි දී සමාජය හා ජනයා විවිධ අරමුණු සඳහා පෙළඹවීම සන්නිවේදනයේ කාර්යයක් බව (අයුතු ආකාරයට පෙළඹවීම සමාජයේ ඉදිරි ගමනට බාධාවක් බව)
- සමාජය සංවර්ධනය කිරීම සඳහා පෙළඹවීමේ කාර්යයන් අත්‍යවශ්‍ය බව

**ඒකකය:** 1.0 සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය (කාලච්ඡෙද 50 යි.)
**නිපුණතාව:** සන්නිවේදන ස්වභාව, ක්‍රියාවලිය, වර්ග හා විධි සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 1.3 සන්නිවේදනයේ විවිධ වර්ග සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.

**කාලච්ඡෙද ගණන:** එකොළහයි

**විෂය අන්තර්ගතය:** සන්නිවේදන වර්ගීකරණය

1. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
2. අන්තර් පුද්ගල සන්නිවේදනය
3. සමූහ සන්නිවේදනය
4. ජන සන්නිවේදනය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:**

1. අන්තර්වර්තීපුද්ගල සන්නිවේදනයේ ක්‍රියාවලිය විග්‍රහ කරයි.
2. අන්තර් පුද්ගල සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කරයි.
3. සමූහ සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කරයි.
4. ජන සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කරයි.
5. සන්නිවේදන වර්ග තුලනාත්මකව විශ්ලේෂණය කරයි.
6. ඒ ඒ සන්නිවේදන වර්ගයන්හි ඵලදායීතාව අත්හදා බලයි.
7. ඒ ඒ සන්නිවේදන වර්ගයන්හි ප්‍රයෝජන විග්‍රහ කරයි.

**හැඳින්වීම:**

සමාජ අත්දැකීමේ ප්‍රක්ෂේපණයක් ලෙස සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භ වන්නේ පුද්ගලයකුගේ සිතෙනි. එය මනස යනුවෙන් ද හැඳින්විය හැකිය. එය ක්‍රියාත්මක වන්නේ මොළය ආශ්‍රිතවය. මනසේ ක්‍රියාවලිය වන්නේ විවිධ තොරතුරු රැස් කර ගැනීමත්, ඒවා අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගැනීමත්ය. අන්තර් වර්තී පුද්ගල සන්නිවේදනය යන්නෙන් සරල ලෙස හැඳින්වෙන්නේ එයයි. සන්නිවේදනය සඳහා තාක්ෂණික මෙවලම් තිබුණ ද ඒවා හසුරුවනු ලබන්නේ ද පුද්ගලයන් විසිනි. එබැවින් සන්නිවේදනය පිළිබඳව හැදෑරීමේ දී පුද්ගලයා ගේ සිතෙහි හැසිරීම පිළිබඳව හැදෑරීම අතිශයින් වැදගත් වේ.

පුද්ගලයකු විසින් අන්‍යයන් සමග සන්නිවේදනයෙහි යෙදීමේ දී අන්තර් පුද්ගල සන්නිවේදනය හා සමූහ සන්නිවේදනය බිහි වේ. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී පුද්ගලයන් දෙදෙනෙකු අතර තොරතුරු හුවමාරුවක් සිදු වේ. මෙය යුගල සන්නිවේදනය යන පදයෙන් ද දක්වන්නට පුළුවන. යුගල සන්නිවේදනය යනු පුද්ගලයකුගේ ජීවිතයේ දී බහුලව යොදා ගන්නා සන්නිවේදන වර්ගයකි. යුගලය ඉක්මවා යාමේ දී සමූහය ඇති වේ. එය කුඩා සමූහයක් හෝ විශාල සමූහයක් හෝ වන්නට පුළුවන. එසේත් නැතිනම් අති විශාල සමූහයක් වන්නට ද පුළුවන. කුඩා සමූහයක් සමග මුහුණට මුහුණ ලා සන්නිවේදනයෙහි යෙදෙන්නට පුළුවන. විශාල සමූහයක් සමග සන්නිවේදනයේ යෙදීමේ දී පුද්ගලයාගේ ශක්තිය ප්‍රමාණවත් නොවන නිසා, ශබ්ද විකාශන උපකරණ යොදා ගන්නට සිදු වේ. අති විශාල සමූහයක් යනු තමන් ඉදිරියේ නොමැති හා තමන්ට නොපෙනෙන පිරිසකි. එවැනි අති විශාල සමූහයක් යන ජනගහණයකි. එසේත් නැතිනම් ජනතාවකි. එසේත් නැතිනම් ජන කණ්ඩායමකි. මෙහි දී ජන *(Mass)* යන පදය භාවිතයට ගැනේ. ඒ නිසා අති විශාල සමූහයක් සමග කරන සන්නිවේදනය ජන සන්නිවේදනය නම් වේ. ජන සන්නිවේදනය සඳහා යොදා ගන්නා මාධ්‍ය ජනමාධ්‍ය නමින් හැඳින් වේ. විශ්ව සන්නිවේදනය ද ජන සන්නිවේදනයේ උපරිම තත්ත්වයකි. විශ්ව සන්නිවේදනය යන්න ජන සන්නිවේදනය තුළ හෝ වෙන්ව හෝ හඳාරන්නට පුළුවන.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

**1. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය**

- පුද්ගලයකු තුළම සිදු වන ආත්ම භාෂණය බව
- සෑම පුද්ගලයකුම බිළිඳු වියේ සිටම පංචේන්ද්‍රිය මගින් තොරතුරු රැස් කරන බව
- රැස් කරන තොරතුරුවලින් බොහොමයක් යටි සිතේ තැන්පත් කර ගන්නා බව
- සමහර තොරතුරු කෙටි මතකයකින් පසු ඉවත් වන බව
- යටි සිතේ තැන්පත්ව ඇති තොරතුරු ජීවිත කාලය තුළ ස්මරණය කළ හැකි බව
- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී තමා සතු තොරතුරු යොදා ගන්නා බව
- අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ තීරණ ගැනීම ප්‍රධාන කාර්යයක් වන බව

- තමා සතු තොරතුරු හොඳ ඒවා නම් තීරණ ගැනීම ප්‍රශස්ත වන බව
- තමා සතු තොරතුරු නොවැදගත් ඒවා නම් තීරණ ගැනීම අසාර්ථක වන බව
- ඉතා හොඳ තොරතුරු බහුල ලෙස රැස් කර ගැනීම පුද්ගලයකු විසින් කළ යුතු බව
- කෙනෙකු තමා පිළිබඳව ඇති කර ගන්නා ස්වයං දෘෂ්ටියට මෙම තොරතුරු හේතු වන බව
- ස්ව - සංකල්පය ගොඩ නැගෙන්නේ ද තමා සතු තොරතුරු අනුව බව
- ස්වයං - දෘෂ්ටිය හා ස්ව - සංකල්පය අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී වැදගත් වන බව
- චිත්ත වේගයන් නිසා අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බව
- විවිධ චිත්ත වේගයන් පාලනය කර ගැනීමට පුද්ගලයකු සතු කුසලතාව අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ගුණාත්මක බව ඉහළ නංවන බව

**2. අන්තර් පුද්ගල සන්නිවේදනය**

- මෙය පුද්ගලාන්තර සන්නිවේදනය යනුවෙන් ද භාවිත වන බව
- පුද්ගලයන් දෙදෙනෙකු අතර කෙරෙන සන්නිවේදනය මෙයින් අදහස් වන බව
- සාමාන්‍යයෙන් මෙය මුහුණට මුහුණ ලා කෙරෙන සන්නිවේදනයක් බව
- නව තාක්ෂණය භාවිතයෙන් මෙහි ස්වරූපය වෙනස් වී ඇති බව
- දුරකථනය හෝ අන්තර් ජාලය හෝ කෙටි පණිවුඩ හෝ මගින් ද මෙය සිදු වන බව
- නව තාක්ෂණය නිසා දුර සිටින දෙදෙනෙකුට මුහුණ බලා ගෙන කතා කළ හැකි බව
- අන්තර් පුද්ගල සන්නිවේදනය ද්වි මාර්ගික සන්නිවේදනයක් වන බව
- සෑම කෙනෙකුටම දෛනික ජීවිතයේ දී නිතරම අන්තර් පුද්ගල සන්නිවේදනයේ යෙදෙන්නට සිදු වන බව
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී සන්නිවේදකයා හා ග්‍රාහකයා යන භූමිකාව මාරු වන බව
- සමහර විට අන්තර් පුද්ගල සන්නිවේදනය ඒක මාර්ගික වන බව
- අන්තර් පුද්ගල සන්නිවේදනයේ විවිධ අරමුණු තිබෙන බව
    - තොරතුරු දැන ගැනීම
    - දුක සැප බෙදා ගැනීම
    - දැනුම ලබා ගැනීම හා ලබා දීම
    - ප්‍රශ්න විසඳා ගැනීම
    - උදව් උපකාර ලබා ගැනීම හා ලබා දීම
    - මග පෙන්වීම
    - උපදේශනය
    - චෝදනා ඉදිරිපත් කිරීම
    - තර්ජනය කිරීම
    - දොස් පැවරීම
    - රහස් අනාවරණය කර ගැනීම
    - ක්‍රියාවලීන් විශ්ලේෂණය
    - ..............................................
- අන්තර් පුද්ගල සන්නිවේදනය ඵලදායී වන්නේ, පුද්ගලයා තුළ පවත්නා ශික්ෂණය අනුව බව
- යහපත් අන්තර් පුද්ගල සන්නිවේදනය මගින් සමාජයක ක්‍රියාවලිය යහපත් වන බව

**3. සමූහ සන්නිවේදනය**

- දෙදෙනෙකු ඉක්මවා ගිය විට එහි සමූහයක් ඇති වන බව
- සමූහය කුඩා, විශාල හෝ අති විශාල හෝ විය හැකි බව
- සමූහ සන්නිවේදනයේ දී ඒක - මාර්ගික හෝ ද්වි - මාර්ගික සන්නිවේදනයක් සිදු වන බව
- අසා සිටීම හා සවන් දීම යන සංකල්පය සමූහ සන්නිවේදනයේ දී දැඩිව ක්‍රියාත්මක වන බව
- සමූහ සන්නිවේදනයේ විවිධ ස්වරූපයන් තිබෙන බව
- සමූහය යන්නට කණ්ඩායම් හා කල්ලි අයත් වන බව
- කණ්ඩායම් වර්ග පහක් දැක්විය හැකි බව
    1. අහඹු කණ්ඩායම්
    2. විශෝධන කණ්ඩායම්
    3. ඉගෙනුම් කණ්ඩායම්
    4. ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම්

5. ක්‍රියාකාරී කණ්ඩායම්

- අහඹු කණ්ඩායමක් යනු හදිසියේ හෝ අහඹු ලෙස හෝ ඇති වන්නක් බව
- විශෝධන කණ්ඩායම් සිය චිත්තවේගයන් මත එක් වන බව
- ඉගෙනුම් කණ්ඩායම් ඉගෙනීම අරමුණු කර ගෙන එක් වන බව
- ප්‍රතිපත්ති සැකසුම් කණ්ඩායම් තීරණ ගැනීමේ කාර්යයට එක් වන බව
- ක්‍රියාකාරී කණ්ඩායම් යමක් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් එක් වන බව
- අහඹු කණ්ඩායම් අවිධිමත්ව බිහි වන බව
- විශෝධන, ඉගෙනුම්, ප්‍රතිපත්ති සැකසුම් හා ක්‍රියාකාරී කණ්ඩායම් බොහෝ දුරට විධිමත් බව
- සමූහය කෙබඳු වුව ද, එහි අරමුණු කුමක් වුව ද සමූහයේ පැවැත්මට සන්නිවේදනය අත්‍යවශ්‍ය බව

## 4. ජනසන්නිවේදනය

- විශාල ජනස්කන්ධයක් සමග කෙරෙන සන්නිවේදන කාර්යය ජනසන්නිවේදනය බව
- ජනසන්නිවේදනය සඳහා භාවිත වන පුවත්පත් සහ සඟරා, ගුවන් විදුලිය හා රූපවාහිනිය ජනමාධ්‍යබව
- ජනසන්නිවේදනයේ දී ග්‍රාහක පිරිස කවුරුන්දැයි නිශ්චිතවම සන්නිවේදකයන් නොදන්නා බව
- ජනසන්නිවේදනය සැම විටම ආයතනගත හා සංවිධානාත්මකව සිදු වන බව
- එක් එක් ජනමාධ්‍යයන්හි සුවිශේෂ ලක්ෂණ තිබෙන බව
- ජනසන්නිවේදනය මගින් විශාල ජනසමාජයකට එකවර තොරතුරු ගෙන යා හැකි බව
- ජනසන්නිවේදනය වර්තමානයේ ජනයාගේ දෛනික ජීවිතයේ කොටසක් බව
- පුවත්පත් පරිහරණයට භාෂා සාක්ෂරතාව අවශ්‍ය බව
- ගුවන් විදුලිය පරිහරණයට ශ්‍රවණ සාක්ෂරතාව අවශ්‍ය බව
- රූපවාහිනිය පරිහරණයට ශ්‍රව්‍ය - දෘශ්‍ය සාක්ෂරතාව අවශ්‍ය බව
- සමස්තයක් වශයෙන් ජනමාධ්‍ය පරිහරණය කරන්නට මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය බව
- තම සංදේශය ඉලක්ක කණ්ඩායමට පමණක් ඉදිරිපත් කිරීමට ජනමාධ්‍යයට නොහැකි බව
- ජනමාධ්‍ය සංදේශ විවෘතව ඉදිරිපත් වන නිසා, එයින් සමාජයට සිදු වන බලපෑම වැඩි බව
- ජනසන්නිවේදන මාධ්‍යයන්ගෙන් වඩාත් ප්‍රචලිතව ඇත්තේ රූපවාහිනිය බව
- රූපවාහිනිය හා ගුවන් විදුලිය තිබුණත් ජනයාට පුවත්පත් ද අත්‍යවශ්‍ය බව
- ජනසන්නිවේදනය සඳහා පුහුණු මාධ්‍යකරුවන් අවශ්‍ය බව
- ජනමාධ්‍යකරුවන් (Media Person ) විසින් සම්පාදිත පෙළ (Text) අධ්‍යයනය කර ඉන් නව දැනුම සම්පාදනය කරන්නා ජනමාධ්‍යවේදියා (Media Expert) බව
- ජනමාධ්‍යකරු යනු මූලික මාධ්‍ය සන්දේශ සම්පාදනය කරන්නා බව
- ජනසන්නිවේදනය සඳහා උසස් තාක්ෂණයක් අවශ්‍ය බව
- ජනසන්නිවේදනය ලෝකයම ආවරණය කරන විට එය විශ්ව සන්නිවේදනය වන බව

**ඒකකය:** 1.0 සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය (කාලච්ඡෙද 50 යි.)
**නිපුණතාව:** සන්නිවේදන ස්වභාව, ක්‍රියාවලිය, වර්ග හා විධි සංසන්දනාත්මකව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 1.4 විවිධ සන්නිවේදන විධි සංසන්දනාත්මකව විග්‍රහ කරයි.

**කාලච්ඡෙද ගණන:** 12යි.

**විෂය අන්තර්ගතය:** සන්නිවේදන විධි

1. වාචික සන්නිවේදනය
2. අවාචික සන්නිවේදනය
3. ලිඛිත සන්නිවේදනය
4. දෘශ්‍ය සන්නිවේදනය
5. ශ්‍රව්‍ය සන්නිවේදනය
6. විධිමත් හා අවිධිමත් සන්නිවේදනය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:**

1. වාචික සන්නිවේදන ක්‍රම අත්හදා බලයි.
2. අවාචික සන්නිවේදන ක්‍රම අත්හදා බලයි.
3. ලිඛිත සන්නිවේදන ක්‍රම අත්හදා බලයි.
4. දෘශ්‍ය සන්නිවේදන ක්‍රම විමර්ශනය කරයි.
5. ශ්‍රව්‍ය සන්නිවේදන ක්‍රම විමර්ශනය කරයි.
6. විධිමත් සන්නිවේදන ක්‍රම විමර්ශනය කරයි.
7. අවිධිමත් සන්නිවේදන ක්‍රම විමර්ශනය කරයි.
8. සියලු සන්නිවේදන ක්‍රම සංසන්දනාත්මකව අගයයි.

**හැඳින්වීම:**

මානවයා ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට සිය එදිනෙදා සමාජ අවශ්‍යතාවන් සපුරා ගැනීමට සන්නිවේදනයේ යෙදී ඇත. මේ ආකාරයට සන්නිවේදනය සඳහා යොදා ගත් විධි නැතිනම් ස්වරූප සන්නිවේදන විශේෂඥයන් විසින් වර්ග කර ඇත. එම වර්ග මානව සමාජයේ සන්නිවේදන අවශ්‍යතාවන් සපුරා ලීමට නිරන්තරව යොදා ගැනේ. මෙයින් බහුලව සිදුවන්නේ අවාචික හා දෘශ්‍ය සන්නිවේදනයයි. මෙහි දී වාචික සන්නිවේදනය යන්නෙන් අදහස් කරන්නේ වචන යොදා ගෙන කතා කිරීමයි. වාචික සන්නිවේදනයට අවාචික සන්නිවේදනය ද එක් වෙයි. සන්නිවේදනාර්ථ මතු වන්නේ ඒ අනුවය. ලිඛිත සන්නිවේදනය පසු කාලීනව නිර්මාණය කර ගන්නා ලද්දකි. දෘශ්‍ය සන්නිවේදනයට ඇත්තේ ඉතා දිග ඉතිහාසයකි. අල්ටා මීරා, ලැස්කෝ ගල් ගුහා චිත්‍ර මෙයට දිය හැකි හොඳම උදාහරණයයි. ශ්‍රී ලංකාවේ ද සීගිරි චිත්‍ර, දොරවක, බුදුරුවගල වැනි විහාරස්ථානවල බිතු සිතුවම් ආදිය දෘශ්‍ය සන්නිවේදනයට අයත් වේ. ශ්‍රී ලංකාවේ දෘශ්‍ය සන්නිවේදනය පිළිබඳව විමසන විට පෙනී යන්නේ, එය ඉතා උසස් සම්ප්‍රදායක් බවට පත් ව තිබූ බවයි. ශ්‍රව්‍ය සන්නිවේදනයට අයත් වන්නේ ගුවන් විදුලිය පමණක් නොවේ. ගුවන් විදුලිය යන්න පසු කාලීනව නිපදවා ගත් තාක්ෂණික මෙවලමකි. ඒ හැර ශ්‍රවණය වන සියලු ශබ්ද ශ්‍රව්‍ය සන්නිවේදනයට අයත් වේ. විධිමත් සන්නිවේදනය පිළි ගත් මෙහෙයවීමකින් ක්‍රියාත්මක කරනු ලබන අතර, අවිධිමත් සන්නිවේදනය පිළි නොගත් මෙහෙයවීමකින් ක්‍රියාත්මක වේ. සංවිධානවල පැවැත්මට විධිමත් හා අවිධිමත් සන්නිවේදනය අතිශයින් වැදගත්ය. මේ සියලු සන්නිවේදන විධි නැතහොත් ස්වරූප වර්තමාන සමාජයේ පැවැත්මට අත්‍යවශ්‍යය. ඉහත දැක් වූ සන්නිවේදන ස්වරූපවලට පරිබාහිරව නව මාධ්‍ය ඔස්සේ නව ස්වරූප නිර්මාණය වෙමින් පවතී. උදාහරණයක් වශයෙන් ගත් විට දුරකථන ඔස්සේ යවන කෙටි පණිවුඩ හා විද්‍යුත් තැපැල් පණිවුඩ දැක්විය හැකිය. මේවා පිළිබඳව තවමත් ප්‍රමාණවත් තරම් විද්‍යාත්මක අධ්‍යයනයන් කර නැත. ඉදිරියේ දී ඒවා ද, සුවිශේෂ සන්නිවේදන ස්වරූපයන් ලෙස දක්වන්නට සිදු වනු ඇත.

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක්**

**1. වාචික සන්නිවේදනය**

- වචනවලින් කෙරෙන සන්නිවේදනය බව
- පුළුල් අර්ථයෙන් ගත් කල වචන යොදා කෙරෙන සියලු සන්නිවේදනයන් අයත් වන බව
- මෙම කොටසේ දී වාචික යන්නෙන් කතා කිරීම අදහස් වන බව
- වාචික සන්නිවේදනය සඳහා භාෂාවක් දැන සිටීම අවශ්‍ය බව

- භාෂාව පිළිබඳ නිපුණතාව අත්‍යවශ්‍ය නොවන බව
- කතා කරන්නට පුළුවන් හැම කෙනෙකුටම වාචික සන්නිවේදනයෙහි යෙදිය හැකි බව
- හැම කෙනෙක් ම දෛනික ජීවිතයේ දී නිරන්තරයෙන් වාචික සන්නිවේදනයේ යෙදෙන බව
- වර්තමානයේ බිහිරි අයට පවා කතා කරන්නට උගන්වන බව
- වාචික සන්නිවේදනයේ දී දෙපාර්ශ්වයම එකම භාෂාව දැන සිටිය යුතු බව
- සන්නිවේදකයා දන්නා භාෂාවෙන් නොව, ග්‍රාහකයාට යෝග්‍ය භාෂාවෙන් කතා කළ යුතු බව
- වාචික සන්නිවේනයේ දී ධනාත්මක යෙදුම්, වචන හා අදහස් යොදා ගැනීම ප්‍රයෝජනවත් බව
- වාචික සන්නිවේදනයේ දී නිවැරදිව ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු බව
- කතා කිරීමේ දී වචන කැඩි - කැඩී හා පැටලි - පැටලී ඉදිරිපත් නොකළ යුතු බව
- වගකීමෙන් තොරව භාෂාව භාවිත  නොකළ යුතු බව
- වාචික සන්නිවේදනයේ දී සූදානම් වීම ප්‍රයෝජනවත් බව
- වාචික සන්නිවේදනයේ දී ක්ෂණික අවස්ථා ඇති වන නිසා හැම විටම සූදානම් විය නොහැකි බව
- වාචික සන්නිවේදනයේ දී වචන පිට කිරීමට පෙර දෙවරක් සිතා බැලිය යුතු බව
- කියූ දේ අලි ඇතුන් ලවාවත් ආපසු අද්දවන්නට බැරි බව
- වාචික සන්නිවේදනයේ දී වචන  7 %ක් ද, රිත්මය  38% ක්ද, අවාචික සංඥා  55% ක් ද භාවිත වන බව

## 2. අවාචික  සන්නිවේදනය

- හැම කෙනෙකුගේම දෛනික සන්නිවේදන කාර්යයන්හි දී අවාචික සන්නිවේදනය බහුලව යොදා ගන්නා බව
- ගලී සහ ලෙදර්ස් විසින් 1976 දී පෙන්වා දුන් පරිදි අවාචික සන්නිවේදනය පහත සඳහන් කාර්යයන් ඉටු කරන බව
    1. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී අර්ථය වටහා ගැනීමට  උපකාරී වීම
    2. වාචිකව ඉදිරිපත් කරනවාට වඩා හොඳින් හැඟීම් හා භාවයන් ඉදිරිපත් කිරීම
    3. අර්ථයන් හා අභිප්‍රායයන් අවුලකින් තොරව ප්‍රකාශ කිරීම
    4. අවාචික සංඥා හා ඉඟි නිසා උසස් සන්නිවේදන මට්ටමක් ඇති වීම
    5. වාචික සංකේතවලට වඩා අවාචික සංඥා කාර්යක්ෂම වීම
    6. යමක් ඇඟවීම හෝ යෝජනා කිරීම සඳහා වඩාත්ම සුදුසු මාධ්‍යය වීම
- අවාචික සන්නිවේදනය අඛණ්ඩව පවතින බව
- අවාචික සන්නිවේදනයට විවිධ ක්‍රම යොදා ගත හැකි බව
- සමහර අවාචික සන්නිවේදන ක්‍රියා අචේතනිකව හෝ පුරුද්දට සිදු වන බව
- අවාචික සන්නිවේදනයට කිසියම් ව්‍යාකරණයක් හෝ රීතියක් හෝ පිළිවෙළක් නොමැති බව
- අවාචික සන්නිවේදන ක්‍රියා හුදෙක් පුද්ගලබද්ධ බව
- පෙනුම හා ඇඳුම් , කායික හැසිරීම් , ඉරියව්, ඉඟි, මුහුණේ භාව ප්‍රකාශයන්, ඇස් සම්බන්ධතාව හා දෑඩි බැල්ම, ස්පර්ශය, ගන්ධය, කථන වේගය, කථන හඬ රටා, රිද්මය, නිහඬතාව, අවකාශය හා පරිසරය ආදී බොහෝ අංග අවාචික සන්නිවේදනයට අයත් වන බව
- අන් අය කතා කරන විලාසය අධ්‍යයනය කිරීමෙන් අවාචික ක්‍රම විධි හඳුනා ගත හැකි බව

## 3. ලිඛිත  සන්නිවේදනය

- භාෂාව යොදා ගෙන ලිවීම මෙයින් අදහස් වන බව
- විවිධාකාරයෙන් ලියන්නට පුළුවන් බව (අතින් / පරිගණකයෙන් / යතුරු ලියනයෙන්)
- ලිවීම සඳහා යොදා ගන්නා ක්‍රමය / තාක්ෂණය කුමක් වුවත්, ලේඛනයකට අරමුණක් ඇති බව
- යොදා ගන්නා ක්‍රමය හෝ තාක්ෂණය හෝ අනුව ලේඛනයේ නිමාව තීරණය වන බව
- විවිධ ලේඛන සඳහා විවිධ ආකෘති යොදා ගන්නා බව
    - වාර්තා
    - අත්පත්‍රිකා
    - ලිපි (පෞද්ගලික / නිල)
    - ෆෝල්ඩර්
    - නිර්මාණාත්මක ප්‍රබන්ධ
    - පොත් හා පොත් පිංච
    - දැන්වීම්
    - පුවත් ලිපි
    - උපදෙස් පත්‍රිකා
    - පුවත්පත්
    - ජීව දත්ත පත්‍රිකා
    - රැකියා අයදුම් පත්

- එක් එක් ලේඛන සුවිශේෂ අනන්‍ය ලක්ෂණවලින් යුක්ත බව
- ඒ ඒ ලේඛන සඳහා යොදා ගන්නා භාෂාව, ආකෘති, යෙදුම් ආදිය සුවිශේෂ බව
- ලේඛන පරිචය ලබා ගත හැක්කේ අඛණ්ඩව විවිධ ලේඛන සැකසීමෙන් බව
- ලේඛන සැකසීම පිළිබඳ නිපුණතාව වෘත්තීය මට්ටමින් සැලකෙන බව
- ලිඛිත සන්නිවේදනයේ දී සැලසුම් කිරීම සඳහා කාලය තිබෙන බව
- ප්‍රශස්ත ලේඛනයකින් වචනයක්වත් ඉවත් කළ නොහැකි බව
- ලේඛනය සඳහා පදනම ඇති වන්නේ කියවීමෙන් බව
- ලේඛනයක් කිහිප වරක් සංස්කරණය කිරීමෙන් එහි තත්ත්වය උසස් කළ හැකි බව

## 4. දෘශ්‍ය සන්නිවේදනය

- ඇසින් දැකීම නිසා සිදු වන සන්නිවේදනය මෙයින් අදහස් වන බව
- ඇසින් දකින දේ පිළිබඳ සීමාවක් නැති බව
- රූපවාහිනිය, චිත්‍ර, මාර්ග සංඥා, චිත්‍රපට, ඡායාරූප, මූර්ති ආදිය දෘශ්‍ය සන්නිවේදනයට අයත් වන බව
- මානව සමාජයේ ආරම්භයේ සිටම දෘශ්‍ය සන්නිවේදනය පැවති බව
- රූප සටහන්, සංඛ්‍යාන රූප, පෝස්ටර් ආදිය ද දෘශ්‍ය සන්නිවේදනයට අයත් බව
- දෘශ්‍ය සන්නිවේදනයේ දී ජන කලා ආදී සම්ප්‍රදායික මෙවලම් යොදා ගන්නා බව
- විධිමත් ව සැලසුම් කිරීමෙන් දෘශ්‍ය සන්නිවේදනය මගින් ප්‍රශස්ත සන්නිවේදනයක් කළ හැකි බව
- නවීන තාක්ෂණය මගින් දෘශ්‍ය සන්නිවේදනය නිර්මාණය කළ හැකි බව ( පරිගණකය, හා වෙනත් ප්‍රක්ෂේපණ හා ප්‍රක්ෂේපණ නො වන උපකරණ මගින් )
- දෘශ්‍ය සන්නිවේදනය ජනයා බොහෝ ප්‍රිය කරන බව
- මිථ්‍යා විශ්වාස, ජන ඇදහිලි ආදිය සමග ද දෘශ්‍ය සන්නිවේදනය සම්බන්ධ බව
- දෘශ්‍ය ක්‍රම විධිවලට පොදු අර්ථයන් ද, සුවිශේෂ අර්ථයන් ද තිබෙන්නට පුළුවන් බව
- දෘශ්‍ය ක්‍රම විධිවලට දේශීය අර්ථයන් ද විදේශීය අර්ථයන් ද තිබෙන්නට පුළුවන් බව

## 5. ශ්‍රව්‍ය සන්නිවේදනය

- ශ්‍රවණය වන සියලු දේ ශ්‍රව්‍ය සන්නිවේදනයට අයත් වන බව
- විවිධ හඬ, ශබ්ද, සංගීතය, මගින් සන්නිවේදනය කළ හැකි බව
- ගුවන් විදුලිය ශ්‍රව්‍ය සන්නිවේදනයට යොදා ගන්නා බලවත් තාක්ෂණික මාධ්‍යයක් බව
- සංයුක්ත තැටි වාදන යන්ත්‍ර, පටි වාදන යන්ත්‍ර, ශබ්ද විකාශන උපකරණ, සංඥා / ශබ්ද ආදියද ශ්‍රව්‍ය සන්නිවේදනයට අයත් වන බව
- එක් එක් ශ්‍රව්‍ය ක්‍රම විධි විවිධ විශේෂ අරමුණු ඉටු කර ගැනීමට යොදා ගන්නා බව
- ශ්‍රව්‍ය සන්නිවේදනය ස්වභාවිකවද, සැලසුම් සහගතවද සිදු වන බව
- මිථ්‍යා විශ්වාස, ජන ඇදහිලි ආදිය සමගද ශ්‍රව්‍ය සන්නිවේදනය සම්බන්ධ බව
- ශ්‍රව්‍ය ක්‍රම විධිවලට පොදු අර්ථයන්ද, සුවිශේෂ අර්ථයන්ද තිබෙන්නට පුළුවන් බව
- ශ්‍රව්‍ය ක්‍රම විධිවලට දේශීය අර්ථයන්ද, විදේශීය අර්ථයන්ද තිබෙන්නට පුළුවන් බව
- විවිධ පරිපාලන කටයුතු , සංඥා ආදිය සඳහා ශ්‍රව්‍ය සන්නිවේදනය මනාව යොදා ගන්නා බව (එල්ලන සීනුව, මේස සීනුව, සයිරන් නලාව, ගිනි නිවන රථ නලාව, ගිලන් රථ නලාව ආදිය)

## 6. විධිමත් හා අවිධිමත් සන්නිවේදනය

- විධිමත් සන්නිවේදනය ඉහළ සිට පහළට ද, පහළ සිට ඉහළට ද, හරස් අතට ද සිදු වන බව
- අවිධිමත් සන්නිවේදනය අවිධිමත් ධාරාවන් ඔස්සේ අපිළිවෙළට ගලා යන බව
- දක්ෂ කෙනෙකුට අවිධිමත් සන්නිවේදනයද සංවිධානයේ වාසියට යොදා ගත හැකි බව
- සාමාන්‍යයෙන් විධිමත් සන්නිවේදනය දුර්වල වන විට අවිධිමත් සන්නිවේදනය පැතිරෙන බව
- විධිමත් සන්නිවේදනය කොතරම් ශක්තිමත් කළත්, අවිධිමත් සන්නිවේදනය පවතින බව
- අවිධිමත් සන්නිවේදනය යනු මිනිසා ගේ කුතුහලය හා සැකය ප්‍රයෝජනයට ගන්නා සන්නිවේදන ක්‍රමයක් බව
- විධිමත් සන්නිවේදනයට වඩා අවිධිමත් සන්නිවේදනය ඉතා වේගවත් බව
- විධිමත් සන්නිවේදනයෙන් නො ලැබෙන තොරතුරු අවිධිමත් සන්නිවේදනයෙන් ලැබෙන බව
- අවිධිමත් සන්නිවේදනය සිදු වන ආකාරය දාම හතරකින් දැක් විය හැකි බව

- තනි දාමයේ දී එක් අයෙකුගෙන් ඊ ළඟ තැනැත්තාට තොරතුර ලබා දෙන බව
- ඕපාදූප දාමයේ දී එක් අයකු විසින් අනෙක් සියල්ලන්ට තොරතුර ලබා දෙන බව
- සම්භාවිතා දාමයේ දී හමු වූ අයකුට තොරතුරු ලබා දෙන බව හා ඒ තැනැත්තා ද එසේම කරන බව
- පරෂද දාමයේ දී එක් අයකු තොරතුර ලබා දෙන්නේ නිශ්චිත සම්බන්ධතාවක් ඇති තවත් කිහිප දෙනෙකුට බව හා ඔවුන් ද ඒ ආකාරයෙන්ම තොරතුර ලබා දෙන බව
- බැලු බැල්මට සම්භාවිතා දාමය හා පර්ෂද දාමය එක සේ පෙනුනත්, ඒවායේ ක්‍රියාකාරිත්වය එක සමාන නොවන බව



**ඒකකය:** 2.0 සන්නිවේදනය හා සමාජය (කාලච්ඡෙද 50 යි.)
**නිපුණතාව:** සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතා හා සමාජ භූමිකාව ද නූතන ගෝලීයකරණ සමාජය තුළ සන්නිවේදන ප්‍රවණතා ද තාර්කිකව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 2.1 සමාජයේ ප්‍රභවය හා විකාශනය ද සමාජ සංයුතිය ද අර්ථ දක්වමින් සමාජීය බල තුලනය හා එහි ඥාන ගවේෂණයේ ස්වභාව ද විග්‍රහ කරයි.

**කාලච්ඡෙද ගණන:** 12

විෂය අන්තර්ගතය: සමාජාවබෝධය
(1) සමාජයේ ප්‍රභවය හා විකාශනය (කාලච්ඡෙද තුනයි.)
(2) සමාජ සංයුතිය (කාලච්ඡෙද තුනයි.)
(3) සමාජීය සම්පත් හා බල කේන්ද්‍රණය (කාලච්ඡෙද තුනයි.)
(4) ඥාන ගවේෂණය (කාලච්ඡෙද තුනයි.)

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:**

1. සමාජයේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ ව තර්කානුකූල ව අදහස් දක්වයි.
2. සමාජ සංයුතියේ අංග හඳුනා ගෙන විග්‍රහ කරයි.
3. සමාජීය සම්පත් හඳුනා ගෙන පැහැදිලි කරයි.
4. බල කේන්ද්‍රනය සිදු වී ඇති හා සිදු වන අයුරු විශ්ලේෂණය කරයි.
5. ඥාණ ගවේෂණය සිදු කරන අයුරු නිවැරදිව විස්තර කරයි.

**හැඳින්වීම**

කිසිවකු ගේ බලපෑමකින් හෝ පාලනයකින් තොරව නිදහසේ වනාන්තර තුළ සැරි සැරූ ප්‍රාථමික මානවයා, ඔවුන්ගේ සරල අවශ්‍යතා සංකීර්ණ වීමත්, විවිධ ජන කොටස් වනාන්තරයේ තැන් තැන්වලින් බිහි වීමත් නිසා ඔවුනොවුන් අතර විවිධ ගැටුම් ඇති කර ගත්හ. එයට විකල්පයක් ලෙස ප්‍රාථමික ජන සමාජ ඇති විය. එහි දී කායික ශක්තිය පදනම් කර ගෙන නායකත්වය ගොඩ නැගිණි. නායකත්වය කේන්ද්‍ර කොට ගනිමින් ජන කණ්ඩායම් ඇති විය.

එසේ ඇති වූ කණ්ඩායම්වල ස්වභාවය අනුව ප්‍රබල කණ්ඩායම් හා දුබල කණ්ඩායම් යනාදී වශයෙන් වර්ග කිරීමට හැකි විය. ප්‍රබල කණ්ඩායම් විසින් දුබල කණ්ඩායම් යටපත් කිරීම නිසා බලය නමැති සංකල්පය සමාජගත විය. ඒ නිසාම සමාජයේ දුබල කණ්ඩායම්, ප්‍රබල කණ්ඩායම්, පාලන කණ්ඩායම්, පාලිත කණ්ඩායම්, වහලුන්, වහල් හිමියන් වශයෙන් වර්ග බිහි විය.

නිර්වාචිකව ආරම්භ වූ සන්නිවේදනය භාෂාව, අක්ෂර, මුද්‍රණ ශිල්පය වැනි මෙවලම් මගින් එකිනෙකා අතර සම්බන්ධතාව ශක්තිමත් කෙරිණි. සමාජයේ බලය පදනම් කර ගෙන භූගෝලීය සීමා පුළුල් කරමින් බලය නමැති සංකල්පය ව්‍යාප්ත වන්නේ, මානව චින්තනය පුළුල් වීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. ඒ නිසාම සමාජයේ තරම තීරණය කිරීමෙහි ලා මූලික කාර්යභාරයක් ඉටු කරනු ලබන්නේ, නූතන දියුණු සන්නිවේදන ක්‍රමවේදයක් මගින් බව විද්‍යාඥයන්ගේ පිළිගැනීම ය.

ඒ අනුව නූතන සන්නිවේදන තාක්ෂණය නිසා ලෝකයම හැකිලෙමින් පවතින බවත්, මුළු ලෝකයම එකම මිනිස් ගම්මානයක් බවට පත් වෙමින් පවතින බවත්, සන්නිවේදන විශාරදයකු වන මාෂල් මැක්ලූහන් ප්‍රකාශ කර ඇත. ඒ අනුව සමාජයේ බලය හා මිනිස් ඥානය පුළුල් වන බවත්, ඒවා සන්නිවේදනය හා කේන්ද්‍රගතව පවතින බවත් අවධාරණය කළ හැකිය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. සමාජයේ ප්‍රභවය හා විකාශනය**

- සමාජය යනු ගතික සංවිධානයක් බව
- සමාජය බිහි වී ඇත්තේ මිනිසාට තනිව ජීවත්වීමට නො හැකි වීම නිසා බව
- අද පවතින සමාජය ඓතිහාසික ක්‍රමික හා අක්‍රමික විකාශයක් බව
- ක්‍රමික විකාශය තුළ විවිධ සමාජ අදියර තිබූ බව
  ( ප්‍රාථමික, වහල්, වැඩවසම්, ධනවාදී හා සමාජවාදී ආදී වශයෙන්)

- ක්‍රමික මෙන්ම අක්‍රමික විකාශය ද සමාජ විකාශනයේ ස්වාභාවික සංසිද්ධියක් බව
- සමාජය යන්න සමාජ විද්‍යාත්මක, දේශපාලනික හා මනෝ විද්‍යාත්මක වශයෙන් අර්ථකථනය කළ හැකි බව
- සමාජයේ විකාශනය සමග තාක්ෂණික සංවර්ධනය ද, තොරතුරු ද, දැනුම ද එක් වන බව
- මිනිසාගේ සීමිත අවශ්‍යතා අසීමිත බවට පත් වූයේ සමාජයේ විකාශනයත් සමග බව
- සමාජයේ ප්‍රභවයට හා විකාශනයට සන්නිවේදනය ප්‍රබලව හේතු වූ බව

**2. සමාජ සංයුතිය**

- සමාජය ස්වාභාවික සංවිධානයක් බව
- සමාජය බිහි වී ඇත්තේ පුද්ගලයා හා පවුල මුල් කර ගෙන බව
- සමාජ සංයුතිය තුළ ඇති පවුල ස්වාභාවික ඒකකයක් බව
- සමාජ සංයුතිය තුළ වාත්තු කරන ලද සංවිධාන ද ඇති බව
- වාත්තු කරන ලද සංවිධානය බිහි වූයේ පුද්ගලයාගේ හා පවුලේ අවශ්‍යතා සපුරා ලීමට බව
- විවිධ සමාජීය සංවිධානයන් ආර්ථික, දේශපාලනික, සංස්කෘතික හා ආගමික වශයෙන් අර්ථ දැක්විය හැකි බව
- සමාජ සංයුතිය සමාජයේ පරිණාමය අනුව විවිධ ආකාරයෙන් වෙනස් වී ඇති බව
- සමාජ සංයුතිය තුළ විවිධ බල කණ්ඩායම් පවතින බව
- සෑම සමාජයක්ම ප්‍රජාමූල සහ ව්‍යාපාර මූල යන අංශ දෙකින් සමන්විත බව

**3. සමාජීය සම්පත් හා බල කේන්ද්‍රණය**

- සමාජයක සම්පත් හිමිකම එහි බල කේන්ද්‍රණයට හේතු වී ඇති බව
- සමාජයක ඇති වටිනාම සම්පත මානව සම්පත බව
- මානව සම්පත් බුද්ධිමය සම්පත් නිර්මාණය කරන බව
- නව භෞතික සම්පත් නිර්මාණය කරන්නේ ද මානව සම්පත් විසින් බව
- සමාජ පන්ති නිර්මාණය වන්නේ සම්පත් හිමිකම පදනම් කරගෙන බව
- විවිධ පරිණාමීය අවස්ථාවන්හි දී සමාජීය සම්පත් හිමිකම විවිධාකාරයෙන් පැවති බව (ගෝත්‍රික පාලන ක්‍රම, රාජාණ්ඩු, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු, සමාජවාදී ආණ්ඩු, ආදී වශයෙන් )
- සමාජයේ අධෝ ව්‍යුහය තුළ ආර්ථික හා නිෂ්පාදන බලවේග පවත්නා බව
- සමාජයේ උපරි ව්‍යුහය තුළ රාජ්‍යය, ආගම්, ජනමාධ්‍ය, කලාව හා දේශපාලනය ආදිය තිබෙන බව
- සමාජයේ බල කේන්ද්‍රණය වෙනස්වීමට අධ්‍යාපනය සුවිශේෂීව බල පෑ බව
- සමාජයේ බල කේන්ද්‍රණයට අභියෝග එල්ල කිරීමට ජනමාධ්‍යවලට හැකි බව

**4. ඥාන ගවේෂණය**

- ඥාන ගවේෂණය මිනිසා විසින් ලෝකය අනාවරණය කර ගන්නට ගත් උත්සාහයේ ප්‍රතිඵලයක් බව
- ඥාන ගවේෂණය ඓතිහාසික ක්‍රියාවලියක් බව
- වර්තමානයේ පවත්නා සමාජ ඥානය දිගු කාලීන ඥාන ගවේෂණයක ප්‍රතිඵලයක් බව
- සන්නිවේදනය, සංජානනය, නියෝජනය, සංකල්ප, විනිශ්චය හා නියාමනය ඥාන ගවේෂණයේ විවිධ කාර්යයන් බව
- ඥාන ගවේෂණයේ දී උද්ගාමී හා නිගාමී තර්ක ක්‍රම භාවිත වන බව
- ඥාන ගවේෂණයේ දී විවිධ ශිල්ප ක්‍රම භාවිත කරන බව (නිරීක්ෂණය, විශ්ලේෂණය, සංස්ලේෂණය, සම්පරීක්ෂාව ආදී )

**ඒකකය:** 2.0 සන්නිවේදනය හා සමාජය (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව:** 2.0 සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතා හා සමාජ භූමිකාව ද නූතන ගෝලීයකරණ සමාජය තුළ සන්නිවේදන ප්‍රවණතා ද තාර්කිකව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 2.2 සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතාව

**කාලච්ඡේද ගණන:** 12 යි.

**විෂය අන්තර්ගතය :** සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතාව

1. සමාජය හා සන්නිවේදන සංවර්ධනය
2. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය
3. සන්නිවේදනයේ සමාජීය බලපෑම
4. සන්නිවේදන නියාමනයන්

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. සමාජය හා සන්නිවේදන සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව හඳුනාගෙන විග්‍රහ කරයි.
2. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය පිළිබඳව පැහැදිලිව විස්තර කරයි.
3. සන්නිවේදනය සමාජය බලපාන අයුරු විශ්ලේෂණාත්මකව ප්‍රකාශ කරයි.
4. සන්නිවේදන නියාමන පිළිබඳව හා ඒවා සමාජය බලපාන අයුරු පැහැදිලි කරයි.

**හැඳින්වීම**

ඕනෑම සමාජයක විවිධ වූ පුද්ගලයන් එකට බැඳ තබා ගන්නා රැහැන වන්නේ සන්නිවේදනයයි. එවැනි සමාජ තුළින් සන්නිවේදනය සඳහා මාධ්‍යයන් බිහි වන්නේ, එම සමාජයේ පවතින ආකල්ප, විශ්වාස, ආගම්, සිරිත් විරිත් වැනි සංස්කෘතිකාංග පදනම් කරගෙනය. ඒ ඔස්සේ සමාජයක - රටක සන්නිවේදන ස්වභාවය අධ්‍යයනය කිරීමේ දී, එම රටේ, සමාජයේ ජීවත්වන පුද්ගලයන්ගේ සමාජ අවශ්‍යතාවන්, ආකල්ප හා සිතුම් පැතුම්, ඇදහිලි හා විශ්වාස වැනි සමාජයේ පවතින තත්ත්වයන් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වේ. පුද්ගලයා අදාළ සමාජයට අනුගත වන්නේත්, දැනුමෙන් සන්නද්ධ වන්නේත්, ඒ සමාජයට හා රටට උචිත පුද්ගලයකු බවට පත් වන්නේත් එම සමාජ සන්නිවේදනය ඔස්සේය.

සන්නිවේදනයේ සමාජීය බලපෑම ඉතා ඉහළය. වර්තමානයේ සමාජය පවත්වා ගෙන යන ප්‍රධාන මෙහෙයුම් කාරකය බවට සන්නිවේදනය පත් වී ඇත. එපමණක් නොව ඒ ඒ සමාජයේ ස්වභාවය විමසීමේ දී එයටම ආවේණික වූ අන්තර්ඥානය පිළිබඳව විමසීම ච අවශ්‍යය. ශ්‍රී ලංකාව උදාහරණයකට ගත හොත්, දේශීයව පැවති සන්නිවේදන අන්තර්ඥානය පිළිබඳව ප්‍රමාණවත් තරමේ අවධානයක් යොමු වී නැත. මේ අනුව සමස්තයක් වශයෙන් සමාජය හා සන්නිවේදනය පිළිබඳ මූලික මට්ටමේ අධ්‍යයනයක් කිරීම ඉතා වැදගත්ය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. සමාජය හා සන්නිවේදන සංවර්ධනය ( කාලච්ඡේද තුනයි.)**

- සමාජය හා සන්නිවේදනයේ සංවර්ධනය අතර ඇත්තේ අන්‍යෝන්‍ය සම්බන්ධයක් බව
- සමාජයේ පැවැත්මට සන්නිවේදනය අත්‍යාවශ්‍ය නිසා සමාජය හා සන්නිවේදනය දියුණු වූ බව
- සන්නිවේදනය සංවර්ධනය වීම නිසා ජනයාගේ අදහස් ප්‍රකාශනය ඉහළ ගිය බව
- සමාජය තුළ අන්තර් සම්බන්ධතා දියුණුවීමට සන්නිවේදන සංවර්ධනය ඉවහල් වූ බව
- විවිධ සමාජ අවස්ථා සඳහා සන්නිවේදනය යොදා ගැනීමේ ක්‍රම - විධි සංවර්ධනය වූ බව
- සන්නිවේදනය සංවර්ධනය වීම නිසා සමාජ ක්‍රියාකාරිත්වය අධිවේගී තත්ත්වයකට පත් වූ බව
- සන්නිවේදන සංවර්ධනය නිසා සමාජය කුඩා වූ බව
- උප සංස්කෘතීන් අතර පවත්නා ස්වභාවය අනුව සන්නිවේදනය සුවිශේෂී වූ බව

**2. ස්වදේශිකත්ව සන්නිවේදන අන්තර්ඥානය (කාලච්ඡේද තුනයි.)**

- ඕනෑම දේශයක් තුළ තමන්ගේම සන්නිවේදන රටා සංවර්ධනය වී තිබෙන බව
- යම් සමාජයක් අද පවත්නා තත්ත්වයට ගෙන ආවේ එයට ආවේණික සන්නිවේදන රටාව බව
- මේ අනුව ශ්‍රී ලංකාවේ ද ස්වදේශික සන්නිවේදන අන්තර්ඥානයක් ඇති බව
- සන්නිවේදනයෙන් ස්වදේශික විවිධ සංස්කෘතීන්ගේ ලක්ෂණ විද්‍යාමාන වන බව

- ඒ ඒ සංස්කෘතීන් පවත්වා ගෙන යාමට සන්නිවේදනය හේතුකාරක වී ඇති බව
- ස්වදේශීය චින්තනය ගොඩ නැංවී ඇත්තේ ස්වදේශීය සන්නිවේදන අන්තර්ඥානය මත බව
- සිරිත් විරිත්, සිතුම් පැතුම්, සමාජ සංකල්ප හා කලාව ආදිය සන්නිවේදන අන්තර්ඥානය නිරූපණය කරන බව
- ස්වදේශික ජනයාගේ පැවැත්ම රඳා පවතින්නේ ස්වදේශික සන්නිවේදන අන්තර්ඥානය මත බව

**3. සන්නිවේදනයේ සමාජීය බලපෑම ( කාලච්ඡේද දෙකයි.)**

- සන්නිවේදනය සමාජය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන බව
- සමාජීය ක්‍රියාකාරිත්වය සන්නිවේදනය මගින් හසුරුවනු ලබන බව
- ඥාති සම්බන්ධතා, මිත්‍රත්වය, සුහදත්වය, ආදී සමාජීය සංසිද්ධීන් පවතින්නේ සන්නිවේදනය මත බව
- පුද්ගලයන් අතර සම්බන්ධය මතුකර දක්වන්නේ සන්නිවේදනය බව
- සමාජ සංවිධාන බිහි කිරීම හා පවත්වා ගෙනයාම සන්නිවේදනයේ කාර්යයක් බව
- සමාජ සංවර්ධනය සඳහා පුද්ගලයන් පොළඹවාලීම සන්නිවේදනය මගින් ඉටු කරන බව

**4. සන්නිවේදන නියාමනයන් ( කාලච්ඡේද දෙකයි.)**

- විවිධ සන්නිවේදන සංදේශ සමාජයට බලපෑම් කරන ආකාරය හැදෑරිය යුතු බව
- සන්නිවේදනයේ කෙටි හා දිගු අරමුණු ද, මතුපිට හා යටි අරමුණු ද තිබෙන බව
- සමාජ සංවර්ධනය සඳහා සන්නිවේදනය නිසි මාර්ගයේ පවත්වා ගෙන යා යුතු බව
- සන්නිවේදනයේ වාණිජ පරමාර්ථ හා සමාජ පරමාර්ථ අතර පරතරයක් පවත්නා බව
- සන්නිවේදනයේ සමාජ පරමාර්ථ මුදුන් පත් කර ගැනීම නියාමනයේ පරමාර්ථය බව
- විවිධ නියාමනයන් සමාජ සන්නිවේදනය කෙරෙහි බලපෑම් ඇති කරන බව
  (සම්ප්‍රදායික චර්යාවන්, නව නියාමන සංවිධාන, ආගමික සංස්ථා, පවුල, පාසල ආදිය)

**ඒකකය** ඃ 2.0 සන්නිවේදනය හා සමාජය (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව** ඃ සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතා හා සමාජ භූමිකාව ද නූතන ගෝලීයකරණ සමාජය තුළ සන්නිවේදන ප්‍රවණතා ද තාර්කිකව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම**ඃ 2.3 සන්නිවේදනයේ සමාජීය භූමිකාව විග්‍රහ කරයි.

**කාල පරිච්ඡේද ගණන** ඃ 12 යි.

**විෂය අන්තර්ගතය**ඃ සන්නිවේදනයේ සමාජීය භූමිකාව

1. පුද්ගල අවශ්‍යතා සඳහා සන්නිවේදනය
2. සමාජීය අවශ්‍යතා සඳහා සන්නිවේදනය
3. තොරතුරු සම්පාදන කාර්යය
4. සමාජානුයෝජනය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. පුද්ගල අවශ්‍යතා සඳහා සන්නිවේදනය යොදා ගන්නා ආකාරය විමර්ශනය කරයි.
2. සමාජීය අවශ්‍යතා සඳහා සන්නිවේදනය යොදා ගන්නා ආකාරය විග්‍රහ කරයි.
3. තොරතුරු සම්පාදනයට සන්නිවේදනය යොදා ගැනීම සංසන්දනාත්මක ව අධ්‍යයනය කරයි.
4. සමාජානුයෝජනයේ දී සන්නිවේදනයේ භූමිකාව අනාවරණය කරයි.
5. සමස්තයක් වශයෙන් සන්නිවේදනයේ සමාජීය භූමිකාව විග්‍රහ කරයි.

**හැඳින්වීම**

මානව සමාජයේ සන්නිවේදනය ආරම්භ වන්නේ, තනි තනි පුද්ගලයාට සිය අවශ්‍යතා තනි ව සාක්ෂාත් කර ගැනීමට නොහැකි නිසා ය. අන් අයගේ අදහස් උදහස් මෙන්ම උදව් උපකාර ද මානව පැවැත්මට අත්‍යවශ්‍ය වේ. මානවයා සමාජ සත්ත්වයකු වන බැවින් අන් අය සමග එකට ජීවත්වීමේ දී කිසියමු පොදු එකඟතාවක් තිබීම අත්‍යවශ්‍ය සාධකයකි. එය සම්පූර්ණ කරනුයේ සන්නිවේදනය මගිනි.

ප්‍රාථමික සමාජයේ අවශ්‍යතා සපුරා ගැනීමට භාවිත කළ සන්නිවේදනය ප්‍රමාණවත් වන්නේ, එම සමාජ අවශ්‍යතාවන් තරමට ය. නමුත් සමාජ අවශ්‍යතා පුළුල් වීමත්, අවශ්‍යතා සංකීර්ණ වීමත් සමග ම සන්නිවේදන ක්ෂේත්‍රය ද වෙනස්කම් රැසකට භාජනය විය. ඒ අනුව සන්නිවේදනයේ කාර්යය ද පුළුල් විය.

මානව සමාජයේ පැවැත්මට අවශ්‍ය සියලු මග පෙන්වීම් කරනු ලබන සමාජය මෙහෙයවන්නාගේ තත්ත්වයට සන්නිවේදනය පත් වන්නේ ඒ නිසාය. ඒ අනුව ඒ ඒ සමාජයට උචිත ආකාරයට සාමාජිකයා ගොඩනැගීමේ කාර්යය කරනු ලබන්නේ ද සන්නිවේදනය මගිනි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. පුද්ගල අවශ්‍යතා සඳහා සන්නිවේදනය**

- ඃ මානව සමාජයේ පොදු අවශ්‍යතා ඇති අතර ම, පුද්ගල අවශ්‍යතා විෂම ලෙස පවතින බව
- ඃ එක් එක් පුද්ගලයාට තම අවශ්‍යතා ඉටු කර ගැනීමට අන්‍යයන් සමග ගනුදෙනු කළ යුතු බව
- ඃ අන්‍යයන් සමග ගනුදෙනුවේ දී සන්නිවේදනය අත්‍යවශ්‍ය මෙවලමක් බව
- ඃ සන්නිවේදන රටාව පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන බව
- ඃ යෝග්‍ය සන්නිවේදන ක්‍රම භාවිත නොකළ හොත් පුද්ගලයාගේ අරමුණු ඉටු නොවන බව
- ඃ පුද්ගල අවශ්‍යතා සපුරා ගැනීමේ දී සංජානනයේ ඇති වන පරස්පරතා බාධක වන බව
- ඃ යොදා ගත හැකි සන්නිවේදන ක්‍රම හා ස්වරූප විවිධ බව

**2. සමාජීය අවශ්‍යතා සඳහා සන්නිවේදනය**

- ඃ සමාජය සංවිධානය වී ඇත්තේ සන්නිවේදනය නිසා බව
- ඃ සමාජය පවත්වා ගෙන යාමට සන්නිවේදනය අත්‍යවශ්‍ය බව
- ඃ සමාජයෙහි විවිධ අවශ්‍යතා ඇති බව
- ඃ සමාජයෙහි පුද්ගලයන් විවිධ බව
- ඃ යොදා ගත හැකි සන්නිවේදන ක්‍රම හා ස්වරූප විවිධ බව

- අවශ්‍යතාවන්ට, පුද්ගලයන්ට ගැළපෙන පරිදි සන්නිවේදන ක්‍රම හා ස්වරූප යොදා ගත යුතු බව
- සමාජ අවශ්‍යතා සපුරා ගැනීමට සන්නිවේදනය කෙතරම් ඉවහල් වූයේ දැයි සොයා ගැනීම අපහසු බව
- සන්නිවේදනය වැරදි ලෙස භාවිත කිරීමෙන් සමාජය තුළ අවුල් වියවුල් ඇති විය හැකි බව
- සමාජයේ යහ පැවැත්ම සන්නිවේදනයේ අරමුණ විය යුතු බව

**3. තොරතුරු සම්පාදන කාර්යය**

- සමාජීය පැවැත්මට තොරතුරු අවශ්‍ය බව
- ජනයා සැම විටම තොරතුරු පිපාසයකින් පෙළෙන බව
- ශරීරයට ආහාර මෙන් මනසට තොරතුරු අවශ්‍ය බව
- විවිධ තොරතුරු මාධ්‍ය ඔස්සේ ජනයාට තොරතුරු ලැබෙන බව
- විධිමත් මාධ්‍ය මෙන් ම අවිධිමත් මාධ්‍ය ඔස්සේ ද ජනයාට තොරතුරු ලැබෙන බව
- තොරතුරක ප්‍රධාන වශයෙන්ම විශ්වසනීයත්වය තිබිය යුතු බව
- තොරතුරක් විශ්වාස කළ හැක්කේ එය නිවැරදි වීමෙන් හා නිසි අධිකාරියකින් නිකුත් වීමෙන් බව
- අවිධිමත් තොරතුරු ද සමාජයේ පැවැත්මට හේතු වන බව
- අවිධිමත් තොරතුරුවල අයහපත් බලපෑමෙන් සමාජය අවුල් වන බව
- නිවැරදි තොරතුරු මූලාශ්‍ර කෙරෙහි ජනයා ගේ අවධානය යොමු විය යුතු බව
- සමාජයට තොරතුරු ලැබෙන ප්‍රධාන මාර්ගයක් ලෙස ජනමාධ්‍ය නම් කළ හැකි බව
- ජනමාධ්‍යයටත් වඩා වේගයෙන් නව මාධ්‍ය ඔස්සේ සමහර තොරතුරු ලැබෙන බව

**4. සමාජානුයෝජනය**

- තමා අයත්වන සමාජය අපේක්ෂා කරන ආකාරයට තම සමාජ ජීවිතයේ විවිධ අවස්ථාවල දී හැසිරිය යුතු ආකාරය ඉගෙන ගැනීම සමාජානුයෝජනය බව
- මෙම හැසිරීම හෙවත් මානව චර්යාවන් ඉගෙන ගැනීම ආරම්භ වන්නේ ඉතා කුඩා අවධියේ සිට බව
- සමාජානුයෝජනය වීමේ දී වර්ධනය කර ගන්නා හැසිරීම් රටා වර්ග දෙකක් තිබෙන බව
    1. පුද්ගලයාගේ අවශ්‍යතා සම්පූර්ණ කරන හැසිරීම්
    2. පුද්ගලයා අයත් වන සමාජය විසින් යහපත් යයි සම්මත හැසිරීම්
- පුද්ගලයකු සමාජානුයෝජනය වන ප්‍රධාන ක්‍රම තුනක් තිබෙන බව
  ( අනුකරණය (Imitation) , තදාත්මීකරණය (Identification), භූමිකා නිරූපණය (Role Playing)
- අනුකරණයේ දී කිසියම් පරමාදර්ශී චරිතවල ගති පැවතුම් තමන්ට ආරෝපණය කර ගන්නා බව
- තදාත්මීකරණයේ දී යම් කෙනෙකු ළඟින් ඇසුරු කරමින් සියලු ගති ලක්ෂණ පවරා ගන්නා බව
- අනුකරණය සඳහා පරමාදර්ශ තෝරා ගැනීමේ දී වර්තමානයේ ජනමාධ්‍යයෙහි බලපෑම දැඩි බව
- භූමිකා රංගනයේ දී තමා ඇසුරු කරන එක් එක් අය ගේ භූමිකාව රඟ දක්වන බව
- සමාජය තුළ පවත්නා සාම්ප්‍රදායික සන්නිවේදන ප්‍රවේග ද සමාජානුයෝජනය ඉටු කරන බව
- සමස්තයක් ලෙස ජනමාධ්‍ය විසින් සමාජානුයෝජනයේ බලවත් භූමිකාවක් ඉටු කරන බව
- න්‍යෂ්ටික පවුලේ හා විස්තෘත පවුලේ සමාජානුයෝජන ස්වභාවය හා ක්‍රියාවලිය වෙනස් බව
- පවුලේ හා පාසලේ සමාජානුයෝජන ක්‍රියාවලියට වගකීමක් ඇතත්, ජනමාධ්‍යයෙන් සිදු වන සමාජානුයෝජනයට වගකීමක් නැති බව

**ඒකකය** : 2.0 සන්නිවේදනය හා සමාජය
**නිපුණතාව** : සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතා හා සමාජ භූමිකාව ද සමකාලීන ගෝලීයකරණ සමාජය තුළ සන්නිවේදන ප්‍රවණතා ද තාර්කික ව විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම**: 2.4 ගෝලීයකරණ හා සන්නිවේදන ප්‍රවණතා විග්‍රහ කරයි.
**කාල පරිච්ඡේද ගණන** : 12 යි.

**විෂය අන්තර්ගතය**: ගෝලීයකරණය හා සන්නිවේදන ප්‍රවණතා

1. ගෝලීයකරණ සංකල්පය
2. දැනුම් සමාජය
3. ගෝලීයකරණය හා නව ප්‍රවණතා
4. පුරවැසි මාධ්‍ය
5. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. ගෝලීයකරණය බිහි වීමේ සමාජීය ප්‍රවණතා හා එම සංකල්පය විග්‍රහ කරයි.
2. තොරතුරු සන්නිවේදනයේ ප්‍රතිඵලයක් වශයෙන් දැනුම් සමාජය බිහි වූ ආකාරය විග්‍රහ කරයි.
3. කේන්ද්‍රීය හා පරිවාරීය රටවලට ගෝලීයකරණය හා එහි නව ප්‍රවණතා බල පා ඇති ආකාරය තුලනාත්මකව විශ්ලේෂණය කරයි.
4. පුරවැසි මාධ්‍ය යන්නෙහි ස්වභාවය, එහි ප්‍රභවය හා ක්‍රියාකාරිත්වය විග්‍රහ කරයි.
5. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය බිහි වීමේ පදනම, එම මාධ්‍යයන්හි ගතිලක්ෂණ හා එහි සමාජීය බලපෑම විග්‍රහ කරයි.

**හැඳින්වීම**

ලොව පුරා පාරජාතික පරිමාණයෙන් විඥාපන අමුද්‍රව්‍ය, තොරතුරු සබඳතා සහ මාධ්‍යයන් පද්ධති වශයෙන් ව්‍යාප්තවීම සන්නිවේදනයේ ගෝලීයකරණය ලෙස සැලකේ. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය තුළ එම ප්‍රවණතාව විවිධ පැති හා විවිධ න්‍යායික පදනම් මත අධ්‍යයනය කරනු ලැබේ. ගෝලීයකරණය හා සන්නිවේදනය පිළිබඳව පර්යේෂණ කරන සමහර විද්වතුන් ගෙන හැර දක්වන්නේ, විද්‍යාවේ හා සංස්කෘතියේ ඉදිරි වර්ධනය හේතු කරගෙන අනාගතයේ බිහි වන තොරතුරු සමාජය තුළ ජාතීන් අතර සහජීවනය වර්ධනය වන බවය. ජනමාධ්‍යයේ හා සන්නිවේදනයේ ගෝලීයකරණය නිසා විවිධ රටවල ස්වාධිපත්‍යය හා සංස්කෘතික අනන්‍යතාව විනාශ වී යන බවත්, ජනමාධ්‍ය හා සන්නිවේදනය මානවවාදී අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මක වනවා වෙනුවට, වාණිජවාදී අරමුණු සඳහා ක්‍රියාත්මක වන බවත් බොහෝ දෙනාගේ අදහසයි.

ගෝලීයකරණය සමාජයේ ඓතිහාසිකව සිදු වන සාර්වාංගික ක්‍රියාවලියකි. එය මානව ක්‍රියාකාරිත්වයේ විවිධ ක්ෂේත්‍ර අතර අන්තර්සම්බන්ධතාව (Interconnectendness ) අන්තර් ක්‍රියාකාරිත්වය (Interaction) , අන්‍යෝන්‍යායත්තතාව (Interdependency) හා තියුණුභාවය ( Intensification), වර්ධනය කරමින් සමස්ත මානව සමාජය ධුරාවලිගත ඒකීය පැවැත්මක් බවට පත් කොට ඇත. සමකාලීන මානව සංහතිය සිය සමාජ පරිණාමයේ සුවිශේෂ යුගයකට ප්‍රවිෂ්ට වී ඇති අතර, ශතවර්ෂ ගණනාවක් පැවති සංවෘත සමාජ හා ජාතික රාජ්‍ය ව්‍යුහයන් සිය පැවැත්මේ අවසානය කරා ළඟා වී තිබේ. එම ව්‍යුහයන් පාදක කොට ගෙන හා ඒවා සිය පෝෂක ප්‍රදේශයන් බවට පත් කොට ගෙන, නව සමාජ සැකැස්මක් නිර්මාණය වී මානව ජීවිතයේ සියලු ක්‍රියාකාරී අවකාශ ඊට ඒකාග්‍ර වී ඇත. මානව ඉතිහාසයේ ප්‍රථම වරට එම නව සමාජ සැකැස්ම මගින් මුළු මානව සංහතියම ඒකීය සමස්ත සමාජයක් බවට පත් කර තිබේ.

ගෝලීය සමාජය තුළ ජනසන්නිවේදන මාධ්‍යයන් හරහා පාර දේශාන්තිකව සිදු වන තොරතුරු, ප්‍රවෘත්ති හා විනෝදාත්මක වැඩ සටහන්වල ව්‍යාප්තියේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික හා කලාපීය සංස්කෘතික අනන්‍යතාව නිෂේධනය වෙමින් සම ජාතීය, සම ප්‍රමිතීය, ඒකාකාරී ගෝලීය සංස්කෘතික හා සන්නිවේදන පරිසරයක් නිර්මාණය වෙමින් පවතී. මෙය ගෝලීය පරිමාණයෙන් විඥාපන ප්‍රාග්ධනය (Informational Capital) ඒකාධිකරණය වීමේ ප්‍රතිඵලයකි.

මෙය තොරතුරු ඒකරාශිකරණයේ සිද්ධි තෝරා ගැනීම් ක්‍රියාවලිය මත තීරණාත්මක බලපෑමක් කර හමාරය. තොරතුරු හා මාධ්‍ය පෙළෙහි අන්තර්ගතය ප්‍රාදේශීයත්වය, ජාතිකත්වය හා කලාපීයත්වය අල්පීකරණය

වීමේ ප්‍රවණතාවක් ඇති කරන්නේ ය. ඒ අතර මේ තත්ත්වය ගෝලීය ග්‍රාහක පරිමණ්ඩලය බහුලීකරණය වීමේ ප්‍රවණතාව උත්සන්න කරන්නේය. මේ ආකාරයට ප්‍රවෘත්තිමය හා විනෝදන වැඩ සටහන්වල අන්තර්ගතය ගෝලීය ලක්ෂණ අත්පත් කර ගැනීමත් සමගම, ග්‍රාහකයන්ගේ රසඥතාව ගෝලීයකරණය වීමේ ප්‍රවණතාව වර්ධනය වන්නේය. මේ තත්ත්වය තුළ ග්‍රාහකයෝ සිය සීමාසහිත ප්‍රදේශවල සිදු වන දේ කෙරෙහි දක්වන උනන්දුව හා ආකර්ෂණය අඩු වන අතර, ඔවුන්ගේ අවධානය හා ආකර්ෂණය වැඩි වැඩියෙන් යොමු වන්නේ, ගෝලීය හා ශිෂ්ටාචාරික පරිමාණයෙන් සිදු වන දේ දැන ගැනීම සඳහාය.

මාධ්‍ය සංස්කෘතිය ගෝලීයකරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස විවිධ ජාතික සංස්කෘතික පුරුෂාර්ථ හා හර පද්ධති සමකාලකරණය (Synchronization), ප්‍රමිතිකරණය (Standadization) , සහ සමජාතීකරණය (Homogenization) වීමේ ප්‍රවණතාව උත්සන්න වෙමින් සමස්ත ජීවන අවකාශය මාධ්‍යකරණය වීමේ ප්‍රවණතාව ශක්තිමත් කරන්නේ ය.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

### 1. ගෝලීයකරණ සංකල්පය

- පර්යාය වශයෙන් ලෝකගතකරණය, පෘථිවිකරණය, විශ්වීයකරණය, ලෝකාවේශය, භූගෝලීයකරණය, ජගත්කරණය, ලෝකකරණය ආදිය යෙදෙන බව
- පිළිගත් පොදු න්‍යායයක් නොමැති බව
- බහුමානීය හා බහුවිෂයයික පරාසයක් පුරා පැතිර පවතින සංකල්පයක් බව
- අන්තර් විෂයයික හා පාර විෂයයික ව විශ්ලේෂණය කළ හැකි බව
- ඓතිහාසික - ස්වාභාවික ක්‍රියාවලියක් වන බව
- මානව සමාජ පරිණාමයේ නව අවධියක්, නව කුලයක්, නව ව්‍යුහයක් බව
- සමාජය යනු ඒකීය සමස්තයක් ලෙස මානව සමාජය ඒකාබද්ධ කරන බව
- මානව සමාජයේ ධුරාවලීගත ව්‍යුහයක් බව
- සාමාන්‍ය මානව සමාජය මත නිර්මාණය වූ උපරි ව්‍යුහයක් වන බව
- මානව සමාජයේ විවිධ ලක්ෂණ අතර, අන්‍යෝන්‍යත්තතාවයේ , අන්තර් ක්‍රියාකාරිත්වයේ හා අන්තර් සම්බන්ධත්වයේ ප්‍රතිඵලයක් වන බව
- ගෝලීය සමාජය මානව සබඳතා තියුණු වීමේ ප්‍රතිඵලයක් වන බව
- ගෝලීය සමාජය කාල--අවකාශ සබඳතාවල සංකෝචනයේ ප්‍රතිඵලයක් වන බව

### 2. දැනුම් සමාජය

- තොරතුරු මත පදනම් වූ සමාජයක් වන බව
- බටහිර අනාගතවාදී සංකල්පය තුළ උපත ලද්දක් බව(1970 - 1980)
- මානව ඉතිහාසයේ නව යුගයක් බව
- දැනුම් සමාජය තුළ නිර්බහුජනීය විඥාපන මාධ්‍යයන් වැදගත් වන බව
- දැනුම් සමාජය තුළ ආර්ථිකය හා සංස්කෘතිය සුවිශේෂ බව
- දැනුම් සමාජය තුළ ජීවන ශෛලිය හා චින්තන මාදිලිය සුවිශේෂී බව

### 3. ගෝලීයකරණය හා නව ප්‍රවණතා

- ගෝලීයකරණය ගතික ක්‍රියාවලියක් වන බව
- ජාතික රාජ්‍යයන් දුර්වල වීමේ ප්‍රතිඵලයක් බව
- ගෝලීයකරණය සමග කලාපීයකරණය සිදු වන බව
- ද්‍රව්‍යමය ආර්ථිකය අබිබවා මූල්‍ය ආර්ථිකය ශක්තිමත් වන බව
- විද්‍යාව හා තාක්ෂණය ආර්ථිකයේ තීරණාත්මක බලවේගයක් වන බව
- ලෝක ආර්ථිකය මත මූල්‍ය සර්වාධිකාරිත්වයක් වර්ධනය වන බව
- ජනසන්නිවේදන මාධ්‍යයන්ගේ ප්‍රමාණාත්මක වර්ධනයක් සිදු වන බව
- ජනසන්නිවේදන මාධ්‍ය ක්‍රියාවලියේ විවිධ සංඝටක වර්ධනය වීම
- විවිධ ජනමාධ්‍යයන් ඒකීය පද්ධති බවට පත් වන බව
- ගෝලීය තොරතුරු අවකාශයක් නිර්මාණය වන බව
- සංස්කෘතික ක්ෂේත්‍රය තුළ ජනසන්නිවේදන තොරතුරු මාධ්‍යයන් ගේ භූමිකාව වර්ධනය වන බව
- ජනමාධ්‍යයන්ට අමතර ව ආත්ම කේන්ද්‍රීය මාධ්‍ය බිහි වන බව

- නව මාධ්‍ය වර්ධනය වන බව
- නූතන මාධ්‍ය හා නව මාධ්‍ය අතර අන්තර් සබඳතා වර්ධනය වන බව
- බහුජන තොරතුරු අවකාශය වාණිජකරණය වන බව
- නව සංස්කෘතික ස්වරූප ඇති වන බව
- විචිත්‍ර සංස්කෘතියක් බිහි වන බව

**4. පුරවැසි මාධ්‍ය (Civic Journalism)**

- මහජන ප්‍රවෘත්තිකරණය යන පදය ද පර්යාය වශයෙන් යෙදෙන බව
- පුරවැසියන් විසින් මාධ්‍ය වාර්තාකරණයෙහි යෙදීම මෙයින් අදහස් වන බව
- සමාජ අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියාත්මක වන බව
- දැවෙන සමාජ - ආර්ථික - දේශපාලනික හා සංස්කෘතික ප්‍රශ්න විසඳීම සඳහා ක්‍රියා කරන බව
- සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය උත්කර්ෂණය කරන බව
- මාධ්‍ය ත්‍රිත්වය ම මේ මගින් එක වර භාවිත කළ හැකි බව
- පුරවැසි හඬ සොයා ගොස් එය මතු කර ගත හැකි බව
- විෂය පථයට ආරම්භයේ දී දේශපාලනය ද ඉන් පසු අපරාධ, මැතිවරණ කටයුතු, සෞඛ්‍ය ගැටලු හා අධ්‍යාපන ප්‍රශ්න ආදිය අයත් වන බව
- මෙහි සාම්ප්‍රදායික ගවේෂණාත්මක පුවත්පත්වේදයේ ලක්ෂණ ඇති බව
- සිද්ධි වාර්තාකරණයේ දී ප්‍රභූ හෝ අධිපති දේශපාලන දෘෂ්ටිකෝණයට වඩා පුරවැසි දෘෂ්ටිකෝණයෙන් සිදු වන බව
- මේ මගින් පුරවැසියන් වැඩි වැඩියෙන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට සම්බන්ධ වන බව
- පුරවැසි ජීවිතයේ ගුණාත්මක බව මේ මගින් පෝෂණය වන බව

**5. විකල්ප හා විරෝධාකල්ප මාධ්‍ය**

- ප්‍රධාන ධාරාවට පරිබාහිර ව ක්‍රියාත්මක වන ජනමාධ්‍යවේදීය ශෛලියක් බව
- සාම්ප්‍රදායික හා බලවත් මාධ්‍ය ආයතනයන්ට එරෙහි ව ගොඩ නැගෙන බව
- මෙහි දී ප්‍රවෘත්ති, සාමාන්‍ය තොරතුරු හා විශේෂාංග ප්‍රමුඛස්ථානයක් ගන්නා බව
- එක් පුද්ගලයකු හෝ කිහිප දෙනෙකු හෝ විසින් ආරම්භ කොට පවත්වා ගෙන යන බව
- මෙම මාධ්‍ය ප්‍රධාන සමාගම් විසින් ආයතනික ව ප්‍රකාශයට පත් කිරීම හා බෙදා හැරීම සිදු නො කරන බව
- හුදු ලාබ ප්‍රයෝජන සඳහා නොව, මතවාදීය කාර්යයන් සඳහා පවත්වා ගෙන යන බව
- ග්‍රාහක කණ්ඩායම කුඩා වුවත් එයින් සමාජයට විශාල බලපෑමක් වන බව
- අන්තර්ගතය ප්‍රධාන ප්‍රවාහයේ අන්තර්ගතයට වඩා වෙනස් වන බව
- ගෝලීය විරෝධී, වර්ගවාදී විරෝධී, පාරිසරික හා සුළු කණ්ඩායම්වල මතයන් මේ මගින් බොහෝ විට නියෝජනය වන බව
- නව සමාජ හර පද්ධතීන් හා අර්ථ මේ මගින් සමාජගත කරන බව
- පාරිභෝගිකවාදයට, ජනප්‍රිය සංස්කෘතියට හා බහු ජන සංස්කෘතියට එරෙහි ව ඉදිරිපත් වන බව
- සමාජ විඥානයෙහි වෙනසක් ඇති කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන බව
- නව දිශාවකට සමාජය ගෙන යාමට ගන්නා උත්සාහයක් වන බව

**ඒකකය** : 3.0 සන්නිවේදන කුසලතා හා නිපුණතා (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව** : අන්තර්වර්තී, අන්තර් පුද්ගල, සමූහ හා උපකරණාධාර සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි.
**නිපුණතා මට්ටම** 3.1 අන්තර්වර්තී පුද්ගල නිපුණතා භාවිතයට ගනියි.

කාල පරිච්ඡේද ගණන : 14

**විෂය අන්තර්ගතය:**

1. තොරතුරු රැස් කිරීම, මතකය හා මතක් කිරීම
2. සිත හසුරුවා ගැනීම
3. තාර්කික චින්තනය හා තීරණ ගැනීම
4. ස්ව-සංකල්ප පෝෂණය
5. ඉගෙනීම

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. තොරතුරු රැස් කිරීම, මතකය හා මතක් කිරීම යන කාර්යයන් හඳුනා ගෙන විස්තර කරයි.
2. සිත හසුරුවා ගැනීමේ නිපුණතාව සංවර්ධනය කර ගනියි.
3. තාර්කික චින්තනය හා තීරණ ගැනීම පිළිබඳ භාවිතය තහවුරු කරයි.
4. ස්ව-සංකල්ප පෝෂණය කර ගනියි.
5. ඉගෙනීම සන්නිවේදනාත්මක දෘෂ්ටි කෝණයෙන් විශ්ලේෂණය කරයි.

**හැඳින්වීම**

සන්නිවේදන ක්‍රියාවලියේ පදනම වන්නේ, අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි. එහි දී තොරතුරු රැස් කිරීම , ඒවා සංදේශ සැකසීම සඳහා නිර්මාණාත්මක ව යොදා ගැනීම, අවස්ථාවෝචිත ව සංදේශ ඉදිරිපත් කිරීම යන ප්‍රධාන කාර්යයන් මෙහි දී ඉටු වේ. අන්තර්වර්තී සන්නිවේදන ක්‍රියාවලියට පියවර තුනක් අයත් වේ. ඒවා මෙසේ ය.




යම් කෙනෙකුගේ අන්තර්වර්තී සන්නිවේදන ක්‍රියාවලිය අන්‍යයන්ට ප්‍රකට වන්නේ, චර්යාව නිසා ය. චර්යාව ඇති වන්නේ සිතිවිලිවල ප්‍රතිඵලයක් වශයෙනි. විවිධාකාර වූ සිතිවිලි සිත තුළ ඇති වේ. සිතිවිලි ඇති වන්නේ හැඟීම් නිසා ය. මේ අනුව අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය ඉතා වේගවත් හා සංකීර්ණ ක්‍රියාවලියක් බවට පත් වේ.

අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය වඩා සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට ප්‍රගුණ කළ යුතු නිපුණතා පහක් විස්තර කළ හැකි ය. ඒවා මෙසේ ය.

1. විවිධ මූලාශ්‍ර මගින් විවිධාකාර වූ තොරතුරු සමුදායක් සිතෙහි රැස් කර ගැනීම. පුද්ගලයා ඇසුරු කරන විවිධ මූලාශ්‍ර මගින් මේ ආකාරයෙන් දැනුවත් ව හෝ නො දැනුවත් ව තොරතුරු රැස් කිරීම සිදු වේ. ඒ සඳහා යොදා ගැනෙන්නේ පුද්ගලයකු සතු පංචේන්ද්‍රියයි.

2. පුද්ගලයකු විසින් සිතෙහි රැස් කර ගෙන ඇති විවිධ දේ අතරින්, තමන් ගේ සංදේශයට අවශ්‍ය තොරතුරු පමණක් තෝරා ගැනීම. මෙය කළ හැක්කේ ප්‍රමාණවත් තොරතුරු සංඛ්‍යාවක් මතකයේ තබා ගැනීමෙන් හා අවශ්‍ය විටක ඒවා වහා තෝරා බේරා ගෙන මතක් කර ගැනීමෙනි.

3. තාර්කික ව තීරණ ගැනීම මගින් සංදේශයේ ස්වභාවය නිගමනය කර ගැනීම. මෙය හැඟීම්බර එකක් හෝ බුද්ධිමය වශයෙන් සැකසුවක් වන්නට පුලුවන. ඒ දෙක ම මනුෂ්‍යයා ගේ චර්යාවට අයත් ය.

4. අවශ්‍යතාවට ගැළපෙන පරිදි සංදේශය නිර්මාණය කර ගැනීම. මෙය ඉතා වේගයෙන් සිදු වන්නකි. සමහර විට කෙනෙකුට මෙම වේගය තේරුම් ගැනීමට පවා අපහසු ය. සිත ඒ තරම් වේගයෙන් ක්‍රියා කරයි.

5. යෝග්‍ය පරිදි සංදේශය ඉදිරිපත් කිරීම. මෙහි දී පුද්ගලයා ගේ චර්යාව ප්‍රකට කෙරේ. එය වාචික හෝ අවාචික හෝ වන්නට පුළුවන. එය ඉඟි, සංකේත හෝ සංඥා මගින් සිදු වන්නට පුළුවන. සංදේශය ඉදිරිපත් කිරීම සඳහා කෙබඳු සන්නිවේදන උපාය මාර්ග යොදා ගන්නේ ද යන්න තීරණය වන්නේ, ඒ ඒ පුද්ගලයා ඒ සඳහා ලබා ඇති අත්දැකීම් සම්භාරය අනුව ය.

ස්ව-සංකල්ප යම් පුද්ගලයකු තමා පිළිබඳ ව ම ගොඩ නංවා ගන්නා අදහස් සමුදායකි. ඒ අනුව තමා කෙබඳු කෙනෙක්දැයි එම පුද්ගලයා විසින් ම නිගමනය කරනු ලබයි. වයසින් අඩු දරුවකු තුළ පවතින්නේ ස්ව සංකල්පය ගොඩ නැගෙන ස්වභාවයකි. එනම් තමන් කෙබඳු කෙනෙක්දැයි එම දරුවා තුළ වැටහීමක් නැත. වයසත් සමග සෑම කෙනෙක් ම තමා ගේ චර්යා රටාවන් ස්ථාවර කර ගනී. එකිනෙකා ගේ හැසිරීම තීරණය වන්නේ මෙම ස්ථාවර චර්යා රටාවන් සමග ය. එය ඒ ඒ පුද්ගලයා ගේ සන්නිවේදන චර්යාවට සෘජු ව ම බල පායි. කෙනෙකු යමක් ප්‍රකාශ කරන ආකාරය, ප්‍රකාශ කරන අන්තර්ගතයේ ස්වභාවය, තීරණවලට එළඹෙන ආකාරය ආදිය මේ අනුව නිගමනය වේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. තොරතුරු රැස් කිරීම මතකය හා මතක් කිරීම (කාලච්ඡේද තුනයි.)**

ඃ විවිධාකාර මූලාශ්‍රයන් මගින් තොරතුරු රැස් කර ගන්නා බව
ඃ තොරතුරු ලබා ගැනීමේ උපකරණ ලෙස පංචේන්ද්‍රිය ම යොදා ගන්නා බව
ඃ තොරතුරු ලබා ගැනීමේ සීමාවක් නැති බව
ඃ හොඳ තොරතුරු මෙන් ම නරක තොරතුරු ද ලැබෙන බව
ඃ ප්‍රයෝජනවත් හා නිෂ්ප්‍රයෝජනවත් තොරතුරු ද ලැබෙන බව
ඃ ලබා ගන්නා තොරතුරු මතකයේ තැන්පත් වන ක්‍රියාවලියක් ඇති බව
ඃ කෙටි කාලීන මතකය හා දිගු කාලීන මතකය අතර ඒකාබද්ධ ක්‍රියාවලියක් ඇති බව
ඃ උඩු සිත හා යටි සිත යනුවෙන් ප්‍රභේදයක් ඇති බව
ඃ අත්දැකීමෙන් ලැබෙන තොරතුරු දිගු කාලීන ව මතකයේ රැඳෙන බව
ඃ මතකය හා මතක් කිරීම යනු මනෝ විද්‍යාත්මක ක්‍රියාවලියක් බව
ඃ මතකයේ ඇති තොරතුරු වර්ග කළ යුතු බව
ඃ අවශ්‍ය තොරතුරු රඳවා ගෙන අනවශ්‍ය තොරතුරු ඉවත් කළ යුතු බව
ඃ තොරතුරු ගොනු මතකයේ නිර්මාණය කළ යුතු බව
ඃ දිගු කාලයක් මතක් කිරීමෙන් තොර වුවත්, සිදු වීම් මතකයේ තැන්පත් ව ඇති බව
ඃ මතකයේ රඳවා ගැනීම හා මතක් කර ගැනීම බුද්ධිමය ක්‍රියාවලියක් බව

මතකයේ ස්වභාව

| | |
|---|---|
| කිය වූ දෙයින් | 10 % |
| ඇසූ දෙයින් | 20 % |
| දුටු දෙයින් | 30 % |
| ඇසූ දුටු දෙයින් | 50 % |
| කියූ ලියූ දෙයින් | 70 % |
| තමන් කළ කී දෙයින් | 80 % |

(මූලාශ්‍රය: Education Media
B.Wiman & J.Nierbhusy)



මතකයේ ස්වභාව දක්වෙන ප්‍රතිශතාත්මක ගණන් මනෝ විද්‍යාත්මක පර්යේෂණ අනුව සකසන ලද්දකි. එයින් පැහැදිලි වන දේ ඉගෙනුමට ඉතා වැදගත් ය. මතක තබා ගැනීම සඳහා කියවීම හා අසා සිටීම ඉතා පහළ මතක අගයක් පෙන්නුම කරයි. ඉහළ මතක අගයක් පෙන්නුම් කරනුයේ තමන් කළ කී දේ මත ය. ඒ අනුව වඩාත් හොඳින් මතක තබා ගැනීම සඳහා කෙබඳු ක්‍රම අනුගමනය කළ යුතුද යන්න නැවත සිතන්නට සිදු වේ. එසේ ම මතකයේ ඇති දේ මතක් කර ගත හැකි ප්‍රමාණය එක් දිනක් ඇතුළත සියයට විසි පහක් හෝ එයටත් අඩු ප්‍රමාණයක් දක්වා අඩු වන බව ද මෙහි දක් වේ. ඒ අනුව යමක් මතකයේ තබා ගෙන දින කිහිපයක් යන විට එය අමතක වීමේ ප්‍රවණතාව වැඩි බව පෙනේ. එබැවින් වඩාත් වැඩි මතකයක් රඳවා ගැනීම සඳහා කෙබඳු ක්‍රම අත්හදා බැලිය යුතුද? යන්න මෙහි දී අවධානය යොමු කළ යුත්තකි.

මතක් කර ගැනීමේ හැකියාව ඉහළ නංවන්නේ කෙසේද?




මතකය ඉහළ නැංවීම සඳහා තමන් ගේ මතකයේ ඇති දේ වරින් වර පුනරීක්ෂණයට භාජනය කිරිම අවශ්‍ය ය. එය තමා විසින් ම කරනු ලබන්නේ නම් මතකයේ රඳවා ගැනීමේ හැකියාව ඉතා ඉහළ මට්ටමකට ළඟා වේ.

මතකය රඳා පවතින්නේ මොළයේ ශක්තිය මත ය. මොළයේ දකුණු පස හා වම් පස ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ව මනෝ විද්‍යාත්මක ව සොයා ගෙන ඇත්තේ මෙසේ ය.

| මොළයේ වම් පස | මොළයේ දකුණු පස |
|---|---|
| කථනය | කලාත්මක ක්‍රියාකාරකම් |
| ගණිතමය හැකියා | සංගීතමය හැකියා / තාලය |
| බුද්ධිමය විශ්ලේෂණ | ආවේදන |
| කියවීම | හඳුනා ගැනීම |
| ලිවීම | අවබෝධය |
| නම් කිරීම | සංකීර්ණ රටා පිළිබඳ සංජානනය |
| පටිපාටි ගත කිරීම | අවකාශය පිළිබඳ හැකිය |
| අනුපිළිවෙළ | මුහුණේ ඉරියව් |
| සංකීර්ණ චාලක අනුපිළිවෙළ | සාකල්‍ය හැකියා |
| විචාරය | අන්තර් ඥානය |
| ඇගයුම | නිර්මාණශීලීබව |
| තර්කය | ප්‍රතිරූප |
| | වර්ණ |

මතක තබා ගැනීම සඳහා යොදා ගත තවත් උපක්‍රමයක් නම් තමන් විසින් රැස් කර ගන්නා තොරතුරු යම් පිළිවෙළකට ගොනු කර ගැනීම ය. ඒ මගින් තමන් ගේ මනස තුළ පරිගණකයක් මෙන් තොරතුරු ගොනු සම්පාදනය කර ගන්නට පුළුවන. එවැනි ක්‍රම කිහිපයක් පහත දැක්වෙන අතර, ඒවා පුහුණු වීමට කලක් ගත වේ. එහෙත් එය පුහුණු වූ පසු තොරතුරු මතකයේ තබා ගැනීම ඉතා පහසු හා ප්‍රිය ජනක දෙයක් බවට පත් වේ.

- එකම වර්ගයේ තොරතුරු එකට ගොනු කිරීම (උදා: තොරතුරු සඳහා පටුනක් සකස් කිරීම)
- විවිධ වර්ගවල තොරතුරු රාමුවකට ගැනීම (උදා: එකිනෙකට සම්බන්ධ තොරතුරු එක් කිරීම)
- සංකල්ප සිතියම් (උදා: එකිනෙක අනු පිළිවෙලට අනුව ධාරා සටහන් සකස් කිරීම)
- තොරතුරු සංවිධානය කිරීම ( උදා: යම් යම් තොරතුරු අවශ්‍ය පිළිවෙළට ලියා ගැනීම)
- උපමා වාක්‍ය, හෝ උපමා උපමේය යොදා ගැනීම ( උදා: යමක් තවත් එකකට සමාන කොට දැක්වීම)
- පුහුණුව ( උදා: මතකයේ ඇති දේ නැවත නැවත භාවිත කිරීම)
- මනඃකල්පිත ලෙස ගොඩ නංවා ගැනීම (උදා: වචන යුගල, කවි, රූප, ලේඛන ආදී ලෙස)

ඉගෙනුම හා මතකය පිළිබඳ තොරතුරු සැකසුම් මාදිලිය




මූලාශ්‍රය: Gagne & Driscoll -1988

මෙම රූප සටහනෙන් පැහැදිලි වන කරුණ නම්, පරිසරයෙන් අප ලබා ගන්නා තොරතුරු මුලින් ම කෙටි කාලීන මතකයට ඇතුළත් වන බවත්, දිගු කාලීන මතකයට ඇතුළත් වන්නේ දෙවනුව බවත් ය. එබැවින් මතකයේ රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ දිගු කාලීන මතකයට තොරතුරු ඇතුළත් කර ගැනීම ය.

**2. සිත හසුරුවා ගැනීම (කාලච්ඡෙද දෙකයි.)**

ඃ සිත යනු නිරන්තර ව ක්‍රියාත්මක පද්ධතියක් බව
ඃ හැඟීම් හා සිතිවිලි නිරන්තරයෙන් ඇති වන බව
ඃ මතක ගබඩාවේ ඇති විවිධ තොරතුරු අපගේ පාලනයෙන් තොර ව මතකයට ගලා එන බව
ඃ විවිධ බාහිර සාධක නිසා සිත උත්තේජනය වන බව
ඃ විවිධ හැඟීම් අනුව සිතිවිලිවල ස්වභාව තීරණය වන බව
ඃ හැඟීම් පාලනය කර ගත හැකි නම්, සිතිවිලි පාලනය කර ගත හැකි බව
ඃ හැඟීම් හා සිතිවිලි පාලනය කර ගැනීම මගින් චර්යාව පාලනය කර ගත හැකි බව
ඃ හැඟීම් හා සිතිවිලි පාලනය පුහුණු විය යුත්තක් බව
ඃ සිත හසුරුවා ගැනීමේ ක්‍රමයක් ලෙස භාවනාව ඉතා යෝග්‍ය ක්‍රියාකාරකමක් බව

- සිත හසුරුවා ගැනීම මානව සමාජයේ පැවැත්මට අවශ්‍ය බව
- ආවේගශීලී අවස්ථාවක සිත හසුරුවා ගැනීම අභියෝගයක් වන බව
- සිත හසුරුවා ගැනීම මගින් අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය හසුරුවා ගත හැකි බව
- මානසික කැළඹීම මිනිසා ගේ ස්වභාවික තත්ත්වයක් බව
- සිත හසුරුවා ගැනීම මිනිසා ගේ බුද්ධිමය කාර්යයක් වන බව
- සිත හසුරුවා ගත් තැනැත්තාට සමාජයේ ඉහළ ස්ථානයක් හිමි වන බව
- සිත හසුරුවා ගැනීම අසීරු කාර්යයක් බව

**3. තාර්කික චින්තනය හා තීරණ ගැනීම ( කාලච්ඡෙද තුනයි.)**

- ගැටලුවක් නිරාකරණයට අවශ්‍ය සාධක තෝරා බේරා ගැනීමේ හැකියාව තාර්කික චින්තනය බව
- කෙනෙකු තර්කානුකූලව කරුණු විමසන්නට පටන් ගන්නේ ඉතා ළාබාල වියේ සිට බව
- තර්කනය යන්න උසස් මානසික ක්‍රියාවක් බව
- දැනුම හා අත්දැකීම් වැඩි වන විට තාර්කික චින්තනය වැඩි දියුණු වන බව
- වයස අවුරුදු නවයේ පමණ සිට තාර්කික චින්තනයේ වර්ධනය පුළුල් වන බව
- තාර්කික චින්තනය ප්‍රශස්ත තීරණ ගැනීමට බල පාන බව
- සෑම කෙනෙකු ම විවිධ තීරණ ගන්නා නමුත්, ඒ සියල්ල ප්‍රශස්ත තීරණ නො වන බව
- ප්‍රශස්ත තීරණ ගැනීම බුද්ධිමත් භාවයේ ලක්ෂණයක් බව
- විකල්ප තීරණ කිහිපයක් අතරින් තැනට සුදුසු තීරණය ගත යුතු බව
- සමහර විට තීරණයක් ගැනීමට ඇති කාලය ඉතා කෙටි විය හැකි බව
- තමන්ට තීරණයක් ගත නො හැකි වූ විට අන් අය ගේ සහය අවශ්‍ය බව
- අයහපත් තොරතුරු යොදා ගැනීමෙන් අයහපත් තීරණ ගැනෙන බව

තීරණ ගැනීමේ පියවර
1. ගැටලුවක් ඇති බව හඳුනා ගැනීම
2. ගැටලුවේ සැබෑ ස්වභාවය විශ්ලේෂණය හා අධ්‍යයනය කිරීම
3. තීරණයක් ගැනීමේ අවශ්‍යතාව නිගමනය කිරීම
4. විකල්ප තීරණ කිහිපයක් ගොඩ නංවා ගැනීම
5. විකල්ප තීරණ තක්සේරු කිරීම
6. තීරණ ක්‍රියාත්මක කිරීමේ ශක්‍යතාව මැන බැලීම
7. වඩාත් යෝග්‍ය තීරණය ගැනීම

**4. ස්ව-සංකල්පය පෝෂණය:**

- පුද්ගලයකු විසින් තමා කෙබඳු කෙනෙක්දැයි හඳුනා ගෙන ඇති ආකාරය ස්ව-සංකල්පයයි.
- තමාගේ ලක්ෂණ සංවර්ධනය කර ගැනීම ස්ව සංකල්පය පෝෂණයයි.
- තමා කවුරුන්දැයි මැනවින් හඳුනා ගෙන සිටීම සෑම කෙනෙකුටම වැදගත් වේ.
- ස්ව සංකල්පය සමාජ විද්‍යා හා මනෝ විද්‍යා ක්ෂේත්‍රය තුළ මතු වූ අදහසකි.
- ස්ව සංකල්පය හා එය පෝෂණය කර ගැනීම පිළිබඳ ව දැනටත් විවිධ පර්යේෂණ පැවැත් වේ.
- මෙම සංකල්පය තවමත් සංවර්ධනය වෙමින් පවතී.
- ස්ව සංකල්පය යන්න පුද්ගලයා පෙර ආත්මයක සිට ගෙන එන්නක් නොවේ.
- උත්පත්තියේ දී පුද්ගලයා තුළ පිහිටි දෙයක් ද නොවේ.
- එය පුද්ගලයා පරිසරය හා ගැටීමෙන් ලබා ගන්නා අත්දැකීම් අනුව ගොඩ නගා ගනු ලබන්නකි.
- ස්ව සංකල්පය යනු පුද්ගලයා විසින් තමන් සංජානනය කර ගෙන ඇති ආකාරයයි.

**නිර්වචන**

ස්ව සංකල්පය යනු පුද්ගලයා ඔහු ගේ ලක්ෂණ පිළිබඳවත්, ඔහු වෙනත් අය හා ඔහු ගේ ම ජීවිතයේ විවිධ අංශ සමග දක්වන සම්බන්ධතා පිළිබඳවත් ගොඩ නගා ගෙන ඇති , කිසියම් වටිනාකම්වලින් යුක්ත වූ, සංජානනයන්ගෙන් සකස් වූ, සංවිධානාත්මක සංගත සංකල්පනික සමස්තයකි. (රොජර්ස් 1959)

ස්ව සංකල්පය යනු පුද්ගලයකු ඔහු පිළිබඳ ව සත්‍ය ලෙස සලකනු ලබන වටිනාකම්වලින් යුක්ත වූ විශ්වාසයන්ගෙන් සකස් වූ සංකීර්ණ ක්‍රියාකාරී පද්ධතියකි. ( පර්කි 1970)

ස්ව-සංකල්පය යනු පුද්ගලයකු තම හැකියාවන්, නිපුණතාවන්, පෙනුම හා සමාජ පිළිගැනුම පිළිබඳ දරනු ලබන ආකල්ප, හැඟීම් හා දැනුම වේ. ( බර්න් 1983)

ස්ව-සංකල්පය අතුරු අංශ තුනකින් සමන්විත ය.

1. කායික ස්වභාව පිළිබඳ ස්ව සංකල්පය
2. හැකියාවන් පිළිබඳ ස්ව සංකල්පය
3. සමාජ පිළිගැනුම් පිළිබඳ ස්ව සංකල්පය

මේ අනුව මෙම අංශ තුන වර්ධනය කර ගැනීම මගින් පුද්ගලයකු ගේ ස්ව සංකල්පය වර්ධනය කර ගත හැකි වේ. ස්ව-සංකල්පය පිළිබඳ ව දැක්විය හැකි ප්‍රධාන කරුණු දෙකකි.

1. ස්ව - සංකල්පය ඇගයීමට ලක් කළ හැකි ය.
2. ස්ව - සංකල්පය යනු ගතික දෙයකි.

මේ නිසා කෙනෙකුට තමන් ගේ ස්ව - සංකල්පය පිළිබඳ ව අගැයීමක් කර, එහි යම් යම් අංශ සංවර්ධනය කර ගන්නට කටයුතු කළ හැකි ය. යම් පුද්ගලයකුට සමාජය තුළ අනන්‍යතාවක් ඇති වන්නේ මේ අනුව ය. මෙහි දී පුද්ගලයා ගේ චර්යාව හා ආකල්ප ඉතා වැදගත් වේ.

**5. ඉගෙනීම:**

- සෑම කෙනෙක් ම ඉගෙනීම ආරම්භ කරන්නේ නොදරුවකු ව සිටින කාලයේ සිට බව
- පරිසරය ඉගෙනීමේ බලවත් මූලාශ්‍රයක් බව
- ඉගෙන ගැනීමේ විවිධ රටා ඇති බව
- වයසත් සමග ඉගෙන ගැනීමේ රටාවන්හි වෙනස්කම් ඇති වන බව
- කෙනෙකු ගේ දැනුම හා අත්දැකීම් ප්‍රමාණය ඉගෙනීම සඳහා අඛණ්ඩ ව භාවිත වන බව
- ඉගෙනීම යන්න සරල අර්ථයෙන් කරනු ලබන ප්‍රකාශයට වඩා සියුම් ක්‍රියාවලියක් බව
- ඉගෙනීම යනු දැනුම, භාවිතය හෝ අත්දැකීම් හෝ ඔස්සේ සිදුවන චර්යාමය වෙනස්වීමක් බව
- ඉගෙනීම සවිඥානික ව සිදු වන්නට බව
- ඉගෙනීම යන්න පාසල් අධ්‍යාපනයට පමණක් සීමා නො වන බව
- ඉගෙනීම සිදු වන්නේ කෙසේද? යන්න පිළිබඳ ව විවිධ පර්යේෂණ පවත්වා ඇති බව
- ඉගෙනීම සම්බන්ධයෙන් ප්‍රධාන න්‍යායයන් දෙකක් ඇති බව
    1. ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යාය
    2. ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යාය

මෙම න්‍යායයන් පිළිබඳ සරල අදහසක් දැන ගැනීමෙන් තම ඉගෙනීමට ප්‍රයෝජනයක් ඇති බව

ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යායයෙන් පැවසෙනුයේ ප්‍රධාන වශයෙන් ම ඉගෙනීම සිදු වන්නේ, ප්‍රබෝධක හා ප්‍රතිචාර අතර ඇති සම්බන්ධය නිසා බව ය. එනම් මෙහි දී ප්‍රබෝධකවලට කෙනෙක් ප්‍රතිචාර දැක්වීමේ දී ඉගෙනීම සිදු වන බව ය. (මේ සඳහා උදාහරණ සපයන්න.)

ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යායයෙන් පැවසෙනුයේ ඉගෙනීම සිදු වන්නේ කෙනෙකු ගේ මානසික ක්ෂේත්‍රය සංවිධානය වීමෙන් බව ය. එහි දී අරමුණු සහිත ව ප්‍රජානනය මුල් කර ගෙන ඉගෙනීම සිදු වේ. මෙහි දී ප්‍රජානනය යනු දැනීම ය. එයට අයත් වන්නේ, සංජානනය, චින්තනය හා තේරුම් ගැනීම ය. සංජානනය යනු යමක් අර්ථ ගැන්වීමයි. ඒ ඒ පුද්ගලයා ගේ හැකියාව අනුව මෙම අර්ථ ගැන්වීම අසමාන වේ. එක ම කාරණය පිළිබඳ ව දෙදෙනෙකු ගේ සංජානනය වෙනස් වන්නට පුළුවන. ( මේ සඳහා උදාහරණ සපයන්න.)

ප්‍රබෝධක ප්‍රතිචාර න්‍යායේ අඩු පාඩු හඳුනා ගෙන ඒ අනුව ක්ෂේත්‍ර ප්‍රජානන න්‍යාය ගොඩ නැගුණි. කෙසේ වුව ද මෙම න්‍යායයන් දෙක ම මගින් කෙනෙකු ගේ ඉගෙනුම් ක්‍රියාවලිය සිදු වන ආකාරය විමර්ශනය කරයි. මෙම න්‍යායයන් දෙක ම අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන ක්‍රියාවලිය සමග බැඳී පවතී. එනම් කෙනෙකු ගේ අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන ක්‍රියාවලිය අසාර්ථක නම්, ප්‍රබෝධක භාර ගැනීමට හා ඒ සඳහා ප්‍රතිචාර දැක්වීමට නො හැකි වේ. එසේ ම සංජානනය, චින්තනය හා තේරුම් ගැනීම යන කාර්යයන් ද සිදු නො වේ.

**ඒකකය** : 3.0 සන්නිවේදනය කුසලතා හා නිපුණතා
**නිපුණතාව** : අන්තර්වර්තී, අන්තර් පුද්ගල, සමූහ හා උපකරණාධාර සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි.
**නිපුණතා මට්ටම** 3.2 අන්තර් පුද්ගල නිපුණතා භාවිතයට ගනියි.

කාල පරිච්ඡේද ගණන : 12

**විෂය අන්තර්ගතය:**

1. ඵලදායී කථනය
2. ශ්‍රවණ නිපුණතා සංවර්ධනය
3. සහානුභූතිය/සහවේදනය
4. ආචාරශීලීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. ඵලදායී කථනය පිළිබඳ අවබෝධයෙන් ඵලදායී ලෙස කථනයෙහි යෙදෙයි.
2. ශ්‍රවණ නිපුණතා වර්ධන ක්‍රම පිළිබඳ අවබෝධයෙන් ශ්‍රවණ නිපුණතා වර්ධනය කර ගනියි.
3. සහනුභූතිය යන්න විග්‍රහ කරමින් එය අත් දැකීමෙන් විඳ ගනියි.
4. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ආචාරශීලීත්වය විග්‍රහ කරමින් ආචාරශීලී ලෙස හැසිරෙයි.

**හැඳින්වීම**

සමාජයක පැවැත්ම රඳා පවතින්නේ අන්තර් පුද්ගල සම්බන්ධතා මත ය. සෑම කෙනෙකුට ම තම දෛනික ජීවිතයේ දී අන්තර් පුද්ගල සන්නිවේදනයෙහි යෙදෙන්නට සිදු වේ. එය විවිධාකාර වේ. විවිධ පාර්ශ්වයන් එයට සම්බන්ධ වේ. අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී සන්නිවේදකස්ථානය හා ග්‍රාහකස්ථානය නිරන්තර ව මාරු වේ. එම නිසා අන්තර් පුද්ගල සන්නිවේදනය පිළිබඳ නිපුණතා සංවර්ධනය කර ගැනීම සෑම කෙනෙකුට ම අත්‍යවශ්‍ය වේ. අන්‍යයන් සමග කෙරෙන සන්නිවේදනයේ දී ඉතා වැදගත් කාර්යයක් නම්, අනෙක් පාර්ශ්වයේ ගැටලු හෝ සංවේදී තත්ත්වයන් හෝ තමන්ට ආරෝපණය කර අගැයීමට ලක් කිරීමට ඇති හැකියාවයි. එසේ කිරීමට හැකි නම් අනුන් පිළිබඳ ව ඉතා සානුකම්පිත ව කටයුතු කරන්නට අපට අවස්ථාව සැලසේ. අවසාන වශයෙන් වැදගත් වන්නේ අන්‍යයන් සමග සන්නිවේදනයේ දී ආචාරශීලී ව කටයුතු කළ යුතු බව ය. ආචාරශීලීත්වය යන්න සාපේක්ෂ යෙදුමකි. එක් එක් සමාජයන්හි හෝ එක් එක් සංස්කෘතීන්හි හෝ ආචාරශීලීත්වය පවත්වා ගෙන යන ආකාරය හා එය ප්‍රදර්ශනය වන ආකාරය විවිධ වෙනස්කම් සහිත ය. කෙසේ වුව ද අවස්ථාවට උචිත ලෙස ආචාරශීලී ව කටයුතු කරන්නට අවශ්‍ය නිපුණතාව සෑම කෙනෙකුට ම තිබිය යුතු ය. මේ සියල්ල සෑම කෙනෙකු ගේ ම පෞද්ගලික ජීවිතයට ද, වෘත්තීය ජීවිතයට ද එක හා සමාන ව වැදගත් වේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. ඵලදායී කථනය: (කාලච්ඡෙද තුනයි.)**

- යම් අරමුණක් ඉටු කර ගැනීම සඳහා දෙදෙනෙකු අතර කෙරෙන අදහස් හුවමාරුවක් බව
- භාෂාව මූලික ව යොදා ගන්නා බව
- කථනය සමග එක් ව ඉරියව්, ඉඟි හා සංඥා ආදිය යොදා ගැනෙන බව
- දෙදෙනා ම කථනයෙහි යෙදෙන නිසා සන්නිවේදකයා හා ග්‍රාහකයා යන්න මාරු වන බව
- පැහැදිලි බව, නිරවුල් බව හා යෝග්‍ය භාෂාව වැදගත් වන බව
- තේරුම් ගත හැකි වේගයකින් කතා කළ යුතු බව
- ඉවසීම හා සංයමය කථනය සමග මිශ්‍ර ව තිබිය යුතු බව
- කථකයා සෑම විට ම ග්‍රාහකයා තේරුම් ගනිමින් කතා කළ යුතු බව
- කථකයාට ධනාත්මක ප්‍රතිචාර දැක්වීම ග්‍රාහකයා ගේ වගකීමක් වන බව
- ආවේගශීලී නො විය යුතු බව
- තමන්ට විශ්වාසයක් නැති, තමන් හරියට ම නො දන්නා දේ නො කිව යුතු බව
- අන්තර් පුද්ගල කථනයෙහි විවිධ අරමුණු තිබිය හැකි බව
- සෑම කෙනෙකුට ම දෛනික ව විවිධ භූමිකා රඟ පාන්නට සිදු වන බව
- මෙම විවිධ භූමිකා තමන් ගේ කථනයට ඍජු ව ම බල පාන බව

- අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී අසීරු පුද්ගලයන් සමග සන්නිවේදනයෙහි යෙදීමට සිදු වන බව
- අසීරු පුද්ගලයන් ජය ගැනීමට ඵලදායී කථනය යොදා ගත හැකි බව
- අසීරු පුද්ගලයන් ජය ගැනීම කෙනෙකු ගේ පෞද්ගලික ජීවිතයේ අභියෝගයක් වන බව
- විවිධ අය ගේ කථන රටා අධ්‍යයනය කිරීමෙන් තමන් ගේ කථන රටාව සකසා ගත හැකි බව

**2. ශ්‍රවණ නිපුණතා සංවර්ධනය**

- අසා සිටීම හා සවන් දීම යනු දෙආකාර වන බව
- ශ්‍රවණය යන්නෙන් අදහස් වන්නේ අවධානයෙන් තොරතුරු ග්‍රහණය කර ගැනීමක් වන බව
- ශ්‍රවණ නිපුණතා සංවර්ධනය නිසා කෙනෙකුට මනා ලෙස තොරතුරු ග්‍රහණ කර ගත හැකි බව
- ශ්‍රවණ නිපුණතා ඉහළ මට්ටමක පවතින විට, මතක තබා ගැනීමේ ක්‍රියාවලිය සාර්ථක වන බව
- යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා සඳහා ශ්‍රවණ නිපුණතා ප්‍රයෝජනවත් වන බව
- විවිධ මානසික චිත්ත වේගයන් ශ්‍රවණය කෙරෙහි අහිතකර ලෙස බල පාන බව
- චිත්ත වේග පාලනය මගින් ශ්‍රවණය උසස් මට්ටමකට ගෙන ආ හැකි බව
- ශ්‍රවණ නිපුණතා සංවර්ධනය යනු කාලයක් තිස්සේ පුහුණු කළ යුත්තක් වන බව
- මානව ජීවියකු ශ්‍රවණය යන්න බිළිඳු වියේ සිට ම කරනු ලබන්නක් බව
- දුර්වල ශ්‍රවණයට හේතු ඇති බව
- ශ්‍රවණය යන්නට අවස්ථා හතරක් තිබේ.

**(1) ඇසීම:** මෙයින් අදහස් වන්නේ, යම් ශබ්දයක් ශ්‍රවණේන්ද්‍රිය විසින් ලබා ගැනීම ය. එය ඉබේ සිදු වන්නකි. අවධානය ඇති වන්නේ පළමු ඇසීමත් සමග ය. එය හුදෙක් කායික ක්‍රියාවලියකි.

**(2) තේරුම් ගැනීම:** තමාට ඇසුණු ශබ්ද තේරුම් ගැනීම දෙවනු ව සිදු වේ. ඒ ඒ ශබ්ද තේරුම් ගැනීමට නම්, ඒ පිළිබඳ පූර්ව දැනුමක් තිබිය යුතු ය. උදාහරණයක් වශයෙන් කෙනෙක් චීන භාෂාවෙන් කරනු ලැබූ කථනයක් ඇසුනාට එය තේරුම් ගැනීමට හැකියාවක් නැත. තමන් දන්නා භාෂාවකින් එම කථනය කරනු ලැබුයේ නම්, එය තේරුම් ගත හැකි ය. එහි දී එයට පෙර එම භාෂාව පිළිබඳ ව තමන් දන්නා ප්‍රමාණය ප්‍රයෝජනයට ගැනේ. ඒ අනුව එය තේරුම් ගැනීම හෝ තේරුම් නො ගැනීම හෝ සිදු වේ.

**(3) අගැයීම:** තුන් වන පියවරේ දී සිදු වන්නේ, තමන් තේරුම් ගත් දේ ඇගයුමට ලක් කිරීම ය. එය තොරතුරක් බවට පත් වන්නේ මෙම පියවරේ දී ය. ඒ අනුව එම තොරතුර තමා විසින් මුලින් ම කෙටි කාල මතකයට ඇතුළත් කර ගනු ලබයි.

**(4) ප්‍රතික්‍රියා දැක්වීම:** අවසාන පියවරේ දී යෝග්‍ය ප්‍රතික්‍රියාවක් දැක්වීම සිදු වේ. එය පුද්ගල බද්ධ ප්‍රතික්‍රියාවකි. එනම් එක ම ශ්‍රවණයක් සඳහා දෙදෙනෙකු දක්වන ප්‍රතික්‍රියාව අතර අසමානකමක් තිබෙන්නට පුලුවන.




**දුර්වල ශ්‍රවණ හැකියාවට හේතු කිහිපයක් ඇත.**

1. අවශ්‍යතාවක් නොමැති වීම
2. නිසි අවධානයක් නොමැති වීම
3. සංජානනය දුර්වල වීම
4. භාෂාව ග්‍රහණය කර ගැනීමට ඇති අපහසුව
5. භාෂාව තේරුම් ගැනීමට ඇති අපහසුව

**ශ්‍රවණ නිපුණතා වර්ධනය කිරීමට හේතු**

1. අවබෝධය සඳහා
2. නිවැරදි බව සඳහා
3. ශ්‍රවණ බාධා මග හැර ගැනීම සඳහා
4. මතක් කර ගැනීමේ අවශ්‍යතාව නිසා
5. විවිධ චිත්තවේග ශ්‍රවණයට බාධාකාරී වන නිසා

**ශ්‍රවණ නිපුණතා වර්ධනය කර ගැනීමේ පියවර**

1. ශ්‍රවණය වන දේ පිළිබඳ ව ඇල්මක් ඇති කර ගන්න.
2. ශ්‍රවණය කළ යුතු බවට මානසිකත්වයක් ගොඩනගා ගන්න.
3. ඇසෙන දේ මානසික ව විවරණය කරන්න.
4. කථනයේ වැදගත් වචන හා වාක්‍ය මනසට ඇතුල් කර ගන්න.
5. තමාට ලැබුණු තොරතුරුවල වැදගත්කම හා නොවැදගත්කම පිළිබඳ ව තීරණය කරන්න.

**ශ්‍රවණ නිපුණතා වර්ධනයට අදාළ විශේෂ කරුණු**

1. පුද්ගලයා ගේ භූමිකාව අනුව ශ්‍රවණය සඳහා යොදා ගත යුතු ක්‍රම වෙනස් වේ.
2. කථකයකු වශයෙන්, ග්‍රාහක සමූහයක එක් අයකු වශයෙන් හා අන්තර් පුද්ගල සන්නිවේදනයේ පාර්ශ්වකරුවකු වශයෙන් ශ්‍රවණය යොදා ගන්නා ආකාරය වෙනස් වේ.

**3. සහානුභූතියඃ**

ඃ කෙනෙකු ගේ චිත්ත ස්වභාව තමන්ට ආරෝපණය කර හැඟීමක් ඇති කර ගැනීම සහානුභූතිය බව
ඃ සමාජීය ජීවිතය සාර්ථක ව ගත කිරීමට අන්‍යයන් ගේ දුක සැප තේරුම් ගත යුතු බව
ඃ සහානුභූතියෙන් යුතු පුද්ගලයන් අන්‍යයන් කෙරෙහි කරුණාවන්ත වන බව
ඃ සහානුභූතියෙන් යුතු පුද්ගලයන්ට සමාජයෙහි හොඳ පිළි ගැනීමක් ඇති බව
ඃ කෙනෙකු ගේ චිත්ත ස්වභාවයෙහි මතු පිට නොව ඇතුළත දකින්නට මේ නිසා හැකි වන බව
ඃ සහානුභූතිය වැඩි දියුණු වන්නට පුළුල් අත්දැකීම් රාශියක් අවශ්‍ය බව
ඃ සාහිත්‍ය කෘති හා වෙනත් නිර්මාණාත්මක කෘති පරිශීලනය මගින් සහානුභූතිය වැඩි දියුණු වන බව

**4. ආචාරශීලීත්වයඃ**

ඃ සමාජ සම්බන්ධතා පිළිබඳ සමාජ පිළි ගැනීම ආචාරශීලීත්වයේ පදනම වන බව
ඃ ආචාරශීලීත්වය ප්‍රදර්ශනය වන හා දැනෙන දෙයක් බව
ඃ විවිධ ජන සමාජයන්හි ආචාරශීලී හැසිරීම්වල වෙනස් කම් ඇති බව
ඃ අන්තර් පුද්ගල සන්නිවේදනයේ දී ආචාරශීලීත්වය ප්‍රසන්න වාතාවරණයක් නිර්මාණය කරන බව
ඃ කථනය, අවාචික ඉරියව් හා හැසිරීම් මගින් ආචාරශීලීත්වය ප්‍රදර්ශනය කළ හැකි බව
ඃ ආචාරශීලීත්වය මගින් අන්තර් පුද්ගල සන්නිවේදනයේ ස්වරූපය නිරූපණය වන බව
ඃ ආචාරශීලීත්වය පුළුල් ලෙස සමාජ ගත වීමෙන් සමාජයේ සංවරබව වැඩි දියුණු වන බව
ඃ සමාජයේ අඛණ්ඩ හා ස්ථිරසාර පැවැත්ම සඳහා ආචාරශීලීත්වය අත්‍යවශ්‍ය සාධකයක් වන බව

**ඒකකය** : 3.0 සන්නිවේදන කුසලතා හා නිපුණතා (කාලච්ඡේද 50 යි.)
**ඒකකය** : 3.0 සන්නවේදනය කුසලතා හා නිපුණතා
**නිපුණතාව** : අන්තර්වර්තී, අන්තර් පුද්ගල, සමූහ හා උපකරණාධාර සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි.
**නිපුණතා මට්ටම**: 3.3 සමූහ සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි.

**කාලච්ඡේද ගණන** : 12

**විෂය අන්තර්ගතය**: සමූහ සන්නිවේදන නිපුණතා

1. සමූහය හඳුනා ගැනීම
2. සාමූහික වැඩ, වගකීම හා වගවීම
3. සම්මුඛ සාකච්ඡා
4. විසම්මුතිය හා එකඟත්වය
5. ආචාරශීලීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. සමූහය යන්න අර්ථ දක්වයි.
2. වගකීම හා වගවීම යන දෙකෙහි වෙනස හඳුනා ගනිමින් ඒවා අගය කරයි.
3. නිවැරදි සම්මුඛ සාකච්ඡාවක ලක්ෂණ අත්හදා බලයි.
4. අන්‍ය මතවලට ගරු කිරීමට පුරුදු වෙයි.
5. නව අදහස් ප්‍රකාශ කරයි.
6. සමූහ සන්නිවේදනයේ දී ආචාරශීලීව හැසිරෙන ආකාරය විමර්ශනය කරමින් අත්හදා බලයි.

**හැඳින්වීම**

සමාජීය සත්ත්වයකු ලෙස මානවයා නිරන්තර ව අන් අය සමග එක් ව කටයුතු කරයි. එම සාමූහික ජීවත් වීම ඓතිහාසික පුරුද්දකි. එකිනෙකා ගේ ආරක්ෂාවට, පැවැත්මට හා අදහස් හුවමාරුවට සමූහය අවශ්‍ය වේ. එය ජීවත් වීමේ කලාවයි. සමූහය යනු යම් පිරිසක ගේ එකතුවකි. මේ පිරිස අතර විවිධ වෙනස්කම් පවතී. වයස, උගත් කම, රැකියාව, ගැහැනු පිරිමි බව, ධනය , වර්ණය, ආගම ආදී විවිධ සාධක මෙම වෙනස්කම්වලට හේතු වේ. යෙදී සිටින කාර්යය හෝ රැකියාව අනුව ද මෙම විවිධතා ඇති වේ. ඒ අනුව සමූහය තවත් පියවර දෙකකට බෙදී යයි. ඒවා නම් කණ්ඩායම් හා කල්ලි ය.

කෙසේ වුව ද මේ ආකාරයෙන් සමස්ත සමූහය අතර ද, කණ්ඩායම් හා කල්ලි අතර ද පැවැත්ම සඳහා සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. එයට හේතුව එකිනෙකා සම්බන්ධ කරන ක්‍රියාවලිය වන්නේ සන්නිවේදනය වන බැවිනි. ඒ අනුව සන්නිවේදනය එකිනෙකා අතර බැඳීම් වැඩි කරන්නට මෙන් ම, එකිනෙකා වෙන් කරන්නට ද හේතු විය හැකි ය.

සාමූහික සන්නිවේදන කාර්යයේ දී පුද්ගලයන් තම වගකීම හා වගවීම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කළ යුතු ය. වගකීමක් ඇති වන්නේ යම් සම්බන්ධතාවක් නිසා ය. වගවීම යන්නෙන් අදහස් වන්නේ කිසිවකු ගේ පෙළඹවීමකින් තොර ව තමන් යම් සම්බන්ධතාවක් කෙරෙහි බැඳීමක් ඇති කර ගැනීම ය. වගකීම් පැහැර හැරිය හැකි ය. වගවීම තමා විසින් ම ඇති කර ගන්නා බැඳීමක් නිසා, එය ඉටු කිරීමට පුද්ගලයා පෙළඹේ. සාමූහික වැඩවල දී වගකීම හා වගවීම යන සංකල්ප දෙක මතු වේ.

සම්මුඛ සාකච්ඡා යන්නෙන් අදහස් වන්නේ සමූහය තුළ කෙරෙන අදහස් හුවමාරුවකි. එහි දී පිරිසක් සාකච්ඡාවේ යෙදෙන්නට පුළුවන. එසේ නැතිනම් එක් අයෙක් හෝ දෙදෙනෙක් හෝ කිහිප දෙනෙක් සමග තවත් පිරිසක් සාකච්ඡාවේ යෙදෙන්නට පුළුවන. මේ කුමන ආකාරයකට සිදු වුවත්, සම්මුඛ සාකච්ඡාව යනු යම් නිශ්චිත අරමුණක් ඇතිව කරනු ලබන කතා බහකි. එය ඕපා දූප කතා කිරීමක් නොවේ. එවැනි සම්මුඛ සාකච්ඡාවක අරමුණ යම් කරුණක් පිළිබඳ ව එකඟත්වයක් ඇති කර ගැනීම වන්නට පුළුවන.

සමූහයක් අතර කෙරෙන සන්නිවේදනයේ දී එකඟ වීම මෙන් ම එකඟ නො වීම ද සිදු විය හැකි ය. එය කිසිසේත් වරදක් නො වේ. එකඟ වීම මෙන් ම නො වීම ද ස්වාභාවික කරුණකි. එහෙත් මෙහි දී වැදගත් වන්නේ එය ආචාරශීලී ව සිදු වීම ය. එකඟ නො වීමේ දී එය ප්‍රචණ්ඩකාරී වන්නට පුළුවන. එසේ වන්නේ නම් එහි දී සන්නිවේදනයේ අරමුණු බිඳ වැටේ. මේ අනුව සමූහ සන්නිවේදන නිපුණතා පුද්ගලයන්

තුළ සංවර්ධනය කර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්මට අත්‍යවශ්‍ය සාධකයකි.

**1. සමූහය හඳුනා ගැනීම ( කාලච්ඡෙද දෙකයි.)**

ඃ සමූහයක් යනු එක් ව කටයුතු කරනු ලබන පුද්ගලයන්ගේ එකතුවක් බව
ඃ මෙම පුද්ගල එකතුව තුළ සමූහ ගුණාංග තිබෙන බව
- අරමුණු
- සන්නිවේදන මාර්ග
- නායකත්වය හා අනුගාමිකත්වය
- විවිධ භූමිකා
- සහජීවනය
- ප්‍රතිමාන හා නියමයන්
  - ගැටලු විසඳීමේ ක්‍රියාවලිය

ඃ මෙම සාමූහික ගුණාංග බිඳ වැටීමෙන් සමූහය ද බිඳී යා හැකි බව
ඃ සමූහයක් පවතින්නේ සමාන ගති ලක්ෂණ වැඩි ප්‍රමාණයක් ඇති නිසා බව
ඃ සමූහය තුළ විවිධතා තිබෙන බව

**2. සාමූහික වැඩ, වගකීම හා වගවීම ( කාලච්ඡෙද දෙකයි.)**

ඃ සමූහයක් එක් ව සිටින්නේ යම් අරමුණක් ඉටු කර ගැනීමට නිසා සාමූහික වැඩ තිබෙන බව
ඃ සාමූහික වැඩ එක් එක් අය අතර බෙදා ගැනීමේ දී වගකීම් ඇති වන බව
ඃ තමන්ට නොපැවරුණු වැඩ පිළිබඳ ව බැඳීමක් ඇති කර ගැනීමෙන් වගවීම ඇති වන බව
ඃ සාමූහික ක්‍රියාකාරකම්වල දී වගකීම හා වගවීම ඉතා වැදගත් වන බව
ඃ වගකීමෙන් හා වගවීමෙන් වැඩ කිරීමෙන් සාමූහික අරමුණු ඉටු කර ගත හැකි බව

**3. සම්මුඛ සාකච්ඡා ( කාලච්ඡෙද දෙකයි.)**

ඃ සම්මුඛ සාකච්ඡාව යන්න එකිනෙකා අතර යම් කරුණක් කේන්ද්‍ර කර ගෙන කරන කතාබහ බව
ඃ විවිධ අරමුණු සඳහා විවිධ සම්මුඛ සාකච්ඡා පැවතිය හැකි බව
ඃ සම්මුඛ සාකච්ඡා මගින් නව අදහස් උත්පාදනය වන බව
ඃ ගැටලු විසඳීම සඳහා ද සම්මුඛ සාකච්ඡා ප්‍රයෝජනවත් වන බව
ඃ සම්මුඛ සාකච්ඡා මගින් සැඟවුණු අදහස් ප්‍රකාශ කරවා ගත හැකි බව
ඃ යම් ගැටලුවක් පිළිබඳ ව එකඟත්වක් ඇති කර ගැනීමට සම්මුඛ සාකච්ඡාව යොදා ගත හැකි බව

**4. විසම්මුතිය හා එකඟත්වය ( කාලච්ඡෙද තුනයි.)**

ඃ සමූහය තුළ සිටින පුද්ගලයන් ගේ අදහස් විවිධාකාර වන බව
ඃ නිදහස් මතධාරී පුද්ගලයන් සිටින සමූහයක විසම්මුතිය හා එකඟත්වය සාමාන්‍ය ස්වභාවයක් බව
ඃ දැඩි ලෙස පාලනය කරන ලද සමූහයක දී විසම්මුතියට ඉඩක් නැති බව
ඃ විසම්මුතිය හා එකඟත්වය ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක් වන බව

**5. ආචාරශීලීත්වය ( කාලච්ඡෙද දෙකයි.)**

ඃ සමූහයක් තුළ උප සංස්කෘතික ලක්ෂණ තිබිය හැකි බව
ඃ ඒ අනුව ආචාරශීලීත්වය ඒ ඒ සමූහයෙන් සමූහයට වෙනස් විය හැකි බව
ඃ සමූහය තුළ මනා සම්බන්ධතාවක් පවත්වා ගන්නට ආචාරශීලී හැසිරීම් අත්‍යවශ්‍ය බව
ඃ සමූහයට අලුතින් එක් වන අය, සමූහය තුළ පවත්නා ආචාරශීලී හැසිරීම් තේරුම් ගත යුතු බව
ඃ සමූහය තුළ සියල්ලන් ආචාරශීලී නො වූ විට, ඒ නිසා සමූහයේ පැවැත්ම බිඳ වැටෙන බව

**ඒකකය** : 3.0 සන්නිවේදන කුසලතා හා නිපුණතා
**නිපුණතාව** : අන්තර්වර්තී, අන්තර් පුද්ගල, සමූහ හා උපකරණාධාර සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි.
නිපුණතා මට්ටම 3.4 සන්නිවේදනය සඳහා විවිධ උපකරණ භාවිත කිරීමේ නිපුණතා ප්‍රකට කරයි.

කාල පරිච්ඡේද ගණන : 12

**විෂය අන්තර්ගතය**: සමූහ සන්නිවේදන නිපුණතා

1. කථන සන්නිවේදන උපකරණ භාවිතය
2. ප්‍රක්ෂේපණීය සන්නිවේදන උපකරණ භාවිතය
3. ප්‍රක්ෂේපණීය නොවන සන්නිවේදන උපකරණ භාවිතය
4. පාරිසරික හෝ නිර්මාණාත්මක හෝ උපකරණ භාවිතය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. විවිධ කථන සන්නිවේදන උපකරණ භාවිතය අත්හදා බලයි.
2. ප්‍රක්ෂේපණීය සන්නිවේදන උපකරණ භාවිතය අත්හදා බලයි.
3. විවිධ ප්‍රක්ෂේපණීය නොවන සන්නිවේදන උපකරණ භාවිතය අත්හදා බලයි.
4. පාරිසරික හෝ නිර්මාණාත්මක හෝ සන්නිවේදන උපකරණ නිර්මාණය කරමින් අත්හදා බලයි.
5. සන්නිවේදන උපකරණ සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක වීමට බලපාන ආකාරය විමසයි.

**හැඳින්වීම**

සන්නිවේදන ක්‍රියාවලියේ දී මිනිසා සතු ශක්තියේ සීමාවට පැමිණි විට ඒ සඳහා බාහිර උපකරණ යොදා ගන්නට සිදු වේ. එයින් මිනිසාගේ සන්නිවේදන කාර්යය සාර්ථක ව කර ගන්නට අවස්ථාව සැලසේ. මේ සඳහා විශේෂයෙන් නව විද්‍යාත්මක මෙවලම් භාවිතය කරනු ලබයි. උදාහරණයක් වශයෙන් තමන්ගේ පුද්ගලයකුගේ කට හඬ යොදා ගත හැකි සීමාවක් තිබේ. එම සීමාව ඉක්මවා යාමට නම් ශබ්ද විකාශන උපකරණ යොදා ගන්නට සිදු වේ. සන්නිවේදන ක්‍රියාවලිය සිදු වන ස්ථානයේ නොමැති දේ පෙන්වන්නට අවශ්‍ය වූ විට ඒ සඳහා ඡායාරූප ආදිය යොදා ගන්නට පුළුවන. එහෙත් විශාල ඡායාරූප සකසා ගැනීමට අපහසු වේ. එබැවින් නව තාක්ෂණය භාවිත කරමින් ප්‍රක්ෂේපණීය උපකරණ යොදා ගත හැකි ය. එවිට වැඩි පිරිසකට එක් වර යමක් විශාල කර පෙන්විය හැකි ය. ප්‍රක්ෂේපණය නො වන උපකරණ වශයෙන් ලෑල්ල යොදා ගැනීම ජනප්‍රිය ක්‍රමයකි.

සන්නිවේදනය සඳහා සෑම විට ම නව තාක්ෂණික මෙවලම් අවශ්‍ය නො වේ. ඒ වෙනුවට සම්ප්‍රදායික ව සකස් කර ගත හැකි නිර්මාණාත්මක දේ යොදා ගන්නට පුළුවන. උදාහරණයක් වශයෙන් පරිසරයෙන් ලබා ගන්නා ගසක අත්තක්, මලක්, ගෙඩියක් වුවත් සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කර ගන්නට යොදා ගන්නට පුළුවන. එසේ ම රූකඩ, අත් රූකඩ වැනි නිර්මාණාත්මක මෙවලම් ද සන්නිවේදන ක්‍රියාවලියේ දී යොදා ගැනේ.

සියලු ආකාරයේ සන්නිවේදන කාර්යය සඳහා යොදා ගන්නා විවිධ උපකරණ භාවිත කිරීමේ දී එම උපකරණය පිළිබඳ නිපුණතාවක් ද, එම උපකරණය තම සන්නිවේදන කාර්යය සඳහා යොදා ගන්නා ආකාරය පිළිබඳ නිපුණතාවක් ද තිබිය යුතු ය. උපකරණ පිළිබඳ නිපුණතාව නොමැති වූ විට ඒවා හැසිරවීම අසීරු වෙයි. ඒවා යොදා ගන්නා ආකාරය පිළිබඳ නිපුණතාව නොමැති වූ විට, එම උපකරණ තිබුණත් නිසි ලෙස ඒවා තම සන්නිවේදන කාර්යය සඳහා යොදා ගන්නට හැකියාවක් නො ලැබේ. මෙම සියලු ආකාරයේ උපකරණවල අවසාන ප්‍රයෝජනය නම් සන්නිවේදන ක්‍රියාවලිය වඩාත් සාර්ථක කර ගන්නට අවකාශය සැලසීම ය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. කථන සන්නිවේදන උපකරණ භාවිතය (කාලච්ඡෙද තුනයි.)**

- විවිධාකාර වූ කථන සන්නිවේදන උපකරණ වර්තමානයේ භාවිත වන බව
- එක් එක් කාර්යයන් සඳහා විවිධ කථන සන්නිවේදන උපකරණ යොදා ගන්නා බව
- සමූහ සන්නිවේදනයේ දී මයික්‍රෆෝනය, මෙගාෆෝනය, යොදා ගැනෙන බව

ඃ මයික්‍රෆෝන විවිධ වර්ග ඇති බව (රැහැන් සහිත හා රැහැන් රහිත, ක්ලිප්ෆෝන් හා හෙඩ්ෆෝන් )
ඃ පුද්ගලාන්තර කථනයේ දී දුරකථන බහුල ව යොදා ගැනෙන බව
ඃ කථන සන්නිවේදන උපකරණ නූතනයේ දී අත්‍යවශ්‍ය භාණ්ඩ ගණයට අයත් වන බව

**2. ප්‍රක්ෂේපණීය සන්නිවේදන උපකරණ භාවිතය ( කාලච්ඡේද තුනයි.)**
ඃ ප්‍රක්ෂේපණය යන්න නවීන තාක්ෂණික ක්‍රියාවලියක් වන බව
ඃ ප්‍රක්ෂේපණ උපකරණ භාවිතය වියදම් සහිත වූවක් බව
ඃ ප්‍රක්ෂේපණ උපකරණ භාවිතයෙන් අදහස් ප්‍රියජනක හා ඵලදායී ලෙස ඉදිරිපත් කළ හැකි බව
ඃ වර්තමානයේ වඩාත් ප්‍රචලිත වී ඇත්තේ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය බව
ඃ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය පරිගණකය හා සම්බන්ධ වූවක් වන බව
ඃ බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය සංයුක්ත තැටි හෝ වීඩියෝ පටි ධාවකය සමග ද සම්බන්ධ කළ හැකි බව
ඃ පරිගණකය යොදා ගත හැකි නිසා විවිධ දේ ඉදිරිපත් කිරීම ඉතා සජීවී ලෙස කළ හැකි බව
ඃ ඕවර්හෙඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය සාපේක්ෂ ව පිරිවැය අඩු උපකරණයක් වන බව
ඃ ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය භාවිත කිරීමට අවශ්‍ය ස්ලයිඩ් කල් ඇති ව සූදානම් කර ගත යුතු බව
ඃ ඕවර්හෙඩ් හා ස්ලයිඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍ර සඳහා අවශ්‍ය උපකරණ කල් ඇති ව සැකසිය යුතු බව
ඃ ප්‍රක්ෂේපණ උපකරණ සියල්ල විදුලි බලයෙන් ක්‍රියාත්මක වන බව
ඃ ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍ර මගින් පොත්වල ඇති දේ ඒ අවස්ථාවේ දී ම ප්‍රක්ෂේපණය කිරීම

**3. ප්‍රක්ෂේපණීය නොවන සන්නිවේදන උපකරණ භාවිතය ( කාලච්ඡේද තුනයි.)**
ඃ මෙම වර්ගය පිරිවැය අඩු හා විදුලි බලය අනවශ්‍ය උපකරණ බව
ඃ භාවිතය ඉතා සරල හා පහසු බව
ඃ සපයා ගැනීම ද පහසු බව
ඃ සාමාන්‍යයෙන් බහුල ව යොදා ගන්නා උපකරණ වශයෙන්
- කළු ලෑල්ල,
- සුදු ලෑල්ල,
- චුම්බක පුවරුව හා
- පිටු පෙරළනය දැක් විය හැකි ය.

ඃ මේ එක් එක් උපකරණවලට ආවේණික ලක්ෂණ තිබෙන බව
ඃ මේ එක් එක් උපකරණ භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් තිබෙන බව
ඃ මේ එක් එක් උපකරණ තනි ව හෝ ඒකාබද්ධ ව යොදා ගත හැකි බව

**4. පරිසරය ආශ්‍රිත හා නිර්මාණාත්මක උපකරණ භාවිතය**
ඃ පරිසරයේ තිබෙන ඕනෑ ම ස්වාභාවික දෙයක් සන්නිවේදන ක්‍රියාවලියේ දී අවශ්‍ය පරිදි යොදා ගත හැකි බව
ඃ පරිසරයේ ඇති බොහෝ දේ නිර්මාණාත්මක ලෙස යොදා ගත හැකි බව
ඃ නව නිර්මාණාත්මක උපකරණ වශයෙන් රූකඩ හා අත් රූකඩ ආදිය යොදා ගත හැකි බව
ඃ තාක්ෂණික උපකරණවලට වඩා මෙවැනි සාම්ප්‍රදායික හෝ පාරිසරික හෝ නිර්මාණාත්මක උපකරණ භාවිතය වඩාත් ප්‍රියජනක වන බව
ඃ සන්නිවේදකයා අවශ්‍ය පරිදි කල් ඇති ව සැලසුම් කර මෙවැනි උපකරණ යොදා ගත යුතු බව
ඃ පිරිවැය ඉතා අඩු උපකරණ බව

**පොදු කරුණු**

මෙම කොටසේ දී සන්නිවේදනය සඳහා යොදා ගන්නා විවිධ උපකරණ පිළිබඳ දැනුම ද, ඒවා භාවිත කිරීමට අවශ්‍ය පුහුණුව ද සිසු සිසුවියන් වෙත ලබා දීම අවශ්‍ය ය. ඒ සඳහා ප්‍රක්ෂේපණීය හා ප්‍රක්ෂේපණීය නොවන විවිධ සන්නිවේදන උපකරණ පෞද්ගලික ව ම භාවිත කිරීමට සෑම කෙනෙකුට ම අවකාශය සැලසිය යුතු ය. ඒ හැර විවිධ පාරිසරික ද්‍රව්‍ය හා නව නිර්මාණාත්මක උපකරණ සන්නිවේදනය සඳහා යොදා ගැනීම අත්හදා බලන්නට පෙළඹවීම අවශ්‍ය ය. ඒ මගින් පිරිවැය අඩු, එසේ ම වඩාත් ප්‍රිය සන්නිවේදන උපකරණ යොදා ගැනීමට ආකල්ප සංවර්ධනයක් කළ හැකි ය.

**ඒකකය** : 4.0 භාෂාව හා ජනමාධ්‍ය භාවිතය
**නිපුණතාව** : භාෂාවේ ස්වභාව පිළිබඳ ව විග්‍රහ කරමින් විවිධ මාධ්‍යයන්හි දී භාෂාව භාවිතයට ගන්නා ආකාරය සංසන්දනාත්මක ව විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම:** 4.1 භාෂාවේ ස්වභාවය, එහි භාවිතය හා භාෂාවේ සන්නිවේදන භූමිකාව විග්‍රහ කරයි.
**කාල පරිච්ඡේද ගණන** : 14 යි.

**විෂය අන්තර්ගතය:** භාෂාව හඳුනා ගැනීම

1. භාෂාවේ ඓතිහාසික විකාශනය
2. භාෂා උපාර්ජනය හා සන්නිවේදන භූමිකාව
3. ජීව භාෂා ප්‍රවණතා
4. භාෂාවේ සම්මතය හා අසම්මතය
5. උප භාෂා

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. භාෂාවේ ඓතිහාසික විකාශනය පිළිබඳ පැහැදිලිව විස්තර කරයි.
2. භාෂා උපාර්ජනය හා සන්නිවේදන භූමිකාව විග්‍රහ කරයි.
3. ජීව භාෂා යන්න හඳුනා ගෙන එහි ලක්ෂණ විග්‍රහ කරයි.
4. භාෂාවේ සම්මතය හා අසම්මතය නිවැරදිව පැහැදිලි කරයි.
5. උප භාෂා පිළිබඳව පැහැදිලිව විස්තර කරයි.

**හැඳින්වීම**

භාෂාව බිහි වීම මානව ශිෂ්ටාචාරයේ විශිෂ්ට සිද්ධියකි. එතෙක් සංකේත, සංඥා හා ශබ්ද මගින් අදහස් හුවමාරු කර ගත් මානවයාට වඩාත් පුළුල් ලෙස අදහස් හුවමාරු කර ගැනීමට මේ නිසා අවස්ථාව ඇති විය. භාෂාව බිහි වීම කිසියම් නිශ්චිත කාල වකවානුවක් තුළ සිදු වූවක් නො වේ. ඒ සඳහා අවුරුදු සිය ගණනක් නැතහොත් දහස් ගණනක් ගත වී තිබේ. ලෝකයේ ඓතිහාසික දියුණු ශිෂ්ටාචාරයන් ආශ්‍රිත ව බිහි වූ විවිධ භාෂාවන් විවිධතා සහිත ය. එක ම වකවානුවක දී විවිධ ජන කණ්ඩායම් විසින් වෙනස්කම් සහිත භාෂාවන් නිපදවා ගැනීම විස්මය සහගත ය.

එක් එක් ජන කණ්ඩායම් විසින් නිපදවා ගත් භාෂාව වෙන් වෙන් ව වැඩී ගිය බව ඓතිහාසිකව පෙනී යයි. හෝඩිය බිහි වීම, අක්ෂර හැඩ සකස් කර ගැනීම හා භාෂාවේ උච්චාරණය ආදිය මේ වකවානුව තුළ ක්‍රමානුකූලව වර්ධනය විය. ලේඛන කලාව හා සාහිත්‍යය බිහි වීම භාෂාව නිපදවා ගැනීමේ දෙවන ප්‍රතිඵලයයි. ඒ අනුව නව නිර්මාණාත්මක අදහස් ලොවට බිහි විය. පසු කාලයේ දී යම් භාෂාවක් යනු යම් ජාතියක අනන්‍ය ලක්ෂණයක් ලෙස සැලකෙන තරමට භාෂාව හා සමාජය අතර සම්බන්ධතාව වර්ධනය විය.

ජනමාධ්‍ය බිහි වීමේ දී භාෂාව විශාල කාර්යභාරයක් ඉටු කළේ ය. පළමුවෙන් බිහි වූයේ පුවත්පත් ය. එය ලිඛිත මාධ්‍යයක් වූ අතර, අක්ෂර සංකේත ඒ සඳහා යොදා ගැනිණි. පාඨකයන් විසින් ඒවා කියවිය යුතු විය. ගුවන් විදුලිය බිහි වීමේ දී ද යොදා ගැනුනේ භාෂාවයි. එය කථන භාෂාවකි. ජනයා විසින් එය සවන් දිය යුතු විය. රූපවාහිනියේ දී කථන භාෂාව ද ලේඛන භාෂාව ද යොදා ගැනුණි. ඒ අනුව සමස්තයක් වශයෙන් ජනමාධ්‍ය විසින් භාවිත කරන ප්‍රධාන සන්නිවේදන මෙවලම ලෙස භාෂාව දැක්විය හැකි ය.

වර්තමානයේ දී ජනමාධ්‍ය හා භාෂාව පිළිබඳ ව, එසේත් නැතහොත් ජනමාධ්‍ය භාෂාව භාවිත කිරීම පිළිබඳ ව වෙසෙසින් කතා කරන්නට සිදු වී තිබේ. එයට හේතුව නම් භාෂාවේ ප්‍රධාන කාර්යය වූ සන්නිවේදනය පමණක් මුල් තැනෙහි ලා භාෂාවේ අවශේෂ කාර්යයන්ට ජනමාධ්‍යයන්ගෙන් හානි පැමිණීමයි. එනම් භාෂාව මගින් සමාජ සදාචාරය ගොඩ නැංවීම, සමාජ හික්මවීම, සංස්කෘතික සම්ප්‍රේෂණය, ජාතික අනන්‍යතාව ඇති කිරීම ආදී අතුරු කාර්යයන් විශේෂයෙන් විද්‍යුත් මාධ්‍ය විසින් නො සලකා හරිනු ලැබ ඇත. ඒ නිසා ජනමාධ්‍ය විසින් භාෂාව භාවිත කිරීම පිළිබඳ ව නව කතිකාවක් ගොඩ නැංවීමට කාලය එළඹ තිබේ. උසස් පෙළ සිසු දරු දැරියන් විසින් මෙම විෂය කොටස අධ්‍යයනය කිරීමේ දී එම කතිකාව ගොඩ නැගීමට අවශ්‍ය පරිසරය සැකසෙන බව පෙනේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. භාෂාවේ ඓතිහාසික විකාශනයඃ**

- භාෂාව බිහි වීම මානව සමාජයේ දැඩි අවශ්‍යතාවක් ව තිබූ බව
- භාෂාව යනු මානවයා තම අදහස් සන්නිවේදනය සඳහා යොදා ගත් විශිෂ්ට උපකරණයක් බව
- ලොව එක් එක් දියුණු ශිෂ්ටාචාර විසින් එක් එක් ආකාරයෙන් භාෂාවන් නිපද වූ බව
- එක් එක් භාෂාවන් අතර වෙනස් කම් ඇති බව
- භාෂාවේ ස්වරූප අනුව රූපාක්ෂර හා සංකේතාක්ෂර යනුවෙන් වර්ග කළ හැකි බව
- චීනය, ජපානය ආදී රටවල් අදටත් භාවිත කරන්නේ මුල් යුගයේ නිපද වූ රූපාක්ෂර බව
- ඉංග්‍රීසි, සිංහල, දෙමළ ආදී අවශේෂ භාෂා සංකේත මගින් අදහස් ප්‍රකාශ කරන බව
- අකුරක හැඩය ඉතා දිගු කාලයක් තිස්සේ වෙනස් වෙමින් පවතින බව
- අකුරේ හැඩය වෙනස් වීම නතර වී නොමැති බව
- භාෂාවට හෝඩියක් බිහි වීම භාෂාවේ පරිණාමයේ විශේෂ සිද්ධියක් බව
- විවිධ භාෂාවල හෝඩිය වෙනස්කම් සහිත බව
- භාෂාවට ව්‍යාකරණ හා වෙනත් රීති සමුදායක් අයත් වන බව
- භාෂාවේ ව්‍යාකරණ හා රීති අදහස් ප්‍රකාශනයේ දී අත්‍යවශ්‍ය බව
- භාෂාව කලාවක් මෙන් ම විද්‍යාවක් ද වන බව
- භාෂාවේ ප්‍රභවය පිළිබඳ පරිණාමවාදී මතයක් හා නිර්මාණවාදී මතයක් ඇති බව

**2. භාෂා උපාර්ජනය හා සන්නිවේදන භූමිකාව**

- බිලිඳු වියේ සිට ම භාෂාව ඉගෙන ගන්නා බව
- භාෂාව ග්‍රහණය කර ගැනීම හා භාෂාව පරිහරණයට ඉගෙනීම භාෂා උපාර්ජනය බව
- යම් ළදරුවකු තමන් අවට පරිසරයෙන් ලැබෙන ඕනෑම භාෂාවක් ඉගෙන ගන්නා බව
- භාෂා උපාර්ජනය ළදරු වියෙන් ආරම්භ වී මරණය දක්වා පවත්නා අඛණ්ඩ ක්‍රියාවලියක් බව
- භාෂාව පුද්ගලයාගේ සන්නිවේදන කාර්යය සඳහා භාවිත වන්නේ උපාර්ජනය මත බව
- භාෂාවේ අර්ථවේදය (Semantics) හා සංඥාර්ථවේදය (Semiotics) යනුවෙන් වර්ග දෙකක් ඇති බව
- එක් භාෂාවක් පමණක් දන්නා කෙනෙකුට වෙනත් භාෂාවක් තේරුම් ගත නොහැකි බව

**3. ජීව භාෂා ප්‍රවණතා**

- ජීව භාෂාවක් සන්නිවේදන කාර්යය සඳහා යොදා ගනිමින් පවත්නා භාෂාවක් බව
- භාෂාවක් ජීවමාන ව පවතින්නේ එය අඛණ්ඩව භාවිත කිරීම නිසා බව
- භාෂාව නිරන්තරව භාවිත කිරීම නිසා එය පෝෂණය වන බව හා වෙනස්වන බව
- භාෂාවේ වචනවලට නව අර්ථ ජනනය වන බව
- භාෂාවේ වචනවල අර්ථයන් භාවිතය අනුව වෙනස් වන බව
- ජීව භාෂාවක් මගින් වඩාත් සංවේදී ලෙස හා නිර්මාණශීලී ලෙස අදහස් ප්‍රකාශ කළ හැකි බව
- භාෂාවක් පෝෂණය වීම නිසා සංජානනය පිළිබඳ විවිධතා ඇති වන බව
- ලෝකයේ සමහර භාෂාවන් කලක් ජීව භාෂාවන්ව තිබී පසුව අජීව භාෂාවන් වූ බව
- සමහර භාෂා අජීව භාෂාවන් බවට පත් වී පසුව ජීව භාෂා බවට පත් කර ගත් බව
- ජීව භාෂාවක අනන්‍ය ලක්ෂණ ඇති බව

**4. භාෂාවේ සම්මතය හා අසම්මතයඃ**

- භාෂාවක සම්මතය යන්න පොදු සමාජය විසින් පිළිගත් සම්ප්‍රදායක් සහිත බව
- භාෂාවක අසම්මතය යන්න පොදු සමාජය විසින් ගත් සම්ප්‍රදායන් බිඳ දමන්නක් බව
- සම්මත භාෂාවක අනන්‍ය ලක්ෂණ තිබෙන බව
- සම්මත භාෂාව යන්න ලෝකයේ ඕනෑම භාෂාවකට පොදු අදහසක් බව
- අසම්මත භාෂාව මගින් සම්මත භාෂාවේ නියමයන් හා පිළිගැනීම් උල්ලංඝනය කරන බව
- භාෂාවක් වැඩෙන නමුත් අසම්මත භාෂාව යනු භාෂාවක වැඩීමක් නොවන බව
- භාෂාවක් අසම්මත ලෙස භාවිත කිරීමට පුද්ගලයෙකුට ඇති අයිතිය සීමා කළ නොහැකි බව
- භාෂාවක් අසම්මත ලෙස භාවිත කිරීමට ජනමාධ්‍යයකට අයිතියක් නැති බව
- භාෂාවක් අසම්මත ලෙස භාවිත කිරීම පිළිබඳ විවිධ උදාහරණ ඇති බව
- භාෂාවක් යම් ජාතියක අනන්‍ය ලක්ෂණයක් වන නිසා එය සුරැකිය යුතු බව

- සම්මත හා අසම්මත භාෂාව සන්නිවේදන කාර්යයේ දී භාවිත වන බව

**5. උප භාෂා**

- උප භාෂා යන්න ප්‍රධාන භාෂා ධාරාවෙන් බිඳී ආ අනු ධාරාවක් බව
- උප භාෂා අයත් වන්නේ උප සංස්කෘතින්ට බව
- උප භාෂාවක් බිහි වීම ස්වාභාවික සංසිද්ධියක් වන බව
- උප භාෂාවක් තුළ ප්‍රධාන භාෂා ධාරාවේ ලක්ෂණ ද උප භාෂා ධාරාවේ ලක්ෂණ ද ඇතුළත් බව
- උප භාෂාවක් බිහි වීම මානව සමාජයේ අවශ්‍යතාවක් බව
- උප භාෂාවක් තුළ එම සංස්කෘතියේ පරිසරය නිරූපණය වන බව
- උප භාෂාවක් තුළ දී යම් යම් වචන, යෙදුම්, උපමා, රූපක ආදිය බිහි වන බව
- උප භාෂාවක් එම ජන කණ්ඩායමට සන්නිවේදන කාර්යය සඳහා අත්‍යවශ්‍ය බව
- උප භාෂාවන් තිබීම ප්‍රධාන ජනමාධ්‍යයන්ට හා ප්‍රධාන සන්නිවේදන ධාරාවට බාධාවක් බව
- ප්‍රාදේශීය, සාමාජීය, වෘත්තික, පාරිසරික ආදී වශයෙන් උප භාෂා බිහි වී ඇති බව

**ඒකකය** : 4.0 භාෂාව හා ජනමාධ්‍ය භාවිතය
**නිපුණතාව** : භාෂාවේ ස්වභාව පිළිබඳ ව විග්‍රහ කරමින් විවිධ මාධ්‍යයන්හි දී භාෂාව භාවිතයට ගන්නා ආකාරය සංසන්දනාත්මක ව විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම:** 4.2 භාෂාවේ විවිධ භාවිතයන් සංසන්දනාත්මකව දක්වයි.
**කාල පරිච්ඡේද ගණන** : 14 යි.

**විෂය අන්තර්ගතය:** භාෂා භාවිත ප්‍රභේද

1. භාෂණය
2. රූපණය
3. විවරණය
4. කථනය
5. ලේඛනය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. භාෂාව භාවිත කරන විධි විවිධාකාර බව විග්‍රහ කරයි.
2. භාෂාවේ රූපණ ස්වභාව අනාවරණය කර දක්වයි.
3. භාෂාව මගින් විවරණය කිරීම අත්හදා බලයි.
4. කථනය සඳහා භාෂාව යොදා ගැනීමේ විධි ක්‍රම සංසන්දනාත්මක විග්‍රහ කරයි.
5. ලේඛන වර්ග සඳහා භාෂාව භාවිතයේ වෙනස්කම් හා එහි නිර්මාණාත්මක බව පෙන්වයි.

**හැඳින්වීම**

භාෂාව යනු මිනිසා විසින් සොයා ගන්නා ලද විශිෂ්ටතම සන්නිවේදන මෙවලමයි. මේ මගින් මිනිසා තම අදහස් හා හැඟීම් විවිධාකාරයෙන් ප්‍රකාශ කරන්නට හැකි ක්‍රම කාලයක් තිස්සේ අත්හදා බලා තිබේ. අද පවතින ලෝකයේ අප විසින් භාෂාව භාවිත කරන්නේ එම අත්හදා බැලීම්වල ප්‍රතිඵලයක් වශයෙනි.

භාෂාව යනු පොදු සංකල්පයක් වුවත්, එය භාවිත කරන්නට සිදු වන්නේ විශේෂ අවස්ථා අනුවය. ඒ ඒ අවස්ථාවෙහි පැන නගින අවශ්‍යතාව අනුව භාෂාව භාවිත කරන්නේ කෙසේද? යන්න මිනිස් සමාජය මේ වන විට හඳුනා ගෙන ඇත. භාෂාවේ වචනවලට හා වගන්තිවලට අර්ථයක් ඇතත්, එම අර්ථ සෑම විට ම එක ආකාරයෙන් යොදා නො ගැනේ. ඒවා අවස්ථානුකූල ව හා පුද්ගලබද්ධ ව වෙනස් වේ.

භාෂාවේ අර්ථය ඉක්මවා යන ආකාරයට අර්ථය තහවුරු කිරීමට හෝ වෙනස් කිරීමට හෝ කථනයේ දී අවාචික සන්නිවේදන ක්‍රම විධි යොදා ගැනීමේ දී රූපණය බිහි වේ. එහි දී භාෂාවට හෝ අවාචික සංඥාවලට හෝ වෙන ම අර්ථයක් නැත. එහි අර්ථය බිහි වන්නේ භාෂාව හා අවාචික සංඥා එක් වීමෙනි. මේ ආකාරයෙන් රූපණය කිරීමේ හැකියාව ලබා ගත හැක්කේ එය දිගු කාලයක් ප්‍රගුණ කිරීමෙනි.

භාෂාව, භාෂණය හා කථනය යනුවෙන් දෙආකාර වේ. භාෂණය යනු තවත් පාර්ශ්වයක් සමග කරනු ලබන කතාබහ කිරීමකි. කථනය එක් පුද්ගලයකු විසින් කරනු ලබන අතර, අනෙක් පාර්ශ්වයක් එය ග්‍රහණය කර ගනී. කථනයෙහි ස්වරූපය අනුව එය කථනමය ඉදිරිපත් කිරීමකි. මෙහි දී භාෂාව වැදගත් වන්නේ, ග්‍රාහකයාට ගැළපෙන ලෙසද, අවස්ථාවට උචිත ලෙස ද, අවශ්‍යතාවට යෝග්‍ය ලෙස ද කථනය සඳහා භාෂාව යොදා ගත යුතු වන නිසා ය.

භාෂාව භාවිත කිරීමේ දී එහි දෘශ්‍ය ස්වරූපය ඇති වන්නේ ලේඛනය නිසා ය. එනම් එහි දී අක්ෂර ලියා තැබීම මගින් අදහස් ප්‍රකාශ කරනු ලබයි. මේ නිසා භාෂාවේ අංග කිහිපයක් කෙරෙහි දැඩි අවධානය යොමු කරන්නට සිදු වේ. භාෂාව, අක්ෂර, වගන්ති ආදී වශයෙනි. මේවා අවශ්‍යතාවට ගැළපෙන ආකාරයෙන් යොදා ගත යුතු ය. එසේ ම එය ග්‍රාහකයන්ට උචිත විය යුතු ය. භාෂාව භාවිතයේ දී ලේඛනයට ලැබෙන විශාල වාසියක් නම් එය කිසිදු අපහසුවකින් තොර ව හා තාක්ෂණික උපක්‍රම භාවිතයෙන් තොර ව සංරක්ෂණය කරන්නට ඇති හැකියාවයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. භාෂණය:**

- අන්‍යෝන්‍ය සන්නිවේදන ක්‍රියාවලියක් සඳහා භාෂාව ශබ්ද නැගීමක් බව
- භාෂණයේ ස්වරූපය අනුව එහි විවිධතා ඇති බව
- භාෂණය මගින් අණ දීම්, ආයාචනා, ආත්ම ප්‍රකාශන ආදිය ඉදිරිපත් කළ හැකි බව
- භාෂණය මගින් පුද්ගලයන් අතර සුහදශීලී වාතාවරණයක් නිර්මාණය කරන බව

**2. රූපණය:**

- භාෂාව උච්චාරණය සමග ඉරියව් හා හැසිරීම් රටා එක් කිරීමෙන් රූපණය බිහි වන බව
- රූපණය නිසා භාෂාවේ අර්ථයන් තහවුරු වීම /වෙනස් කිරීම /ප්‍රතික්ෂේප කිරීම සිදු වන බව
- රූපණය අන්‍යෝන්‍ය සන්නිවේදනයේ දී අත්‍යවශ්‍ය බව
- රූපණය මගින් අදහස් දැඩි ව ප්‍රක්ෂේපණය වන බව
- රූපණය යනු පුද්ගලබද්ධ සංසිද්ධියක් බව
- රූපණය ඉබේ පුහුණු වන්නක් වන අතර, දැනුවත් ව එය සංවර්ධනය කර ගත හැකි බව

**3. විවරණය**

- භාෂාව මගින් නොයෙක් දේ විවරණය කළ හැකි බව
- මානව සමාජය තුළ විවරණය අත්‍යවශ්‍ය කාර්යයක් බව
- ජනමාධ්‍ය භාවිතය තුළ දී විවරණය නිරන්තරයෙන් සිදු වන්නක් බව
- ජනමාධ්‍යකරුවන් මෙන් ම ග්‍රාහකයන් ද විවරණයේ යෙදෙන බව
- විවරණය සඳහා භාෂාව පමණක් ප්‍රමාණවත් නොවන බව
- විවරණය සඳහා පෞද්ගලික දෘෂ්ටියක් හා මතවාදයක් අවශ්‍ය බව
- භාෂාව යොදා ගනිමින් කරනු ලබන්නේ පෞද්ගලික දෘෂ්ටිය හා මතවාදය ඉදිරිපත් කිරීම බව
- එකම කාරණය විවිධාකාරයෙන් විවරණය කරන්නට භාෂාව යොදා ගත හැකි බව

**4. කථනය**

- කථනය යන්න අදහස් වචන හඬ නැංවීමෙන් ඉදිරිපත් කරන්නක් බව
- භාෂණය හා කථනය සමාන ලක්ෂණ සහිත වුවත්, කථනය ඒක පුද්ගල කාර්යයක් බව
- භාෂාව නිර්මාණශීලීව භාවිත කිරීමේ හැකියාව කථනයේ දී ඉතා වැදගත් වන බව
- විවිධ පුද්ගලයන් විසින් කථනයේ දී වචන උච්චාරණය විශේෂ ලක්ෂණ සහිතව යොදා ගන්නා බව
- අවස්ථානුකූලව කථන රටාව, රිද්මය, වේගය හා යෙදුම් ආදියේ සුවිශේෂතා ඇති බව

**5. ලේඛනය**

- ලේඛනය යන්න අකුරු ලිවීමක් නොවන බව
- ලේඛනයකට අරමුණක් ඇති බව
- ලේඛනය සම්පාදනය කළ යුත්තේ එම අරමුණ ඉටු කර ගැනීමට ගැළපෙන ලෙස බව
- විවිධ ලේඛන රටා ඇති බව
- නව තාක්ෂණික සොයා ගැනීම් නිසා ලේඛන රටා වෙනස් වී ඇති බව
- ප්‍රශස්ත ලේඛනයකින් එක් වචනයක් හෝ ඉවත් කළ නොහැකි බව
- භාෂාවේ නියමිත සම්ප්‍රදායයන්, රීති, යෙදුම්, ව්‍යාකරණ, විරාම ලක්ෂණ ආදිය අත්‍යවශ්‍ය බව
- ලේඛන ඉදිරිපත් කිරීමේ ආකෘති තිබෙන බව
- විවිධ ලේඛන රටා හා විවිධ ලේඛන ආකෘති අධ්‍යයනය කළ යුතු බව

**ඒකකය** : 4.0 භාෂාව හා ජනමාධ්‍ය භාවිතය
**නිපුණතාව** : භාෂාවේ ස්වභාව පිළිබඳ ව විග්‍රහ කරමින් විවිධ මාධ්‍යයන්හි දී භාෂාව භාවිතයට ගන්නා ආකාරය සංසන්දනාත්මක ව විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම**: 4.3 විවිධ මාධ්‍යයන්ට අදාළ ව භාෂාව හැසිරවීමේ ක්‍රම විධි හා රටා සංසන්දනාත්මක ව අත්හදා බලයි.

**කාල පරිච්ඡේද ගණන** : 12 යි.

**විෂය අන්තර්ගතය**: ජනමාධ්‍යයට අදාළව භාෂාව හැසිරවීම

1. මුද්‍රිත මාධ්‍ය සඳහා ලේඛනය
2. ගුවන් විදුලි මාධ්‍ය සඳහා ලේඛනය
3. රූපවාහිනී මාධ්‍ය සඳහා ලේඛනය, භාෂණය හා කථනය
4. නව මාධ්‍යයන්හි භාෂාව හැසිරවීම

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. විවිධ මාධ්‍යයන්ට අදාළ ව භාෂාව හැසිරවීමේ ක්‍රම සහ විධි පිළිබඳ අත්හදා බලයි.
2. මුද්‍රිත මාධ්‍යයට අදාළ ව භාෂාව භාවිත කිරීමේ හැකියාව ප්‍රකට කරයි.
3. ගුවන් විදුලි මාධ්‍යයට අදාළ ව භාෂාව භාවිත කිරීමේ හැකියාව ප්‍රකට කරයි.
4. රූපවාහිනී මාධ්‍යයට අදාළ ව ලේඛනය, කථනය හා භාෂණය සඳහා භාෂාව භාවිතය අත්හදා බලයි.
5. නව මාධ්‍යයයන්හි භාෂාව භාවිතයේ ප්‍රවණතා හා ගැටලු විමර්ශනය කරයි.

**හැඳින්වීම**

තාක්ෂණික සංවර්ධනයත් සමග භාෂාව භාවිත කිරීමට නව අවකාශයක් ඇති විය. එනම් ජනමාධ්‍ය බිහි වීම ය. ඉතා දිගු කලක් පෝෂණය වෙමින් පැවති භාෂාව භාවිත කරන ලද්දේ සිතීමට, කතා කිරීමට හා ලිවීමට ය. එහෙත් ජනමාධ්‍ය බිහි වීම නිසා ඒ සඳහා ජනමාධ්‍ය භාවිත කිරීමට නව ක්‍රමවේදයන් ගවේෂණය කරන්නට සිදු විය. ජනමාධ්‍යයන්ට සම්බන්ධ මාධ්‍යවේදීන් මෙන් ම, මාධ්‍ය පිළිබඳ ව පර්යේෂණ කරන්නන්ද, මාධ්‍ය අධ්‍යාපනයෙහි යෙදී සිටින්නන් ද මේ ආකාරයෙන් භාෂාව ජනමාධ්‍ය සඳහා භාවිත කිරීමේ විවිධ ක්‍රමෝපායයන් අත් හදා බලන්නට වූහ.

පුවත්පත ද, ගුවන් විදුලිය ද, රූපවාහිනිය ද අනු පිළිවෙළින් ලොවට බිහි වූ අතර, ඒ එක් එක් මාධ්‍යයන්හි ආවේණික ලක්ෂණ භාෂාව භාවිත කිරීම කෙරෙහි සෘජුවම බල පෑවේ ය. එසේ ම භාෂාව නිර්මාණාත්මක ලෙස භාවිත කරන්නට ජනමාධ්‍යවලට සිදු විය. සංවේදී පුවත් හා සංවේදී ප්‍රකාශන කෙරෙහි ජනයා දක්වන ඇල්ම අවබෝධ වීම නිසා භාෂාව සංවේදී ලෙස හසුරුවන්නට අවශ්‍යතාවක් ඇති විය.

මෙහි දී විශේෂයෙන් කැපී පෙනෙන්නක් නම් ජනමාධ්‍යයේ ඇති සීමාසහිත බව භාෂාව කෙරෙහි බල පා ඇති බව ය. පුවත්පතක් ගත් විට එහි ප්‍රධාන පුවතට ඇත්තේ සීමිත ඉඩකි. ඒ තුළ ආකර්ශණීය ලෙසද, අවශ්‍ය තොරතුරු ඇතුළත් වන ලෙස ද, විශාල අකුරු යොදා ගනිමින් භාෂාව ඉදිරිපත් කරන්නට සිදු විය. ගුවන් විදුලියේ ද, රූපවාහිනියේ ද මේ ආකාරයේ විශේෂතා හා සීමාවන් භාෂාව කෙරෙහි බල පෑම් ඇති කළේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මේ වන විට ජනමාධ්‍ය භාෂාව යනුවෙන් අනන්‍යතාවක් ඇති භාෂාවක් පිළිබඳ ව සිතන්නට අපට අද සිදු වී තිබේ. ජනමාධ්‍යයේ පවත්නා සන්නිවේදක හා ග්‍රාහක අතර පවත්නා දුරස්ථ භාවය ද භාෂාව කෙරෙහි බල පා තිබේ. තමන් ඉදිරියේ සිටින කෙනෙකු සමග සන්නිවේදනයෙහි යෙදෙන විට යොදා ගන්නා භාෂාවට වඩා වෙනස් ලෙස තමන් නොදන්නා ග්‍රාහකයන් සමූහයක් වෙත එක්වර ළඟා වීමේ දී යොදා ගන්නා ජනමාධ්‍යයට සිදු වී තිබේ. එබැවින් ජනමාධ්‍ය සඳහා භාෂා භාවිතය යනු සුවිශේෂයෙන් අධ්‍යයනය කළ යුතු එසේම තවමත් සංවර්ධනය නොවූ අධ්‍යයන ක්ෂේත්‍රයක් බව පෙනේ.

තවත් කිව යුත්තක් නම්, ජනමාධ්‍ය අතර පවත්නා තරගය නිසා භාෂාව භාවිතය ඉතා පහත මට්ටමකට වැටෙමින් පවතින බවය. ග්‍රාහකයන්ට සමීපවීම යන සංකල්පය වරදවා වටහා ගෙන ඇති නව විද්‍යුත් මාධ්‍ය එදිනෙදා ජනයා පෞද්ගලිකව කතා කරන භාෂාව මාධ්‍ය භාෂාව වශයෙන් යොදා ගෙන ඇත. එසේ ම භාෂා කිහිපයක විශේෂයෙන් සිංහල හා ඉංග්‍රීසි හෝ සිංහල හා දෙමළ එක් ව භාෂාව යොදා ගෙන

කතා කිරීම විද්‍යුත් මාධ්‍යකරුවන්ගේ සිරිතක් වී තිබේ. මේ මගින් කුමන හෝ භාෂාවක අනන්‍යතාවට මෙන් ම එහි ජාතික ලක්ෂණවලට ද බරපතල ලෙස හානි පැමිණේ. එපමණක් නොව එම භාෂා ශ්‍රවණය කරන්නන්ගේ චර්යාත්මක වර්ධනය ද බිඳ වැටීම වැළැක්විය නො හැකි ය. මෙහි දී සිදු ව ඇත්තේ ජනමාධ්‍ය සඳහා භාෂාව භාවිත කිරීමේ ප්‍රමිතීන් වෙළෙඳ ප්‍රතිපත්ති මත නිගමනය කිරීම ය.

විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

**1. මුද්‍රිත මාධ්‍ය සඳහා භාෂා භාවිතයඃ**

- මුද්‍රිත මාධ්‍ය යනුවෙන් පුවත්පත්, පොත් හා සඟරා දැක්වෙන බව
- පුවත්පත්, සඟරා හා පොත්වලට ආවේනික ගති ලක්ෂණ ඇති බව
- පුවත්පත දිනපතා හෝ සතිපතා ප්‍රකාශ වන අතර එය හැකි ඉක්මණින් කියවීම පුරුද්දක් බව
- සඟරා ප්‍රකාශ වීමෙන් පසු කාලයක් වරින් වර කියවිය හැකි බව
- පොත් ඉතා දිගු කාලයක් තිස්සේ වරින් වර කියවන්නට හැකි බව
- පුවත්පතේ, සඟරාවේ හා පොතේ ආවේණික ලක්ෂණ අනුව භාෂාව භාවිත කළ යුතු බව
- පොතකට ඇති ඉඩ සීමා නොවන අතර, පුවත්පත හා සඟරාව පිටු සීමා කර ඇති බව
- පුවත්පතේ හා සඟරාවේ පිටුවල ඇති සීමිත ඉඩ උපරිම ලෙස යොදා ගැනීම දුෂ්කර කාරියක් බව
- සාම්ප්‍රදායික භාෂා භාවිතයට වඩා වෙනස් ලෙස පුවත්පත් හා සඟරා භාෂාව යොදා ගන්නා බව
- ඉතා ඉක්මනින් ග්‍රහණය වන, දැඩි ව දැනෙන හා සංවේදී වචන හා යෙදුම් පුවත්පත්වල බහුල බව
- පුවත්පත්වල දී භාෂාව භාවිත කරන්නේ පොදු සමාජයකට පොදුවේ උචිත වන ලෙස බව
- පුවත්පත්වල දී එක් එක් ඉලක්ක කණ්ඩායම් සඳහා භාෂාව භාවිත කිරීමේ විශේෂතා ඇති බව

**2. ගුවන් විදුලි මාධ්‍ය සඳහා භාෂා භාවිතය**

- ගුවන් විදුලිය ශ්‍රව්‍ය මාධ්‍යයක් පමණක් බව
- ගුවන් විදුලියේ භාෂාව ග්‍රහණය කර ගත යුත්තේ ශ්‍රවණයෙන් පමණක් බව
- ගුවන් විදුලි ග්‍රාහකයන් විසින් තමන් අසන දේ සිතේ මවා ගත යුතු බව (පරිකල්පනය)
- ගුවන් විදුලි අසන්නන් විවිධ මට්ටම්වල සිටින නිසා සරල භාෂාවක් භාවිත කළ යුතු බව
- ගුවන් විදුලිය සඳහා ලිවීමේ දී කෙටි වාක්‍ය වැඩියෙන් යොදා ගත යුතු බව
- අනවශ්‍ය පරිදි සංඛ්‍යා දත්ත ඉදිරිපත් නොකළ යුතු බව
- ගුවන් විදුලියේ භාෂා භාවිතය අසන්නන්ගේ පරිකල්පනය ඉහළ නැංවීමට යෝග්‍ය විය යුතු බව
- අසන්නන්ගේ දැනුම, අත්දැකීම්, රුචිකම්, අභිලාෂයන් අනුව සංජානනය කරන බව
- ගුවන් විදුලි මාධ්‍යයේ දී ලිවීම කවුරුන් කළත්, එය අසන්නන් වෙත ගෙන යන්නේ ශිල්පීන් බව
- ගුවන් විදුලි ශිල්පීන් සතුව මනා, ආකර්ෂණීය කථන විලාසයක් තිබිය යුතු බව
- වචන උච්චාරණය, සමීප බව හා විශ්වසනීයබව ගුවන් විදුලි කථනයේ දී තහවුරු විය යුතු බව
- ගුවන් විදුලි මාධ්‍යයේ දී ලේඛනය සහිත ව හා රහිත ව කථනය සිදු වන බව
- ලේඛනය තිබුණත් නැතත්, කථනය සරල විය යුතු බව
- ගුවන් විදුලි වැඩ සටහන්වල ස්වභාවය අනුව භාෂාව යොදා ගත යුතු බව

**3. රූපවාහිනී මාධ්‍ය සඳහා ලේඛනය, භාෂණය හා කථනය**

- රූපවාහිනිය ශ්‍රව්‍ය, දෘශ්‍ය, චලන හා වර්ණ මාධ්‍යයක් බව
- රූපවාහිනියෙහි වැඩි තැනක් අත් වන්නේ දෘශ්‍ය මාධ්‍යයට බව
- රූපවාහිනියේ අදහස් ගොඩ නැංවෙන්නේ දෘශ්‍ය මාධ්‍ය සමග භාෂාව එක් වීමෙන් බව
- රූපවාහිනියේ දී මාධ්‍ය ශිල්පියා ද දෘශ්‍යමය වශයෙන් පෙනී සිටින බව
- රූපවාහිනී මාධ්‍ය ශිල්පියාගේ සියලු ඉරියව් නරඹන්නන් දකින බව
- රූපවාහිනියට විශේෂ තාක්ෂණ ක්‍රම යොදා ගන්නා බව
- රූපය හා භාෂාව එක සමාන ව ප්‍රබලව තිබීම රූපවාහිනී මාධ්‍යයේ දී අත්‍යවශ්‍ය බව
- රූපවාහිනියේ විවිධ වැඩ සටහන් සඳහා ලේඛනය යොදා ගන්නා බව
- රූපවාහිනී පිටපත් රචනය නිර්මාණශීලී කාර්යයක් වන බව
- රූපවාහිනී වැඩ සටහන්වල ස්වභාවය අනුව භාෂාව යොදා ගත යුතු බව

**4. නව මාධ්‍යයන්හි භාෂාව හැසිරවීම:**

- ප්‍රධාන වශයෙන් ම පරිගණකය , ජංගම දුරකථනය හා අන්තර්ජාලය අයත් වන බව
- මෙම නව මාධ්‍ය වර්තමානයේ සන්නිවේදන කාර්යයන් සඳහා බහුලව භාවිත වන බව
- නව මාධ්‍යයන්හි ඇති සීමිත ඉඩකඩ හා පිරිවැය ආදිය නිසා ලේඛන කෙටි විය යුතු බව
- නව මාධ්‍යයන් බොහොමයක් ජාත්‍යන්තර භාෂාවලින් ක්‍රියාත්මක වන බව
- දේශීය භාෂාවලින් නව මාධ්‍ය ක්‍රියාත්මක කිරීමට නව මෘදුකාංග අවශ්‍ය බව
- කෙටි පද යෙදුම් නව මාධ්‍යයන්හි භාවිත වන බව
- ඉංග්‍රීසි අකුරුවලින් දේශීය භාෂා ලිවීමේ නව ප්‍රවණතාවක් ඇති බව
- නව මාධ්‍යය බිහි වීම නිසා දේශීය භාෂාවන් නව අභියෝගයකට ලක් වී ඇති බව

**ඒකකය** : 4.0 භාෂා හා ජනමාධ්‍ය භාවිතය
**නිපුණතාව** : භාෂාවේ ස්වභාවය පිළිබඳ ව විග්‍රහ කරමින් විවිධ මාධ්‍යයන්හි දී භාෂාව භාවිතයට ගන්නා ආකාරය සංසන්දනාත්මක ව විශ්ලේෂණය කරයි.
**නිපුණතා මට්ටම:** 4.4 ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ ප්‍රබලතා, දුබලතා හා සීමා තුලනාත්මකව විග්‍රහ කරයි.
**කාල පරිච්ඡේද ගණන** : 12 යි.

**විෂය අන්තර්ගතය:** ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ ප්‍රබලතා, දුබලතා හා සීමා

1. ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ ප්‍රබලතා
2. ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ දුබලතා
3. ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ සීමා

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. විවිධ ජනමාධ්‍යයන්හි භාෂා භාවිතයේ ප්‍රබලතා සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.
2. විවිධ ජනමාධ්‍යයන්හි භාෂා භාවිතයේ දුබලතා අනාවරණය කර ගනී.
3. විවිධ ජනමාධ්‍යයන්හි භාෂා භාවිතයේ සීමාවන් ප්‍රකාශ කරයි.

**හැඳින්වීම**

ජනමාධ්‍යයේදී භාෂාව භාවිත කිරීමට තාක්ෂණය යොදා ගනී. පුවත්පත්, ගුවන් විදුලිය හා රූපවාහිනිය යන මාධ්‍ය තුනේ දී ම අඩු වැඩි වශයෙන් භාෂාව යොදා ගනියි. එහි දී පුවත්පත හා ගුවන් විදුලිය ගැනෙයි. වැඩියෙන් ද, රූපවාහිනිය අඩුවෙන් භාෂාව භාවිත කරන බව පෙනේ. එහෙත් මෙම මාධ්‍ය තුනේ දී ම භාෂාව භාවිත කිරීමේ වැදගත්කම එක සමාන ය.

ජනමාධ්‍යයේ දී ද භාෂාව භාවිත කරන්නේ පුද්ගලයා වුවත්, ඔවුන් තම ජීවිතයේ භාෂාව භාවිත කරන ආකාරයට වඩා වෙනස් ලෙස මෙහි දී භාෂාව භාවිත කරයි. එහි දී සිදු වන්නේ ඒ ඒ මාධ්‍යයන්හි පවත්නා සුවිශේෂතාවන්ට අනුකූල ව භාෂාව භාවිත කිරීම ය. එවිට එහි පවත්නා ප්‍රබලතා, දුබලතා හා සීමාවන් හඳුනා ගනිමින් කටයුතු කරන්නට සිදු වේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ ප්‍රබලතා:**

- කෙටියෙන්, සංක්ෂිප්තව, නිර්මාණශීලීව භාෂාව යොදා ගත හැකි බව
- සිත් ගන්නා සුලු ලෙස භාෂාව යොදා ගත හැකි බව
- ග්‍රාහකයාගේ සංවේදීතාව ඉහළ නැංවිය හැකි බව
- ග්‍රාහක අවධානය ලබා ගත හැකි බව

**2. ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ දුබලතා:**

- යොදා ගන්නා භාෂාව සමාජයේ සියලු ග්‍රාහකයන්ට නොගැළපීමට ඉඩ ඇති බව
- යොදා ගන්නා භාෂාව සමාජයේ සියලු ග්‍රාහකයන්ට හොඳින් තේරුම් ගත නොහැකි විය හැකි බව
- යොදා ගන්නා භාෂා රටාව සමහර ග්‍රාහකයන් විසින් ප්‍රතික්ෂේප කළ හැකි බව

**3. ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ සීමා:**

- පුවත්පතක ඉඩ සීමා වන බව
- ගුවන් විදුලි මාධ්‍යයේ දී හැකි තරම් කෙටියෙන් අදහස් ඉදිරිපත් කළ යුතු බව
- රූපවාහිනියේ දී භාෂාව අනවශ්‍ය පරිදි යොදා ගැනීමෙන් එහි රූපමය බව අඩු විය හැකි බව
- ග්‍රාහක සීමාවන් භාෂාවට බලපෑම් ඇති කරන බව
- සදාචාරාත්මක සීමාවන් නිසා භාෂාව ප්‍රවේශමෙන් පරිහරණය කළ යුතු බව

**ඒකකය:** 5.0 මහජන සම්බන්ධතාව (කාලච්ඡෙද 50 යි.)
**නිපුණතාව:** මහජන සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මෙවලම් හා ක්‍රම යොදා ගැනීම අත්හදා බලයි.
**නිපුණතා මට්ටම:** 5.1 ශ්‍රී ලාංකික සුවිශේෂතා පාදක කර ගනිමින්, මහජන සම්බන්ධතාව කෙබඳුදැයි විග්‍රහ කරයි.

**කාලච්ඡෙද ගණන:** 12 යි.

**විෂය අන්තර්ගතය:** මහජන සම්බන්ධතා හැඳින්වීම

1. මහජනයා අර්ථ ගැන්වීම
2. මහජන සම්බන්ධතාවේ අවශ්‍යතාව හා ස්වභාවය
3. මහජන සම්බන්ධතා නිර්වචන
4. මහජන සම්බන්ධතා භාවිතය (ශ්‍රී ලංකාව ඇසුරෙන්)

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. මහජනයා යන්න විග්‍රහ කරයි.
2. මහජන සම්බන්ධතාවේ අවශ්‍යතාව තක්සේරු කරයි.
3. මහජන සම්බන්ධතාවේ ස්වභාව විග්‍රහ කරයි.
4. මහජන සම්බන්ධතාව පිළිබඳ නිර්වචන විස්තරාත්මක ව ප්‍රකාශ කරයි.
5. ශ්‍රී ලංකාව ආශ්‍රිතව මහජන සම්බන්ධතා භාවිතය සාම්ප්‍රදායික හා නූතන උදාහරණ ඇසුරෙන් විවරණය කරයි.

**හැඳින්වීම**

මහජන සම්බන්ධතාව යන්න අලුතින් හඳුන්වා දුන් විෂය ක්ෂේත්‍රයක් ලෙස පෙනුනත්, එහි කාර්යයන් හා භාවිතය සාම්ප්‍රදායික සමාජය තුළ ම තිබුණ බව පැහැදිලි ය. සාම්ප්‍රදායික ජන ජීවිතය තුළ කෙරෙන විවිධ සමාජ කාර්යයන්හි දී ඒවා සාර්ථක කර ගැනීම සඳහා මනා මහජන සම්බන්ධතාවක් අවශ්‍ය බව ජනයා අත්දැකීමෙන් තේරුම් ගත්හ. ඒ නිසා ඔවුහු විවිධ මහජන සම්බන්ධතා ක්‍රම විධි සමාජ අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා යොදා ගත්හ. විවාහ මංගල්‍ය, අවමංගල්‍ය, විවිධ ආගමික හා සමාජීය උත්සව , ගෙවැදීම්, කෘෂිකාර්මික කාර්යයන් ආදියෙහි දී මේ ආකාරයෙන් පිළිගත් මහජන සම්බන්ධතා ක්‍රම ඉතා අපූරුවට භාවිත කර ඇත. ශ්‍රී ලංකාව පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී පෙනී යන්නේ, එම මහජන සම්බන්ධතා ක්‍රම විධි, නාගරික ව, ග්‍රාමීය ව, ප්‍රදේශ වශයෙන්, ආගම් වශයෙන්, ජාතීන් වශයෙන් විවිධ වෙනස්කම් සහිත ව භාවිත කර ඇති බව ය

වර්තමාන සමාජයේ නව අවශ්‍යතා සඳහා ද මහජන සම්බන්ධතා වැඩි වැඩියෙන් යොදා ගැනේ. විවිධ සංවිධානවලට තම පැවැත්ම සඳහා මහජනයා අවශ්‍ය වේ. එසේ ම ගෘහයකට වුව ද පැවැත්ම සඳහා හිතවතුන් හා අසල්වාසීන් අවශ්‍ය වේ. දේශපාලනඥයන්ට සිය දේශපාලන කටයුතු සාර්ථක ව කර ගෙන යාම සඳහා ආධාර කරුවන් ද, ඡන්ද දායකයන් ද අවශ්‍ය වේ. මේ ආකාරයෙන් විවිධ අවශ්‍යතා සඳහා මහජන සම්බන්ධතාව යොදා ගන්නා බව පෙනේ.

මහජන සම්බන්ධතාව යන්න විෂයාත්මක ව පැහැදිලි කරන විට පෙනී යන්නේ, එය ප්‍රවර්ධන උපක්‍රමයක් වන බව ය. එවිට එය අලෙවිකරණයට අයත් වේ. අලෙවිකරණයේ එක් ශ්‍රිතයක් වන්නේ ප්‍රවර්ධනයයි. එසේත් නැතිනම් වැඩි දියුණු කිරීමයි. භාණ්ඩ අලෙවිකරණයේ දී පාරිභෝගික සම්බන්ධතාව ඉහළ මට්ටමක පවත්වා ගෙන යාම අවශ්‍ය වේ. ප්‍රවර්ධන උපක්‍රමයක් ලෙස මහජන සම්බන්ධතාව යොදා ගනී. මහජනයා තම ව්‍යාපාරය කෙරෙහි ප්‍රසන්න හැඟීමකින් යුක්ත නම් එය ව්‍යාපාරයේ දියුණුවට හේතු වේ. මේ නිසා මහජනයා තුළ එවැනි ප්‍රසන්න හැඟීමක් ඇති කිරීමට හා එම හැඟීම පවත්වා ගෙන යාමට විවිධ මහජන සම්බන්ධතා උපක්‍රම භාවිත කරනු ලබයි.

සමස්තයක් වශයෙන් කිව හැක්කේ, සාම්ප්‍රදායික සමාජය තුළ ද, නවීන සංවිධාන තුළ ද මහජන සම්බන්ධතා අවශ්‍යතාව එක ආකාරයෙන් ම පවතින බව ය. වෙනසකට ඇත්තේ එක් එක් අවශ්‍යතාවන් සඳහා යොදා ගන්නා මහජන සම්බන්ධතා ක්‍රම විධි වෙනස්කම් සහිත වීම ය. එහෙත් අවසානයේ ඒ සියල්ලේ අරමුණ එක ය. එනම් මහජනයා සමග හොඳ හිතවත් සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම ය. පාසලක් උදාහරණයට ගත් විට වුව ද පෙනී යන්නේ එයට ජනප්‍රියත්වයක් ආරෝපණයවීමට මහජන

සම්බන්ධතාව ප්‍රයෝජනයට ගැනෙන බව ය. ඒ නිසා දැනුවත් ව මහජන සම්බන්ධතා උපක්‍රම සැලසුම් කර භාවිත කිරීමෙන්, තමා හෝ තම ව්‍යාපාරය හෝ තමා ද සිටින සංවිධානය හෝ සාර්ථක ව පවත්වා ගෙන යන්නට හැකි බව ය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. මහජනයා අර්ථ ගැන්වීම**

- මහජන සම්බන්ධතා කාර්යයේ දී මහජනයා යන්න පොදු මහජනයා නො වන බව
- පොදු මහජනයා අතරින් තෝරා ගත් පිරිසක් පමණක් මහජනයා ලෙස මෙහි දී සැලකෙන බව
- ඒ අනුව මහජන (Publics) යන්න බහුවචනයෙන් යුක්ත ව අර්ථකථනය වන බව
- සෑම සංවිධානයකට ම තෝරා ගත් මහජන කණ්ඩායමක් සිටින බව
- සංවිධානයකට අයත් මහජන කණ්ඩායම සංවිධානය තුළ ද පිටතට ද සිටින බව
- එක් සංවිධානයකට අයත් මහජන කණ්ඩායම තවත් සංවිධානයකට අයත් මහජන කණ්ඩායමට වඩා වෙනස් විය හැකි බව
- වාණිජමය සංවිධානයක් ගත් විට එයට අයත් වන මහජන කණ්ඩායම පහත සඳහන් පරිදි වර්ග කළ හැකි බව
    1. ප්‍රජාව
    2. සේවක පිරිස
    3. සේවා සහ ද්‍රව්‍ය සපයන්නෝ
    4. ආයෝජකයෝ ( බැංකු වැනි මූල්‍යායතන)
    5. බෙදාහරින්නෝ
    6. පාරිභෝගිකයෝ හා පරිශීලකයෝ
    7. උපදේශකයෝ
- මේ ආකාරයෙන් ඕනෑ ම සංවිධානයකට අයත් මහජන කණ්ඩායම වර්ග කළ හැකි බව

**2. මහජන සම්බන්ධතාවේ අවශ්‍යතාව හා ස්වභාව**

- වාණිජමය හෝ වාණිජමය නොවන හෝ කෙබඳු සංවිධානයක වුව ද පැවැත්මට එයට සම්බන්ධ මහජනයා අත්‍යවශ්‍ය බව
- ගෘහයකට හෝ ආගමික මධ්‍යස්ථානයකට හෝ පාසලකට හෝ ආරෝග්‍යශාලාවකට වුව ද ඒවායේ පැවැත්මට එයට සම්බන්ධ මහජනයා අත්‍යවශ්‍ය බව
- මහජන සම්බන්ධතාවේ අවශ්‍යතාව වාණිජ අවශ්‍යතාව ඉක්මවා යන බව



**3. මහජන සම්බන්ධතා නිර්වචනඃ**

ඃ මහජන සම්බන්ධතාව දැන්වීම්කරණයෙන් වෙනස් වන බව හා දැන්වීම්කරණය භාවිත නො කළත් සෑම සංවිධානයකට ම මහජන සම්බන්ධතාව අත්‍යවශ්‍ය බව

ඃ මහජන සම්බන්ධතාව අලෙවිකරණයෙන් වෙනස් වන බව හා අලෙවිකරණයෙහි අංගයක් වශයෙන් මහජන සම්බන්ධතාව දැක්විය හැකි බව

ඃ මහජන සම්බන්ධතාව අලෙවි ප්‍රවර්ධනයෙන් වෙනස් වන බව

ඃ මහජන සම්බන්ධතාව ප්‍රචාරණයෙන් වෙනස් වන බව

ඃ මහජන සම්බන්ධතාව ප්‍රසිද්ධියෙන් වෙනස් වන බව හා මහජන සම්බන්ධතාව නිසා ප්‍රසිද්ධිය ඇති වන බව

ඃ විවිධ පර්යේෂකයන් විසින් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇති බව

ඃ එක් එක් නිර්වචනවල වචන, විස්තර කිරීම් හා යෙදුම් වෙනස් ලෙස පෙනුනත්, ඒවායේ සමස්ත අර්ථය සමාන වන බව

**බ්‍රිතාන්‍ය මහජන සමබන්ධතා ආයතනයේ නිර්වචනයඃ**

" මහජන සම්බන්ධතා යනු, කිසියම් සංවිධානයක් සහ එයට අදාළ ජනතාව අතර අන්‍යොන්‍ය අවබෝධය ස්ථාපිත කර පවත්වා ගෙන යාම සඳහා සිතා මතා, සැලසුම් සහගත ව , ඉවසීමෙන් යුතු ව දරනු ලබන ප්‍රයත්නයකි.

**ඉන්දියානු මහජන සම්බන්ධතා ආයතනයේ නිර්වචනයඃ**

මහජන සම්බන්ධතාව යනු යම් සංවිධානයක් හා එයට අදාල මහජනයා අතර අන්‍යොන්‍ය අවබෝධය හා කීර්ති නාමය ගොඩ නැංවීම හා පවත්වා ගෙන යාම ගනු ලබන සැලසුම් සහගත හා කල් පවත්නා සියලු ප්‍රයත්නයන් ය.

ඒ අනුව මෙම නිර්වචනවලින් මහජන සම්බන්ධතාවට අයත් ප්‍රධාන කාර්යයන් තුනක් ඉස්මතු කර දැක්වෙයි.

1. සංවිධානයකට අදාළ ජන කණ්ඩායම් හා පවත්වන සබඳතා
2. හොඳ සබඳතා ඇති කර ගැනීමට යොදා ගන්නා ක්‍රම හා විධි
3. සබඳතාවල ගුණාත්මක භාවය හෝ තත්ත්වය

**4. මහජන සම්බන්ධතා භාවිතය ( ශ්‍රී ලංකාව ඇසුරින්)ඃ**

ඃ ශ්‍රී ලාංකික ඉතිහාසයේ රජවරු හා පාලකයෝ සිය මහජනයා සමග මනා සම්බන්ධතාවක් පවත්වා ගෙන යාමට වෙහෙසුණු බව

ඃ මහජනතාව අතර ප්‍රසාදය වැඩි කර ගැනීම සඳහා රජවරුන් විසින් විවිධාකාර ආගමික කටයුතු, කලා ශිල්ප, සාහිත්‍යය ආදි ක්ෂේත්‍රවල කටයුතු කළ බව

ඃ මහජනයාගේ අදහස් ලබා ගැනීම සඳහා රජවරුන් හා පාලකයන් වෙස් වළා ගෙන සංචාරය කළ බව

ඃ පසු කාලීන ව ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලය අත්පත් කර ගත් විදේශිකයන් ද, මහජනතාවගේ ප්‍රසාදය ලබා ගැනීම සඳහා සැලසුම් සහගත ව විවිධ මහජන සම්බන්ධතා කාර්යයන් සිදු කළ බව

ඃ 1948 දී සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් මත රාජ්‍ය ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවක් පිහිටුවීමෙන් රාජ්‍ය මහජන සම්බන්ධතාව කෙරෙහි වැදගත් පියවරක් ගත් බව

ඃ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රථම පාලන වාර්තාවට අනුව එහි ආරම්භක අරමුණු මෙසේ ය.

1. රජය හා ජනතාව අතර මහජන සම්බන්ධතා ඉහළ අදියරකට නැංවීම
2. විවිධ ප්‍රකාශන, අත්පොත්, ප්‍රවෘත්ති නිවේදන හා ප්‍රවෘත්ති වාර්තා ආදිය නිකුත් කිරීම මගින් රජයේ වැඩ කටයුතු පිළිබඳ මහජනයා දැනුවත් කිරීම
3. මෙරට තොරතුරු විමසන්නා වූ විදේශිකයනට හා ස්වදේශිකයනට හා පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් වෙනත් රාජ්‍යයන් සඳහා ද ශ්‍රී ලංකාව වෙනුවෙන් පෙනී සිටින දූත මණ්ඩලය සඳහා ද තොරතුරු සැපයීම
4. රජයේ චිත්‍රපට අංශයේ කටයුතු සංවිධානය කිරීම
5. රජයේ ප්‍රකාශන නිකුත් කිරීම හා රජයේ ප්‍රකාශන අලෙවිය

ඃ රාජ්‍ය හා පෞද්ගලික හෝ රාජ්‍ය නො වන සංවිධානවල මහජන සම්බන්ධතා කටයුතු භාර ව මහජන සම්බන්ධතා නිලධාරි / මාධ්‍ය නිලධාරි / ප්‍රවෘත්ති නිලධාරි ආදී තනතුරු නම් වලින්

හැඳින්වෙන නිලධාරීන් සිටින බව

ඃ විවිධ මට්ටමේ මහජන නියෝජිතයන් සඳහා මහජන සම්බන්ධතා නිලධාරීන් / මාධ්‍ය නිලධාරීන් / ප්‍රවෘත්ති නිලධාරීන් සිටින බව

ඃ පොලිසියේ මහජන සම්බන්ධතා අංශය ද, ආරක්ෂක සේවාවන්හි මාධ්‍ය ප්‍රකාශකයන් ද මහජන සම්බන්ධතා කාර්යයන්හි යෙදී සිටින බව

ඃ පොලිස් මහජන සම්බන්ධතා හා අපරාධ වැළැක්වීමේ කාර්යාංශයෙන් කෙරෙන කාර්යයන්

(1) අපරාධ නිවාරණ ක්‍රම පිළිබඳ ව මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීමේ දේශන

(2) පොලිස් හා මහජනතාව අතර සබඳතා වැඩ දියුණු කිරීමේ දේශන, සම්මන්ත්‍රණ හා වැඩ මුළු සංවිධානය කිරීම හා පැවැත්වීම

(3) විවිධ විෂයයන් පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීම සඳහා තානාපති කාර්යාලවල අනුග්‍රහයෙන් ලබා ගන්නා කෙටි වාර්තා චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම

(4) පාසල් ප්‍රදර්ශන සඳහා පොලිස් කාර්යභාරය හඳුනා ගැනීමට හැකි ප්‍රදර්ශන කුටි සංවිධානය කිරීම

(5) අපරාධ වැළැක්වීම හා මහජන සම්බන්ධතා විෂයයන් පිළිබඳ පුවත්පත්වල ලිපි පළ කිරීමෙන් ජනතාව දැනුවත් කිරීම

(6) ආපදා අවස්ථාවල දී මහජනතාවට පිළිසරණ වීම හා සහනාධාර කටයුතු කිරීම

(7) දිවයිනේ ප්‍රධාන ආගමික උත්සවවල දී මහජනයාට පිහිටවීම සඳහා මහජන සම්බන්ධතා කාර්යාංශයක් පවත්වා ගෙන යාම

(8) රූපවාහිනිය, ගුවන් විදුලිය හා පුවත්පත් ඇතුළු ජනමාධ්‍ය සඳහා පොලිස් දෙපාර්තමේන්තුව සම්බන්ධ මහජනතාවට වැදගත් වන්නා වූ විවිධ ප්‍රවෘත්ති මුදා හැරීම හා වැඩ සටහන් සංවිධානය කිරීම

(9) ජාතික වැදගත්කමක් ඇති අවස්ථාවල දී ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සහ ඒකාබද්ධව ක්‍රියා කිරීම

(10) පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම හා මහජන සම්බන්ධතා කාර්යයන් පිළිබඳ ව දේශන පැවැත්වීම හා සංවිධානය කිරීම

ඃ ශ්‍රී ලාංකික ජන සමාජය තුළ විවිධ සමාජීය අවස්ථාවන්හි සුවිශේෂ මහජන සම්බන්ධතා විධි හා ක්‍රම භාවිත කරන බව (විවාහ මංගල්‍යය, අවමංගල්‍යය, ආගමික උත්සව, යාතු කර්ම, වාර්ෂික සම්ප්‍රදායික උත්සව )

ඃ සමාජ සංවිධානයක් ලෙස ගත් විට පවුලකට ද මහජන සම්බන්ධතා සැලැස්මක් තිබිය යුතු බව

ඃ තනි පුද්ගලයන් ද සමාජයේ තමන්ගේ ස්ථානය පවත්වා ගෙන යාම සඳහා මහජන සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කරන බව

ඃ පාසලකට ද ඵලදායි මහජන සම්බන්ධතා සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමෙන්, සමාජය තුළ ජනප්‍රියත්වයක් අත් පත් කර ගත හැකි බව

**ඒකකය:** 5.0 මහජන සම්බන්ධතාව (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව:** මහජන සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මෙවලම් හා ක්‍රම යොදා ගැනීම අත්හදා බලයි.
**නිපුණතා මට්ටම:** 5.2 මහජන සම්බන්ධතා සඳහා යොදා ගත හැකි විවිධ මෙවලම් හා විධි අත්හදා බලයි.

**කාලච්ඡේද ගණන:** 12 යි.

**විෂය අන්තර්ගතය:** මහජන සම්බන්ධතා මෙවලම් හා විධි

1. මුද්‍රිත මාධ්‍ය
2. ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය
3. ඡායාරූප
4. ප්‍රදර්ශන
5. මාධ්‍ය සම්බන්ධතා
6. අනුග්‍රාහකත්වය
7. පාරිසරික මෙවලම්

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදා ගන්නා මෙවලම් හා විධි විස්තර කරයි.
2. ඒ ඒ මෙවලම් හා විධි සංසන්දනාත්මක ව අගය කරයි.
3. ඒ ඒ මෙවලම් හා විධි මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදා ගන්නා ආකාරය විග්‍රහ කරයි.
4. ඒ ඒ මෙවලම් හා විධි භාවිතය පිළිබඳ අත්දැකීම් ලබා ගනියි.

**හැඳින්වීම**

මහජන සම්බන්ධතා කටයුතු සඳහා විවිධ මෙවලම් භාවිත කළ හැකි ය. ඒවායින් ප්‍රමුඛ මෙවලම් වන මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍ය , ඡායාරූප , ප්‍රදර්ශන හා පාරිසරික මෙවලම් පිළිබඳ ව ද, මාධ්‍ය සම්බන්ධතා හා අනුග්‍රාහකත්වය යන මහජන සම්බන්ධතා විධි පිළිබඳව ද මූලික නිපුණතාවක් ලබා ගැනීම ඉතා ප්‍රයෝජනවත් ය. මෙම මෙවලම් හා විධි සුවිශේෂ අනන්‍ය ලක්ෂණවලින් යුක්ත වේ. එසේ ම ඒවා වෙන් වෙන් ව මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදා ගත නො හැකි ය. ඒවා යොදා ගත යුත්තේ ජාලයක් වශයෙනි. නැතහොත් පද්ධතියක් වශයෙනි. මෙම ජාලය ගොඩ නැංවීම සඳහා ඒවායේ අනන්‍ය ලක්ෂණ වෙන් වෙන් ව හඳුනා ගැනීම අත්‍යවශ්‍ය වේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. මුද්‍රිත මාධ්‍ය:**

- පිටපත් වැඩි සංඛ්‍යාවක් අවශ්‍ය වන මුද්‍රණ කාර්යයක දී බහුල ව යොදා ගන්නේ සමතල මුද්‍රණය බව
- පිටපත් අඩු සංඛ්‍යාවක් අවශ්‍ය වන මුද්‍රණ කාර්යයක දී ඩිජිටල් මුද්‍රණ ක්‍රමය වාසිදායක වන බව
- සමතල හා ඩිජිටල් මුද්‍රණ ක්‍රමවල නිමාව උසස් බව
- ඩිජිටල් මුද්‍රණ ක්‍රම යොදා ගෙන බැනර්, පෝස්ටර් ආදිය, කඩදාසි, පොලිතීන්, රෙදි, ප්ලාස්ටික්, ආදියේ මුද්‍රණය කළ හැකි බව. සමතල මුද්‍රණයේ දී එවැනි ද්‍රව්‍ය භාවිතය අසීරු බව
- මුද්‍රිත මාධ්‍යයේ දී අත් පත්‍රිකා, පෝස්ටර්, ෆෝල්ඩර්, පුවත් සඟරා, වාර සඟරා. බැනර්, ප්‍රදර්ශන පුවරු, ආදිය නිර්මාණය කළ හැකි බව
- මුද්‍රිත මාධ්‍යයේ දී ඇතුළත් කරනු ලබන වචන හා රූප ඉතා ප්‍රවේශමෙන් තෝරා ගත යුතු බව
- සියලු වචන හා රූප මහජන සම්බන්ධතා ඉලක්ක සපුරා ගැනීමට යෝග්‍ය දැයි තක්සේරු කළ යුතු බව
- මුද්‍රිත මාධ්‍ය මෙවලම් ග්‍රාහකයා ළඟ කලක් තබා ගත හැකි බව
- ඉතා ආකර්ෂණීය ලෙස මුද්‍රිත මාධ්‍ය සැකසිය යුතු බව
- එක් එක් මුද්‍රිත මාධ්‍ය නිෂ්පාදනවල ගුණාංග පිළිබඳ ව වෙන් වෙන් ව සැලකිය යුතු බව
- එක් එක් මුද්‍රිත මාධ්‍ය නිෂ්පාදන යොදා ගන්නේ වෙන් වෙන් අරමුණු සඳහා බව

## 2. ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යඃ

- ශ්‍රව්‍ය - දෘශ්‍ය මෙවලම් මහජන සම්බන්ධතා ක්ෂේත්‍රයේ දී ඉතා ඵලදායී ලෙස යොදා ගන්නා බව
- රූපවාහිනිය හා සිනමාව යන ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යයන්ගෙන් රූපවාහිනිය බහුල ලෙස මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදා ගන්නා බව
- රූපවාහිනියේ සියලු වැඩ සටහන් මහජන සම්බන්ධතා කටයුතු සඳහා යොදා ගත හැකි බව
  - ප්‍රවෘත්ති විකාශය
  - කාලීන වැඩ සටහන්
  - ක්‍රීඩා වැඩ සටහන්
  - විශේෂ වැඩ සටහන් ( ඉවුම් පිහුම්, උද්‍යාන පාලනය, සත්ත්ව පාලනය වැනි )
  - නාට්‍ය හා වෙනත් නාට්‍යමය වැඩ සටහන්
  - සංගීතමය වැඩ සටහන්
  - ආගමික වැඩ සටහන්
  - සාකච්ඡා හා සංවාද වැඩ සටහන්
  - ළමා වැඩ සටහන්
  - විද්‍යා වැඩ සටහන්
  - අධ්‍යාපන වැඩ සටහන්
  - චාරිකා වැඩ සටහන්
  - කාන්තා වැඩ සටහන් ආදිය
- මෙයට අමතර ව ස්ලයිඩ් ප්‍රක්ෂේපණය, ඕවර් හෙඩ් ප්‍රක්ෂේපණය, බහු මාධ්‍ය ප්‍රක්ෂේපණය ආදිය ද සමග සංයුක්ත තැටි, පටි ආදිය යොදා ගත හැකි බව

## 3. ඡායාරූපඃ

- විවිධ වර්ගයේ තාක්ෂණය යොදා ගත් ඡායාරූප විවිධ පරිමාණයෙන් යොදා ගත හැකි බව
- ඡායාරූප අපහසුවකින් තොර ව යම් කෙටි කාලයක් ප්‍රදර්ශනය කළ හැකි බව
- මහජන සම්බන්ධතා සඳහා ඡායාරූප නිර්මාණය කිරීම ඉතා සැලකිල්ලෙන් කළ යුතු බව
- යෝග්‍ය ඡායාරූප ගොනුවකින් නිසි ලෙස තෝරා ගත යුතු බව
- කතා කරන ඡායාරූප නැතහොත් ක්‍රියාකාරී ඡායාරූප වඩාත් යෝග්‍ය බව
- මහජන සම්බන්ධතා කටයුතු සඳහා ඡායාරූප නිර්මාණය විශේෂඥ කාර්යයක් බව
- මහජන සම්බන්ධතා සඳහා විවිධාකාරයෙන් ඡායාරූප යොදා ගත හැකි බව
  - ඡායාරූප ප්‍රදර්ශනාගාරයක් අඛණ්ඩ ව පවත්වා ගෙන යාම
  - අවශ්‍ය අයට ඡායාරූප පිටපත් ලබා ගැනීමට ඉඩ සැලසීම
  - ප්‍රවෘත්ති නිවේදන සමග ඡායාරූප නිකුත් කිරීම
  - විශේෂාංග ලිපි සමග පළ කිරීමට ලබා දීම
  - කවුළු ප්‍රදර්ශන වශයෙන් ඉදිරිපත් කිරීමට
  - විවිධ විශේෂ අවස්ථාවල දී ප්‍රදර්ශනය කිරීමට
  - විශාලනය කර ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කිරීමට
  - සංවිධානයේ වාර ප්‍රකාශනවල ඇතුළත් කිරීමට
  - විවිධ පත්‍රිකා (හැන්ඩ් බිල්ස්, ලීෆ්ලට්ස්, ෆෝල්ඩර්ස්,) පොත් පිංච, පෝස්ටර්, සේවක
  - අත්පොත්, වාර්ෂික වාර්තා ආදියේ අවශ්‍ය වූ විට ඇතුළත් කිරීමට
  - නිශ්චල ඡායාරූප වශයෙන් විවිධ අවස්ථාවල භාවිත කිරීමට
- ඡායාරූපවලට පාඨයක් යෙදීම මගින් එයට වඩාත් නිර්මාණශීලී අර්ථයක් ලබා දිය හැකි බව

## 4. ප්‍රදර්ශන

- ප්‍රදර්ශනවල අරමුණ වන්නේ, ඒවා නරඹන්නට පැමිණෙන්නන් මගින් අදහස් බෙදා හැරීම බව
- කුමන හෝ සංවිධානයක අරමුණක් ඉටු කර ගැනීමට සැලසුම් කළ ප්‍රදර්ශන යොදා ගත හැකි බව
- ප්‍රදර්ශන විවිධ වර්ග තිබෙන බව
  - මහජන ප්‍රදර්ශන
  - වෙළෙඳ ප්‍රදර්ශන
  - කෘෂිකාර්මික ප්‍රදර්ශන
  - අධ්‍යාපන ප්‍රදර්ශන
  - වෛද්‍ය ප්‍රදර්ශන

    - ජාත්‍යන්තර ප්‍රදර්ශන
    - ජංගම ප්‍රදර්ශන
    - කුඩා ප්‍රදර්ශන ( කවුළු ප්‍රදර්ශන, ප්‍රදර්ශන පුවරු, ගමනාගමන සේවාවන්හි ප්‍රදර්ශන ආදිය)
- බොහෝ විට සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන එක් ව පවත්වන බව
- ප්‍රදර්ශන නරඹන්නන්ට ගෙන යාමට යම් යම් මහජන සම්බන්ධතා මෙවලම් අවශ්‍ය බව
- මහජන සම්බන්ධතාව සඳහා ප්‍රදර්ශන යොදා ගන්නා අතර ම, ප්‍රදර්ශනය සාර්ථක කර ගන්නට මහජන සම්බන්ධතා වැඩ සටහනක් අවශ්‍ය බව

## 5. මාධ්‍ය සම්බන්ධතා:

- මහජන සම්බන්ධතා සැලැස්මට අදාළ තොරතුරු උපරිම වශයෙන් පුවත්පත් හා විද්‍යුත් මාධ්‍ය මගින් ජනතාව වෙත යැවීමට හා ජනතාව තුළ ඒ පිළිබඳ දැනුම, අවබෝධය හා ප්‍රසාදය ගොඩ නැංවීමට මාධ්‍ය සම්බන්ධතා මගින් උත්සාහ ගන්නා බව
- මාධ්‍ය සම්බන්ධතා වැඩ සටහනක් පැවැත්වීමට පෙර සියලු මාධ්‍ය පිළිබඳ ඉතා හොඳ අවබෝධයක් තිබිය යුතු බව
- සාර්ථක මාධ්‍ය සම්බන්ධතාවක් සඳහා වූ මූලධර්ම තිබෙන බව
    - මහජන සම්බන්ධතා නිලධාරීන් සියලු මාධ්‍ය සමග ද්වි මාර්ගික සම්බන්ධතාවක් පවත්වා ගෙන යා යුතු බව
    - තම සංවිධානය පිළිබඳ නිවැරදි හා විශ්වාසනීය තොරතුරු ඉක්මනින් ලබා ගත හැකි ක්‍රමය පිළිබඳ ව සියලු මාධ්‍ය දැනුවත් කර තිබීම
    - මාධ්‍යවලට අවශ්‍ය සියලු තොරතුරු යෝග්‍ය මාධ්‍ය ලබා දීම
    - අවශ්‍ය වූ විට හෝ කාලීන වශයෙන් මාධ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම
    - යම් යම් තොරතුරු තහවුරු කර ගැනීමට මාධ්‍යවලට ඉඩ කඩ සලසා දීම
    - මහජන සම්බන්ධතා නිලධාරි හා සංවිධානයේ ඉහළ කළමනාකාරිත්වය මාධ්‍ය සමග පෞද්ගලික සම්බන්ධතා අඩු වැඩි වශයෙන් පවත්වා ගෙන යාම
    - කාලීන ව ප්‍රවෘත්ති නිවේදන මාධ්‍ය වෙත නිකුත් කිරීම
    - මාධ්‍ය සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම මගින් මාධ්‍ය සම්බන්ධතා ප්‍රවර්ධනය කළ හැකි බව
    - මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීම සඳහා විශේෂඥ නිලධාරියකු ඕනෑ ම සංවිධානයක සිටිය යුතු බව

## 6. අනුග්‍රාහකත්වය:

- සංවිධානයේ කීර්ති නාමය හා මහජන අවබෝධය වැඩි දියුණු කර ගැනීමට සමත් වන විවිධ සමාජ ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම මෙයින් අදහස් වන බව
- කෙටි කාලීන ක්‍රියාකාරකම්වලට ද, දිගු කාලීන ව්‍යාපෘතිවලට ද අනුග්‍රාහකත්වය ලැබෙන බව
- අනුග්‍රාහකත්වය සැලසීම එකඟ වූ කොන්දේසි මත සිදු වන බව
- විවිධ ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති සඳහා අනුග්‍රාහකත්වය දක්වන බව

| | | |
|---|---|---|
| ක්‍රීඩා | සංස්කෘතික හා ආගමික | ප්‍රකාශන |
| ප්‍රදර්ශන | අධ්‍යාපනය | පුන්‍ය කටයුතු |
| වෘත්තික කටයුතු | සෞඛ්‍ය කටයුතු | නිවාස හා මාර්ග |

- විධිමත් ව කටයුතු කරන බොහෝ සංවිධාන සිය වාර්ෂික හා දිගු කාලීන සැලැස්මට අනුව අනුග්‍රාහකත්වය ක්‍රියාත්මක කරන බව
- ප්‍රචාරණ දැන්වීමකින් ලැබෙන ප්‍රචාරණයට වඩා අනුග්‍රාහකත්වය මගින් ලැබෙන මහජන ප්‍රසාදය ඉහළ මට්ටමක පවතින බව
- ශ්‍රී ලංකාව තුළ මත්පැන් හා දුම්වැටි නිෂ්පාදකයන්ට අනුග්‍රාහකත්වය දැක්විය නො හැකි බව

## 7. පාරිසරික මෙවලම්:

- සංවිධානයකට ගනුදෙනුකරුවන් හා මහජනයා පැමිණෙන ස්ථානයක් තිබෙන බව (උදා: බැංකුව, තැපැල් කාර්යාලය, රෝහල, කාර්යාලය, පාසල්, වෙළෙඳ සැල් ආදී ලෙස)
- ඒ ඒ ස්ථානයන්ට පැමිණෙන පුද්ගලයන් තුළ ප්‍රසාදයක් හා ප්‍රසන්න හැඟීමක් ඇති වන ආකාරයෙන් එම ස්ථානවල පරිසරය නිර්මාණය කළ යුතු බව
- සුන්දර ගොඩනැගිලි පරිසරය, මල් පෝච්චි, මාළු ටැංකි, කුඩා දරුවන් සඳහා සෙල්ලම් භාණ්ඩ,

රූපවාහිනී යන්ත්‍ර, වායු සමීකරණය, සැප පහසු ගෘහ භාණ්ඩ හා උපකරණ, මහජන සම්බන්ධතා සඳහා යොදා ගන්නා මුද්‍රිත ද්‍රව්‍ය ආදී බොහෝ දේ පාරිසරික මෙවලම් ගණයට අයත් වන බව

- ඕනෑම සංවිධානයක මෙවැනි සැලසුම් කරන ලද පාරිසරික මෙවලම් යොදා ගැනීමෙන් මහජන සම්බන්ධතා අරමුණු ඉටු කර ගත හැකි බව
- නිවසක වුව ද යෝග්‍ය පාරිසරික මෙවලම් යොදා ගැනීමෙන් එම නිවසට පැමිණෙන මහජනයා තුළ ප්‍රසන්න හැඟීමක් ඇති කළ හැකි බව
- පාරිසරික මෙවලම් නිර්මාණය හා නඩත්තුව සඳහා පිරිවැයක් සහිත බව
- යම් සංවිධානයක පාරිසරික මෙවලම් සැලසුම් සහගත ව ගොඩ නැංවිය යුතු බව
- පොලිසියක් හෝ රෝහලක් හෝ වැනි ස්ථානයක වුව ද යෝග්‍ය පාරිසරික මෙවලම් ගොඩ නැංවීම තුළින් හොඳ මහජන සම්බන්ධතාවක් ගොඩ නැංවිය හැකි බව

**ඒකකය:** 5.0 මහජන සම්බන්ධතාව (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව:** 5.0 මහජන සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මෙවලම් හා ක්‍රම යොදා ගැනීම අත්හදා බලයි.
**නිපුණතා මට්ටම:** 5.3 මහජන සම්බන්ධතා සඳහා විවිධ නිපුණතා ප්‍රකට කරයි.
**කාලච්ඡේද ගණන:** 12 යි.

**විෂය අන්තර්ගතය:** මහජන සම්බන්ධතා නිපුණතා

1. මුද්‍රිත මාධ්‍ය නිපුණතා
2. මාධ්‍ය නිවේදන
3. මාධ්‍ය සාකච්ඡා
4. පරිසරය නිර්මාණය
5. පුද්ගල ප්‍රතිරූපය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. මහජන සම්බන්ධතා කටයුතු සඳහා මුද්‍රිත මාධ්‍ය යොදා ගනී.
2. මාධ්‍ය නිවේදන නිකුත් කිරීම ප්‍රායෝගික ව සිදු කරයි.
3. ආදර්ශ මාධ්‍ය සාකච්ඡාවක් පවත්වයි.
4. මහජන සම්බන්ධතා ප්‍රවර්ධනය වන සේ තෝරා ගත් පරිසරයක් නිර්මාණය කරයි.
5. මහජන සම්බන්ධතා කාර්යයෙහි දී පුද්ගල ප්‍රතිරූපය ගොඩ නංවන ආකාරය විදහා දක්වයි.

**හැඳින්වීම**

මහජන සම්බන්ධතා කටයුතු සාර්ථක ව ක්‍රියාත්මක කළ හැක්කේ, ඒ සඳහා ප්‍රමාණවත් නිපුණතා සංවර්ධනය කර ගත් අයට ය. එබැවින් කෙබඳු මහජන සම්බන්ධතා නිපුණතා සංවර්ධනය කර ගත යුතුදැයි සිසුන් විසින් දැන ගත යුතු ය. ඒවා අත්හදා බැලිය යුතු ය. මුද්‍රිත මාධ්‍ය නිපුණතා යන්නෙන් යම් මුල් පිටපතක් නිර්මාණය කර එය මුද්‍රිත මාධ්‍යයෙන් ප්‍රකාශයට පත් කිරීම හා තෝරා ගත් ග්‍රාහකයන් වෙත ඒවා ලැබෙන්නට සැලැස්වීම අදහස් කෙරේ. මෙහි දී මූලික වශයෙන් කෙබඳු මුද්‍රණ තාක්ෂණ ක්‍රම කෙසේ යොදා ගන්නේද? යන්න පිළිබඳ ව නිපුණතාව තිබිය යුතු ය. වර්තමානයේ දී සමතල මුද්‍රණ ක්‍රමය බහුල ව යොදා ගන්නා අතර, අවශ්‍ය අවස්ථාවන් හි දී තිර මුද්‍රණය ද, අංකිත පිටපත්කරණය ද යොදා ගැනේ. ඒ අනුව ඒ ඒ මුද්‍රණ ක්‍රමවල තාක්ෂණික කටයුතු පිළිබඳ ව ද, ඒ ඒ කාර්යයන් සඳහා යොදා ගන්නා කඩදාසි හෝ බෝඩ් ආදිය ද, අකුරු වර්ග ආදිය ද පිළිබඳ ව මනා ව දැන සිටිය යුතු ය.

මාධ්‍ය නිවේදන නිකුත් කරනුයේ කිසියම් නිශ්චිත කාර්යයක් සම්බන්ධ ව ය. එවැනි මාධ්‍ය නිවේදනයක් සඳහා මනා ලෙස භාෂාව යොදා ගත යුතු ය. එසේ ම අනවශ්‍ය එක් අකුරක්වත් එවැනි නිවේදනයකට ඇතුළත් නො විය යුතු ය. ඒ නිසා භාෂාව නිර්මාණශීලී ව භාවිත කිරීම පිළිබඳ නිපුණතා මෙහි දී අත්‍යවශ්‍ය වේ. එපමණක් නොව මාධ්‍ය නිවේදනයට අන්තර්ගත විය යුතු කරුණු පිළිබඳ නිසි හැදෑරීමක් කළ යුතු අතර ම. අවශ්‍ය තොරතුරු ක්‍රමානුකූල ව ඇතුළත් කිරීම අවශ්‍ය ය.

මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීමේ නිපුණතා සංවර්ධනය කර ගත යුත්තේ, එවැන්නක් පැවැත්වීමේ ප්‍රායෝගික අත්දැකීමක් ලබා ගනිමිනි. එබැවින් පාසලේ විශේෂ කාර්යයක් සම්බන්ධ කර ගනිමින් මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානය කර පැවැත්වීම අවශ්‍ය ය. මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීමෙන් පමණක් එම අත්දැකීම ලබා ගත නො හැකි ය.

පරිසර නිර්මාණය කිරීමේ දී තෝරා ගත් ස්ථානයක පරිසරය සිත් ගන්නා සුලු ආකාරයෙන් නිර්මාණය කිරීමේ අත්දැකීම් ලබා ගත යුතු ය. සමහර විට පාසලේ කාර්යාලය මේ සඳහා තෝරා ගන්නට පුළුවන. පිටතින් පැමිණෙන අමුත්තන්ට හෝ දෙමාපියන්ට හෝ සතුටින් පැමිණ, සතුටින් ආපසු යා හැකි වාතාවරණයක් නිර්මාණය කිරීම මෙහි අරමුණයි. මේ මගින් පාසලට ඉහළ මහජන සම්බන්ධතා සංස්කෘතියක් ඇති කර ගනියි.

පුද්ගල ප්‍රතිරූපය ඉහළ නැංවීම අවශ්‍ය වන්නේ, තමන් හමු වන මහජනතාව තුළ විශ්වාසයක් හා ප්‍රසන්න හැඟීමක් ඇති කිරීම සඳහා ය. ඒ අනුව පුද්ගලයකුගේ කාය භාෂාව මෙන් ම හැසිරීම් රටා ද. ඉරියව්

ද පුද්ගල ප්‍රතිරූපය ගොඩනැංවීමට සහය වේ. එපමණක් නොව මාධ්‍ය භාවිත කරමින් පුද්ගලයකු ගේ ප්‍රතිරූපය ගොඩ නංවන්නට ද පුළුවන. මේ සඳහා උපාය මාර්ග භාවිත කරන්නට සිදු වේ. විශේෂයෙන් ආයතන ප්‍රධානියකු ගේ ප්‍රතිරූපය නැංවීමේ උපාය මාර්ග දැන ගෙන සිටීම හා ඒවා අත්හදා බැලීම ද ප්‍රයෝජනවත් ය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. මුද්‍රිත මාධ්‍ය නිපුණතා**

- උත්තල මුද්‍රණය, සමතල මුද්‍රණය, තිර මුද්‍රණය , අංකිත මුද්‍රණය තාක්ෂණික වශයෙන් වෙනස් බව
- උත්තල මුද්‍රණය සඳහා ඊයම් අකුරු භාවිත වන බව
- උත්තල මුද්‍රණය ක්‍රමයෙන් භාවිතයෙන් බැහැර වෙමින් පවතින බව
- සමතල මුද්‍රණය සඳහා මුද්‍රණ තහඩු භාවිත කරන බව
- සමතල මුද්‍රණය මගින් උසස් තත්ත්වයේ මුද්‍රිත පිටපත් ලබා ගත හැකි බව
- තිර මුද්‍රණය වෙනම ම ශිල්පීය ක්‍රමයක් වන බව
- තිර මුද්‍රණය මගින් කඩදාසි, රෙදි, බෝඩ් ආදියේ මුද්‍රණය කළ හැකි බව
- අංකිත මුද්‍රණය වර්තමානයේ ඉතා ජනප්‍රිය බව
- අංකිත මුද්‍රණය ඉතා ඉක්මණින් නිම කර ගත හැකි බව
- අංකිත මුද්‍රණය මගින් අඩු පිටපත් ප්‍රමාණයක් වුව ද ලබා ගත හැකි බව
- අංකිත පිටපත්කරණය මගින් ඉතා ඉක්මණින් වාර්තා ආදිය සම්පාදනය කළ හැකි බව
- එක් එක් මුද්‍රණ ක්‍රම එක් එක් අවශ්‍යතා සඳහා විවිධ ලෙස යොදා ගත හැකි බව
- ඒ ඒ මුද්‍රණ ක්‍රමවල ගුණාත්මක බව, පිරිවැය හා නිමැවුම් වේගය වෙනස් වන බව

**2. මාධ්‍ය නිවේදන**

- මාධ්‍ය නිවේදනයක් සකස් කිරීම සඳහා මූලික තොරතුරු ගවේෂණයක් කළ යුතු බව
- මාධ්‍ය නිවේදනයට අරමුණු ගොඩ නැංවිය යුතු බව
- අවශ්‍ය තොරතුරු ප්‍රවේශමෙන් තෝරා ගත යුතු බව
- තෝරා ගත් තොරතුරු නිර්මාණාත්මක ව හා යෝග්‍ය ආකාරයෙන් ගොනු කළ යුතු බව
- සියලු මාධ්‍යවලට උචිත ලෙස නිවේදනය සකස් කළ යුතු බව
- නිවේදනයට නිල වශයෙන් අත්සන් කළ යුතු බව
- මාධ්‍ය නිවේදන නිකුත් කිරීමේ දී ෆැක්ස් පණිවුඩ සහ විද්‍යුත් තැපැල වඩාත් යෝග්‍ය බව

**3. මාධ්‍ය සාකච්ඡා**

- මාධ්‍ය සාකච්ඡාවකට අරමුණක් ගොඩ නැංවිය යුතු බව
- මාධ්‍ය සාකච්ඡාවේ දී ඉදිරිපත් කරනු ලබන අදහස් නිසි ලෙස ගොනු කළ යුතු බව
- අවශ්‍ය පරිදි මුද්‍රිත හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ආකාරයෙන් තොරතුරු ප්‍රතිනිර්මාණය කළ යුතු බව
- මාධ්‍ය සාකච්ඡාව සඳහා යෝග්‍ය ස්ථානයක් තෝරා ගෙන එය ප්‍රියජනක ලෙස සූදානම් කළ යුතු බව
- මාධ්‍ය සාකච්ඡාව සඳහා යවනු ලබන ආරාධනා පත්‍රය තෝරා ගත් තැනැත්තන් වෙත ලැබෙන බවට සහතික කර ගැනීම හා ඔවුන්ගෙන් ප්‍රතිචාර ලබා ගැනීම
- මාධ්‍ය සාකච්ඡාවට සහභාගි වන්නන් සඳහා හොඳින් සංග්‍රහ කළ යුතු බව
- මාධ්‍ය සාකච්ඡාවට පැමිණෙන්නන් පිළි ගැනීමේ කවුළුවක් පැවැත්විය යුතු බව
- කාලය සකසුරුවම් ලෙස භාවිත කරමින් සැලසුම් කළ වේලාවට ම සාකච්ඡාව නිම කළ යුතු බව
- සාකච්ඡාවට සහභාගි වන්නන්ට ප්‍රශ්න අසන්නට ඉඩ දිය යුතු බව

**4. පරිසරය නිර්මාණය**

- පැමිණෙන මහජනයාගේ සිත් ඇද ගන්නා සුලු ආකාරයෙන් පරිසරය නිර්මාණය කළ යුතු බව
- ඒ සඳහා තෝරා ගන්නා ස්ථානය හොඳින් අධ්‍යයනය කළ යුතු බව
- පරිසරය නිර්මාණය කිරීමේ සැලැස්මක් සකස් කර ගත යුතු බව
- පරිසර නිර්මාණයේ දිගු කාලීන පැවැත්මක් මෙන් ම කෙටි කාලීන පැවැත්මක් ද ඇති බව
- පරිසරය අඛණ්ඩ ව ප්‍රිය ජනක ලෙස පවත්වා ගෙන යාම කළ යුතු බව
- පරිසරය නිර්මාණය කිරීම හා එය නඩත්තු කිරීම ඒ ඒ අයට පැවරිය යුතු බව

**5. පුද්ගල ප්‍රතිරූපය:**

- පුද්ගලයකු ගේ ප්‍රතිරූපය ගොඩ නැංවීම ද මහජන සම්බන්ධතා කාර්යයක් වන බව
- පුද්ගලයාගේ ගති ලක්ෂණ, ඇවතුම් - පැවතුම්, හැසිරීම් හා පෙනුම ආදිය යෝග්‍ය ලෙස සැකසිය යුතු බව
- සමහර කාර්යයන්හි දී පුද්ගල ප්‍රතිරූපය ඉතා වැදගත් වන බව
- පුද්ගල ප්‍රතිරූප ගොඩ නැංවීම දිගු කාලීන කාර්යයක් වන බව
- යම් සංවිධානයක පුද්ගලයන්ගේ ප්‍රතිරූපය එම සංවිධානයට කීර්තියක් වන ලෙස පවතින බව
- තමන්ගේ ප්‍රතිරූපය ද ගොඩ නංවා ගැනීම කෙරෙහි හැම කෙනෙක් ම සැලකිලිමත් විය යුතු බව
- තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නැංවෙන්නේ කෙබඳු ගුණාංග හෝ ලක්ෂණවලින් දැයි හඳුනා ගත යුතු බව
- යෝග්‍ය ගුණාංග හෝ ලක්ෂණ පෝෂණය කර ගත යුතු බව

**ඒකකය:** 5.0 මහජන සම්බන්ධතාව (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව:** මහජන සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මෙවලම් හා ක්‍රම යොදා ගැනීම අත්හදා බලයි.
**නිපුණතා මට්ටම:** 5.4 මහජන සම්බන්ධතා වැඩ සටහනක් සඳහා සැලසුම් සම්පාදනය කිරීමේ පියවර අත්හදා බලයි.

**කාලච්ඡේද ගණන:** 12 යි.

**විෂය අන්තර්ගතය:** මහජන සම්බන්ධතා සැලසුම්

1. තත්ත්ව විශ්ලේෂණය හා ග්‍රාහකයන් හඳුනා ගැනීම
2. මහජන සම්බන්ධතා ඉලක්ක හා අරමුණු ගොඩ නැංවීම
3. ක්‍රම විධි හා උපාය මාර්ග තීරණය
4. සැලැස්ම සම්පාදනය
5. පෙර ඇගයුම

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. නියාමක වැඩ සටහනක් සඳහා තත්ත්ව විශ්ලේෂණය කර ග්‍රාහකයන් හඳුනා ගනී.
2. මහජන සම්බන්ධතා නියාමක වැඩ සටහනක් සඳහා ඉලක්ක හා අරමුණු ගොඩ නංවයි.
3. අදාළ නියාමක වැඩ සටහන සඳහා යෝග්‍ය ක්‍රම විධි හා උපාය මාර්ග සංසන්දනාත්මක ව තෝරා ගනියි.
4. නියාමක වැඩ සටහනක් සඳහා සමස්ත සැලැස්මක් සම්පාදනය කරයි.
5. සැලැස්ම ක්‍රියාත්මක කිරීමට සුදුසු තත්ත්වයක පවතින්නේදැයි පෙර ඇගයුමක් කරයි.
6. නියාමක වැඩ සටහනක් අත්හදා බලයි.

**හැඳින්වීම**

ඉන්දියානු මහජන සම්බන්ධතා ආයතනය දක්වන පරිදි මහජන සම්බන්ධතාව යනු යම් සංවිධානයක් හා එයට අදාළ මහජනයා අතර අන්‍යොන්‍ය අවබෝධය හා කීර්ති නාමය ගොඩ නැංවීම හා පවත්වා ගෙන යාම ගනු ලබන සැලසුම් සහගත හා කල් පවත්නා සියලු ප්‍රයත්නයන් ය. මෙම සරල නිර්වචනය අනුව පැහැදිලි වන වැදගත් ම කරුණ නම්, කුමන හෝ සංවිධානයකට වුව ද, අදාළ මහජනයා සමග හොඳ සම්බන්ධතාවක් පවත්වා ගෙන යාම එම සංවිධානයේ ජීවිත පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන බවයි. එම සංවිධානය සමග මහජනයා ගනුදෙනු කිරීමේ දී මෙම සම්බන්ධතාව දෙආකාරයකින් බල පවත්වයි. එකක් නම් හොඳ මහජන සම්බන්ධතාවක් මගින් එම සංවිධානයට අත්පත් වන කීර්ති නාමයයි. අනෙක නම් හොඳ මහජන සම්බන්ධතාවක් මගින් සෑම වර්ගයක ම ගනුදෙනුකරුවන් ප්‍රසාදයට පත් වීමයි. මෙහි දී සෑම වර්ගයක ම ගනුදෙනුකරුවන් යන්නෙන් එම සංවිධානය සමග ගනුදෙනු කරන බාහිර පුද්ගලයන් හා අභ්‍යන්තර පුද්ගලයන් ලෙස සැලකෙන කාර්ය මණ්ඩලය ද අදහස් වේ. යම් සංවිධානයක් සාර්ථක ව පවත්වා ගෙන යන්නට මෙම කීර්ති නාමය ද, ප්‍රසාදය ද අත්‍යවශ්‍ය වේ.

විශේෂයෙන් වාණිජ ව්‍යාපාර ගත් විට කීර්ති නාමය ගොඩ නැංවීම හා ප්‍රසාදය අත්පත් කර ගැනීමට දැන්වීම්කරණය ද යොදා ගනු ලබයි. ඒ සඳහා ද පිරිවැයක් දැරීමට සිදු වේ. මහජන සම්බන්ධතා කාර්යයේ දී ද පිරිවැයක් දරන්නට සිදු වේ. එසේ වුවත් දැන්වීම්කරණයෙන් ලැබෙන කීර්තියට හා ප්‍රසාදයට වඩා ස්ථාවර වූ ද, තහවුරු වූ ද කීර්ති නාමයක් හා ප්‍රසාදයක් මහජන සම්බන්ධතාවෙන් අත්පත් කර ගන්නට පුළුවන. මේ නිසා දිගු කාලීන අරමුණු ඇති සෑම සංවිධානයක් ම තම වාර්ෂික සැලැස්ම තුළ මහජන සම්බන්ධතා වැඩ සටහනක් ඇතුළත් කරනු ලබන අතර, ඒ සඳහා පිරිවැය වෙන් කිරීමක් ද කරනු ලබයි.

වාර්ෂික සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඉතා භාර ධූර වූ කාර්යයකි. එය ඒ සඳහා වෙන් කර ඇති මුදල් වියදම් කිරීම යන පටු අර්ථයෙන් නො සැලකිය යුතුය. මහජන සම්බන්ධතා වැඩසටහනෙහි අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා යෝග්‍ය සැලසුම් නිර්මාණය කිරීමත්, ඒවා ක්‍රියාත්මක කිරීමත්, එහි ප්‍රතිලාභ අගැයීමත් මෙයට අයත්ය.

පළමුවන කාර්යය නම් පවත්නා තත්ත්වය කෙබඳුදැයි නිසි ලෙස විවරණය කිරීම ය. එයින් අදහස් වන්නේ තමන්ගේ සංවිධානයේ පවත්නා තත්ත්වය යන්න නො වේ. සියලු පාරිසරික තත්ත්වයන් නිසි ලෙස අධ්‍යයනය කළ යුතුය. පාරිසරික තත්ත්වයන් යන්නට දේශපාලනික, සමාජීය, ආර්ථික පරිසරය ද

අයත් වේ. ඒ මගින් වෙනත් සංවිධාන විසින් ක්‍රියාත්මක කර ඇති වෙනත් මහජන සම්බන්ධතා වැඩ සටහනක් ද අධ්‍යයනය කරන්නට සිදු වේ.

දෙවනුව මහජන සම්බන්ධතා වැඩ සටහනේ ඉලක්ක හා අරමුණු ගොඩ නැංවිය යුතු ය. තුන් වෙනුව එම ඉලක්ක හා අරමුණු ජය ගැනීම සඳහා යොදා ගත උපාය මාර්ග හා යොදා ගත යුතු ක්‍රම හා විධි මොනවාද? යන්න පිළිබඳ ව නිශ්චය කළ යුතු ය. සමස්ත මහජන සම්බන්ධතා වැඩ සටහන සඳහා වෙන් කර ඇති මුදල් ප්‍රමාණය අනුව මෙම නිශ්චය කිරීම කළ යුතු ය. අවසාන සැලැස්ම සම්පාදනය කළ යුත්තේ ඒ අනුව ය. එයට කාල රාමුව, ක්‍රම හා විධි, වගකීම් බෙදා ගැනීම, නිර්ණායක ආදිය ඇතුළත් විය යුතු ය. සකස් කරන ලද සැලැස්ම ක්‍රියාත්මක කිරීමට පෙර ඇගයුමට ලක් කළ යුතු ය. සැලැස්ම කොතරම් යථාර්ථවත් ද, යෝග්‍ය ද, යන්න තීරණය කිරීම මෙහි අරමුණ වේ. ක්‍රියාත්මක කිරීමෙන් පසු කරනු ලබන්නේ පසු ඇගයුමකි. එය ද ඉතා අවශ්‍ය ය. එසේ නො වුවහොත් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන නිසි ඉලක්ක සාක්ෂාත් කර ගන්නා ලද්දේ ද, කුමන කාර්යයන් අසාර්ථක වූයේ ද, එයට හේතු මොනවාද? යන්න නිගමනය කළ නො හැකි වේ. පසු අගැයීමේහි අනාවරණයන් ඉදිරි සැලසුම් සම්පාදනයේ දී යොදා ගත හැකි ය.

මහජන සම්බන්ධතා වැඩසටහනක් සැලසුම් කිරීම, අරමුණු හතරක් ඉටු කර ගැනීම මත පදනම් වේ.

1. මහජන සම්බන්ධතා අරමුණු නිශ්චය කර ගැනීම
2. මූල්‍ය හා මානව සම්පත් අවශ්‍ය ප්‍රමාණයන් හා ස්වාභාවයන් තක්සේරු කිරීම
3. ප්‍රමුඛතා තීරණය කිරීම
4. ශක්‍යතාව තක්සේරු කිරීම

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. තත්ත්ව විශ්ලේෂණය හා ග්‍රාහකයන් හඳුනා ගැනීම**

- මහජන සම්බන්ධතා වැඩ සටහන හුදෙකලා කාර්යයක් නොවන බව
- වැඩසටහන සැලසුම් කළ යුත්තේ එයට බලපාන සියලු පාරිසරික තත්ත්වයන් අධ්‍යයනය කිරීමෙන් පසු බව
- පාරිසරික තත්ත්වයන් යන්නට අභ්‍යන්තර හා බාහිර පාරිසරික තත්ත්වයන් අයත් වන බව
- පාරිසරික තත්ත්වයන් යන්නට දේශපාලනික, සමාජීය හා ආර්ථික සාධක අයත් වන බව
- විශේෂයෙන් තරගකාරී වෙනත් සංවිධානයන්හි තත්ත්වය අධ්‍යයනය ඉතා අවශ්‍ය බව
- මහජන සම්බන්ධතා වැඩසටහනක් සැම විට ම කිසියම් මහජන පිරිසක් ඉලක්ක කර ගෙන සැලසුම් කරනු ලබන බව
- එම නිසා ඉලක්ක මහජන පිරිස වෙන් කර හඳුනාගැනීම හා ඔවුන්ගේ ගති ලක්ෂණ අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය බව
- ග්‍රාහක පිරිස නිසි ලෙස අධ්‍යයනය කිරීමෙන් ලබා ගන්නා අනාවරණයන් අනුව එම වැඩ සටහන සැලසුම් කළ යුතු බව
- මේ ආකාරයෙන් තත්ත්වය විශ්ලේෂණය හා ග්‍රාහකයන් හඳුනා ගැනීම යනු සරල කාර්යයක් නොව විශේෂඥ කාර්යයක් වන බව
- විශාල සංවිධානවල මේ ආකාරයෙන් තත්ත්වය විශ්ලේෂණය හා ග්‍රාහකයන් හඳුනාගැනීම සඳහා අඛණ්ඩ ව ක්‍රියාත්මක වන පර්යේෂණ අංශ ක්‍රියාත්මක වන බව
- බොහෝ සංවිධාන මෙම කාර්යය සඳහා බාහිර විශේෂඥයන්ගේ සහාය ලබා ගන්නා බව
- මහජන සම්බන්ධතා සේවා සපයනු ලබන විශේෂඥ ආයතන විසින් ද මෙවැනි පර්යේෂණ පවත්වනු ලබන බව
- සමීක්ෂණ, නිරීක්ෂණ, ප්‍රශ්නාවලී, සාකච්ඡා, විශේෂඥ වාර්තා ආදිය මගින් මේ ආකාරයෙන් තත්ත්ව විශ්ලේෂණය හා ග්‍රාහකයන් හඳුනා ගැනීම සඳහා තොරතුරු හා දත්ත ලබා ගත හැකි බව

**2. මහජන සම්බන්ධතා ඉලක්ක හා අරමුණු ගොඩ නැංවීම**

- දිගු කාලයේ දී අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන කීර්ති නාමය ගොඩ නැංවීම, අනාගත ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම ආදිය දිගු කාලීන අරමුණුවලට අයත් වන බව
- කෙටි කාලයේ දී අත්පත් කර ගැනීමට අපේක්ෂා කරන මහජන ප්‍රසාදය ඉහළ නැංවීම, අලෙවි පරිමාණය ඉහළ නැංවීම ආදිය කෙටි කාලීන අරමුණුවලට ඇතුළත් වන බව

- ඍජු අරමුණු වශයෙන් යම් ඉලක්ක ජන සංඛ්‍යාවක් යම් නිශ්චිත කාලයක් තුළ තම සංවිධානය වෙත ගෙන්වා ගැනීම හෝ තම සංවිධානයට පැමිණෙන ගනුදෙනුකරුවන් තුළ ප්‍රසාදය ඇති කිරීම වැනි දේ දැක්විය හැකි බව
- වක්‍ර අරමුණු වශයෙන් ගනුදෙනුකරුවන් තම සංවිධානයේ සේවාවන් වෙත ආකර්ෂණීය කරවා ගැනීම වැනි දේ දැක්විය හැකි බව
- මහජන සම්බන්ධතා වැඩ සටහනක් සැලසුම් කිරීමේ දී මේ ආකාරයෙන් නිසි අරමුණු හා ඉලක්ක ගොඩ ලිඛිත ව දැක්විය යුතු බව

### 3. ක්‍රම විධි හා උපාය මාර්ග තීරණය

- මහජන සම්බන්ධතා වැඩසටහන්වල දී යොදා ගත හැකි ක්‍රම - විධි හා උපාය මාර්ග විවිධ බව
- වඩාත් යෝග්‍ය හා වඩාත් කාර්යක්ෂම ක්‍රම විධි හා උපාය මාර්ග තෝරා ගත යුතු බව
- ඒ ඒ ක්‍රම - විධි හා උපාය මාර්ග අරමුණු ඉටු කර ගැනීම සඳහා යෝග්‍ය විය යුතු බව
- ඒ ඒ ක්‍රම විධි හා උපාය මාර්ග අය වැය ඇස්තමේන්තු සමග ගැළපිය යුතු බව
- ක්‍රම විධි යන්නට මහජන සම්බන්ධතාව ඇති කිරීම සඳහා යොදා ගැනීමට යොදා ගන්නා මුද්‍රිත මාධ්‍ය ස්වරූප, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ස්වරූප ආදිය ද, මාධ්‍ය සාකච්ඡා, ප්‍රදර්ශන ආදී විවිධ විධි ද, අයත් වන බව
- උපාය මාර්ග යන්නෙන් අදහස් වන්නේ ඒ ඒ මහජන සම්බන්ධතා වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරනු ලබන ප්‍රවේශයන් බව
- උපාය මාර්ග වශයෙන් යම් ප්‍රදර්ශනයක් විවෘත කිරීමට දේශපාලනඥයකු ගෙන්වීම, ග්‍රාහක ප්‍රතිචාර ලබා ගැනීම සඳහා ත්‍යාග ලබා දීම හෝ හොඳම ප්‍රතිචාර සඳහා අගැයීම් ක්‍රමයක් යොදා ගැනීම ආදිය දැක්විය හැකි බව

### 4. සැලැස්ම සම්පාදනය

- මහජන සම්බන්ධතා සැලැස්ම යනු තෝරා ගත් විවිධ ක්‍රම - විධි හා උපාය මාර්ගවලින් සමන්විත පද්ධතියක් බව
- ඒ ඒ ක්‍රම - විධි හා උපාය මාර්ග එකිනෙක හා සම්බන්ධ ව ක්‍රියාත්මක වන බව
- ඒ ඒ ක්‍රම - විධි / උපාය මාර්ග අනුපිළිවෙලින් නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක විය යුතු බව
- සමස්ත සැලැස්ම කුඩා ඒකක වශයෙන් වෙන් කර ඒ ඒ කුඩා ඒකක වෙන් වෙන් ව පුද්ගලයන්ගේ වගකීම් යටතේ ක්‍රියාත්මක කළ යුතු බව
- කුඩා ඒකක නිසි ලෙස ක්‍රියාත්මක කරන ලද බව තහවුරු කළ හැකි නිර්ණායක තිබිය යුතු බව
- සැලැස්ම සකස් කිරීම සාමූහික ව කළ යුත්තක් බව
- සැලැස්ම නියාමනය කිරීමේ සැලැස්මක් ද තිබිය යුතු බව
- සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ වගකීම සාමූහික ව ඉටු කළ යුතු බව
- සැලැස්ම සඳහා අය වැය ඇස්තමේන්තුවක් තිබිය යුතු බව
- සැලැස්ම සංශෝධනය කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා ද ඉඩ තිබිය යුතු බව
- හොඳ තොරතුරුකරණ පද්ධතියක් සැලැස්ම සමග සම්බන්ධ විය යුතු බව
- සැලැස්ම සැකසීමට විස්තරාත්මක ආකෘතියක් යොදා ගත යුතු බව
- සැලැස්මට සම්බන්ධ වන සියලු දෙනා ම සැලැස්ම දැන සිටිය යුතු බව

### 5. පෙර අගැයීම්

- ඉතා හොඳින් සකස් කරන ලද සැලැස්මක් වුවත්, එය ක්‍රියාත්මක කරන්නට පෙර අගැයීමකට ලක් කළ යුතු බව
- සැලැස්ම අරමුණු ඉටු කරගැනීමට ගැළපෙන, අය - වැය ඇස්තමේන්තුවට ඔරොත්තු දෙන හා ක්‍රියාත්මක කළ හැකි එකක් දැයි අවසාන වශයෙන් ද තක්සේරු කිරීම පෙර අගැයීමේ කාර්යය වන බව
- පෙර අගැයීම් කළ යුත්තේ සැලසුම සම්පාදනය කරන ලද අය විසින් නොව, වෙනත් විශේෂඥ කණ්ඩායමක් මගින් බව හා එම අගැයීම් සැලසුම් සම්පාදක කණ්ඩායම ද සහභාගි විය යුතු බව
- සැලැස්මේ යම් වෙනස්කම් කරන්නට පෙර අගැයීම් කණ්ඩායම විසින් යෝජනා කළ හැකි බව
- පෙර අගැයීම් මගින් සැලැස්මේ ක්‍රියාකාරී අවස්ථා හා ස්වරූප නිසි ලෙස තක්සේරු කරන බව

| |
|---|
| **විෂය ක්ෂේත්‍රය** : මාධ්‍ය සංස්කෘතිය (කාලච්ඡේද 50 යි.) |
| **නිපුණතාව** : 6.0 මාධ්‍ය සංස්කෘතියේ ස්වාභාවය, ව්‍යාප්තිය හා බලපෑම ද වෙළෙඳ පොළ සමග ඇති සම්බන්ධතා ද විග්‍රහ කරයි. |
| **නිපුණතා මට්ටම:** 6.1 මාධ්‍ය සංස්කෘතියේ ස්වාභාවය, අවශ්‍යතාව හා විකාශනය පැහැදිලි කරයි. |

**කාල පරිච්ඡේද ගණන** : 15

**විෂය අන්තර්ගතය:** මාධ්‍ය සංස්කෘතිය හඳුනා ගැනීම

1. සංස්කෘතිය පිළිබඳ නිර්වචන හා සංකල්ප
2. මාධ්‍ය හා සංස්කෘතිය අතර සම්බන්ධතා
3. මාධ්‍ය සංස්කෘතියේ සමාජීය අවශ්‍යතාව
4. මාධ්‍ය සංස්කෘතිය ජන සංස්කෘතියේ විකාශනයක් ලෙස

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. සංස්කෘතිය පිළිබඳ නිර්වචන හා සංකල්ප විග්‍රහ කරයි.
2. මාධ්‍ය හා සංස්කෘතිය අතර පවත්නා සම්බන්ධතා විග්‍රහ කරයි.
3. මාධ්‍ය සංස්කෘතියේ සමාජීය අවශ්‍යතාව තහවුරු කරයි.
4. මාධ්‍ය සංස්කෘතිය ජන සංස්කෘතියේ විකාශනයක් වූ ආකාරය විස්තර කරයි.

**හැඳින්වීම**

සංස්කෘතිය යනු ගතික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එයින් අදහස් වන්නේ සංස්කෘතිය යන්න නො කඩවා වෙනස් වෙමින් පවතින්නක් බව ය. සංස්කෘතිය යන පදය නිර්මාණය කර ඇත්තේ ඉංග්‍රීසියෙන් යෙදෙන Culture පදයට අනුරූපී ව ය. සමාජ හා මානව විද්‍යාඥයකු වූ එඩ්වඩ් ටයිලර් විසින් දක්වා ඇති පරිදි සංස්කෘතිය යනු දැනුම, ඇදහිලි, විශ්වාස, කලාව, සදාචාරය, නීතිය, සිරිත් විරිත් හා සමාජයේ සාමාජිකයකු වශයෙන් මිනිසා විසින් සාක්ෂාත් කර ගත් හුරු පුරුදු හා හැකියාවන් ඇතුළත් සංකීර්ණ සමස්තයයි.

1936 දී රැල්ෆ් ලින්ටන් විසින් දක්වා ඇති පරිදි, සංස්කෘතිය යනු සාමාජිකයන්ගේ ජීවන ක්‍රමයට එනම්, ඔවුන් විසින් ඉගෙන එක් රැස් කොට ගන්නා වූත්, බෙදා හදා ගෙන පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යනු ලැබූ අදහස් - උදහස් හා පුරුදුවලට ය.

1944 දී මානව විද්‍යාඥ බී. මැලිනොවුස්කි විසින් දක්වා ඇති පරිදි, සංස්කෘතිය යනු උපකරණ, පාරිභෝගික ද්‍රව්‍ය, විවිධ සමාජයීය සමූහයන්ගේ ව්‍යුහමය ලක්ෂණ, මානව සංකල්පනා, ශිල්ප, විශ්වාස හා චාරිත්‍රයන්ගෙන් අනුබද්ධ සමස්තයයි.

සමාජ විද්‍යාත්මක ව සමාජයක් යන්න අර්ථ කථනය කරනු ලබන්නේ, පුද්ගල අන්තර් ක්‍රියාවන්ගෙන් බැඳුණු සාමාජික එකතුවකි. සංස්කෘතිය යනු එම සමාජයේ ජීවන ක්‍රමයේ හරයයි. එයින් අදහස් වන්නේ සමාජය හා සංස්කෘතිය යනු එකිනෙක බද්ධ වී ඇති බව ය. සමාජයක් පවතින්නේ නම් එයට අයත් සංස්කෘතියක් තිබිය යුතු අතර , සංස්කෘතියක් පැවතීමට නම් සමාජයක් තිබිය යුතු ය. සෑම පුද්ගලයකු ම ඉපදුණු විගස හෙතෙම සංස්කෘතික පුද්ගලයෙක් බවට පත් වන්නේ යැයි පිළි ගැනීමක් තිබේ. එහෙත් ඇත්ත වශයෙන් ම නම් පුද්ගලයකු මව් කුසයේ සිටින අවදියේ ම සංස්කෘතික පුද්ගලයකු වන බව, ගැබිණියක් සම්බන්ධ විවිධ වත් පිළිවෙත් හැදෑරූ විට අනාවරණය වේ.

මාධ්‍ය සංස්කෘතිය යන්න කුමක්දැයි හැදෑරීමේ දී පෙනී යන්නේ යම් සංස්කෘතියක හැඩ රුව තීරණය කිරීමෙහි ලා ජනමාධ්‍ය කෙබඳු බලපෑමක් ඇති කරන්නේ දැයි හැදෑරිය යුතු බව ය. ජනමාධ්‍යයන්ගෙන් තොර ව පැවති සමාජයන්හි සංස්කෘතිය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ලද්දේ, ආගම, අධ්‍යාපනය, සිරිත් විරිත්, වැඩිහිටියන් හා විවිධ සමාජ සම්බන්ධතා ය. එහෙත් ජනමාධ්‍ය ව්‍යාප්තියත් සමග මේ සියල්ල අබිබවා එය සංස්කෘතිය කෙරෙහි දැඩි ව බල පාන ප්‍රධාන සාධකය බවට පත් වී ඇත. මාධ්‍ය සංස්කෘතිය යන්නෙන් අදහස් කරනු ලබන්නේ, ඒ ආකාරයෙන් මාධ්‍යයේ බලපෑම බලවත් ව ඇති සමාජයක සංස්කෘතියට ය. එවැනි සමාජයක පුද්ගලයන්ගේ සියලු හැසිරීම් රටා හෝ වැඩි ම හැසිරීම් රටා ප්‍රමාණයක් මාධ්‍ය විසින් ලබා දෙන සංදේශ මගින් හසුරුවනු ලබයි. මෙය දැනුවත් ව මෙන් ම නො දැනුවත් ව සිදු වන්නකි. නූතනයේ ගෝලීයකරණය තුළ මේ ආකාරයෙන් මාධ්‍ය විසින් විශ්ව මට්ටමේ තෝරා ගැනීම් කෙරෙහි සියලු රටවල ජනයා පොළඹවා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඒ රටවල ජන සමාජයන්ට ආවේණික සංස්කෘතික

ලක්ෂණ ඉක්මවා ගෝලීය සංස්කෘතික ලක්ෂණ ව්‍යාප්ත වීමේ ස්වභාවයක් ඇති බව පෙනේ. වර්තමානය වන විට මාධ්‍ය සංස්කෘතිය ඒ ඒ සමාජයන්හි සාම්ප්‍රදායික සංස්කෘතීන්ට විශාල අභියෝගයක් බවට පත් ව ඇත. සංස්කෘතිය ගතික බව සැබෑ ය. එය වෙනස්වීම්වලට භාජනය වන්නේ ක්‍රමික ව ය. මාධ්‍ය සංස්කෘතිය තුළ දී මෙම ක්‍රමික බව අත්හැර දමේ. ඒ වෙනුවට මාධ්‍ය විසින් නිර්මාණය කරනු ලබන විවිධ අංග වහා ම සංස්කෘතිය විසින් භාර ගනු ලැබේ. එය පවත්නා සම්ප්‍රදායික සංස්කෘතියට එකඟ ද? පටහැනි ද? යන්න පිළිබඳ විමසීමක් නැත. එක් අතකට එය මාධ්‍යයේ පවත්නා අධිකාරී බලයක් ලෙස ද පෙනී යයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

### 1. සංස්කෘතිය පිළිබඳ නිර්වචන හා මූලිකාංග

- මානව විද්‍යාඥයන් විසින් සංස්කෘතිය පිළිබඳ විවිධ නිර්වචන / සංකල්ප ගොඩ නංවා ඇති බව
- ටයිලර්, ලින්ටන් හා මැලිනොවුස්කි විසින් දක්වා ඇති නිර්වචන පමණක් අධ්‍යයනය කිරීම ප්‍රමාණවත් වන බව
- ඕනෑම සංස්කෘතියක් මූලිකාංගවලින් සමන්විත වන බව
- උප සංස්කෘතිය, විරෝධී සංස්කෘතිය, සංස්කෘතික විසරණය, සංස්කෘතික සම්පර්කය, සංස්කෘතික ලැග්ම, සංස්කෘති රාශිකෘතිය හා සංස්කෘතික ත්වරණය මූලිකාංග වන බව
- උප සංස්කෘතිය යන්නෙන් විවිධ සාධක මත වෙන් ව පවතින උප සමාජයන්ට අයත් සංස්කෘතිය අදහස් වන අතර, එය වෘත්තීන්, කාර්යයන්, ප්‍රදේශ ආදී සාධක අනුව සුවිශේෂ විය හැකි බව
- විරෝධී සංස්කෘතිය යන්නෙන් පවත්නා සංස්කෘතියට විරෝධීව පවත්වා ගෙන යන වෙනස් ලක්ෂණ සහිත සංස්කෘතික කණ්ඩායම් අයත් වන අතර එය ස්වභාවික සමාජ සිදුවීමක් බව
- සංස්කෘතික විසරණය යන්නෙන් යම් සංස්කෘතියක් ගොඩ නංවා ගැනීමට වෙනත් සංස්කෘතීන්ගේ නවීකරණයන් හෝ නව සොයා ගැනීම් ඇතුළත් කර ගැනීම අදහස් වන බව
- සංස්කෘතික සම්පර්කය යන්නෙන් බලවත් සමාජයක් විසින් තම සංස්කෘතිකාංග දුර්වල සමාජයකට අවශෝෂණය කිරීම මෙයින් අදහස් වන බව
- සංස්කෘතික ලැග්ම යන්නෙන් යම් සංස්කෘතියක අංග දියුණු නො වී එක ම ආකාරයෙන් පැවතීම අදහස් වන බව
- සංස්කෘති රාශිකෘතිය යන්නෙන් මානව සමාජයේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විවිධ දේ නිර්මාණය කරමින් රාශිගත කිරීම අදහස් වන බව
- සංස්කෘතික ත්වරණය යන්නෙන් විවිධ නව අදහස් හා සොයා ගැනීම් එක් වෙමින් සංස්කෘතියක් වෙනස් වීම හෝ වැඩි දියුණු වීම වේගවත් වීම අදහස් වන බව

### 2. මාධ්‍ය හා සංස්කෘතිය අතර සම්බන්ධතා

- සංස්කෘතික ක්‍රියාවලියේ බලවත් සාධකයක් ලෙස මාධ්‍ය පවතින බව
- මාධ්‍ය හා සංස්කෘතිය අතර සම්බන්ධයේ ස්වාභාව එක් එක් සමාජයන්හි සංස්කෘතියේ බලවත් කම හෝ දුර්වලකම හෝ මත තීරණය වන බව
- සමහර සංස්කෘතීන් ඉතා බලවත් ලෙස මාධ්‍යයේ ක්‍රියාකාරිත්වය සීමා කරන බව
- ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් ලෙස මාධ්‍ය බලවත් ව පවතින විට එයට සංස්කෘතිය කෙරෙහි බලපෑම් ඇති කළ හැකි ශක්තිය වැඩි වන බව
- විවෘත හා නම්‍යශීලී සංස්කෘතියක් තුළ දී මාධ්‍යයේ හැසිරීම නිදහස් ආකාරයෙන් පවතින බව
- සංස්කෘතිය කෙරෙහි මාධ්‍යයේ බලපෑම වැඩි වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මාධ්‍ය සංස්කෘතිය උපදින බව

### 3. මාධ්‍ය සංස්කෘතියේ සමාජීය අවශ්‍යතාව

- මාධ්‍ය සංස්කෘතිය බිහි වන්නේ සමාජය විසින් මාධ්‍යයේ සංදේශවලට අනුගත වීම නිසා බව
- සමාජයේ සංස්කෘතික හැසිරීමට බල පාන ආගම, සදාචාරය, සිරිත් විරිත් හා අධ්‍යාපනයට වඩා මාධ්‍යයේ බල පෑම සමාජය විසින් භාර ගෙන ඇති බව
- නවීකරණය වීම සඳහා සමාජය තුළ ඇති කැමැත්ත මාධ්‍ය සංස්කෘතිය තුළින් නිරූපණය වන බව
- සංකීර්ණ සමාජ පරිසරය තුළ සමාජයට වඩාත් පොදු වූ තොරතුරු හුවමාරුව ක්‍රමය තුළ මාධ්‍ය පවතින බව
- නූතනයේ මාධ්‍ය යන්න උපකරණයන්ට වඩා ජීවන ක්‍රමයක් බවට පත් වී තිබෙන බව

- මාධ්‍ය සංස්කෘතිය නිසා සමාජයට ගෝලීය මට්ටමින් පැවැත්මක් ඇති බව
- මාධ්‍ය සංස්කෘතියේ පවත්නා ආකර්ෂණීය බවට සමාජය ඇලුම් කරන බව
- සාම්ප්‍රදායික සංස්කෘතියේ සීමාවන් මාධ්‍ය සංස්කෘතිය විසින් ඉක්මවා යන බව
- සමාජ අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා මාධ්‍ය සංස්කෘතිය දායක වන බව
- නව සමාජ අවශ්‍යතා මාධ්‍ය සංස්කෘතිය විසින් නිර්මාණය කරන බව

**4. මාධ්‍ය සංස්කෘතිය ජනසංස්කෘතියේ ව්‍යාප්තියක් ලෙස**

- සංස්කෘතිය ගොඩනගන්නේ සහ පවත්වා ගෙන යන්නේ ජනයා විසින් ම බව
- මාධ්‍ය සංස්කෘතිය ගොඩනැංවෙන්නේ මාධ්‍යය විසින් ඉදිරිපත් කරනු ලබන සංදේශයන් ජනයා විසින් තම ජීවන චර්යාවට එක් කර ගැනීමෙන් බව
- ජනසංස්කෘතියේ සාම්ප්‍රදායික සාධක ඉක්මවා මාධ්‍යයේ සාධක ජනයා කෙරෙහි බලපා ඇති බව
- අවසාන අර්ථයේ දී මාධ්‍ය සංස්කෘතියේ බොහෝ අංග ජනසංස්කෘතියට එක්වන බව

**විෂය ක්ෂේත්‍රය** : මාධ්‍ය සංස්කෘතිය (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව** : 6.0 මාධ්‍ය සංස්කෘතියේ ස්වභාවය, ව්‍යාප්තිය හා බලපෑම ද වෙළෙඳ පොළ සමග ඇති සම්බන්ධතා ද විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 6.2 මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය හා සංයෝගය විග්‍රහ කරයි.

**කාල පරිච්ඡේද ගණන** : 15

**විෂය අන්තර්ගතය:** මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය හා සංසරණය

1. මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තියේ හා සංසරණයේ ස්වභාවය
2. මාධ්‍ය සංස්කෘතිය හා තාක්ෂණය
3. මාධ්‍ය සංස්කෘතිය හා සමාජීය වෙනස්වීම්
4. මාධ්‍ය සංස්කෘතික සංසරණයේ අසමබරතාව

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තියේ හා සංසරණයේ ස්වභාවය ලාංකික පරිසරය තුළ විග්‍රහ කරයි.
2. මාධ්‍ය සංස්කෘතිය හා තාක්ෂණය අතර සම්බන්ධතාව විවාදයට භාජනය කරයි.
3. මාධ්‍ය සංස්කෘතිය හා සමාජීය වෙනස්වීම් අතර පවත්නා අන්‍යෝන්‍ය ගනුදෙනුව අනාවරණය කරයි.
4. මාධ්‍ය සංස්කෘතික සංසර්ණයේ අසමබරතාව ගෝලීය වශයෙන් පවත්නා ස්වභාවය විස්තර කරයි.

**හැඳින්වීම**

ජනසංස්කෘතියට දැඩි බලපෑමක් විද්‍යුත් මාධ්‍යයන්ගේ හා නව මාධ්‍යයන්ගේ නැගීමත් සමග ඇති වූ බව ඓතිහාසික කරුණකි. මුද්‍රිත මාධ්‍යයේ බලපෑම සමාජගත වූ නමුත් එය ජනසංස්කෘතියේ මූලික ව්‍යුහය දැඩි ලෙස වෙනස් කරන්නට හේතු වූයේ නැත. මුද්‍රිත මාධ්‍ය විසින් ජනසංස්කෘතිය පෝෂණය කරනු ලැබී ය. එහෙත් විද්‍යුත් මාධ්‍යය හා නව මාධ්‍ය විසින් සිය සංදේශ නිර්මාණය කරන ලද්දේ, ජනසන්නිවේදනයේ පදනමක පිහිටා නොව, ජනසංස්කෘතියට අභියෝගයක් වන පරිදි ය. මෙහි ලා අවධානය යොමු කළ යුතු කරුණක් නම්, විද්‍යුත් මාධ්‍ය හා නව මාධ්‍ය බටහිරකරණය සම්ප්‍රේෂණය කිරීමෙහි ලා උත්සුක වූ බව ය. මාධ්‍ය අතර තරගයත්, වාණිජ අරමුණු ඉස්මතුවීමත් නිසා විද්‍යුත් හා නව මාධ්‍ය විසින් ලෝකය පුරා පතුරුවා හරින ලද්දේ ව්‍යාපාරික මාධ්‍ය අන්තර්ගතයකි. එයට විවිධ නිර්මාණාත්මක දේ ඇතුළත් වුවත්, ඒ තුළ පැවතියේ බටහිර සංස්කෘතිය විසින් තක්සේරු කරන ලද්දාවූත්, බටහිර සංස්කෘතිය විසින් නිශ්චය කරනු ලද්දාවූත් අන්තර්ගතයකි.

විශේෂයෙන් මෑත දශක දෙක තුළ ලෝකය පුරා මාධ්‍ය තාක්ෂණය ව්‍යාප්ත වී ඇත්තේ ඇදහිය නොහැකි තරම් විස්මිත ලෙස ය. තාක්ෂණික උපකරණ සමග තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රම ද වෙනස් වී ඇත. චන්ද්‍රිකා තාක්ෂණය ලොව පුරා භාවිතයට ගැනීම මෙහි පදනමයි. ඒ නිසා පෙර නො වූ විරූ ආකාරයෙන් බටහිර මාධ්‍යයන් ලොව පුරා ආධිපත්‍යය ලබා ගත් බව පෙනී යයි. මූලික වශයෙන් පැවතියා වූ ස්වදේශික සංස්කෘතික ලක්ෂණ පහත් කොට සැලකීම ද, බටහිරින් එන සංස්කෘතික ලක්ෂණ දියුණු හා නවීකරණය වූ ඒවා යැයි සැලකීම ද, එසේ සලකන්නට පුරුදු කිරීම ද නිසා, මාධ්‍ය සංස්කෘතිය ව්‍යාප්ත වීමට පුළුල් අවකාශයක් ඇති විය.

මාධ්‍ය සංස්කෘතිය හුදෙක් මාධ්‍ය භාවිතයක් නොව, සමස්ත සමාජයේ ම ජීවන ක්‍රමය වෙනස් කිරීමක් බවට පත් විය. එය කොතරම් වේගයෙන් සිදු වන්නේදැයි කිව හොත්, ඒ පිළිබඳ ව දෙවරක් සිතන්නටවත් නො හැකි තත්ත්වයට සමාජය පත් වී තිබේ. එසේ ම මාධ්‍යයේ මෙම වේගවත් ව්‍යාප්තිය පිළිබඳ ව පෙර අත්දැකීම් සමාජයට නො තිබූ නිසා, මෙම ව්‍යාප්තියට මුහුණ දෙන්නේ කෙසේදැයි සිතා ගන්නට ද සමාජයට නො හැකි වී ඇත.

අවසානයේ පෙනී යන කරුණ නම් මාධ්‍ය සංස්කෘතික සංසරණය අසමබර ව පවත්නා බව ය. එය බටහිර ජීවන සංකල්ප නැගෙනහිරට ගෙන ඒමට විනා නැගෙනහිර ජීවන සංකල්ප බටහිරට ගෙන යන්නට සමත් වී නැත. අප ජීවත් වන ආසියාතික රටවල පවත්නා ඉතා උසස් ජීවන රටාවන් හා ජීවන අංග ලෝක මට්ටමට ගෙන යාම වෙනුවට බටහිර ජීවන රටාවන් හා ජීවන අංග ලෝකය පුරා පැතිරවීමට මාධ්‍ය

සංස්කෘතියට හැකි වී තිබේ. අවසානයේ දී අප විසින් මාධ්‍ය සංස්කෘතිය යන්නෙන් අදහස් කරන්නේ ද බටහිර සංස්කෘතිය විසින් නිර්මාණය කරන ලද මාධ්‍ය සංස්කෘතිය බව පෙනී යයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. මාධ්‍ය සංස්කෘතියේ ව්‍යාප්තියේ හා සංසරණයේ ස්වභාව**

- මාධ්‍ය සංස්කෘතිය විශේෂයෙන් බටහිර සමාජ සංස්කෘතිය මූලාශ්‍ර කර ගත් බව
- මාධ්‍ය සංස්කෘතිය ව්‍යාප්තියේ දී සිදු ව ඇත්තේ බටහිර සංස්කෘතික ලක්ෂණ ප්‍රකෘති තත්ත්වයෙන් හෝ අනුකරණයෙන් හෝ ලෝකය පුරා බෙදා හැරීමක් බව
- මාධ්‍ය සංසරණයේ ඇත්තේ අධිපතිවාදී ස්වභාවයක් බව
- මාධ්‍ය සංස්කෘතික සංසරණයේ දී හුවමාරුවක් සිදු වීම අවම බව
- ජාතික සංස්කෘතිය කෙරෙහි අභිමානයක් නොමැති වීම මාධ්‍ය සංස්කෘතියේ ව්‍යාප්තියට වාසියක් බව
- මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තියේ හා සංසරණයේ ප්‍රධාන භූමිකාව ඉටු කරනු ලබන්නේ මාධ්‍ය විසින්ම බව
- මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය හා සංසරණය ස්වභාවික ක්‍රියාවලියකට වඩා සැලසුම් කරන ලද ක්‍රියාවලියක් බව
- මාධ්‍ය සංස්කෘතික සංසරණය මගින් නව යටත් විජිතවාදී දේශපාලනික අරමුණු ඉටු කර ගත හැකි බව

**2. මාධ්‍ය සංස්කෘතිය හා තාක්ෂණය**

- මෑත දශක දෙක තුළ ලෝකයේ මාධ්‍ය තාක්ෂණය ඇදහිය නො හැකි ආකාරයෙන් දියුණු වී ඇති බව
- මාධ්‍ය තාක්ෂණය සමග විදුලි හා විද්‍යුත් සංදේශ තාක්ෂණය එක් වී ඇති බව
- විද්‍යුත් මාධ්‍ය සමග නව මාධ්‍යයන්ගේ සංවර්ධනය ද එක් වී ඇති බව
- තොරතුරු හුවමාරුව පිළිබඳ සමාජයේ චර්යාවන් අතිශයින් වෙනස් වී ඇති බව
- ඍජු තොරතුරු සමග සංස්කෘතික ලක්ෂණ හා චර්යාත්මක අංග ද සම්ප්‍රේෂණය වන බව
- මාධ්‍ය සංස්කෘතිය මාධ්‍ය තාක්ෂණයේ ඍජු ඵලයක් බව
- මාධ්‍ය තාක්ෂණයේ සංවර්ධනය අඛණ්ඩ ව සිදු වෙමින් පවතින බව
- මාධ්‍ය තාක්ෂණය සමාජීය වශයෙන් සරල භාවිතයක් බවට පත් වී ඇති බව
- මාධ්‍ය සංස්කෘතිය පවත්වා ගෙන යාමට මාධ්‍ය තාක්ෂණය ඉවහල් වී ඇති බව
- මාධ්‍ය සංස්කෘතිය හා මාධ්‍ය තාක්ෂණය අතර අන්‍යෝන්‍ය සම්බන්ධයක් ඇති බව
- මාධ්‍ය සංස්කෘතියේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය විසින් මාධ්‍ය තාක්ෂණය ඉල්ලා සිටින බව

**3. මාධ්‍ය සංස්කෘතිය හා සමාජීය වෙනස්වීම්**

- සමාජීය වෙනස් වීම් ස්වභාවික සංසිද්ධියක් වන බව
- සමාජීය වෙනස් වීම් අඛණ්ඩ ව සිදු වන බව
- මාධ්‍ය සංස්කෘතිය නිසා සමාජය කෘත්‍රිම ලෙස හා හදිසි ලෙස වෙනස් වී ඇති බව
- මාධ්‍ය සංස්කෘතිය නිසා ඇති වන සමාජීය වෙනස් වීම් නිසා සංස්කෘතික ගැටුමක් ඇති වන බව
- මාධ්‍ය සංස්කෘතිය විසින් ඇති කරනු ලබන වෙනස ව්‍යාපාරික අරමුණු හා බටහිරකරණය මුල් කර ගෙන ඇති බව
- මාධ්‍ය සංස්කෘතිය නිසා විශේෂයෙන් තරුණ, ළමා හා කාන්තා පිරිස ගේ චර්යාවන්හි බරපතල වෙනස් වීම් ඇති කරනු ලබන බව
- සමාජයේ ඉතා සංවේදී චර්යාවන් කෙරෙහි මාධ්‍ය සංස්කෘතිය තදින් බලපෑම් ඇති කරන බැවින්, සමාජයේ සංවේදී චර්යාවන්හි බරපතල වෙනස් කම් ඇති කළ හැකි බව
- මාධ්‍ය සංස්කෘතියේ උපක්‍රමශීලී ප්‍රවේශයන්ට සමාජය හසු ව ඇති බව
- මාධ්‍ය සංස්කෘතියෙහි මතු පිට අරමුණු ව්‍යාජ ලෙස පෙනෙන අතර, තුන් වන ලෝකයෙහි සමාජීය මතවාදය වෙනස් කිරීම යටි අරමුණුවල පවත්නා බව

**4. මාධ්‍ය සංස්කෘතික සංසරණයේ අසමබරතාව**

- මාධ්‍ය සංස්කෘතිය නිර්මාණය කිරීමේ උපාය මාර්ග සැලසුම් කරනු ලබන්නේ බටහිරකරණය පදනම් කර ගෙන බව
- මාධ්‍ය සංස්කෘතිය සංසරණය වන්නේ ඒක මාර්ගික ව බව
- ලෝකයේ ඒ ඒ සංස්කෘතීන්හි වටිනා අංග හුවමාරු කර ගැනීමක් මාධ්‍ය සංස්කෘතික සංසරණයෙන් සිදු නො වන බව
- බටහිර ඍජු චර්යාත්මක හෝ අනුකරණාත්මක අංග හෝ පමණක් සංසරණයට භාජනය වන බව
- විශේෂයෙන් ආසියා / අප්‍රිකා කලාපයන්හි සංස්කෘතීන්හි වටිනා අංග නොසලකා හැරීමට හා අවතක්සේරු කිරීමටත්, බටහිර සංස්කෘතිකාංග උසස් ලෙස සැලකීමටත් මාධ්‍ය සංස්කෘතිය විසින් හුරු කිරීමත්, නැගෙනහිර මතවාදය හෙළා දකිමින් බටහිර මතවාදය සමාජගත කිරීමටත් මාධ්‍ය සංසරණයේ අසමබරතාව හේතු වී ඇති බව

**විෂය ක්ෂේත්‍රය** : මාධ්‍ය සංස්කෘතිය (කාලච්ඡෙද 50 යි.)
**නිපුණතාව** : 6.0 මාධ්‍ය සංස්කෘතියේ ස්වභාවය, ව්‍යාප්තිය හා බලපෑම ද වෙළෙඳ පොළ සමග ඇති සම්බන්ධතා ද විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම:** 6.3 මාධ්‍ය සංස්කෘතියේ බලපෑම තුලනාත්මක ව විග්‍රහ කරයි.

**කාල පරිච්ඡේද ගණන** : 10

**විෂය අන්තර්ගතය**: මාධ්‍ය සංස්කෘතියේ බලපෑම

1. සංස්කෘතික කම්පනය
2. සංස්කෘතික ආක්‍රමණය
3. සංස්කෘතික හුවමාරු

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. මාධ්‍ය සංස්කෘතියේ බලපෑම් ශ්‍රී ලාංකික සමාජය ඇසුරින් විමර්ශනය කරයි.
2. මාධ්‍ය සංස්කෘතිය නිසා සංස්කෘතිය කම්පනයට පත් ව ඇති ආකාරය විග්‍රහ කරයි.
3. විවිධ විදේශීය සංස්කෘතිකාංග දේශීය සංස්කෘතිය ආක්‍රමණය කර ඇති ආකාරය උදාහරණ සහිත ව පෙන්වා දෙයි.
4. සංස්කෘතික හුවමාරුව නිසා ජාතික සංස්කෘතිය පෝෂණය හා පරිහානිය වී ඇති ආකාරය ශ්‍රී ලාංකික සංස්කෘතිය පදනම් කර ගෙන විග්‍රහ කරයි.

**හැඳින්වීම**

මාධ්‍ය සංස්කෘතිය යනු ජනසංස්කෘතියේ ම ව්‍යාප්තියක් ලෙස, එහෙත් ජනසංස්කෘතියේ අංග යටපත් කරමින් පෝෂණය වී ව්‍යාප්ත වන්නකි. එහි සමාජීය බලපෑම විවිධාකාර ය. යම් සමාජයකට අයත් සංස්කෘතියට අදාළ සාධක බලවත් ව පවතින විට මාධ්‍ය සංස්කෘතියට එයින් වන බලපෑම අවම වේ. එහෙත් සංස්කෘතියේ සාධක දුර්වල ව පවතින විට, එසේත් නැතිනම් මාධ්‍ය සංස්කෘතියේ අංග වඩාත් බලවත් ව ඉදිරිපත් වන විට, දේශීය සංස්කෘතිය කෙරෙහි එයින් දැඩි බලපෑමක් ඇති වේ. නූතන මාධ්‍ය හා තොරතුරු සමාජය තුළ මෙම තත්ත්වය පාලනය කිරීම ඉතා අපහසු වී ඇත. එයට යොදා ගත හැකි පිළියම් දෙකකි.

එකක් නම් මාධ්‍ය සංස්කෘතියේ ස්වරූපය දැඩි ලෙස පාලනය කිරීම ය. මේ සඳහා යොදා ගත හැක්කේ අන්තවාදී පිළිවෙත් ය. එනම් ආගම හා නීතිය මේ සඳහා පාලන උපකරණ වශයෙන් යොදා ගත හැකි ය. එසේ වුවත් වර්තමාන ලෝකයේ මේ ආකාරයෙන් අන්තවාදී ලෙස ආගම හා නීතිය පාලන උපකරණ වශයෙන් යොදා ගැනීම අනුමත නො කෙරේ. මේ සඳහා දිය හැකි හොඳ ම උදාහරණය නම් ඇෆ්ගනිස්ථානයේ තලේබාන්වරුන් මාධ්‍ය කෙරෙහි දක්වන අන්තවාදී ප්‍රතිපත්තියයි. මෑතක දී එරට වැසියන් කිහිප දෙනෙකුට තලේබාන්වරුන් විසින් දැඩි දඬුවම් පමුණුවන ලද්දේ, පවුලේ උත්සවයක දී තරුණ පිරිසක් රැප් ගී ගායනා කිරීම නිසා ය. මේ ආකාරයෙන් සමාජීය දැඩි පාලන ක්‍රම මගින් සමස්ත ප්‍රජාව පාලනය කළ නොහැකි ය.

දෙවැන්න නම්, මාධ්‍ය සාක්ෂරතාව සමාජයට අත්පත් කර දීම ය. මේ මගින් මාධ්‍ය සංදේශ යථාර්ථවාදී ලෙස අර්ථ කථනය කර භාර ගන්නට සමාජයේ නිපුණතාව වර්ධනය කළ හැකි ය. මෙය පුළුල් සමාජ අධ්‍යාපන ක්‍රියාවලියකි. එහෙත් පවත්නා යථාර්ථය නම් මාධ්‍ය ව්‍යාපාරය විසින් අඛණ්ඩ ව ඇති කරනු ලබන බලපෑම පාලනය කිරීම අපහසු බව ය. ඒ නිසා සංස්කෘතික කම්පනය සිදු වේ. එපමණක් නොව ශක්තිමත් පදනමක සිට සංස්කෘතික ආක්‍රමණය ද සිදු වේ. කෙසේ වුව ද සංස්කෘතියක පැවැත්මට අවශ්‍ය සංස්කෘතික හුවමාරුව ද මාධ්‍ය සංස්කෘතිය නිසා ඉතා සක්‍රීය ව සිදු වන බව අමතක නො කළ යුත්තකි. මේ නිසා කුමන සමාජයක් වුව ද සංවර්ධනය වේ.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. සංස්කෘතික කම්පනය:**

- පවත්නා සංස්කෘතියෙහි අගය කරනු ලබන අංග, බාහිර සංස්කෘතිකාංගවලින් යටපත් වීම නිසා සමාජයක් තුළ ඇති වන සංවේදීභාවය සංස්කෘතික කම්පනය බව
- සංස්කෘතික කම්පනය ගැටුම්කාරී ස්වභාවයකින් ප්‍රකාශ වන්නට පුළුවන් බව
- සමහර විට සංස්කෘතික කම්පනය වැඩිහිටි - තරුණ අරගලයක් ලෙස ද පෙන්නුම් කෙරෙන බව
- නව සංස්කෘතිකාංග සමාජයේ එක් කොටසක් භාර ගන්නා අතර තවත් කොටසක් භාර නො ගැනීම නිසා කම්පනය ඇති වන බව
- සංස්කෘතික කම්පනය ලෝක ඉතිහාසයෙහි සෑම කාලයක ම සමාජයන්හි අඩු - වැඩි වශයෙන් පැවති බව හා අනාගතයේ දී ද පවත්නා බව
- සමාජීය සම්ප්‍රදායන් දැඩි ව පැවතීම ද සංස්කෘතික කම්පනයට හේතු වන බව
- විරෝධී සංස්කෘතිය නිසා සංස්කෘතික කම්පනය ඇති වීම ලෝකයේ බොහෝ රටවල මහා පරිමාණයෙන් සිදු වී ඇති බව
- විරෝධී සංස්කෘතියක් බිහි වීමත්, සංස්කෘතික කම්පනය ඇති වීමත් ස්වභාවික සංසිද්ධීන් බව

**2. සංස්කෘතික ආක්‍රමණය:**

- වෙනත් සංස්කෘතීන්ගේ අංග තවත් සංස්කෘතියකට බලහත්කාරයෙන් එක් කිරීම සංස්කෘතික ආක්‍රමණය බව
- සැලසුම් සහගත ව හා සැලසුමකින් තොර ව සංස්කෘතික ආක්‍රමණය සිදු වන බව
- ඓතිහාසික ව පෙනී යන්නේ සංස්කෘතික ආක්‍රමණය මූලික වශයෙන් දේශපාලනික සංසිද්ධීන්ගේ ඍජු හෝ වක්‍ර හෝ ක්‍රියාකාරිත්වයක් ලෙස බව
- සංස්කෘතික ආක්‍රමණය නව යටත්විජිතවාදී ක්‍රියාමාර්ගයක් බව
- සංස්කෘතික ආක්‍රමණය පිටුපස වෙළෙඳ අපේක්ෂාවන් ද තිබෙන බව
- සැලසුම් සහගත ව සිදු වන සංස්කෘතික ආක්‍රමණයේ දී මාධ්‍යයන් ගේ සහාය එයට ලැබෙන බව
- මුලින් සංස්කෘතික ආක්‍රමණයක් වශයෙන් එක් වන අංග පසු ව සංස්කෘතියේ කොටසක් බවට පත් වන බව
- සංස්කෘතික ආක්‍රමණය බලහත්කාරයෙන් හෝ උපක්‍රමශීලී ව හෝ සිදු විය හැකි බව

**3. සංස්කෘතික හුවමාරුව:**

- සංස්කෘතික හුවමාරුව සමාජීය වශයෙන් ඉතා ඵලදායක බව
- ඓතිහාසික වශයෙන් බැලූ විට සෑම සංස්කෘතියක හුවමාරු වූ අංග තිබෙන බව
- සංස්කෘතික හුවමාරුව ඒ ඒ සංස්කෘතීන් විසින් කැමැත්තෙන් භාර ගන්නා බව
- හුවමාරු වූ සංස්කෘතීන් අංග පසු ව ඒ ඒ සංස්කෘතීන්ගේ ආවේණික අංග බවට පත් වන බව
- සංස්කෘතික අංග හුවමාරුව ජාතීන් අතර සිදු වන විට සමාජීය සහජීවනයට එය හේතු වන බව
- සංස්කෘතික හුවමාරුව ජාතීන් හා රටවල් අතර සහයෝගයට හේතු වන බව
- සංස්කෘතික හුවමාරුව සැලසුම් සහගත ව ද, සැලසුමකින් තොර ව ද සිදු වන බව
- සංස්කෘතික හුවමාරුව නිසා සමාජ සංවර්ධනය සිදු වන බව

**විෂය ක්ෂේත්‍රය** : මාධ්‍ය සංස්කෘතිය (කාලච්ඡේද 50 යි.)
**නිපුණතාව** : 6.0 මාධ්‍ය සංස්කෘතියේ ස්වභාවය, ව්‍යාප්තිය හා බලපෑම ද වෙළෙඳ පොළ සමග ඇති සම්බන්ධතා ද විග්‍රහ කරයි.
**නිපුණතා මට්ටම**: 6.4 මාධ්‍ය සංස්කෘතිය හා වෙළෙඳ පොළ අතර පවත්නා අන්තර් සම්බන්ධතා විග්‍රහ කරයි.

**කාල පරිච්ඡේද ගණන** : 10 යි.

**විෂය අන්තර්ගතය**: මාධ්‍ය සංස්කෘතිය හා වෙළෙඳ පොළ

1. ගෝලීයකරණය හා නව ලිබරල්වාදය
2. ව්‍යාපාරික ආධිපත්‍යය හා මාධ්‍ය සංස්කෘතිය
3. වෙළෙඳ පොළ ව්‍යාප්තිය හා මාධ්‍ය සංස්කෘතිය
4. මාධ්‍ය දැන්වීම්කරණය හා සමාජය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල**

1. ගෝලීයකරණයේ හා ලිබරල්වාදයේ ප්‍රභවය, විකාශනය හා බලපෑම විග්‍රහ කරයි.
2. මාධ්‍ය සංස්කෘතිය කෙරෙහි ව්‍යාපාරික ආධිපත්‍යය බලපා ඇති ආකාරය විග්‍රහ කරයි.
3. මාධ්‍ය සංස්කෘතිය පවත්වා ගැනීම වෙළෙඳ පොළ ව්‍යාප්තියට හේතු වන ආකාරය ශ්‍රී ලාංකික අත්දැකීම් ඇසුරින් විශ්ලේෂණය කරයි.
4. මාධ්‍ය දැන්වීම්කරණය සමාජයට කෙබඳු ප්‍රයෝජනයක් අත්පත් කර දෙන්නේද? යන්න හා එයින් ඇති වන යහපත් හා අයහපත් බලපෑම් කෙබඳුදැයි විශ්ලේෂණාත්මක ව දක්වයි.

**හැඳින්වීම**

මාධ්‍ය සංස්කෘතිය හා වෙළෙඳ පොළ අතර ඇත්තේ නොබිඳිය හැකි සම්බන්ධයකි. මාධ්‍ය සංස්කෘතිය ගොඩ නංවන්නේ සහ පවත්වා ගෙන යන්නේ වෙළෙඳ පොළේ සිටින ව්‍යාපාරික ප්‍රජාව විසිනි. වෙළෙඳ පොළේ පැවැත්මට මාධ්‍ය සංස්කෘතිය විශාල සේවාවක් ඉටු කරයි. ඒ නිසා මාධ්‍ය සංස්කෘතියට රිසි සේ හැසිරෙන්නට ව්‍යාපාරික ප්‍රජාව විසින් ඉඩ දෙන්නේ නැත. සම්පත් ඒකරාශි වී ඇත්තේ වෙළෙඳ පොළ තුළ ය. මාධ්‍ය සංස්කෘතිය හසුරුවන්නට වෙළෙඳ පොළට අධිකාරී බලයක් ලැබෙන්නේ මේ නිසා ය. මාධ්‍ය සංස්කෘතියේ ඇති කරනු ලබන සෑම වෙනසකින් ම වෙළෙඳ පොළට වාසියක් අත්පත් කර ගැනීම අපේක්ෂා කෙරේ. එම නිසා මාධ්‍ය සංස්කෘතියට අයත් සෑම ලොකු කුඩා අංගයක් ම තමන්ගේ වාසියට හසුරුවා ලීම වෙළඳ පොළේ අභිමතයයි.

වෙළඳ පොළ යන්නට පාරිභෝගිකයා ද අයත් වේ. මෙම සංසිද්ධියේ දී පාරිභෝගිකයාට බලයක් නැති බව පෙනේ. පාරිභෝගිකයා ව්‍යාපාරික ආධිපත්‍යය විසින් ගොඩ නංවන මාධ්‍ය සංස්කෘතියේ ගොදුරක් බවට පත් ව සිටී. තමන් ගොදුරක් බවට පත් ව සිටින බව මාධ්‍ය පාරිභෝගිකයාට වැටහෙන්නේ නැත. එයට හේතුව වෙළඳ පොළ විසින් මාධ්‍ය සංස්කෘතිය හසුරුවනු ලබන්නේ ඉතා සියුම් උපාය මාර්ග යොදා ගනිමිනි. ඒ සඳහා මාධ්‍ය පර්යේෂණ ද, මනෝ විද්‍යාව ද, නිර්මාණශීලී චින්තනය ද, මාධ්‍ය තාක්ෂණය ද වෙළඳ පොළ විසින් ඉතා අපූරුවට යොදා ගනී.

මාධ්‍ය දැන්වීම්කරණය සමාජය කෙරෙහි දැඩි ව බල පාන පද්ධතියකි. එය සමාජයට අත්‍යවශ්‍ය බවට සැකයක් නැත. එහෙත් එයින් සිදු වන භාණ්ඩ හෝ සේවා හෝ පිළිබඳ ව තොරතුරු ජනතාව වෙත ගෙන යාමට වඩා වැඩිමනත් දෙයක් සිදු වේ. එනම් විවිධ වූ භාණ්ඩ හා සේවා පිළිබඳ මානසිකත්වය සමාජය තුළ ගොඩ නැංවීමේ කෙටි කාලීන හා දිගු කාලීන අරමුණු මෙම මාධ්‍ය දැන්වීම්කරණය තුළ ඉතා ශක්තිමත් ව ක්‍රියාත්මක වන බව ය. ව්‍යාපාරික ආධිපත්‍යය මගින් රාජ්‍යයන් කෙරෙහි ද දැඩි බලපෑම් ඇති කරන වකවානුවක මාධ්‍ය දැන්වීම්කරණය විසින් සමාජය කෙරෙහි දැඩි බලපෑමක් ඇති කිරීම පුදුමයට කරුණක් නො වේ. එහෙත් මෙහි දී සමාජය මෙම මාධ්‍ය ආධිපත්‍යයට මුහුණ දීමට සූදානම් නො කිරීම විශාල ප්‍රශ්නයක් බවට පත් ව තිබේ. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ සමාජය හසුරුවන ගාමක බලවේගය බවට මාධ්‍ය පත් වීම ය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

**1. ගෝලීයකරණය හා නව ලිබරල්වාදය:**

- ගෝලීයකරණය යනු මාධ්‍ය ව්‍යාප්තිය විසින් ම නිර්මාණය කරන ලද්දක් බව
- මාධ්‍ය හා තොරතුරු තාක්ෂණය නිසා ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් කරන ලද බව
- රාජ්‍යය හා ජාතික යන සංකල්ප ගෝලීයකරණය තුළ අභියෝගයට ලක් වී ඇති බව
- ගෝලීයකරණයේ ස්වරූපය අනුව බටහිර ආධිපත්‍යය ලෝකය පුරා පැතිර යමින් පවතින බව
- ජාතික අනන්‍යතාව හා ජාතික සංස්කෘතිය යන්න ගෝලීයකරණය ඉදිරියේ අභියෝගයට ලක් ව ඇති බව
- ගෝලීයකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් නව ලිබරල්වාදය නිර්මාණය වූ බව
- නව ලිබරල්වාදයෙහි පදනම වන්නේ, ගෝලීයකරණය බව
- නව ලිබරල්වාදය බටහිර හා යුරෝපීය ව්‍යාපාරික ආධිපත්‍යය මුල් කර ගෙන ඇති බව
- ජාතික ආර්ථික ස්වාධීනත්වයන් සමග නව ලිබරල්වාදය ගැටෙන බව
- නව ලිබරල්වාදය පවත්වා ගෙන යාම මාධ්‍ය සංස්කෘතියේ ප්‍රධාන භූමිකාවක් වන බව

**2. ව්‍යාපාරික ආධිපත්‍යය හා මාධ්‍ය සංස්කෘතිය:**

- මාධ්‍ය මෙහෙයවන්නේ ව්‍යාපාරික ආධිපත්‍යය විසින් බව
- මාධ්‍ය පවතින්නේ ව්‍යාපාරික ආධිපත්‍යයේ අනුග්‍රහයෙන් බව
- ව්‍යාපාරික අනුග්‍රහයෙන් බැහැර ව මාධ්‍යයට ස්වාධීන පැවැත්මක් නැති බව
- මාධ්‍යයේ සියලු ප්‍රකාශනයන් ව්‍යාපාරික ආධිපත්‍යයේ ආරක්ෂිත සීමාව තුළ පවතින බව
- මාධ්‍ය සංස්කෘතිය තමන්ට අවශ්‍ය පරිදි හැඩ ගැස්වීම ව්‍යාපාරික ආධිපත්‍යය විසින් කරනු ලබන බව
- සමාජීය මනස ව්‍යාපාරික ආධිපත්‍යයට ගැලපෙන පරිදි හැඩ ගැස්වීම මාධ්‍ය විසින් කරනු ලබන බව
- මාධ්‍ය සංස්කෘතියේ ස්වරූපය අනුව එහි ව්‍යාපාරික ආධිපත්‍යය වසන් වී තිබෙන බව හෝ එය ඉතා ආකර්ෂණීය හා සුමට ආකාරයෙන් පවතින බව
- මාධ්‍ය සංස්කෘතිය තමන්ට අවශ්‍ය ලෙස හැඩ ගස්වා ගැනීම සඳහා මාධ්‍ය විශේෂඥයන් මගින් මාධ්‍ය පර්යේෂණ පවත්වන බව

**3. වෙළෙඳ පොළ ව්‍යාප්තිය හා මාධ්‍ය සංස්කෘතිය:**

- වෙළෙඳ පොළේ ව්‍යාප්තිය සඳහා මාධ්‍ය සංස්කෘතිය විශාල සේවයක් ඉටු කරන බව
- මාධ්‍ය සංස්කෘතියට ගොදුරු වන්නන්, තමන් වෙළෙඳ පොළ ව්‍යාප්ති කාර්යයක් ඉටු කරන බව නො දන්නා බව
- වෙළෙඳ පොළ විසින් ව්‍යාප්ත කරනු ලබන මාධ්‍ය සංස්කෘතියට එරෙහි ව ඉදිරිපත් වන සම්ප්‍රදායික සංස්කෘතික මතවාදය සිහින් හඬක් පමණක් බව
- සම්ප්‍රදායික සංස්කෘතික මතවාදය සැම විට ම වෙළෙඳ පොළ ව්‍යාප්තියේ දී නො සලකා හැරිය නො හැකි බව (උදාහරණයක් වශයෙන් ආගමික රූප හෝ සංකේත ආදිය භාණ්ඩ ඇසුරුම්වලට

හෝ ලාංඡන හෝ සඳහා යොදා ගෙන ඉදිරිපත් කිරීමට සම්ප්‍රදායික සංස්කෘතික මතවාදය ඉඩ නො දෙයි. එසේ ම එවැනි සංකල්ප තහවුරු කිරීමට මාධ්‍ය සංස්කෘතිය යොදා ගන්නට වෙළෙඳ පොළ ව්‍යාප්තියේ දී අවකාශ නො ලැබේ. තවත් උදාහරණයක් නම් හලාල් ආහාර පිළිබඳ සලකුණු කිරීම කුමන හෝ රටක ආහාර වෙළෙඳාමේ දී අත්‍යවශ්‍ය වී තිබේ. එසේ නොවුවහොත් වෙළෙඳ පොළ ව්‍යාප්ත කළ නො හැකි ය. මෙය සම්ප්‍රදායික සංස්කෘතියට අයත් ආගමික චින්තාවට මාධ්‍ය සංස්කෘතිය හා වෙළෙඳ පොළ ව්‍යාප්තිය යටපත් වීමකි. )

**4. මාධ්‍ය දැන්වීම්කරණය හා සමාජය:**

- මාධ්‍ය දැන්වීම්කරණය සමාජීය අවශ්‍යතාවක් බව
- මාධ්‍ය දැන්වීම්කරණය ව්‍යාපාරික අවශ්‍යතාවක් බව
- මාධ්‍ය දැන්වීම්කරණය මගින් සමාජීය චර්යාවන් වෙනස් කරනු ලබන බව
- සමාජීය චර්යාවන් යහපත් ලෙස ද, අයහපත් ලෙස ද වෙනස් කරන්නට මාධ්‍ය දැන්වීම්කරණයට හැකි බව
- මාධ්‍ය දැන්වීම්කරණය සෘජු ව්‍යාපාරික අදහස් ඉදිරිපත් කිරීමට ද,

  මහජන සේවාවන් පිළිබඳ අදහස් ඉදිරිපත් කිරීමට ද,

මහජනතාවගේ මතවාදය වෙනස් කිරීමට දේශපාලනික වශයෙන් ද යොදා ගත හැකි බව

- මාධ්‍ය දැන්වීම්කරණය මගින් යම් යම් දේ පිළිබඳ ව සමාජය තුළ සංවාදයක් ගොඩ නංවන්නට හැකි බව
- යම් යම් භාණ්ඩ හෝ සේවා හෝ අදහස් හෝ විශ්වාසයෙන් යුතු ව තෝරා ගැනීමට මාධ්‍ය දැන්වීම්කරණය නිසා මහජනතාවට හැකි බව

# ඉගෙනුම් --- - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා
# ආදර්ශ ක්‍රියාකාරකම්

## 1. මූලික උපදෙස්

මෙම කොටසේ දැක්වෙන්නේ ඉගෙනුම් ---- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි ආදර්ශ ක්‍රියාකාරකම් ය. ඒවා ඒ ආකාරයෙන් ම යොදා ගත යුතු යැයි අපේක්ෂා නො කෙරේ. ගුරු භවතාට අවශ්‍ය පරිදි ඒවායේ යම් යම් වෙනස් කම් කර ගන්නට පුළුවන. එසේ ම එක් එක් නිපුණතා මට්ටම සඳහා දක්වා ඇති පරිදි එක් ක්‍රියාකාරකමක් පමණක් නො සෑහේ. ආදර්ශ ක්‍රියාකාරකම් අධ්‍යයනය කොට ඒ ඒ කාලච්ඡේද සඳහා පන්ති කාමරයේ දී යොදා ගත හැකි වෙනත් ක්‍රියාකාරකම් යෝග්‍ය පරිදි පෙර සූදානම් කර ගෙන පැමිණීම ගුරු භවතා ගේ වගකීමකි. පන්ති කාමරයට පැමිණ පෙර දින අවසාන කළ තැනින් ආරම්භ කිරීම වැනි අසාර්ථක ක්‍රම ගුරු භවතා යොදා නො ගත යුතු ය. සෑම කාලච්ඡේදයක දී ම අලුත් අත්දැකීමක් ලබා ගන්නට සිසු පිරිස තුළ කැමැත්තක් ඇති කළ යුතු අතර ම, එම අලුත් අත්දැකීම ලබා දීමට ගුරු භවතා කටයුතු කළ යුතු ය. එක් එක් කාලච්ඡේදය සඳහා යොදා ගන්නා නව ක්‍රියාකාරකම් පෙර සූදානම් කර ලිපි ගොනුවක රඳවා තැබීමත්, ඒවා යොදා ගත් පසු අවශ්‍ය වෙනස් කම් හෝ සංවර්ධනය කළ යුතු තැන් හෝ පිළිබඳ ව සටහන් කර නැවත ලිපි ගොනුවේ රඳවා තබා ගැනීමත් මගින් එක් වර්ෂයක් තුළ දී මැනවින් සකස් කරන ලද ක්‍රියාකාරකම් පද්ධතියක් රැස් කර ගන්නට ගුරු භවතාට අවකාශය ලැබේ. ගුරු භවතා ගෙ අනන්‍යතාව ආරක්ෂා වන්නේ අනුන් විසින් ලබා දුන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමෙන් නොව, තමන් ගේ ම වූ ක්‍රියාකාරකම් පද්ධතියක් ගොඩ නංවා ක්‍රියාත්මක කිරීමෙනි. මෙම විෂයය දරුවන්ට නැවුම් අත්දැකීමක් ලබා දෙන්නේ, සටහන් කට පාඩම් කිරීමට සැලැස්වීමෙන් නොව, ක්‍රියාකාරී ව ඉගෙන ගන්නට අවකාශ සලසා දීමෙනි.

## 2. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ න්‍යායික පදනම

පන්ති කාමරයේ දී යොදා ගත් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ද, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය ද මෙම විෂය ඉගැන්වීමේ දී බැහැර කරනු ලැබේ. ඒ වෙනුවට යොදා ගන්නේ තොරතුරු මාධ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමයයි.

මෙම ඉගෙනුම් - ඉගැන්වීම් මාදිලිය අනුව ගුරු භවතා මෙන් ම ශිෂ්‍යයා ද තොරතුරු හා මාධ්‍ය පරිහරණය කරයි. සමහර විට ගුරු භවතාට පෙර යම් තොරතුරක් ශිෂ්‍යයාට ලැබෙන්නට පුලුවන. මේ අනුව ගුරු භවතා ශිෂ්‍යයාට වඩා තොරතුරු මාධ්‍ය පරිහරණය කරන්නකු විය යුතු ය. ඒ සමග ම හැකිතාක් තොරතුරු මාධ්‍ය පරිහරණය කරන්නට ශිෂ්‍යයා පෙළඹවිය යුතු ය. විවිධ තොරතුරු සපයා ගත හැකි මූලාශ්‍ර පිළිබඳ ව මග පෙන්වීමක් කළ යුතු ය. විශේෂයෙන් මෙහි දී අන්තර්ජාලය තොරතුරු මාධ්‍යයක් ලෙස බලවත් ව පරිහරණය කළ හැකිය. එයට අමතර ව දිනපතා හා සතිපතා පුවත්පත්, සඟරා, පොත් ආදිය ද, තොරතුරු

රැස් කරනු ලැබූ සංයුක්ත තැටි ද යෝග්‍ය පරිදි පන්ති කාමරය තුළ පරිහරණය කරන්නට හැකි ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කර ගැනීම ගුරු භවතා ගේ වගකීමකි. තොරතුරු මූලාශ්‍ර හඳුනා ගැනීමත්, තොරතුරු රැස් කිරීමත්, තොරතුරු විශ්ලේෂණය කිරීමත් සඳහා ශිෂ්‍යයාට ගුරු භවතා ගේ සහය හා මග පෙන්වීම අවශ්‍ය ය. මෙයින් අදහස් වන්නේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය භාර ගුරු භවතා අලුත් විය යුතු බව ය. එවැනි වෙනස් වීමකට ගුරු භවතා සූදානම් විය යුතු ය.

මෙම වෙනස ඇති කරන්නට ජාතික අධ්‍යාපන ආයතනය ද, අධ්‍යාපන අමාත්‍යාංශය ද අඩු - වැඩි වශයෙන් කටයුතු කරනු ඇත. එසේ වුවත් මෙම වෙනස ඇති කර ගැනීමේ පෞද්ගලික අභිප්‍රායයක් ගුරු භවතා විසින් තමා තුළ ගොඩ නංවා ගත යුතු ය. එසේ ස්ව සංකල්පය වර්ධනය කර ගැනීමෙන් අන්‍යයන්ගේ සහයක් නොමැති ව ම වුව ද තමන් ගේ ගුරු භූමිකාව අලුත් කර ගන්නට අවකාශය සැලසේ.

**විෂය ඒකකය: 1. සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය**

**1.1 නිපුණතා මට්ටම :** සන්නිවේදනය අධ්‍යයනය කිරීම සඳහා එහි විකාශනය, ස්වභාව, නිර්වචන හා සංකල්ප විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** සන්නිවේදනය යනුවෙන් තමන් සිතන්නේ හෝ දන්නේ හෝ කුමක්දැයි ලියන ලෙස ඒකල පැවරුමක් දෙන්න.

**2 වන පියවර:** තිදෙනා බැගින් කණ්ඩායම් කර එක් අදහසක් ගොඩ නංවන්නට උපදෙස් දෙන්න .

**3 වන පියවර:** කණ්ඩායම් විසින් සකස් කළ අදහස කඩදාසියක ලියා බෝඩ් එකේ එල්ලන්න. ඒ ඒ කණ්ඩායමට පැමිණි එම අදහස ප්‍රකාශ කරන්නට සලස්වන්න.

**4 වන පියවර:** ඒ ඒ කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද අදහස්වල ඇති වැදගත් පද හෝ යෙදුම් වෙන් කර බෝඩ් එකේ ලියන්නට එක් සිසුවකුට උපදෙස් දෙන්න.

**5 වන පියවර:** ඒ ඒ පද හෝ යෙදුම් හෝ යොදා ගෙන සන්නිවේදනය පිළිබඳ අදහසක් / නිර්වචනයක් ගොඩ නංවන ලෙස කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

**6 වන පියවර:** එක් එක් කණ්ඩායම් විසින් ගොඩ නංවන ලද අදහස් ප්‍රකාශ කරන්නට ඉඩ දෙන්න.

**7 වන පියවර:** බ්‍රිස්ටල් බෝඩ් එකක පෙර සූදානම් කර ගෙන පැමිණි සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල් නිර්වචනය පන්තිය ඉදිරියේ ප්‍රදර්ශනය කර, එය කියවන්නට සලස්වන්න.

**8 වන පියවර:** තම කණ්ඩායම් විසින් සකස් කර ඇති නිර්වචනය හා ලැස්වෙල් නිර්වචනය අතර ඇති පරතරය හඳුනා ගන්නට ඉඩ දෙන්න.

**9 වන පියවර:** ලැස්වෙල් නිර්වචනය සාකච්ඡා කරන්න.

**10 වන පියවර:** ලැස්වෙල් නිර්වචනය ලියා ගන්නට සලස්වන්න.

**විෂය ඒකකයඃ 1. සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය**

**1.2 නිපුණතා මට්ටම :** සන්නිවේදනයේ මූලිකාංග ආකෘති හා කාර්යයන් විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවරඃ** ලැස්වෙල් නිර්වචනයට අයත් අවස්ථා පහ ලොකු අකුරින් සඳහන් කර පෙර සූදානම් කර ගෙන පැමිණි බෝඩ් පහ පන්තියේ සිසුන් පස් දෙනෙකු අතට දෙන්න.

**2 වන පියවරඃ** බෝඩ් පහ අනු පිළිවෙලින් දැක්වෙන පරිදි පන්තියේ ඉදිරියේ ඒවා ප්‍රදර්ශනය වන සේ පේළියට සිටින්නට උපදෙස් දෙන්න. අනු පිළිවෙල සකස් කර ගැනීම සියලු සිසු දරු දැරියන්ගේ සාකච්ඡාවෙන් සිදු විය යුතු අතර, ගුරු භවතා කිසිදු උපදෙසක් නොදිය යුතුය.

**3 වන පියවරඃ** සිසුන් නිසි පිළිවෙලට බෝඩ් ප්‍රදර්ශනය කළ පසු එක් එක් බෝඩ් එක පිළිබඳ ව සිසුන් ගේ අදහස් විමසන්න.

**4 වන පියවරඃ** එක් එක් බෝඩ් එකට අදාළව සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ වන පාර්ශ්වය නම් කරන්න. (සන්නිවේදකයා, පණිවුඩය, - මාධ්‍යය, - ග්‍රාහකයා, - බලපෑම )

**5 වන පියවරඃ** ඒ එ පාර්ශ්වය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**විෂය ඒකකයඃ 1. සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය**

**1.3 නිපුණතා මට්ටම :** සන්නිවේදනයේ විවිධ වර්ග සංසන්දනාත්මක ව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවරඃ** දෙනෙත් වසා ගෙන, කුඩා කළ සිදු වූ දෙයක් මතක් කර ගන්නට සිසුන්ට කියන්න.

**2 වන පියවරඃ** තමන්ට මතක් වූ දේ ප්‍රකාශ කරන්නට කැමති සිසුන් කිහිප දෙනෙකුට ඉඩ දෙන්න.

**3 වන පියවරඃ** අවුරුදු බොහෝ ගණනකට පෙර සිදු වූ දෙයක් එතෙක් කල් තොරතුරක් ලෙස ගබඩා කර තිබුණේ කොහේදැයි විමසන්න.

**4 වන පියවරඃ** එවැනි තොරතුරු කොපමණක් තමන් ගේ සිතේ ගබඩා කර තිබේදැයි විමසන්න.

**5 වන පියවරඃ** සිතීමේ ක්‍රියාවලිය ඉබේ සිදු වන වේගවත් දෙයක් බව පහදන්න.

**6 වන පියවරඃ** පෑන හෝ අල්පෙනිත්තක් හෝ කඩදාසියක් පෙන්වා ඒ ගැන විනාඩි දෙකක් කතා කරන්නට කැමති කෙනෙකුට ආරාධනා කරන්න.

**7 වන පියවරඃ** කතාව පැවැත්වීමෙන් පසු ඒ ගැන සාකච්ඡා කරන්න. එම අදහස් ගලා ගෙන ආවේ කොහෙන්ද? අදහස් නැති වූයේ නම් ඒ ඇයි? එම අදහස් සිතේ තැන්පත් කර ගත්තේ කෙසේද? මතකයේ රඳවා ගැනීම හා මතක් කිරීම යනුවෙන් ක්‍රියාවන් දෙකක් තිබෙන බව පහදන්න. හැම කෙනෙක් ම තමන්ගේ ම සිත සමග කතා කරන බවත්, සන්නිවේදනය ආරම්භ වන්නේ එතැනින් බවත් පෙන්වා දෙන්න.

**විෂය ඒකකය: 1. සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය**

**1.4 නිපුණතා මට්ටම :** විවිධ සන්නිවේදන විධි සංඥාත්මක ව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** විවාහ මංගල්‍යය උත්සවයක් උදාහරණයට ගෙන සාකච්ඡාව ආරම්භ කරන්න.

**2 වන පියවර:** එහි විවිධ ආකාරයෙන් සන්නිවේදනය සිදු වන බව පැහැදිලි කරන්න.

**3 වන පියවර:** එහි සිදු වන සන්නිවේදනයන් එකක් බැගින් කලු ලෑල්ලේ හෝ සුදු ලෑල්ලේ ලියන්නට හැම කෙනෙකුට ම ඉඩ දෙන්න. එක ම කාරණය එක් වතාවකට වඩා ලිවීමට ඉඩ දෙන්න.

**4 වන පියවර:** ලෑල්ලේ ලියා ඇති සන්නිවේදනයන් සිදු වන විධි සාරාංශ කරන්නට සිසුනට කියන්න. එහි දී එක් වතාවකට වඩා වැඩියෙන් ලියා ඇති දේ මකා දමන්න.

**5 වන පියවර:** ළමුන් ලියා ඇති දේ පිළිවෙළකට පෙළ ගස්වා ලෑල්ලේ ලියන්නට සිසුන් කිහිප දෙනෙකුට ඉඩ දෙන්න. අවශ්‍ය මග පෙන්වීම් කරන්න.

**6 වන පියවර:** එක් එක් සන්නිවේදන විධි පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න. ඒ සෑම විධියක් ම මානව සමාජයේ සන්නිවේදන අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගන්නා ඒවා බව පැහැදිලි කරන්න.

**විෂය ඒකකය: 2. සන්නිවේදනය හා සමාජය**

**2.1 නිපුණතා මට්ටම:** සමාජයේ ප්‍රභවය හා විකාශනය ද සමාජ සංයුතිය ද අර්ථ දක්වමින් සමාජීය බල තුලනය හා එහි ඥාන ගවේෂණයේ ස්වභාවය ද විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** රයිඩර් හැගාර්ඩ් විසින් ලියා ඇති අප්‍රිකානු ජීවිතය දැක්වෙන රත්නාගාරය වැනි නවකතා පොතක් පන්තියට රැගෙන යන්න. එය පන්තියට පෙන්වා එම පොත කියවා ඇත්දැයි විමසන්න. එහි කතාව පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න. එහි කතාව තුළ අප්‍රිකානු වනය තුළ ඇති පුරාණ ගම්මාන පිළිබඳ ව විවිධ විස්තර දක්වා ඇති බව පැහැදිලි කරන්න.

**2 වන පියවර:** නවකතාවේ ප්‍රධාන චරිතය වන ක්වාටර්මේන් ගෝත්‍රික මිනිසුන් විසින් අල්ලා ගනු ලැබ සිරකරුවකු මෙන් රැගෙන යාම විස්තර කෙරෙන ඡේදයක් පන්තිය ඉදිරියේ කියවන්නට සිසුවෙකුට / සිසුවියකට ඉඩ දෙන්න. එක් වරක් මදි වුවහොත් දෙවරක් කියවන්න සලස්වන්න.

**3 වන පියවර:** එම ඡේදය අනුව කල්පනා කරමින් එම ගෝත්‍රික සමාජයේ කෙබඳු ලක්ෂණ තිබෙන්නට ඇත්දැයි සිතන්නට සිසුන්ට ඉඩ දෙන්න. තිදෙනාගේ හෝ පස් දෙනාගේ හෝ කණ්ඩායම් වශයෙන් එම ලක්ෂණ ඩිමයි කඩදාසියක ලියන්නට සලස්වන්න. ලියා අවසාන වූ පසු එම කඩදාසි පන්තියේ ඉදිරිපිට ප්‍රදර්ශනය කරන්න.

**4 වන පියවර:** එම අදහස් සමස්තයක් වශයෙන් සාකච්ඡා කරමින්, වනාන්තරයේ ජීවත් වූ මානවයා එවැනි ගෝත්‍රික සමාජයක් බවට පත් වූ ආකාරයත්, එම ගෝත්‍රික සමාජය නූතන

සමාජය දක්වා වර්ධනය වීමේ දී ඇති වී තිබෙන වර්ධනයන් ද සාකච්ඡා කරන්න. ඒවා ලෑල්ලේ අංක වශයෙන් දක්වන්නට සිසුන්ට ඉඩ දෙන්න.

**විෂය ඒකකය: 2. සන්නිවේදනය හා සමාජය**

**2.2 නිපුණතා මට්ටම:** සන්නිවේදනය හා සමාජය අතර සම්බන්ධතාව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** මෙයට වසර සිය ගණනකට පෙර සිදු වූ මුහුද ගොඩ ගැලීම හා විහාර මහා දේවියගේ කතාව පන්තියේ සාකච්ඡා කරන්න. ඉන් පසු මෑතක සිදු වූ සුනාමි ව්‍යසනයේ දී සිදු වූ මුහුද ගොඩ ගැලීම ගැන ද සාකච්ඡා කරන්න.

**2 වන පියවර:** පන්තිය කණ්ඩායම් දෙකකට බෙදන්න.

**පළමුවන කණ්ඩායම:** කැලණියේ මුහුද ගොඩ ගැලීමේ දී එම තොරතුර රට පුරා පැතිර ගිය ආකාරය

**දෙවන කණ්ඩායම:** සුනාමි ව්‍යසනයේ දී එම තොරතුර රට පුරා පැතිර ගිය ආකාරය

භූමිකා රංගන දෙකකින් රඟ දක්වන්නට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න. කණ්ඩායමේ සියලු දෙනා ම කුමන ආකාරයකින් හෝ භූමිකා රංගනයට දායක විය යුතු බව දන්වන්න.

**3 වන පියවර:** භූමිකා රංගන රඟ දක්වන්නට ඉඩ දෙන්න. එක් කණ්ඩායමක් භූමිකා රංගනය ඉදිරිපත් කරන විට, ඔවුන් විසින් යොදා ගන්නා සන්නිවේදන කාර්යයන් අනෙක් කණ්ඩායම වාර්තා කළ යුතු ය.

**4 වන පියවර:** එක් එක් කණ්ඩායම් භාවිත කළ සන්නිවේදන කාර්යයන් ලෑල්ලේ ලැයිස්තු ගත කරන්න.

**5 වන පියවර:** මුල් අවස්ථාවේ යොදා ගත් සමහර සන්නිවේදන කාර්යයන් දෙවන අවස්ථාවේ දී ද යොදා ගෙන ඇති බවත්, සමහර සන්නිවේදන කාර්යයන් දෙවන අවස්ථාවේ දී පමණක් යොදා ගෙන ඇති බවත් සාකච්ඡා කරන්න.

**6 වන පියවර:** තවත් අවුරුදු සියයකින් පසු මේ ක්‍රියාකාරකම කරනු ලැබුවේ නම්, එයට එක් කරන්නට සිදු වන නව සන්නිවේදන කාර්යයන් කෙබඳු විය හැකිදැයි සාකචඡා කරන්න. සිසුන්ගෙන් ඉදිරිපත් වන නව අදහස් ලෑල්ලේ දක්වන්න.

**විෂය ඒකකය: 2. සන්නිවේදනය හා සමාජය**

**2.3 නිපුණතා මට්ටම:** සන්නිවේදනයේ සමාජීය භූමිකාව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (විනාඩි 30 යි.)**

**1 වන පියවර:** මහදැනමුත්තා පිටරට යන්නට විදේශ ගමන් බලපත්‍රයක් ගන්නට පැමිණි බවට අලුත් කතන්දරයක් ගොඩ නංවන්න. එය පන්තියට ඉදිරිපත් කරන්න. එම ගමන සිදු වූ ආකාරය සිසුන් සමග ගොඩ නංවන්න.

**2 වන පියවර:** මහදැනමුත්තාගේ ගමනේ ඒ ඒ අවස්ථා කිහිපයක් වෙන් කර ගන්න.

(1) ගෝලයන්ගෙන් සමුගැනීම
(2) බස් රියේ පැමිණීම

(3) ආපන ශාලාවකින් තේ බීම
(4) ඡායාරූපය ගැනීම
(5) විදේශ ගමන් බලපත්‍රය ලබා ගැනීම

**3 වන පියවර:** එක් එක් අවස්ථාව කෙටියෙන් භූමිකා රංගනයක් ලෙස ඉදිරිපත් කරන්නට සිසු කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

**4 වන පියවර:** ඒ ඒ අවස්ථාවල දී මහදැනමුත්තාගේ භූමිකාව වෙනස් වූ ආකාරය සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** එක් එක් භූමිකා රංගනය අනුව එකිනෙකාගේ දෛනික ජීවිතයේ විවිධ අවස්ථාවන් ද දැක්විය හැකි බව සාකච්ඡා කරන්න.

**6 වන පියවර:** පුද්ගලයකුගේ දෛනික ජීවිතයේ සැම අවස්ථාවකදීම සන්නිවේදනය යොදා ගන්නා බවත්, එයින් බැහැරව කිසිවක් කළ නොහැකි බවත් දක්වන්න.

**විෂය ඒකකය: 2. සන්නිවේදනය හා සමාජය**

**2.4 නිපුණතා මට්ටම:** ගෝලීයකරණය හා සන්නිවේදන ප්‍රවණතා විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (විනාඩි 30 යි.)**

**1 වන පියවර:** සතියේ දිනපතා හෝ සතිපතා හෝ පුවත්පත් කිහිපයක් පන්තියට ගෙන යන්න. එක් එක් පුවත්පත සිසු කණ්ඩායම්වලට බෙදා දෙන්න.

**2 වන පියවර:** එම පුවත්පත්වල ඇති පුවත් හා ලිපි අධ්‍යයනය කරමින්, ඒවා ලෝකය සමග සම්බන්ධ වන ආකාරය, නව දැනුම ඉදිරිපත් කිරීමට යොදා ගෙන ඇති ආකාරය, විවිධ විරුද්ධ මත දැක්වීම් හා එකඟ වීම්, පාඨකයන් මාධ්‍යයට මැදිහත් වීම් ආදී විවිධ ශීර්ෂයන් යටතේ අදහස් දක්වන්නට එම කණ්ඩායම්වලට ඉඩ දෙන්න.

**3 වන පියවර:** ජනයාට මේ ආකාරයෙන් ගෝලීය තොරතුරු ලබා ගැනීමෙන් තොර ව ජීවත්විය හැකිද? නොහැකිද? යන ප්‍රශ්නය සිසුන්ට ඉදිරිපත් කර විවාද කරන්න.

**විෂය ඒකකය: 3. සන්නිවේදන කුසලතා හා නිපුණතා**

**3.1 නිපුණතා මට්ටම:** අන්තර්වර්තී පුද්ගල නිපුණතා භාවිතයට ගනියි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 15 යි.)**

**1 වන පියවර:** අයිසෙක් නිව්ටන් විසින් ගුරුත්වාකර්ෂණය සොයා ගැනීමේ සිද්ධිය රසවත් ලෙස සිසුනට ඉදිරිපත් කරන්න.

**2 වන පියවර:** අයිසෙක් නිව්ටන්ගේ භූමිකාව රඟ දක්වන්නට සිසුවකුට ආරාධනා කරන්න.

**3 වන පියවර:** සිසුවාගේ භූමිකා රංගනය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**4. වන පියවර:** අයිසෙක් නිව්ටන් තමන්ගේ සිත සමග ම කතා කරමින් තර්ක කරන ලද ආකාරය පහදන්න. එහි දී නිව්ටන් විසින් ගොඩ නංවන ලද්දේ තාර්කික චින්තනය බවත්,

ඔහුට ඒ සඳහා ප්‍රයෝජනවත් වූයේ ඔහු ගේ සිතේ එතෙක් රැස් කර තිබූ තාර්කික තොරතුරු බවත්, අප ද මෙවැනි බොහෝ දේ නිරන්තරයෙන් දකින නමුත් ඒ පිළිබඳ ව තර්ක නොකරන බවත්, තමන්ගේ සිත සමගම කතා කිරීමෙන් බොහෝ වටිනා අදහස් ගොඩ නංවා ගත හැකි බවත් සාකච්ඡා කරන්න.

**විෂය ඒකකය: 3. සන්නිවේදන කුසලතා හා නිපුණතා**

**3.2 නිපුණතා මට්ටම**: අන්තර් පුද්ගල නිපුණතා ප්‍රකට කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** පහත සඳහන් අවස්ථාව පන්තියට ඉදිරිපත් කරන්න.
එක් වයස්ගත කාන්තාවක / පිරිමියකු බස් නැවතුමක සිටින අනෙක් අය සමග කුමක් හෝ කියන්නට උත්සාහ ගනියි. එහෙත් අනෙක් මගීන්ට මෙම තැනැත්තා පිළිබඳ ව අවධානයක් නැත. එම තැනැත්තා කියන්නට උත්සාහ ගන්නේ කුමක්දැයි අනෙක් අය දන්නේ නැත.

**2 වන පියවර:** මෙම අවස්ථාව භූමිකා රංගනයකින් ඉදිරිපත් කරන්නට කණ්ඩායම් තුනකට උපදෙස් දෙන්න. එක් කණ්ඩායමක් මෙම භූමිකා රංගන නිරීක්ෂණය කරමින් අවසානයේ ඒ පිළිබඳ ව අදහස් ඉදිරිපත් කළ යුතු බව දන්වන්න.

**3 වන පියවර:** භූමිකා රංගනවල දී පහත සඳහන් ස්වභාවයන් ඉදිරිපත් වූ ආකාරය ද, එක් එක් කණ්ඩායම්වල එම ස්වභාවය වෙනස් වූ ආකාරය ද සාකච්ඡා කරන්න.

- එකිනෙකා කතා කළ ආකාරය
- අනෙක් අය සවන් දුන් ආකාරය
- වයස්ගත තැනැත්තාගේ ගැටලුව කෙරෙහි අනෙක් අය සංවේදී වූ ආකාරය
- ඔවුනොවුන්ගේ හැසිරීම්වල තිබූ ආචාරශීලීභාවය

**4 වන පියවර:** සෑම කෙනෙකු ගේ ම දෛනික ජීවිතයේ දී අන්‍යයන් සමග ඵලදායී ලෙස සන්නිවේදන ගනුදෙනුවක යෙදෙන්නට හැම කෙනෙකුට ම සිදු වන බවත්, ඒ සඳහා නිපුණතා නොමැති වුවහොත්, සමාජයේ පැවැත්මක් නොමැති බවත් තහවුරු කරන්න.

**විෂය ඒකකය: 3. සන්නිවේදන කුසලතා හා නිපුණතා**

**3.3 නිපුණතා මට්ටම:** සමූහ සන්නිවේදන නිපුණතා ප්‍රකට කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** පහත සඳහන් අවස්ථාව සිසුන්ට ඉදිරිපත් කරන්න.
අලුත් ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය සඳහා අනුමැතිය ලබා දීමට එක්තරා රූපවාහිනී ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා ඇත. අධ්‍යක්ෂවරුන්ගෙන් කිහිප දෙනෙක් මෙම ටෙලි නාට්‍යය නිෂ්පාදනය කරනවාට එකඟ නැත. එයට හේතුව එම ටෙලි නාට්‍යයේ අන්තර්ගතය සමාජයට හිතකර නොවීමයි. සමාජයට අහිතකර දේ ඉදිරිපත් කර මුදල් සෙවීම මෙම රූපවාහිනී ආයතනයේ යුතුකම නොවේ යැයි ඔවුහු අදහස් දක්වති. තවත් කිහිප දෙනෙක් පවසන්නේ මෙම ටෙලි නාට්‍යය නරඹන්නන් අතර ඉතා ජනප්‍රිය විය හැකි අතර, ඒ නිසා රූපවාහිනී ආයතනයට විශාල ආදායමක් වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය කිරීමෙන් උපයා ගත හැකි බව ය. මේ

සාකච්ඡාව අවසන් වන්නේ තීරණයක් ගැනීම පසුවට කල් තබමිනි.

**2 වන පියවර:** මෙම අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාව ඉදිරිපත් කරන්නට සිසු කණ්ඩායමකට පවරන්න. කණ්ඩායමක් දහ දෙනෙකු පමණ විය හැකි ය. කැමති නම් කණ්ඩායම් දෙකක් මේ සඳහා යෙදවිය හැකි ය.

**3 වන පියවර:** අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම හොඳින් නිරීක්ෂණය කරන්නට අනෙක් සිසුන්ට කියන්න.

**4. වන පියවර:** සාකච්ඡාව අවසානයේ දී තම තමන්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කරන්නට අනෙක් සිසුන්ට ඉඩ දෙන්න.

**5 වන පියවර:** සිසුන්ගේ නිරීක්ෂණ මත පදනම් ව අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාව පිළිබඳ ව අදහස් දක්වන්න.

**6 වන පියවර:** එම සාකච්ඡාවේ පහත සඳහන් අංග කෙරෙහි අවධානය යොමු කරන්න.

- අධ්‍යක්ෂ මණ්ඩලයේ කණ්ඩායම් හැඟීම හා වගකීම
- තීරණ ගැනීමේ සාමූහික වගකීම පිළිබඳ ව සාමාජිකයන් දැරූ ආකල්පය
- සම්මුඛ සාකච්ඡාව පැවති ආකාරය
- අන්‍යයන්ට කතා කරන්නට ඉඩ දීම
- අන්‍යයන්ගේ මතයට ඉඩ දීම
- ආචාරශීලීභාවය

**විෂය ඒකකය: 3. සන්නිවේදන කුසලතා හා නිපුණතා**

**3.4 නිපුණතා මට්ටම:** සන්නිවේදනය සඳහා විවිධ උපකරණ භාවිත කිරීමේ නිපුණතා ප්‍රකට කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි. )**

**1 වන පියවර:** විවිධ සන්නිවේදන උපකරණවල ඡායාරූප පෙර සූදානම් කර ගෙන පන්තියට ගෙන ගොස් ලෑල්ලේ ප්‍රදර්ශනය කරන්න. / නැතිනම් එවැනි ඡායාරූප රැගෙන එන්නට කල් ඇති ව සිසුනට දැනුම් දෙන්න. එසේ ගෙන ආ ඡායාරූප පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

**2 වන පියවර:** එක් එක් උපකරණයක් බැගින් තෝරා ගෙන ඒ පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරන්නට සිසු කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

**3 වන පියවර:** සරල හා ප්‍රයෝජනවත් උපකරණයක් වශයෙන් ඕවර්හෙඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය යොදා ගත හැකි බව පහදන්න.

**4 වන පියවර:** පන්ති කාමරයේ දී ඕවර්හෙඩ් ප්‍රක්ෂේපණ යන්ත්‍රය සඳහා විනිවිදක පත්‍ර නිර්මාණය කිරීමට අවශ්‍ය සැලැස්මක් තනි තනි ව කඩදාසියක නිර්මාණය කරවන්න.

**විෂය ඒකකය: 4. භාෂාව හා ජනමාධ්‍ය භාවිතය**

**4.1 නිපුණතා මට්ටම:** භාෂාවේ ස්වභාවය, එහි භාවිතය හා භාෂාවේ සන්නිවේදන භූමිකාව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** කල් ඇතිව සූදානම් කර ගත් ගුවන් විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශන කිහිපයක් සිසුන්ට ඇසෙන්නට සලස්වන්න. (එම ගු-වන් විදුලි ප්‍රවෘත්තිවලට ස්වදේශීය සේවයේ ප්‍රවෘත්ති ප්‍රකාශය ද අනිවාර්යයෙන් ඇතුළත් කළ යුතුය.)

**2 වන පියවර:** ස්වදේශීය සේවයේ ප්‍රවෘත්ති ප්‍රකාශය අනෙක් ගුවන් විදුලි සේවාවන්හි ප්‍රවෘත්ති ප්‍රකාශයන් සමග සසඳමින් අගැයීමක් කරන්නට සිසුන්ට අවකාශ සලසා දෙන්න. ඔවුනට නිදහසේ අදහස් ඉදිරිපත් කරන්නට ඉඩ දිය යුතුය.

**3 වන පියවර:** එක් එක් ග--ුවන් විදුලි සේවාවන්හි භාෂා භාවිතය අනුව සම්මතය හා අසම්මතය පිළිබඳ අදහස් ගොඩ නංවන්නට සිසුනට ඉඩ දෙන්න.

**4 වන පියවර:** භාෂාවක් ජාතියක අනන්‍ය ලක්ෂණයක් ලෙස සැලකිය හැකි ද? යන්න පිළිබඳ ව මතයක් සිසුන් සමග සාකච්ඡා කරමින් ගොඩනංවන්න.

**විෂය ඒකකය: 4. භාෂාව හා ජනමාධ්‍ය භාවිතය**

**4.2 නිපුණතා මට්ටම:** භාෂාවෙහි විවිධ භාවිතයන් සංසන්දනාත්මක ව දක්වයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** අන්දරේ සීනි කෑ හැටි ජන කතාව තමන්ගේ ප්‍රබන්ධයක් ලෙස නිර්මාණාත්මක ව ලියන්නට සිසුන්ට පවරන්න. අභ්‍යාස පොතක පිටුවක් සෑහේ.

**2 වන පියවර:** කැමති සිසුන් දෙදෙනෙකු පන්තියේ ඉදිරියට ගෙන්වන්න. එක් අයෙකු විසින් කතාව කියනු ලබන අතර, අනෙක් සිසුවා අසා සිටී. අසන්නා ද විවිධ ප්‍රශ්න අසමින් හා අදහස් පළ කරමින් එම භාෂණයට සහභාගි වෙයි.

**3 වන පියවර:** මුලු පන්තියට ම කතාව කියන්නට කැමති කෙනෙකුට එයට ඉඩ දෙන්න.

**4 වන පියවර:** අසන්නන්ගේ මනසෙහි අදාළ රූප නිර්මාණය වූයේ ද? ඉදිරිපත් කිරීමේ දී කථකයා විසින් රූපණය භාවිත කරනු ලැබුවේ ද? යන්න පිළිබඳ ව සිසුන්ගේ අදහස් විමසන්න.

**5 වන පියවර:** අන්දරේ සීනි කෑ හැටි ජන කතාව පිළිබඳ ව විවරණයක් කරන්නට සිසුවකුට ඉඩ දෙන්න.

**6 වන පියවර:** එකම කතාව එක් එක් ආකාරයෙන් ඉදිරිපත් කිරීමේ දී භාෂාව විවිධාකාරයෙන් භාවිත වූ බව සිසුන් සමග සාකච්ඡා කරන්න. එසේ විවිධාකාරයෙන් භාෂාව භාවිත වීම අත්‍යවශ්‍ය කරුණක් බව ද පහදා දෙන්න.

**විෂය ඒකකය: 4. භාෂාව හා ජනමාධ්‍ය භාවිතය**

**4.3 නිපුණතා මට්ටම:** විවිධ මාධ්‍යයන්ට අදාළ ව භාෂාව හැසිරවීමේ ක්‍රම විධි හා රටා සංසන්දනාත්මක ලෙස අන්හඳා බලයි.

**1 වන ක්‍රියාකාරකම (විනාඩි 15 යි.)**

**1 වන පියවර:** රූපවාහිනියෙන් ගීත ඉල්ලන එස්.එම්.එස් පණිවුඩයක් ලෑල්ලේ ලියන්නට සිසුවකුට පවරන්න.

**2 වන පියවර:** ඒ ආකාරයෙන් රෝම අකුරු යොදා වෙනත් භාෂාවක පණිවුඩයක් ලිවීමේ යෝග්‍යතාව හෝ අයෝග්‍යතාව පිළිබඳ ව සිසුන් ගේ අදහස් විමසන්න.

**3 වන පියවර:** නව මාධ්‍ය තාක්ෂණය නිසා ලෝකයේ භාෂා භාවිතයට ඇති වී තිබෙන අභියෝග පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**4 වන පියවර:** ඉංග්‍රීසි භාෂාව හැර වෙනත් භාෂා ද තම ලේඛන කටයුතු සඳහා රෝම අකුරු භාවිත කරන බවත්, ඔවුන්ට නව මාධ්‍ය තාක්ෂණය නිසා අභියෝගයක් මතු වී නැති බවත්, තමන්ගේම අක්ෂර භාවිත කරන ජාතීන්ට තම භාෂාවේ අනන්‍යතාව සඳහා අභියෝග මතු වී ඇති බවත් සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** අන්තර්ජාලයේ විද්‍යුත් තැපෑලෙන් විදේශ රටක සිටින ශ්‍රී ලාංකික මිතුරකුට යැවීම සඳහා ශ්‍රී ලංකාවේ විශේෂ ප්‍රවෘත්තියක් රෝම අකු-රු යොදා ගෙන තනි තනි ව ලියන්නට පවරන්න.

**6 වන පියවර:** ඒ ඒ සිසුන් ගේ ලේඛනය අනෙක් අයට හුවමාරු කර ගෙන කියවන්නට සලස්වන්න.

**විෂය ඒකකය: 4. භාෂාව හා ජනමාධ්‍ය භාවිතය**

**4.4 නිපුණතා මට්ටම:** ජනමාධ්‍යයේ භාෂා භාවිතයේ ප්‍රබලතා, දුබලතා හා සීමා තුලනාත්මක ව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** දිනපතා පුවත්පත් කිහිපයක් පන්තියට රැගෙන යන්න.

**2 වන පියවර:** ඒ ඒ පුවත්පත්වල මුල පිටුවේ ඇති ප්‍රධාන ප්‍රවෘත්තියේ ශීර්ෂ පාඨ ලෑල්ලේ ප්‍රදර්ශනය වන සේ අල්ලා ගෙන සිටින්නට සිසුන් කිහිප දෙනෙකුට කියන්න.

**3 වන පියවර:** ඒ ඒ ශීර්ෂ පාඨවල නිර්මාණශීලී ස්වභාවය පිළිබඳ ව සිසුන්ගේ අදහස් ලබා ගන්න.

**4 වන පියවර:** එම ශීර්ෂ පාඨ පුවත්පත් පාඨකයන් ගේ සිත් කොතරම් ආකර්ෂණිය කරන්නේ දැයි සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** එම ප්‍රවෘත්ති හා ශීර්ෂ පාඨ ප්‍රාදේශීය ව්‍යවහාරය අනුව නැවත ලියන්නට ඒකල පැවරුමක් සිසුන්ට දෙන්න.

**6 වන පියවර:** පැවරුම් කිහිපයක් පමණක් පන්තිය ඉදිරියේ කියවන්නට සලස්වන්න.

**7 වන පියවර:** ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයන් ජාතික මට්ටමේ ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීමට යොදා ගත නොහැකි බව සාකච්ඡා කරන්න.

**විෂය ඒකකය: 5. මහජන සම්බන්ධතාව**

**5.1 නිපුණතා මට්ටම:** ශ්‍රී ලාංකික සුවිශේෂතා පාදක කර ගනිමින්, මහජන සම්බන්ධතා කෙබඳුදැයි විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** අලුත් අවුරුදු / රාමසාන් / තයිපොංගල් / නත්තල් වැනි උත්සව දිනයක නිවසකට ගොඩ වන හිතවතුන් පිළිගන්නා ආකාරය දැක්වෙන කෙටි භූමිකා රංගන කිහිපයක් ඉදිරිපත් කරන්නට සිසුන්ට අවස්ථාව දෙන්න.

**2 වන පියවර:** අමුත්තන් පිළිගැනීම සඳහා ගෙහිමියන් කටයුතු කළ ආකාරය, භාවිත කරන ලද ආමන්ත්‍රණ, යෙදුම්, ඉඟි ආදිය පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.

**3 වන පියවර:** පැරණි සමාජයෙහි නිවාසවල ඉදිරිපස කොටස අමුත්තන් සඳහා වෙන් කර සකස් කර තිබූ ආකාරය සාකච්ඡා කරන්න.

**4 වන පියවර:** අමුත්තන් පිළිගැනීමේ විවිධ චාරිත්‍ර වාරිත්‍රවල තිබුණේ මහජන සම්බන්ධතා ලක්ෂණ බව පෙන්වා දෙන්න.

**5 වන පියවර:** නිවසට පැමිණෙන අමුත්තන් පිළිගැනීම සඳහා විවිධ අවස්ථාවල යොදා ගන්නා චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ ව සාකච්ඡා කරන්න. සාම්ප්‍රදායික ජන සමාජයෙහි එයට ලැබී තිබුණු වැදගත්කම පෙන්වා දෙන්න.

**විෂය ඒකකය: 5. මහජන සම්බන්ධතාව**

**5.2 නිපුණතා මට්ටම:** මහජන සම්බන්ධතා සඳහා යොදා ගත හැකි විවිධ මෙවලම් හා විධි අත්හදා බලයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** පාසල් මාධ්‍ය දින උත්සවයේ තෑගි සහ සහතික පත් , ප්‍රදර්ශනය පැවැත්වීම, ඡායාරූප ගැනීම, සංග්‍රහ කටයුතු , ශබ්ද විකාශන උපකරණ, වේදිකාව නිර්මාණය, පෝස්ටර් හා බැනර්, ආදී විවිධ කාර්යයන් සඳහා අනුග්‍රාහකයන් වීමට කැමති ව්‍යාපාරිකයන් ලෙස සිසුන් කිහිප දෙනෙකු තෝරා ගන්න.

**2 වන පියවර:** පාසල් මාධ්‍ය සමාජයේ නිලධාරි මණ්ඩලය වශයෙන් තවත් සිසුන් කිහිප දෙනෙකු තෝරා ගන්න.

**3 වන පියවර:** අනෙක් සිසුන් සියල්ල නිරීක්ෂකයන් වශයෙන් තෝරා ගන්න.

**4 වන පියවර:** අනුග්‍රාහක ව්‍යාපාරිකයන් සමග සාකච්ඡාව පවත්වන්න. මූලික කොන්දේසි පිළිබඳ එකඟතාවකට පැමිණෙන්න. ව්‍යාපාරිකයන්ගේ කොන්දේසි ද සාකච්ඡාවට ගන්න. මාධ්‍ය සමාජයට වඩා වාසිදායක වන ආකාරයෙන් එකඟතාවකට පැමිණෙන්න.

**5 වන පියවර:** මෙම සාකච්ඡාව පිළිබඳ ව නිරීක්ෂකයන්ගේ අදහස් පන්තියට ඉදිරිපත් කරවන්න.

**6 වන පියවර:** මහජන සම්බන්ධතා කාර්යයෙහි දී අනුග්‍රාහකත්වයේ ඇති වැදගත් කම හා අනුග්‍රාහකයන් එසේ අනුග්‍රහය දක්වන්නේ එයින් තම කීර්ති නාමයට ද වාසියක්

අත්පත් වන නිසා හෝ තම ව්‍යාපාරික කාර්යයන්ට වාසියක් අත්පත් වන නිසා බව සාකච්ඡා කරන්න.

**විෂය ඒකකය: 5. මහජන සම්බන්ධතාව**

**5.3 නිපුණතා මට්ටම:** මහජන සම්බන්ධතා සඳහා විවිධ නිපුණතා ප්‍රකට කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

1 **වන පියවර:** දිනපතා පුවත්පත් කිහිපයක් පන්තියට බෙදා දෙන්න.

**2 වන පියවර:** සිසුන් කණ්ඩායම් වශයෙන් පුවත් පත කියවමින් උත්සව, විවෘත කිරීම්, ත්‍යාග ප්‍රදානයන්, තරග පැවැත්වීම ආදී විවිධ කාර්යයන් පිළිබඳ ව පුවත්පතේ පළ වී ඇති වාර්තා හඳුනා ගන්නට සලස්වන්න.

**3 වන පියවර:** එක් කණ්ඩායමක් එක ප්‍රවෘත්තියක් බැගින් පන්තියේ සියල්ලන්ට ඇසෙන සේ කියවන්න.

**4 වන පියවර:** පාසල් මාධ්‍ය සමාජයේ ඉදිරියට ක්‍රියාත්මක වන හෝ ක්‍රියාත්මක වූ හෝ විශේෂ අවස්ථාවක් හෝ විශේෂ කාර්යයක් හෝ පිළිබඳ ව මාධ්‍යයට වාර්තාවක් යැවීමේ වැදගත් කම සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** තෝරා ගත් එක් කාර්යයක් හෝ අවස්ථාවක් හෝ පිළිබඳ ව මාධ්‍ය නිවේදනයක් සම්පාදනය කරන්නට සිසුන්ට පවරන්න.

**6 වන පියවර:** එක් එක් කණ්ඩායම් විසින් සකස් කරන ලද මාධ්‍ය නිවේදන සියල්ල ලෑල්ලේ එල්ලන්නට සලස්වන්න. සියල්ලන්ට ම ලෑල්ල ඉදිරිපිටට පැමිණ ඒවා කියවන්නට ඉඩ දෙන්න.

**7 වන පියවර:** කණ්ඩායම්වල නිවේදන සියල්ල එක් කර ගනිමින්, එක් නිවේදනයක් සකස් කර ගන්න. එය සියල්ලන්ට ලියා ගන්නට සලස්වන්න.

**8 වන පියවර:** මෙම නිවේදනය මාධ්‍යයට තැපැල් කිරීම සඳහා සියලු මාධ්‍යයන්ගේ ලිපිනයන් ලැයිස්තුවක් සකස් කර ගෙන එන්නට ගෘහ පැවරුමක් දෙන්න.

**විෂය ඒකකය: 5. මහජන සම්බන්ධතාව**

**5.4 නිපුණතා මට්ටම:** මහජන සම්බන්ධතා වැඩ සටහනක් සඳහා සැලසුම් සම්පාදනය කිරීමේ පියවර අත්හදා බලයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** පාසල් මාධ්‍ය උලෙළක් පැවැත්වීම පිළිබඳව අදහස් විමසන්න.

**2 වන පියවර:** එම උලෙළට සම්බන්ධ කර ගත යුතු හා අවධානය යොමු කරවා ගත යුතු පිරිස කවුරුන්දැයි ලෑල්ලේ ලිවීමට සිසුන්ට ඉඩ දෙන්න.

**3 වන පියවර:** එම උලෙළ සඳහා ප්‍රධාන ආරාධිතයන් ගෙන්වා ගැනීමට අවශ්‍ය ද? නැද්ද? යන්න තීරණය කරන්නට සිසුන්ට ඉඩ දෙන්න. ප්‍රධාන ආරාධිතයන්ගේ ඇති ප්‍රයෝජනය

කුමක් ද? යන්න සාකච්ඡා කරන්න.

**4 වන පියවර:** පාසල් මාධ්‍ය උලෙලේ දී ප්‍රදේශයේ සිටින ප්‍රවීණ මාධ්‍යකරුවන්ට ඇගයුම් සම්මාන පිරිනැමීම කොතරම් ප්‍රයෝජනවත් ද? යන්න සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** එසේ අගැයුම් සම්මාන පිරිනැමිය යුත්තේ කාටදැයි පස් දෙනෙකු ගේ ලැයිස්තුවක් සකස් කරවන්න.

**6 වන පියවර:** එම ලැයිස්තුවේ ඇතුළත් පස් දෙනා පිළිබඳ තොරතුරු සපයා ගෙන එන්නට පැවරුමක් දෙන්න.

**විෂය ඒකකය: 6. මාධ්‍ය සංස්කෘතිය**

**6.1 නිපුණතා මට්ටම:** මාධ්‍ය සංස්කෘතියේ ස්වභාවය, අවශ්‍යතාව හා විකාශනය විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** නූතන තරුණ පරපුරෙහි කැපී පෙනෙන චර්යාවන් කිහිපයක් ලෑල්ලේ ලියන්නට සලස්වන්න.

**2 වන පියවර:** ඒ එක් එක් චර්යාවන් තරුණ පරපුරට වැදගත් වන්නේ කුමක් නිසාදැයි සාකච්ඡා කරන්න.

**3 වන පියවර:** ඒ එක් එක් චර්යාවන් තරුණ පරපුර වෙත ගෙන ආවේ කුමන ප්‍රවාහයක් ඔස්සේදැයි සාකච්ඡා කරන්න. එම ප්‍රවාහය ජනමාධ්‍ය බව තහවුරු කරන්න.

**4 වන පියවර:** එවැනි චර්යාවන් තරුණ පරපුර තුළ ස්ථාපිත කරන්නට ජනමාධ්‍යවලට අවශ්‍ය වූයේ කුමක් නිසා දැයි සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** ජනමාධ්‍ය පිටුපස සිටින ව්‍යාපාරික ප්‍රජාව විසින් තරුණ පරපුරේ චර්යාව හසුරුවන්නේ ව්‍යාපාරික අරමුණු ඉටු කර ගැනීම සඳහා බව තහවුරු කරන්න.

**6 වන පියවර:** ජනමාධ්‍ය ඔස්සේ එන විවිධ චර්යාවන් ඉතා ආකර්ෂණීය බවත්, ඒවා ප්‍රතික්ෂේප කළ නොහැකි ආකාරයෙන් ඉදිරිපත් වන බවත් සාකච්ඡා කරන්න.

**7 වන පියවර:** සමාජ චර්යා තීරණය කිරීමේ දී ආගම, අධ්‍යාපනය, සම්ප්‍රදාය, සිරිත් විරිත් ආදියට වඩා මාධ්‍ය බලවත් බව තහවුරු කරන්න.

**8 වන පියවර:** ජන ජීවිතය හැසිරවීමේ වැඩි බලය මාධ්‍ය විසින් අත්පත් කර ගැනීම නිසා මාධ්‍ය සංස්කෘතිය බිහි වූ බව තහවුරු කරන්න.

**විෂය ඒකකය: 6. මාධ්‍ය සංස්කෘතිය**
**6.2 නිපුණතා මට්ටම:** මාධ්‍ය සංස්කෘතික ව්‍යාප්තිය හා සංයෝගය විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** සමාජයෙහි චර්යාවන් වෙනස් වීම පිළිබඳව සාකච්ඡා කරන ලිපි හෝ ප්‍රවෘත්ති ඇතුළත් පුවත්පත් පිටු කිහිපයක් පන්තියට ගෙන ගොස් සිසු කණ්ඩායම්වලට දෙන්න.

**2 වන පියවර:** එවැනි වෙනස්වීම් සිදු වීමේ ස්වභාවය පිළිබඳව කෙටි සාකච්ඡාවක් කරන්න.

**3 වන පියවර:** ඒ ඒ ලිපි හෝ ප්‍රවෘත්ති ආශ්‍රයෙන් සමාජයෙහි සිදු වී ඇති චර්යාත්මක වෙනස්කම් කිහිපයක් හඳුනා ගෙන ලැයිස්තු ගත කරන්නට කණ්ඩායම්වලට පවරන්න.

**4 වන පියවර:** සිදු වී ඇති වෙනස්වීම් ඉදිරිපත් කරන්නට කණ්ඩායම්වලට ඉඩ දෙන්න.

**5 වන පියවර:** තෝරා ගත් වෙනස්වීම් කිහිපයක් ලැල්ලේ දක්වන්න.

**6 වන පියවර:** එම වෙනස්වීම් සිදු වී ඇති ආකාරය හා එයට මාධ්‍යයේ ඇති සම්බන්ධතාව කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

**විෂය ඒකකය: 6. මාධ්‍ය සංස්කෘතිය**

**6.3 නිපුණතා මට්ටම:** මාධ්‍ය සංස්කෘතියේ බලපෑම තුලනාත්මකව විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** ගුවන් විදුලි යන්ත්‍රයක් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කර, අවර ගණයේ ගීත ඉදිරිපත් කරන හා භාෂාව අව්‍යක්තව භාවිත කරන එෆ්. එම්. නාලිකාවක ගීත ඉදිරිපත් කිරීමක් අසන්නට සලස්වන්න.

**2 වන පියවර:** එම ගීත හා යොදා ගන්නා කථන භාෂාව පිළිබඳ ව විවෘත සාකච්ඡාවක් කරන්න.

**3 වන පියවර:** එම ගීත හා භාෂාව තුළ ඇති සංස්කෘතික ආක්‍රමණය පිළිබඳව අදහස් විමසන්න.

**4 වන පියවර:** සම්ප්‍රදායික සමාජයක් තුළ දී එවැනි සංස්කෘතික ආක්‍රමණයක් නිසා ඇති වන කම්පනයේ ස්වභාවය පිළිබඳ ව සාකච්ඡා කරන්න.

**5 වන පියවර:** එම ගුවන් විදුලි නාලිකා නියෝජනය කරන්නේ කෙබඳු සංස්කෘතියක්දැයි සාකච්ඡා කරන්න.

**6 වන පියවර:** සංස්කෘතික හුවමාරුවකින් යම් සංස්කෘතියක් පෝෂණය වන අතරම, සංස්කෘතික ආක්‍රමණයකින් පවත්නා සංස්කෘතිය දැඩි ලෙස වෙනස් වන බව පහදන්න.

**විෂය ඒකකය: 6. මාධ්‍ය සංස්කෘතිය**

**6.4 නිපුණතා මට්ටම:** මාධ්‍ය සංස්කෘතිය හා වෙළඳ පොළ අතර පවත්නා අන්තර් සම්බන්ධය විග්‍රහ කරයි.

**1 වන ක්‍රියාකාරකම (කාලය විනාඩි 30 යි.)**

**1 වන පියවර:** පුවත්පත් කිහිපයක් පන්තියේ සිසුන් කණ්ඩායම් අතර බෙදා දෙන්න.

**2 වන පියවර:** ඒ ඒ පුවත්පත්වල පළ කර ඇති වෙළෙඳ දැන්වීම් පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කරන්නට සිසුන්ට උපදෙස් දෙන්න. මෙම අධ්‍යයනයට දැන්වීම් සඳහා වෙන් කර ඇති මුළු ඉඩ, පිටුවල මුළු ඉඩ, ඒ ඒ දැන්වීම්වල ප්‍රමාණයන්, දැන්වීම් පළ කරන්නන්, දැන්වීම්වල අන්තර්ගතය, දැන්වීම්වලින් ඉදිරිපත් කරන පණිවුඩවල ස්වභාවය, දැන්වීම් නිර්මාණය කිරීමේ උපාය මාර්ග, දැන්වීම්වල වර්ණ, ආදිය ඇතුළත් විය යුතුය.

**3 වන පියවර:** සමස්ත වාර්තාවක් සකස් කර පන්තියට ඉදිරිපත් කරන්නට සිසු කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

**4 වන පියවර:** එක් විශාල දැන්වීමක් සිසුන්ගේද කැමැත්ත ඇතිව තෝරා ගන්න.

**5 වන පියවර:** තෝරා ගත් දැන්වීම ලෑල්ලේ ප්‍රදර්ශනය කරමින්, එහි අන්තර්ගතය සමාජයට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

## පාසල් පාදක ඇගයුම් වැඩ සටහන

**1 වන නිපුණතාව (විෂය ක්ෂේත්‍රය: සන්නිවේදන අධ්‍යයන ප්‍රවේශය)**

**කණ්ඩායම් පැවරුම්:** පැය දෙකක් තුළ පාසලෙහි සන්නිවේදන කාර්යයන් අධ්‍යයනය කර වාර්තාවක් සකස් කරන්න.

**ඒකල පැවරුම්:** සන්නිවේදන වර්ග හා සන්නිවේදන විධි ඇතුළත් වන පරිදි ඒ 3 කඩදාසියක් භාවිතයෙන් රූප සටහනක් නිර්මාණය කරන්න.

**2 වන නිපුණතාව (විෂය ක්ෂේත්‍රය: සන්නිවේදනය හා සමාජය)**

**කණ්ඩායම් පැවරුම:** පුද්ගලයන් දහ දෙනෙකු සමග සාකච්ඡා කර සන්නිවේදනය හා සමාජය අතර පවත්නා අන්තර් සම්බන්ධය පිළිබඳ ව ඔවුන් දක්වන අදහස් හා ඒ පිළිබඳ ඇගයුමක් ඇතුළත් කෙටි වාර්තාවක් සකස් කරන්න.

**ඒකල පැවරුම:** පුද්ගලයන් දහ දෙනෙකු සමග සාකච්ඡා කර සන්නිවේදනය අවශ්‍ය වන්නේ කුමකටදැයි ඔවුන් දක්වන අදහස් හා ඒ පිළිබඳ ඇගයුමක් ඇතුළත් කෙටි වාර්තාවක් සකස් කරන්න.

**3 වන නිපුණතාව (විෂය ක්ෂේත්‍රය: සන්නිවේදන කුසලතා හා නිපුණතා)**

**කණ්ඩායම් පැවරුම:** විනිවිදක පත්‍ර හතරක් තුනක් යොදා ගනිමින් , ඕවර්හෙඩ් ප්‍රොජෙක්ටරය භාවිතයෙන් විනාඩි දහයක ඉදිරිපත් කිරීමක් කරන්න.

**ඒකල පැවරුම:** මම කවුද? යන මාතෘකාව යටතේ ඒ 4 පිටුවක රචනාවක් ලියන්න.

**4 වන නිපුණතාව (විෂය ක්ෂේත්‍රය : භාෂාව හා ජනමාධ්‍ය භාවිතය)**

**කණ්ඩායම් පැවරුම:** ගුවන් විදුලි නාලිකා පහක ප්‍රවෘත්ති ප්‍රකාශයන් ස්වදේශීය සේවයේ ප්‍රවෘත්ති ප්‍රකාශය සමග සසඳමින් වාර්තාවක් සකස් කරන්න. උදාහරණ ද ඉදිරිපත් කරමින් වාර්තාව පන්තියේ දී ඉදිරිපත් කරන්න.

**ඒකල පැවරුම:** දිනපතා පුවත් පතකින් සංවර්ධන මූලික ප්‍රවෘත්තියක් තෝරා ගෙන එය ගුවන් විදුලියට උචිත වන සේ නැවත ලියන්න.

**5 වන නිපුණතාව (විෂය ක්ෂේත්‍රය: මහජන සම්බන්ධතාව)**

**කණ්ඩායම් පැවරුම:** විවාහ මංගල්‍ය උත්සවයක දී යොදා ගන්නා මහජන සම්බන්ධතා ක්‍රම (සම්ප්‍රදායික හා නව) අධ්‍යයනය කරමින් වාර්තාවක් සම්පාදනය කරන්න.

**ඒකල පැවරුම:** ආරෝග්‍ය ශාලාවක්, රජයේ කාර්යාලයක්, වාණිජ බැංකුවක්, සමුපකාර ප්‍රාදේශිකයක්, රෙදි පිළි වෙළෙඳ සැලක්, ආපන ශාලාවක් වැනි ස්ථාන දෙකක් තෝරා ගෙන ඒවායේ මහජන සම්බන්ධතා කටයුතු ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ සංසන්දනාත්මක වාර්තාවක් සකස් කරන්න.

**6 වන නිපුණතාව (විෂය ක්ෂේත්‍රය: මාධ්‍ය සංස්කෘතිය)**

**කණ්ඩායම් පැවරුම:** වයස් ගත ඥාතීන් තිදෙනෙකු සමග සාකච්ඡා කර, ඔවුන්ගේ ළමා වියේ දී තිබුණාට වඩා වර්තමාන සමාජයේ ගති පැවතුම් / චර්යාවන් , ඇඳුම් පැළඳුම් හා භාණ්ඩ / ආහාර පරිභෝජනය ආදිය සංස්කෘතික ලක්ෂණ වෙනස් වී ඇති ආකාරය හා එම වෙනස් වීමට ජනමාධ්‍ය බල පා ඇති ආකාරය දක්වෙන වාර්තාවක් සකස් කරන්න.

**ඒකල පැවරුම:** රූපවාහිනී වෙළෙඳ දැන්වීම් පහක් නම් කර ගෙන ඒවා අධ්‍යයනය කරමින්, ඒ මගින් ජනතාවට ලබා දෙන පණිවුඩය හා පෙළඹවීමේ උපාය මාර්ග ප පිළිබඳ විවේචනාත්මක වාර්තාවක් සකස් කරන්න.

**උපදෙස්:**

1. සිසුන් විසින් ඉදිරිපත් කරනු ලබන පැවරුම් පිටපතක් පාසලේ පුස්තකාලයේ මාධ්‍ය අංශයේ හෝ පන්ති පුස්තකාලයේ හෝ සුරැකිව තබන්න. ඒවා ඊ ළඟ වර්ෂයේදී එම පන්තිවලට පැමිණෙන දරුවන්ට අධ්‍යයනය කළ හැකිය.
2. අවශ්‍ය අවස්ථාවන්හිදී මෙම පැවරුම්වල ක්‍රියාකාරකම් හෝ තේමාවන් හෝ වෙනස් කර ගැනීම ගුරු භවතාගේ කාර්යයකි.

(නිපුණතා මට්ටම ලකුණු 4 3 නිපුණතා මට්ටමට අඩු 2 1 )

## 1. ඔබේ පාසලේත් මාධ්‍ය සමාජයක් ආරම්භ කරන්න.

1. පසුබිමඃ

සන්නිවේදන හා මාධ්‍ය ක්‍රියාකාරකම් අන් කවරදාකටවත් වඩා වර්තමාන සමාජය කෙරෙහි දැඩි ව බල පා ඇති අතර, මේ බල පෑම දවසෙන් දවස වැඩි වේ. සන්නිවේදන මාධ්‍ය ආයතන සංවිධානාත්මක හා දැවැන්ත වන අතර, එහි බලපෑමෙන් මිදීමට හැක්කේ කාටදැයි සිතා ගන්නට ද නොහැකි තරම්ය. එබැවින් මෙම සන්නිවේදන මාධ්‍යයන් විශ්ලේෂණය කර ගැනීමට හා ඒවා තෝරා බේරා ගෙන ග්‍රහණය කර ගැනීමට අවශ්‍ය ශික්ෂණය දරුවන්ට ලබා දීම අධ්‍යාපන පද්ධතියේ වගකීමකි. අනෙක් අතට සන්නිවේදන නිපුණතා නොමැතිව තමන්ගේ පෞද්ගලික ජීවිතය ගොඩ නැංවීම හා පවත්වා ගෙන යාමද අසීරු කරුණක් වී ඇත. එබැවින් ජීවන නිපුණතාවක් වශයෙන් සන්නිවේදන නිපුණතා අත්පත් කර ගැනීම අත්‍යවශ්‍ය වී තිබේ. එසේම නිර්මාණශීලී දරු දැරියන්ට හා ගුරු භවතුන්ටද සන්නිවේදන මාධ්‍ය පරිසරය මගින් බොහෝ ප්‍රයෝජන අත්පත් කර ගත හැකිය. පාසල් මාධ්‍ය සමාජ පිහිටුවීමේ පසු බිම එයයි.

යම් පාසලක සාමාන්‍ය පෙළ හෝ උසස් පෙළ හෝ විෂයයක් වශයෙන් සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය උගන්වන්නේ නම්, එම පාසලේ මාධ්‍ය සමාජයක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම අනිවාර්ය කාර්යයකි. පන්ති කාමරයේ ක්‍රියාවලියට සමගාමීව ප්‍රායෝගික කාර්යයන් ක්‍රියාත්මක කළ හැක්කේ පාසල් මාධ්‍ය සමාජය මගිනි. පාසල් මාධ්‍ය සමාජයක දළ සංවිධාන සටහන මෙසේ දැක්විය හැකිය.




**1. අභ්‍යන්තර කමිටුවඃ** මාධ්‍ය සමාජයේ මුදුන් මට්ටමේ මෙහෙයුම් කණ්ඩායම මෙනමින් හැඳින් වේ. එහි ප්‍රධානියා වන්නේ විදුහල්පතිතුමා / තුමියයි. ඒ හැර අධ්‍යාපන සංවර්ධන කටයුතු භාර නියෝජ්‍ය විදුහල්පතිතුමකු / තුමියක, මාධ්‍ය සමාජය භාර ගුරුමව්වරුන් / පියවරුන් ද අයත් වේ. මෙයින් බැහැර වූ වෙනත් ගුරු මව්වරුන් / පියවරුන් ද මාධ්‍ය සමාජයේ අභ්‍යන්තර කමිටුවට ඇතුළත් කරන්නට විදුහල්පතිතුමාට/ තුමියට හැකිය. උදාහරණයක් වශයෙන් සංගීතය, චිත්‍ර, නැටුම් විෂය භාර ගුරුමව / පියා හෝ වෙනත් ගුරු මව්වරුන් හෝ පියවරුන් මෙයට සම්බන්ධ කළ හැකිය. මේ ආකාරයෙන් අභ්‍යන්තර කමිටුව පාසලේ ගුරු මණ්ඩලයේ සාමාජිකයන් වැඩි පිරිසකින් සමන්විත වීම මාධ්‍ය සමාජයේ කටයුතුවලට පහසුවකි. උදාහරණයක්

වශයෙන් මාධ්‍ය සමාජයේ ව්‍යාපෘති හතට අදාළ වන සේ ගුරුමව්වරුන් / පියවරුන් අභ්‍යන්තර කමිටුවට සම්බන්ධ කර ගත හැකිය. ඒ මගින් ඒ ඒ ව්‍යාපෘතිවල කටයුතු වඩාත් සාර්ථකව ක්‍රියාත්මක කරන්නට අවකාශය ලැබේ. අභ්‍යන්තර කමිටුවේ කාර්යයන් මෙසේ දැක්විය හැකිය.

1. මාධ්‍ය සමාජයේ කටයුතු පිළිබඳ ව අවසාන තීරණ ගැනීම
2. වාර්ෂික සැලැස්ම සඳහා අවසාන අනුමැතිය ලබා දීම
3. මාධ්‍ය සමාජයේ කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් දීම
4. අවස්ථානුකූලව අනුමැතියන් ලබා දීම
5. මාධ්‍ය සමාජයේ රැස්වීම් සඳහා නියෝජනයන් ලබා දීම
6. මාධ්‍ය සමාජයේ බාහිර කමිටුව සම්බන්ධීකරණය කිරීම
6. විදුහල්පතිතුමා / තුමිය විසින් අදහස් කරන කුමන හෝ මැදිහත්වීමක්

**2. බාහිර කමිටුව:** මාධ්‍ය සමාජයේ කාර්යයන් සාර්ථකව කර ගෙන යාම සඳහා බාහිර අනුග්‍රාහකත්වය ලබා ගැනීම බාහිර කමිටුව ස්ථාපිත කර ගැනීමේ අරමුණයි. පාසල් මට්ටමින් මාධ්‍ය සමාජයක් පවත්වා ගෙන යාමේ දී විවිධ අවස්ථාවල විවිධ අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා බාහිර අනුග්‍රාහකත්වය අවශ්‍ය වේ. උදාහරණ වශයෙන් යම් පුහුණු වැඩ සටහනක් සඳහා පුහුණු කරුවකු ලබා ගැනීම, සම්මන්ත්‍රණයක් සඳහා දේශකයකු ලබා ගැනීම, තරගයකට සම්බන්ධව සහතික පත්‍ර මුද්‍රණය කරවා ගැනීම, විශේෂ වැඩ සටහනක් සඳහා බැනරයක් සකස් කරවා ගැනීම, මාධ්‍ය උලෙළට සම්බන්ධව විශේෂ තිළිණ නිර්මාණය කරවා ගැනීම ආදිය දැක්විය හැකිය. මේ ආකාරයේ විවිධ අවශ්‍යතා පැන නැගුණු අවස්ථාවලදී අනුග්‍රාහකයන් සොයා ගැනීමට වෙහෙස වීම බොහෝ විට සිදු වන දෙයයි. එම දුෂ්කරතාව මග හරවා ගැනීම සඳහා පාසල් මාධ්‍ය සමාජයට සුභ පතන්නන් කණ්ඩායමක් මාධ්‍ය සමාජය ආරම්භයේ සිටම සම්බන්ධ කර ගැනීම බාහිර කමිටුව ස්ථාපිත කර ගැනීමේ අරමුණයි. මේ සඳහා පහත සඳහන් අය වෙන් වෙන්ව හඳුනා ගත යුතුය.

1. ආදී ශිෂ්‍ය ශිෂ්‍යාවන්
2. දෙමාපියන්
3. සාහිත්‍යකරුවන් / කලාකරුවන් / වෙනත් නිර්මාණශීලීන්
4. විද්වතුන්
5. ජනමාධ්‍යකරුවන් හා ජනමාධ්‍යවේදීන්
6. ව්‍යාපාරිකයන්
7. රාජ්‍ය නිලධාරීන්
8. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයන්
9. හිටපු ගුරුභවතුන් හා විදුහල්පතිවරුන් / වරියන්
10. මහජන නියෝජිතයන්

බාහිර කමිටුව ස්ථාපිත කර ගැනීමට පහත සඳහන් ක්‍රියා පිළිවෙල අනුගමනය කිරීම යෝග්‍යය.

1. බාහිර කමිටුව සංවිධානය කිරීම සඳහා මාධ්‍ය සමාජයේ කමිටුවක් පත් කර ගන්න.

2. එම කමිටුව රැස් ව සාකච්ඡා කරමින් යෝග්‍ය පුද්ගලයන්ගේ හෝ ආයතනවල හෝ ලැයිස්තුවක් සම්පාදනය කර ගන්න.

3. එම ලැයිස්තුව මාධ්‍ය සමාජය භාර ගුරුමව්වරුන් / පියවරුන් වෙත ඉදිරිපත් කර සාකච්ඡා කර සංශෝධනයන් කර මූලික අනුමැතිය ලබා ගන්න.

4. විදුහල්පතිතුමා / තුමිය වෙත ලේඛනය ඉදිරිපත් කර ලිඛිතව අනුමැතිය ලබා ගන්න.

5. අනුමැතිය ලබා ගත් ලේඛනයට අයත් ඒ ඒ පුද්ගලයන් ගේ හා ආයතනවල විස්තර හැකිතාක් රැස් කර ගන්න. මෙම තොරතුරුවලට ඒ ඒ අයගේ නම්,

- පෞද්ගලික ලිපිනයන් / රාජකාරි ලිපිනයන් / විද්‍යුත් ලිපිනයන් ද,
- තනතුර හා විශේෂඥතාවන් ද,
- දුරකථන අංක ද,
- පාසලට සම්බන්ධතාවක් ඇත්නම් එය ද,
- සපයා ගත හැකි වෙනත් යෝග්‍ය තොරතුරු ද ඇතුළත් විය යුතු ය.

6. එම විස්තරාත්මක ලේඛනය මාධ්‍ය සමාජය භාර ගුරුමව්වරුන් / පියවරුන් මගින් විදුහල්පතිතුමා/ තුමිය වෙත ලිපි ගොනුවකින් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්න.

7. ඒ ඒ අය පාසල් මාධ්‍ය සමාජයේ බාහිර කමිටුවේ සාමාජිකයකු වශයෙන් ඇතුළත් කිරීමට විදුහල්පතිතුමා ගේ / තුමියගේ අනුමැතිය සහිතව මාධ්‍ය සමාජයේ රැස්වීමකදී තීරණය කර ගන්නා ලද බව ද, ඉදිරි කාලයේදී මාධ්‍ය සමාජයේ සංවර්ධනය සඳහා සහයෝගය අපේක්ෂා කරන බවද දැක්වෙන ලිපියක් ඒ ඒ අයට වෙන් වෙන්ව යැවීම

8. මාධ්‍ය සමාජයේ වාර්ෂික සැලැස්මේ අනුමත පිටපතක් ඒ ඒ අය වෙත යැවීම

9. මාධ්‍ය සමාජයේ රැස්වීම්වල සංක්ෂිප්ත වාර්තාවන්, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත එක් එක් වැඩ සටහන් පිළිබඳ විස්තර හා නිම කරන ලද එක් එක් වැඩ සටහන් පිළිබඳ විස්තර

10. .....................................................................................................................................

මේ ආකාරයෙන් බාහිර කමිටුවේ සාමාජිකයන් නිරන්තරයෙන් දැනුවත් කිරීම මගින් ඔවුන් තුළ මාධ්‍ය සමාජයේ කටයුතු පිළිබඳව උනන්දුවක් හා ප්‍රසාදයක් ඇති වේ. ඒ අනුව තමන්ගෙන් මාධ්‍ය සමාජයට යම් උපකාරයක් කිරීම පිළිබඳව ඔවුන්ම කල්පනා කරන්නට පුලුවන. එසේම ඒ ඒ අවසථාවල විවිධ උපකාර ලබා දෙන ලෙස බාහිර කමිටුවේ සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටින්නට මාධ්‍ය සමාජයට පුලුවන. මෙහිදී විශේෂයෙන් මතක තබා ගත යුත්තක් නම්, මාධ්‍ය සමාජයේ බාහිර කමිටුව සම්බන්ධීකරණය කිරීම අභ්‍යන්තර කමිටුවේ කාර්යයක් වන බවය. ඒ නිසා කිසිම අවස්ථාවක මාධ්‍ය සමාජයේ නිලධාරීන් විසින් අභ්‍යන්තර කමිටුවේ අනුමැතියකින් තොරව බාහිර කමිටුවේ සාමාජිකයන් සමග මොනම ආකාරයක හෝ සම්බන්ධයක් නොපැවැත්විය යුතුය. එසේම ඔවුන් වෙත යවනු ලබන සෑම ලිපියක්ම පාසලින් පිටතට යන ලිපියක් වන බැවින්, ඒ සඳහා විදුහල්පතිතුමා / තුමියගේ නිර්දේශය / අනුමැතිය අදාළ පරිදි ලිපියේ සටහන් කරවා ගත යුතුය.

**3. සභාපති / නියෝජ්‍ය සභාපති / උප සභාපති:** මාධ්‍ය සමාජයේ සභාපති නිලධාරීන්ගේ මූලික කාර්යය වන්නේ රැස්වීම්වලදී මූලාසනය දැරීමය. එයට අමතරව ලිපි අත්සන් කිරීමද එක් කාර්යයකි. සභාපති විසින් මාධ්‍ය සමාජයේ වාර්ෂික සැලැස්ම සම්පාදනය කර මහ සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. පාසලේ අභ්‍යන්තර කමිටුව නිල වශයෙන් සම්බන්ධීකරණය කිරීමද සභාපති කාර්ය මණ්ඩලයේ කාර්යයකි. එසේම මාධ්‍ය සමාජයේ සියලු කාර්යයන් පිළිබඳව නිරන්තරයෙන් සොයා බැලීමද අවශ්‍ය සහයෝගය ලබා දීමද, යම් යම් කාර්යයන් සැලසුම් කිරීම හා සංවිධානය කිරීමද, අදාළ වන පරිදි ඒවා ක්‍රියාත්මක කිරීමද සභාපති නිලධාරීන් ගේ කාර්යයන්ට අයත් වේ. එසේම මාධ්‍ය සමාජයේ ප්‍රධාන කාර්යයන් වන මාධ්‍ය උළෙලක් පැවැත්වීම, මාධ්‍ය අධ්‍යාපන සතිය, යුනෙස්කෝ ලෝක පොත් දිනය, මාධ්‍ය වැඩ හුරුව සතිය ආදී විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමද සභාපති කාර්ය මණ්ඩලයේ වගකීමකි.

**3. ලේකම් / සමලේකම්වරුන් / නියෝජ්‍ය ලේකම්වරුන් / සහකාර ලේකම්වරුන්:** මාධ්‍ය සමාජයේ ලේකම් කාර්ය මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන්නේ මාධ්‍ය සමාජයට අයත් ලේඛන කටයුතු නිසි ලෙස පවත්වා ගෙන යාමය. වාර්තා පොත් හා මාධ්‍ය සමාජයේ දැන්වීම් පුවරුව ඒ අතර ප්‍රධාන වේ. රැස්වීම් කැඳවීම, පෙර රැස්වීම්වල වාර්තා ඉදිරිපත් කිරීම, රැස්වීම්වල ස්තුති කතාව පැවැත්වීම, නිසි අනුමැතිය සහිතව මාධ්‍ය වෙත නිල තොරතුරු යැවීම, අනුමත දැන්වීම් නිකුත් කිරීම, රැස්වීම් කැඳවීමේ දැන්වීම් නිසි අනුමැතිය සහිතව දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම හා සන්නිවේදනය කිරීම, නිසි අනුමැතිය සහිතව අවශ්‍ය අවස්ථාවන්හි දී මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම, මහජන සම්බන්ධතා කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, මාධ්‍ය සමාජයේ නාම පුවරුවක් පවත්වා ගෙන යාම, සාමාජික හැඳුනුම් පත් හා ලාංඡන ලබා දීම, මාධ්‍ය සමාජයේ ගීතය ගායනා කිරීම පුහුණු කිරීම ආදිය ලේකම් නිලධාරීන්ගේ කාර්යයන්ට මූලිකව අයත් වේ. ලේකම් නිලධාරීන් තම කාර්යයන් ඉටු කිරීමේදී පරිගණක භාවිතයට යොමු වන්නේ නම් ඉතා යෝග්‍යය.

**4. භාණ්ඩාගාරික / නියෝජ්‍ය භාණ්ඩාගාරික / උප භාණ්ඩාගාරිකවරුන් :** මාධ්‍ය සමාජයේ සාමාජික මුදල් රැස් කිරීම, අරමුදල් රැස් කිරීම ඇතුළුව මුදල් හෝ වත්කම් හෝ සම්බන්ධ සියළු කාර්යයන් භාණ්ඩාගාරික නිලධාරීන්ට අයත් වේ. ඒ අනුව නිසි ලෙස ගිණුම් පොත් පවත්වා ගෙන යාම, අදාළ පරිදි රිසිට් නිකුත් කිරීම, රැස් වන මුදල් ප්‍රධාන භාණ්ඩාගාරික ලෙස කටයුතු කරන ගුරුතුමා / ගුරුතැමිය වෙත භාර දීම හෝ මාධ්‍ය සමාජයේ බැංකු තැන්පත් ගිණුමේ තැන්පත් කිරීම, මුදල් හා වත්කම් ගනුදෙනුවලට අදාළ සියළු ලිපි ලේඛන, නිසි පරිදි අනුමැතිය සහිතව, සුරක්ෂිතව පවත්වා ගෙන යාම, අරමුදල් සපයා ගැනීමේ විශේෂ කාර්යයන් යෝජනා කිරීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ද භාණ්ඩාගාර නිලධාරීන්ගේ කාර්යයන් අතරට අයත් වේ. මෙම කාර්යයන් සඳහාද හැකි පරිදි පරිගණක යොදා ගැනීම යෝග්‍යය.

**5. කාරක සභාව:** මාධ්‍ය සමාජයේ අභිමතය පරිදි පන්ති නියෝජනය වන ලෙස හා පිරිමි / ගැහැණු නියෝජනය වන ලෙස කාරක සභාව පත් කර ගත යුතුය. ඒ ඒ අවස්ථාවන්හි මාධ්‍ය සමාජයේ නිල සාකච්ඡාවලට සහභාගි වීම, තමන්ගේ ඡන්දය ලබා දීම මගින් මාධ්‍ය සමාජයේ නිලධාරි මණ්ඩලයේ රැස්වීම් වලදී තම මතය පළ කිරීම, සාමාජිකයන්ගේ අයදුම් පත් සම්බන්ධයෙන් අනුමැතිය ලබා දීම ආදියද, මාධ්‍ය සමාජය විසින් ව්‍යවස්ථාව හා අතුරු ව්‍යවස්ථා මගින් සම්මත කර ගන්නා ලද වෙනත් කාර්යයන් ඉටු කිරීම කාරක සභා සාමාජික සාමාජිකාවන්ගේ වගකීම වේ. එසේම සෑම කාරක සභා සාමාජිකයකුම කුමන හෝ ව්‍යාපෘතියක කාර්යයන් සමග නිශ්චිතව සම්බන්ධව කටයුතු කළ යුතු අතර, තමන් කුමන ව්‍යාපෘතිය සමග සම්බන්ධව කටයුතු කරන්නේදැයි මාධ්‍ය සමාජයේ මහ සභා රැස්වීමේදී සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

**6. ප්‍රධාන සංවිධායක / නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක:** මෙම තනතුරු සෘජුවම මාධ්‍ය සමාජයේ ව්‍යාපෘතීන් හත ක්‍රියාත්මක කිරීමේ වගකීම සමග බැඳී පවතී. එනම් ව්‍යාපෘති හතෙහි කටයුතු නිසි ලෙස මෙහෙයවීම සම්බන්ධයෙන් ප්‍රධාන සංවිධායක හා නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක මූලික වශයෙන් වග කිව යුතුය. යම් වර්ෂයක් තුළ ඒ ඒ ව්‍යාපෘතීන්ගෙන් ප්‍රමාණවත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත්නම් එහි ගෞරවයද එසේ ක්‍රියාත්මක කර නැතිනම් එම වගකීමද ප්‍රධාන සංවිධායක හා නියෝජ්‍ය ප්‍රධාන සංවිධායක විසින් භාර ගත යුතුය.

**7. ව්‍යාපෘති සංවිධායක / නියෝජ්‍ය ව්‍යාපෘති සංවිධායක:** සෑම ව්‍යාපෘතියකටම සංවිධායකවරයකු හා නියෝජ්‍ය සංවිධායකවරයකු පත් කර ගැනීම මාධ්‍ය සමාජයේ මහ සභා රැස්වීමකදී කළ යුතුය. ඔවුන්ගේ ප්‍රධාන කාර්යය වන්නේ තමන්ටගේ වගකීමට අයත් වන ව්‍යාපෘතියේ වාර්ෂික සැලැස්මක් සකස් කර එය ක්‍රියාත්මක කිරීම පිළිබඳවය. එම අදාළ ව්‍යාපෘතිය වර්ෂය තුළ ප්‍රමාණවත් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත්නම් එම ගෞරවයද, ක්‍රියාත්මක කර නොමැති නම් එම වගකීමද ව්‍යාපෘති සංවිධායක හා නියෝජ්‍ය ව්‍යාපෘති සංවිධායක විසින් භාර ගත යුතුය. තම ව්‍යාපෘතියේ වාර්ෂික සැලැස්මක් සකස් කර එය මාධ්‍ය සමාජයේ සාමාන්‍ය රැස්වීමකට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමද, එය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට අදාළව තම සහය ලබා දීම හා නිසි පරිදි එම කටයුතු මෙහෙයවීමද මෙම නිලධාරීන්ගේ වගකීමයි.

**8. ව්‍යාපෘති සාමාජිකත්වය:** මාධ්‍ය සමාජය යටතේ ව්‍යාපෘති හතක් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා ස්ථිර සාමාජික පිරිසක් නම් කර ගැනීම හෝ නොගැනීම කළ හැකිය. එය මාධ්‍ය සමාජයේ අභිමතය පරිදි වේ. ස්ථිර සාමාජික පිරිසක් නම් කර ගනු ලැබුවත්, නොලැබුවත්, මාධ්‍ය සමාජයේ ඕනෑම සාමාජිකයෙකුට යම් ව්‍යාපෘතියක් යටතේ යම් ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කරන්නට අවකාශය තිබේ. මෙයින් අදහස් වන්නේ ව්‍යාපෘති සාමාජිකත්වය යනු විවෘත දෙයක් බවය. එවැනි අවකාශයක් ඇති කර ඇත්තේ, නිශ්චිතව නිලධාරි මණ්ඩලයට ඇතුළත් නොවන, එහෙත් යමක් කරන්නට කැමැත්තක් ඇති සාමාජිකයනට අවකාශ සලසා දෙනු පිණිසය.

**9. 1. පර්යේෂණ හා ගවේෂණ ව්‍යාපෘතිය:** මාධ්‍ය සමාජය යටතේ ඇති පළමුවන ව්‍යාපෘතිය මෙයයි. පර්යේෂණ හා ගවේෂණ යන පදයන් තරමක් බරපතල ලෙස එක් වරම දැනෙන්නට පුලුවන. ඇත්තෙන්ම එම පදවලින් අදහස් වන්නේ බරපතල කාර්යයන් බව ඇත්තය. එහෙත් ඒවායේ ඉතා මූලික මට්ටමේ පර්යේෂණ හා ගවේෂණ ක්‍රියාත්මක කරන්නට මාධ්‍ය සමාජයට පුලුවන. පර්යේෂණ හා ගවේෂනවලින් කරන්නේ අලුත් දැනුමක් සොයා ගැනීමය. ඒ නිසා පාසල තුළදීද එවැනි අලුත් දැනුමක් සොයා ගැනීමේ කුඩා පර්යේෂණ හා ගවේෂන කරන්නට මාධ්‍ය සමාජයේ සාමාජිකයන් පෙළඹීම තුළින් ඉදිරියේදී ඔවුන්ට වඩාත් විශාල පර්යේෂණ හා ගවේෂන ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය මූලික අත්දැකීම ලැබේ. පාසලේදී ක්‍රියාත්මක කළ හැකි සරල මට්ටමේ පර්යේෂණ හා ගවේෂන කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

- පාසලට මිල දී ගන්නා පුවත්පත කියවීම පිළිබඳ අධ්‍යයනයක්
- පාසලේ ළමුන් අතර ජනප්‍රිය ගීත දහයක් හඳුනා ගැනීමේ සමීක්ෂණයක්
- ගමේ ගෙවල්වල ගුවන් විදුලිය/ රූපවාහිනිය / පුවත්පත් පරිහරණය කිරීම පිළිබඳ අධ්‍යයනයක්
- ගමේ කඩේට ගන්නා පුවත්පත කියවීම පිළිබඳ අධ්‍යයනයක්
- පාසලේ පුස්තකාලයේ පොත් කියවීම පිළිබඳ අධ්‍යයනයක්
- ළමුන් ඉගෙනීම සඳහා රූපවාහිනිය යොදා ගන්නා ආකාරය පිළිබඳ අධ්‍යයනයක්
- ..................................................................................................................

පර්යේෂණයක් හෝ ගවේෂණයක් හෝ කිරීමේදී කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීම ඉතා ප්‍රයෝජනවත්ය. ඒ මගින් එම කාර්යයන් බෙදා ගෙන පහසුවෙන් ක්‍රියාත්මක කරන්නට අවකාශය ලැබේ. පර්යේෂණයක් හෝ ගවේෂණයක් ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි වාර්තාව මාධ්‍ය සමාජයට ඉදිරිපත් කිරීම යෝග්‍යය. ඒ අනුව එහි අනාවරණයන් සියල්ලන්ට දැන ගන්නට අවස්ථාව සැලසේ. එසේම එම වාර්තාවේ පිටපත් සහභාගී වූ සාමාජිකයන් වෙත තබා ගැනීම අත්‍යවශ්‍යය. තවත් පිටපත් පුස්තකාලය, අභ්‍යන්තර කමිටුව හා බාහිර කමිටුව වෙත ඉදිරිපත් කිරීම යෝග්‍යය. මෙහිදී වාර්තාව යන්නෙන් පිටු බොහෝ ප්‍රමාණයක් ඇතුළත් ලේඛනයක් අදහස් නොකෙරේ. වාර්තාව හැකි තාක් කෙටි කිරීම හැම අතින්ම යෝග්‍යය.

**9. 2. කුසලතා සංවර්ධන ව්‍යාපෘතිය:** මෙම ව්‍යාපෘතිය යටතේ මාධ්‍ය සමාජයේ සාමාජික සාමාජිකාවන්ගේ කුසලතා සංවර්ධනය කිරීම අරමුණු කර ගත් විවිධ පුහුණු වැඩ සටහන් පැවැත්වීම අපේක්ෂා කෙරේ. එම පුහුණු වැඩ සටහන්වල කාලය කොපමණ දැයි නිශ්චිත ව කිව නොහැකිය. එය පැය කිහිපයක සිට දවස් කිහිපයක් දක්වා එම කාලය පැතිරෙන්නට පුලුවන. කාලය පිළිබඳව නිශ්චය කර ගත යුත්තේ, එහි අවශ්‍යතාව හා ක්‍රියාත්මක කිරීමේ හැකියාව අනුවය. විදුහල්පතිතුමා / තුමිය විසින් අනුමත කරන්නේ නම් අවට පාසල්වල මාධ්‍ය සමාජ සාමාජික සාමාජිකාවන් යම් සංඛ්‍යාවකටද එම පුහුණු වැඩ සටහන්වලට සහභාගී වීමට අවකාශය සලසා දීම යෝග්‍යය. මාධ්‍ය සමාජය යටතේ සංවර්ධනය කළ හැකි කුසලතාද නිශ්චිත ව නම් කළ නොහැකිය. එය එම මාධ්‍ය සමාජයේ හා එම පුහුණු වැඩ සටහන සැලසුම් කරන කණ්ඩායමේ සැලැස්ම අනුව තීරණය කළ යුතු ය. එහෙත් උදාහරණ කිහිපයක් මෙසේ දැක් විය හැකිය.

- ප්‍රවෘත්ති වාර්තාකරණය පිළිබඳව
- නිශ්චල ඡායාරූප ශිල්පය පිළිබඳව
- විකට රංගනය පිළිබඳව
- කාටූන් චිත්‍ර නිර්මාණය පිළිබඳව
- පද්‍ය කාව්‍ය නිර්මාණය පිළිබඳව
- කෙටි කතා නිර්මාණය පිළිබඳව
- බිත්ති පුවත්පත් නිර්මාණය පිළිබඳව
- නිවේදන ශිල්පය පිළිබඳව
- ප්‍රවෘත්ති සංස්කරණය පිළිබඳව
- ..............................................................

කුසලතා සංවර්ධන පුහුණු වැඩ සටහන් පැවැත්වීමේදී පැන නගින ප්‍රධාන ගැටලු දෙකකි. එකක් නම් ඒ සඳහා යෝග්‍ය සම්පත්දායකයන් සොයා ගැනීමයි. දෙවැන්න නම් අවශ්‍ය උපකරණ සපයා ගැනීමයි. මේ සඳහා විදුහල්පතිතුමා / තුමියගේද අවසරය ඇතිව බාහිර කමිටුවේ සහය ලබා ගන්නට පුලුවන. එසේ බාහිර අනුග්‍රහයක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, පුහුණු වැඩ සටහන පිළිබඳ සම්පූර්ණ විස්තරයක්ද, එහි අය වැය ඇස්තමේන්තුවක්ද සමග අදාළ අනුග්‍රාහකයන් වෙත තොරතුරු ඉදිරිපත් කරන්නට සිදු වේ. පුහුණු වැඩ සටහනක් අවසානයේදී පුහුණුලාභීන් වෙත සහතික පත්‍රයක් මාධ්‍ය සමාජයේ නමින් පිරිනැමීම වඩාත් යෝග්‍යය. එසේම පුහුණුලාභීන්ගේ දක්ෂතා ඉදිරිපත් කිරීමක්ද මේ යටතේ කළ හැකිය.

**9. 3. නිර්මාණාත්මක ව්‍යාපෘතිය:** මාධ්‍ය සමාජයේ සාමාජික සිසු දරු දැරියන්ගේ විවිධ නිර්මාණ ඉදිරිපත් කිරීමේ විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම මෙයින් අදහස් වේ. ඒ සම්බන්ධ උදාහරණ කිහිපයක් මෙසේ දැක් විය හැකිය.

- චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීම
- කාටූන් ප්‍රදර්ශනයක් පැවැත්වීම
- ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම
- කෙටිකතා පොතක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම
- පුවත්පතක් මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරිම
- බිත්ති පුවත් පතක් ප්‍රකාශයට පත් කිරීම
- ගීත ප්‍රසංගයක් පැවැත්වීම
- පාසල් ගුවන් විදුලි සේවයක් පැවැත්වීම
- .............................................................................

නිර්මාණාත්මක කාර්යයක් සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා තරමක කාලයක් ගත වන්නට පුලුවන. එහෙත් හොඳ නිර්මාණයක් ඉදිරිපත් කිරීම වඩාත් වැදගත් වේ. එසේම මේ සඳහා පිරිවැයක්ද දරන්නට සිදු වේ. එම පිරිවැය කෙසේ ආවරණය කරන්නේද යන්න විශේෂයෙන් සැලසුම් කළ යුතුය. උදාහරණයක් වශයෙන් පොතක් ප්‍රකාශ කිරීමේදී එය අලෙවි කර ආදායම් ලබා ගන්නට පුලුවන. එහෙත් පොත මුද්‍රණයට යන වියදම මුලින් දරන්නට සිදු වේ. ඒ සඳහා ක්‍රමයක් යොදා ගැනීම අවශ්‍යය. මේ නිසා නිර්මාණාත්මක ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී ප්‍රමාණවත් කාලයක් අවශ්‍යය. නිර්මාණාත්මක කාර්යය කරනු ලබන සාමාජිකයා හෝ සාමාජිකයන් කිහිප දෙනෙකු හෝ විසින් මේ සඳහා අවශ්‍ය සැලසුම් සම්පාදනය කිරීම යෝග්‍යය. බොහෝ විට මේ සඳහා දෙමාපියන්ගේද සහය ලබා ගැනීමට සිදු වේ.

**9.4. රස වින්දන ව්‍යාපෘතිය :** රස වින්දනය ජීවිතයට අවශ්‍ය දෙයකි. මාධ්‍යවල ප්‍රධාන කාර්යය බවට පත් වී තිබෙන්නේද ග්‍රාහකයන්ට රස විඳින්නට නොයෙක් දේ ඉදිරිපත් කිරීමයි. එහෙත් ඇත්තෙන්ම ඔවුන් ගාහකයාට යෝග්‍ය දේ රස විඳින්නට ලබා දෙන්නේද යන්න විශාල ප්‍රශ්නයකි. හොඳ දෙයක් රස විඳින්නට පුරුදු පුහුණු වූ විට බාල දේ ප්‍රතික්ෂේප කරන්නට පුරුදු වේ. එම පුරුද්ද ඇති කර ගත යුත්තේ බාල කාලයේ සිටමය. ඒ නිසා පාසල් අවදියේදීම මේ ආකාරයෙන් විවිධ දේ රස විඳින්නට හා ඒවා විවේචනය කරන්නට පුරුදු පුහුණු වීම ඉතා ප්‍රයෝජනවත්ය. රස වින්දන වැඩ සටහනක් සැලසුම් කිරීමේදී ප්‍රධාන අරමුණු දෙකක් ඉටු කර ගන්නට පුලුවන. පළමුවැන්න නම් හොඳ දේ කුමක්දැයි තෝරා ගන්නට සාමාජික සාමාජිකාවන්ට අවකාශය ලබා දීමය. දෙවැන්න නම් බාල දේ කුමක්දැයි හඳුනා ගැනීමට අවකාශ සැලසීමයි. මෙම අරමුණු දෙකම රස වින්දන වැඩ සටහන්වලදී ඉටු කර ගන්නට පුලුවන. මාධ්‍ය ඔස්සේ නිරන්තරයෙන් ලැබෙන්නේ අවර ගණයේ රස වින්දනයක් නිසා, එහි ගුණ අගුණ හඳුනා ගැනීම අතිශයින් වැදගත්ය. රස වින්දන වැඩ සටහන් සඳහා ආදර්ශ ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක් වේ.

- පුස්තකාලයේ පොත් කිහිපයක් රස විඳීම
- හොඳ ගීත රස විඳීම
- හොඳ ටෙලි නාට්‍යයක් නැරඹීම
- අවර ගණයේ ටෙලි නාට්‍ය නරඹා විවේචනය කිරීම
- නොනවතින ගීත තැටියක් වාදනය කර එය රසය අර්ථ කථනය කිරීම
- නටන්නට ගයන ගී හා සිතන්නට ගයන ගී අතර වෙනස අර්ථ කථනය කිරීම
- රූපවාහිනී ගීත වැඩ සටහනක් නරඹා එය විමර්ශනය කිරීම
- ..............................................................................................

රස වින්දන වැඩ සටහන් පැවැත්වීමේදී එයට මාධ්‍ය සමාජයේ සාමාජික නොවන සිසු දරු දැරියන්ටද සහභාගි වන්නට අවස්ථාව සලසා දීම ප්‍රයෝජනවත්ය. ඒ මගින් පාසල තුළ උසස් රස වින්දන ශක්තියක් ගොඩ නංවන්නට අවකාශය ලැබේ.

**9.5. ප්‍රජා සන්නිවේදන ව්‍යාපෘතිය:** මෙය පාසලට අලුත් ක්ෂේත්‍රයකි. ප්‍රජාව යන්නෙන් හැඳින්වෙන්නේ කවුරුන්දැයි මුලින් තේරුම් ගැනීම අවශ්‍යය. පාසලේ ප්‍රජාව යන්නෙන් අදහස් වන්නේ සිසු සිසුවියන් හා ගුරු මණ්ඩලයයි. පාසලේ ආසන්න ප්‍රජාව ලෙස දෙමාපියන්ද ඇතුළත් වේ. ප්‍රජාව තුළ යම් චර්යාත්මක වෙනසක් ඇති කිරීම ප්‍රජා සන්නිවේදනයයි. සාමාන්‍යයෙන් ප්‍රජාව තුළ චර්යාත්මක වෙනස්කම් ඇති කිරීමට යොදා ගන්නා සරල ක්‍රමය නම් බලය යොදා ගැනීමයි. එයට දඬුවම් කිරීමද අයත් වේ. එහෙත් බලය යොදා ගෙන ඇති කරනු ලබන චර්යාවන් එතරම් ස්ථිර නොවන අතරම, හිතකාමීද නොවේ. එබැවින් සැබෑ චර්යාත්මක වෙනසක් ඇති කළ හැක්කේ ප්‍රජාවගේ සිතීම වෙනස් කිරීමෙනි. ඒ මගින් නව ආකල්ප ගොඩ නංවන්නට පුලුවන. එය පහසු කටයුත්තක් නොව ඉතා අසීරු කටයුත්තකි. ඒ සඳහා කෙබඳු ක්‍රම වේද යොදා ගන්නේද? යන්න නිශ්චිතව දැක්විය නොහැකිය. එක් තැනකට ගැලපෙන ක්‍රමයක් තවත් තැනකට නොගැලපීම මෙහි ඇති විශේෂයයි. ඒ නිසා තමන්ගේ පාසලේ ප්‍රජාව පිළිබඳව හොඳ අධ්‍යයනයක් කිරීමෙන් පසු ප්‍රජා සන්නිවේදන වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. එවැනි වැඩ සටහන්වලින් ප්‍රජාව තුළ කෙබඳු නව චර්යාවන් ඇති කිරීමට අපේක්ෂා කරන්නේදැයි නිශ්චිතව හඳුනා ගෙන සැලසුම් සම්පාදනය කළ යුතුය. ඒ සඳහා වූ උදාහරණ කිහිපයක් පහත දැක් වේ.

1. පාසල තුළ ගමන් කිරීමේ දී දකුණෙන් ගමන් කරන්නට පුරුදු කිරීම
2. මහල් ගොඩනැගිලිවල පඩි පෙළේ ගමන් කිරීමේ දී දකුණෙන් යාමට පුරුදු කිරීම

3. පාසලේ තැන තැන කෙළ ගැසීමේ පුරුද්ද නැති කිරීම
4. අප ද්‍රව්‍ය නිසි තැනකට දැමීමට පුරුදු කිරීම
5. පන්තියෙන් පිටත යාම හා පන්තියට ඇතුලු වීම පිළිබඳ චර්යාවක් ගොඩ නැංවීම

ප්‍රජා සන්නිවේදන ව්‍යාපෘතිය අනෙක් ඒවාට වඩා අපහසු ය. එයට හේතුව නව චර්යාවන් ඇති කිරීම ලෙහෙසි පහසු නො වන නිසා ය. එහෙත් එක් කණ්ඩායමක් උත්සාහ ගත් දෙය නිසි ආකාරයෙන් වාර්තා කර ඇත්නම්, තවත් කණ්ඩායමකට එතැන සිට එය වෙනත් ආකාරයකින් අත්හදා බලන්නට පුලුවන. කිසිදු ප්‍රයත්නයක් අසාර්ථක යැයි අත් හැර දැමිය යුතු නැත.

9.6. සාම සන්නිවේදන ව්‍යාපෘතිය: වර්තමානයේ පෙනී යන කරුණක් නම්, සමාජය තුළ එකිනෙකා අතර සාමකාමී සහයෝගය ශීඝ්‍රයෙන් බිඳ වැටෙමින් පවතින බව ය. එය ඉතා කණගාටුදායක කරුණකි. එකිනෙකා අතර සාමකාමී සහජීවනය ගොඩ නැංවීම ආරම්භ කිරීමට හොඳ ම ස්ථානය නම් පාසලයි. මේ සඳහා විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරන්නට පුලුවන. මේවායේ අවසාන ප්‍රතිඵලය විය යුත්තේ පාසලේ දරුවන් තුළ සාමකාමී හැඟීම් වර්ධනය කිරීමත් විවිධ ගැටුම් අවම කිරීමත් ය. විශේෂයෙන් පාසල් සිසු සිසුවියන් සම්බන්ධ කිසිම ආකාරයක හෝ ප්‍රචණ්ඩකාරී සිදු වීම් නො වන තත්ත්වයට පාසල පත් කර ගත හැකි නම් එය විශාල ජයග්‍රහණයකි. මේ සඳහා කරනු ලබන වැඩ සටහන් එක් දවසකින් නතර කළ නො හැකි ය. ඒ නිසා වර්ෂය පුරා පැතිරී යන පරිදි විවිධ කුඩා වැඩ සටහන් මාලාවක් ක්‍රියාත්මක කළ යුතු ය. මේ සඳහා කණ්ඩායම් කිහිපයක් ඉදිරිපත් ව කටයුතු කළ යුතු ය. කළ හැකි වැඩ කිහිපයක් උදාහරණ වශයෙන් පහත දැක් වේ.

- පොලිසියේ මහජන සම්බන්ධතා අංශයේ සහයෝගය ඇති ව සාමය පවත්වා ගෙන යාමට අදාළ කරුණු පිළිබඳ දැනුම පුලුල් කිරීම
- විවිධ ආගමික නායකවරුන් ගෙන්වා සාමාකාමී ජීවිතයක අගය පිළිබඳ ව දැනුම ලබා දීම
- සාමය සම්බන්ධ පෝස්ටර් පාසල තුළ ප්‍රදර්ශනය කිරීම
- සාමය තේමා කර ගත් ගීත නිර්මාණය
- සාමය තේමා කර ගත් ගීතමය වැඩ සටහන් පැවැත්වීම
- ..........................................................................

**9.7. ආපදා හා අනතු-රු සන්නිවේදන ව්‍යාපෘතිය:** මෙය පාසලට අලුත් අත්දැකීමක් ලබා දෙන ව්‍යාපෘතියකි. ආපදාවකට මුහුණ දීමට පුහුණු කිරීම මෙන් ම අනතුරුදායක අවස්ථාවන් පිළිබඳ ව නිපුණතා සංවර්ධනය ද මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. ආපදාවන් පාලනය කළ හැකි අතර, අනතුරු වළක්වා ගත හැකි ය. එහෙත් අනතුරු හැම තැන ම තිබෙන බව ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් පෙනේ. එයට කළ යුතු පිළියම නම් සැම විට ම සැලකිල්ලෙන් හා අවධානයෙන් යුතු ව කටයුතු කිරීම ය.

පාසල තුළ එහා මෙහා දුව ගෙන යාමේ දී ඇද වැටීමට පුලුවන. විද්‍යාගාරයේ දී නිසි පිළිවෙත් අනුගමනය නො කිරීම අනතුරු ඇති වීමට හේතු වේ. දෙදෙනෙකු මුහුණට මුහුණ ලා හැපීමෙන් බරපතල තුවාල සිදු විය හැකි ය. පාසලේ ගොඩනැගිලි වටේ ඇති කානුවකට කකුල ලෙස්සා යන්නට පුලුවන. බස් රියේ යද්දී ඉදිරිපස අසුන හොඳින් අල්ලා ගෙන නොසිටියහොත්, හදිසි තිරිංග තද කිරීමක දී ඉදිරි අසුනේ මුහුණ වැදෙන්නට පුලුවන.

ආපදාව සාමූහික ව මුහුණ දීමට සිදු වන සිද්ධියකි. ආපදාව වැළැක්වීමට හෝ පාලනය කිරීමට හෝ පුලුවන. එහෙත් එය දැන ගෙන කටයුතු කළ යුතු ය. ආපදාවට මුහුණ දීමට සූදානම් කිරීම ද අතිශයින් වැදගත් වේ. ගින්නක්, ගංවතුරක්, සුළි සුළඟක් වැනි අවස්ථාවක එයට මුහුණ දෙන්නේ කෙසේද? නො සැලකිලිමත් ලෙස කටයුතු කිරීමෙන් බරපතල හානි සිදු වන්නට පුලුවන. අනතුරු මෙන් ම ආපදාවන් ද පාසලට සීමා වී නැත. ඒවා ඔබ සිටින හැම තැනකට ම උරුම ඒවා ය. නිවසේ දී ද අනතුරු සිදු වන්නට පුලුවන.

ඒ නිසා ආපදා හා අනතුරු සන්නිවේදන ව්‍යාපෘතිය යටතේ විවිධ අනතුරු හා ආපදා පිළිබඳ ව දැනුම ලබා දීම, ඒවාට මුහුණ දීමට පුහුණු කිරීම, ඒ පිළිබඳ පොත් පත් කියවන්නට සපයා දීම, විශේෂඥයන් මගින් සම්මන්ත්‍රණ පැවැත්වීම ආදිය එක් එක් කණ්ඩායමට කළ හැකි ය.

10. සාමාජිකත්වය: පාසල් මාධ්‍ය සමාජයේ සාමාජිකත්වය වර්ග දෙකක් යටතේ දැක් වේ. එයට හේතුව යම් සංවිධානයක සාමාජිකත්වය යනු වගකීම් සහගත කාර්යයක් බව දරුවන්ට අවබෝධ කර ගන්නට අවකාශ සලසා දීම ය. සාමාජික අයදුම්පත්‍රයක් දීමෙන් ම සාමාජිකයකු නො වන අතර, සාමාජික වගකීම් හා යුතුකම් ඉටු කිරීම ද අවශ්‍ය බව සියලු සාමාජික සාමාජිකාවන්ට අවබෝධ කර දීම අවශ්‍ය ය.

**(1) පූර්ණ සාමාජිකත්වය:** මෙය ඉංග්‍රීසියෙන් **Full Member** ලෙසත්, කෙටි යෙදුමෙන් **FM** ලෙසත් හැඳින් වේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ සන්නිවේදනය විෂයය හදාරන සිසු සිසුවියන්ට හා සන්නිවේදනය හා මාධ්‍ය පිළිබඳ නිපුණතා සහිත සිසු සිසුවියන්ට ය. මාධ්‍ය සමාජයේ නිලධාරින් ලෙස කටයුතු කිරීමට අයිතිය ඇත්තේ මෙම සාමාජිකත්වයට පමණි.

**(2) ආශ්‍රය සාමාජිකත්වය:** මෙය ඉංග්‍රීසියෙන් Associate Member ලෙසත්, කෙටි යෙදුමෙන් AMලෙසත් හැඳින් වේ. මෙම සාමාජිකත්වය සන්නිවේදනය හා මාධ්‍ය පිළිබඳ ඇල්මක් ඇති ඕනෑ ම කෙනෙකුට ලබා ගත හැකි ය. මාධ්‍ය සමාජයේ නිලධාරීන් වීමට ආශ්‍රය සාමාජිකත්වයට අවසර නැත. එහෙත් ව්‍යාපෘති යටතේ යම් ක්‍රියාකාරකම් කරන්නට ආශ්‍රය සාමාජිකයන්ට ද ඉදිරිපත් විය හැකි ය. සක්‍රීය ලෙස කටයුතු කරන ආශ්‍රය සාමාජිකයන්ට තම සාමාජිකත්වය ලබා මාස තුනකට පසු තම සාමාජිකත්වය පූර්ණ සාමාජිකත්වය දක්වා උසස් කරන ලෙස ලිඛිත ව ඉල්ලා සිටින්නට පුලුවන. ඒ අනුව ආශ්‍රය සාමාජිකයකු පූර්ණ සාමාජිකයකු දක්වා උසස් කරන්නට මාධ්‍ය සමාජයේ කාරක සභා රැස්වීමක දී පුලුවන.

සාමාජික කාඩ් පත් හෝ හැඳුනුම් පත් නිකුත් කිරීමේ දී එහි ලොකු අකුරෙන් **FM** හෝ AM හෝ යනුවෙන් අදාළ වන පරිදි සඳහන් කිරීම යෝග්‍ය ය.

**11. වාර්ෂික සැලැස්ම:** මාධ්‍ය සමාජයට නව නිලධාරීන් පත් කර ගත් විට මාසයක් ඇතුළත වාර්ෂික සැලැස්මක් සකස් කර මහ සභාවකට ඉදිරිපත් කර අනුමත කර ගත යුතු ය. වාර්ෂික සැලැස්ම සකස් කිරීම සභාපති ගේ මූලිකත්වයෙන් යුතු ව කළ යුතු අතර, ඒ සඳහා සියලු නිලධාරීන් එක් විය යුතු ය. වාර්ෂික සැලැස්ම සකස් කළ යුත්තේ මාධ්‍ය සමාජය භාර ගුරු මව්වරුන් හා පියවරුන් විසින් ලබා දෙන උපදෙස් සැලකිල්ලට ගනිමිනි. මාධ්‍ය සමාජයට ඉදිරිපත් කිරීමට පෙර එය විදුහල්පතිතුමා / තුමිය වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතු ය. නිසි ලෙස සකස් කර අනුමැතිය ලබා ගන්නා ලද වාර්ෂික සැලැස්මේ පිටපත් දෙකක් බ්‍රිස්ටල් බෝඩ් දෙකක සකස් කර එකක් විදුහල්පතිතුමා ගේ කාර්යාලය තුළ තැබීමට කටයුතු කරන්න. දෙවැන්න මාධ්‍ය සමාජයේ දැන්වීම් පුවරුවක හෝ මාධ්‍ය සමාජයේ කාමරයේ හෝ ප්‍රදර්ශනය කළ යුතු ය.

**12. මාධ්‍ය සමාජයේ වාර්තා පොත:** මහ සභා, විශේෂ, මාසික, කාරක සභා ආදී කුමන රැස්වීමක වුව ද වාර්තාව නිසි පරිදි තබා ගැනීම ලේකම් නිලධාරීන්ගේ කාර්යයකි. මේ සඳහා සී.ආර්.පොතක් යොදා ගැනීම යෝග්‍ය ය. එසේ ම පහසුකම් ලබා ගත හැකි නම්, වාර්තාව පරිගණක ගත කර තැබිය යුතු ය. සෑම වාර්තාවක් ම සභාපති විසින් අත්සන් කර, මාධ්‍ය සමාජය භාර ගුරු මව්වරුන් / පියවරුන් අත්සන් කර විදුහල්පතිතුමා වෙත ඉදිරිපත් කර අනුමත කර ගත යුතු ය.

## 2. මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනට දරුවන් සහභාගි කරවන්න.

**1. හැඳින්වීම :** මාධ්‍ය වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහන අත්හදා බලනු ලැබුවේ 2006 වර්ෂයේ දී ය. මෙයට සම්බන්ධ කර ගනු ලබන්නේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන 10 වන ශ්‍රේණියේ සිසු දරු දැරියන් හා 12 වන ශ්‍රේණියේ අවසාන වාරයේ සිසු දරු දැරියන් ය. මෙම සිසු සිසුවියන් පාසල අසල ඇති කාර්යාලයක සතියක කාලයක් වැඩ අත්දැකීමක් ලබා ගැනීම මෙම වැඩ සටහනින් සිදු වේ. ඒ සඳහා සිසු සිසුවියන් යොදවනු ලබන්නේ පහත සඳහන් ආකාරයෙනි.

(1) 10 වන ශ්‍රේණියේ සිසු සිසුවියන් : පාසල අසල ඇති ඕනෑ ම රජයේ කාර්යාලයකට ය.
(2) 12 වන ශ්‍රේණියේ සිසු සිසුවියන්: සමෘද්ධි ව්‍යාපාරයේ කාර්යාලයකට

**2. අරමුණ:** 10 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු සිසුවියන්ට සන්නිවේදනය හා මාධ්‍ය වැඩ ලෝකය පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගන්නට අවකාශය සලසා දීම හා 12 වන ශ්‍රේණියේ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු සිසුවියන්ට සංවර්ධන සන්නිවේදන වැඩ ලෝකය පිළිබඳ සැබෑ අත්දැකීමක් ලබා ගන්නට අවකාශය සලසා දීම

**3. සංවිධානය කරන ආකාරය:** සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂය භාර ගුරු භවතා විසින් විදුහල්පතිතුමා ගේ / තුමිය ගේ අනුමැතිය ඇති ව සංවිධානය කළ යුතු ය.

යෝග්‍ය කාර්යාලයක් සොයා ගැනීම,
ඒ සඳහා එම කාර්යාල ප්‍රධානීන් ගේ අනුමැතිය ලබා ගැනීම,
ආරක්ෂක පිළිවෙත් හා සෞඛ්‍ය පහසුකම් සොයා බැලීම
සිසු සිසුවියන් ගේ එකඟත්වය හා ප්‍රතිඥාව ලබා ගැනීම,
දෙමාපියන් ගේ එකඟත්වය හා ප්‍රකාශය ලබා ගැනීම,
සමස්ත සැලැස්ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලිඛිත ව ලබාගැනීම
දෙමාපියන් ගේ හා සිසු සිසුවියන් ගේ රැස්වීමක් පැවැත්වීම
අදාළ දිනයන්හි දී ළමුන් එම කාර්යාලයට අනුයුක්ත කර වැඩ අත්දැකීම් ලබාගන්නට අවකාශය සැලසීම
නිසි ලෙස අධීක්ෂණය කිරීම
වැඩ සටහන නිම වූ පසු පාසලේ දී ඒ පිළිබඳ සාකච්ඡාවක් පැවැත්වීම
අවසාන වාර්තාව සම්පාදනය කර අවශ්‍ය පරිදි ඉදිරිපත් කිරීම

පසු ගිය වසරවල අත්දැකීම් අනුව දැක්විය යුත්තේ, මෙම වැඩ සටහන සඳහා රජයේ කාර්යාල උපරිම සහයෝගය ලබා දෙන බවත්, අදාළ දරුවන්ගෙන් බහුතරය මෙම වැඩ සටහනට සහභාගි වන බවත් ය. යම් පාසලක 10 වන ශ්‍රේණියේ හෝ 12 වන ශ්‍රේණියේ අවසාන වාරයේ අනෙකුත් සිසු සිසුවියන් ද ඉල්ලා සිටින්නේ නම්, විදුහල්පතිතුමා / තුමිය ගේ අනුමැතිය ඇති ව ඔවුන් ද මෙම වැඩ සටහනට සහභාගි කරවීම යෝග්‍ය ය.

4. පොදු කරුණු: මෙම වැඩ සටහනට සහභාගි වීම හෝ නො වීම එම සිසු සිසුවියන් ගේ අභිමතය අනුව වේ. එසේ ම දෙමාපියන් ද එකඟ විය යුතු ය. වැඩ හුරුව කාලය තුළ නිශ්චිත පුහුණුවක් අපේක්ෂා කරනු නො ලැබේ. එහෙත් එම කාර්යාලයේ විවිධ අංශවල කටයුතුවලට සහයෝගය ලබා දෙමින් ඒවායේ කටයුතු කෙරෙන ආකාරය පිළිබඳ ව අත්දැකීමක් ලබා ගත යුතු ය.

5. වැඩ හුරුව දින පොත: සෑම සිසු සිසුවියක විසින් ම වැඩ හුරුව කාලය තුළ සියලු විස්තර දින පොතක සටහන් කළ යුතු ය. මේ සඳහා කුඩා සී.ආර්. පොතක් සෑහේ.

6. වැඩ හුරුව කාලය: සාමාන්‍යයෙන් සෑම වර්ෂයක ම ජුනි මාසයේ අවසාන දින පහේ සතිය මේ සඳහා යොදා ගත හැකි ය. ( ඒ නිසා සංවිධාන කටයුතු ජුනි මුල් සතියේ ආරම්භ කිරීම යෝග්‍ය ය.) කෙසේ වුවත් විදුහලේ අවශ්‍යතාව පරිදි මෙම සතිය වෙනස් කර ගැනීමට කිසිදු බාධාවක් නැත.

**සිසු ප්‍රතිඥාව හා දෙමාපිය ප්‍රකාශයඃ**

**සිසු ප්‍රතිඥාව**

මෙහි පහත අත්සන් කරනු ලබන ..............................................................................................................
විද්‍යාලයේ 10/12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන හා
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
යන ස්ථිර ලිපිනයෙහි පදිංචි .............................................................................................................
වන මම ........................................................................... .............................................................................. දී
200......................................මස ..................................................................................................දිනයන්හි දී
පවත්වනු ලබන පස් දින පාසල් වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනට කැමැත්තෙන් සහභාගි වන බවත්, එම වැඩ හුරුව කාලය තුළ විශ්වාසවන්තව, අවංකව හා විනයගරුකව ද, අන්‍යයන් සමග සහයෝගයෙන් හා කරුණාවන්තව ද කටයුතු කරන බවට හා මෙම වැඩ හුරුව වැඩ සටහන මගේ අනාගත ජීවිකා වෘත්තිය සැලසුම් කර ගැනීමට කරනු ලබන උපකාරයක් ලෙස සලකා වගකීමෙන් යුතුව කටයුතු කරනු ලබන බවටත්, එම වැඩ හුරුව අධ්‍යාපන වැඩ වැඩ සටහනෙන් උපරිම ප්‍රයෝජන ලබා ගන්නා බවටත් පොරොන්දු වෙමි.

දිනය අත්සන

**මව / පියා / භාරකරුගේ ප්‍රකාශය**

මෙහි ඉහත අත්සන් කර ඇති මගේ දරුවා වන ..........................................................................................
.........................................................................................................විද්‍යාලයයේ 10/12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන
.................................................................................................................................................ශිෂ්‍යයා / ශිෂ්‍යාව
.......................................................................................................................................................................දී
පැවැත්වෙන පස් දින කාර්ය ස්ථාන ගත පාසල් වැඩ හුරුව අධ්‍යාපන වැඩ සටහනට 20.........................................................................................................යන දිනයන්හි දී සහභාගි වීම පිළිබඳ මගේ කැමැත්ත මෙයින් පළ කරන අතර, එම දරුවා උදය එම කාර්ය ස්ථානයට ගෙන යාම හා සවස ආපසු කැඳවා ගෙන යාමේ වගකීම මා විසින් භාර ගන්නා බවත්, මෙම වැඩ සටහනට සහභාගි වීමට දරුවාට අවශ්‍ය සියලු සහයෝගයන් ලබා දෙන බවටත් පොරොන්දු වෙමි.

දිනය...................................... මව / පියා / භාරකරු
නම ..........................................................
ලිපිනයඃ

අත්සන .................................

( මාධ්‍ය වැඩ හුරුව වැඩ සටහන සම්බන්ධ සියලු උපදෙස් ඒ සම්බන්ධයෙන් සම්පාදනය කර ඇති මග පෙන්වීමේ අත්පොතේ ඇතුළත් ය. )

## 3. මාධ්‍ය අධ්‍යාපන සතිය වැඩ සටහන

**1. හැඳින්වීම:** සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන්නේ නැති සිසු සිසුවියන්ට හා දෙමාපියන්ට මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ දැනුමක් ලබා දීමත්, ඔවුන් ගේ ආකල්ප පෝෂණයත් සඳහා පවත්වනු ලබන වැඩ සටහනක් ලෙස මාධ්‍ය අධ්‍යාපන සතිය වැඩ සටහන හැඳින්විය හැකි ය. එය පළමුවරට අත්හදා බලනුයේ 2009 වර්ෂයේ දී ය. අවසාන වශයෙන් මෙහි ප්‍රධාන අරමුණ වන්නේ, විචාරශීලී මාධ්‍ය ග්‍රාහක පිරිසක් පාසල තුළින් සමාජගත කිරීමට අවශ්‍ය පදනම සකස් කිරීම ය.

**2. සංවිධානය:** සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයය හදාරන සිසු සිසුවියන් හා එම විෂයය උගන්වන ගුරු භවතුන් විසින් මෙම වැඩ සටහන සංවිධානය කරනු ලැබේ. ඒ සඳහා අනෙකුත් ග-ුරු භවතුන් ගේ ද සහයෝගය අවශ්‍ය පරිදි ලබා ගත යුතු ය. එහෙත් අනෙක් සිසු සිසුවියන් ගේ සහයෝගය සංවිධාන කටයුතු සඳහා ලබා ගත යුත්තේ එය අත්‍යවශ්‍ය ම වන්නේ නම් පමණි. එසේ නො වන්නේ නම්, විෂය හදාරන සිසු සිසුවියන්ට මෙම සංවිධාන කටයුතු පිළිබඳ අත්දැකීමක් ලබා ගන්නට සියලු අවකාශ ලබා දිය යුතු ය.

**3. දිනයන් :** 2009 වර්ෂයේ මාධ්‍ය අධ්‍යාපන සතිය ඔක්තෝබර් 26 / 30 සතියේ දී පවත්වනු ලැබේ. ඒ අනුව ඉදිරියට සෑම වර්ෂයක ම ඔක්තෝබර් මස අවසාන දින පහේ සතියේ දී පාසල් මාධ්‍ය අධ්‍යාපන සතිය වැඩ සටහන පැවැත්වීම යෝග්‍ය ය. එහෙත් විදුහලේ අවශ්‍යතාව පරිදි මෙම වැඩ සටහන වෙනත් සතියක පැවැත්වීමට අවකාශය තිබේ.

**4. වැඩ සටහනේ ස්වභාවය:**

1 වන දිනය: ආරම්භක දිනය (පෝස්ටර්, චිත්‍ර, නිර්මාණ, ආදිය ප්‍රදර්ශන විවෘත කිරීම මෙදින කළ හැකි ය. මාධ්‍ය අධ්‍යාපන සතියේ ආරම්භක දිනයයි. මාධ්‍යය වගකීමෙන් යුතු ව පරිහරණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයක් පාසල තුළ පැවැත්වීම)

2 වන දිනය: ප්‍රසාංගික දිනය (නාට්‍ය. ගීත වැඩ සටහන්, භූමිකා රංගන ආදිය)

3 වන දිනය: පාසල් සිනහ දිනය (දන්ත සෞඛ්‍ය සායනයක් පැවැත්වීම හා මානසික සෞඛ්‍ය පිළිබඳ ව දැනුම ලබා දීමේ සම්මන්ත්‍රණයක් සුදුසු විද්වතකුගේ මූලිකත්වයෙන් පැවැත්වීම)

4 වන දිනය: මාධ්‍ය සාක්ෂරතා දිනය (ප්‍රාථමික පන්තිවල දරුවන් ගේ දෙමාපියන් සඳහා මාධ්‍ය හා ළමයා තේමා ගත් සම්මන්ත්‍රණයක් හා සාකච්ඡාවක් පැවැත්වීම. මෙහි දී සන්නිවේදන විෂයය ඉගෙන ගන්නා දරු දැරියන් ද සම්මන්ත්‍රණයේ දේශන පැවැත්විය යුතු ය. සුදුසු ආරාධිතයන් ද මේ සඳහා සහභාගි කරවා ගත හැකි ය.

5 වන දිනය: මාධ්‍ය පා ගමන: මාධ්‍ය වගකීමෙන් හා විචාරශීලී ව පරිහරණය කිරීමේ අවශ්‍යතාව හා වැදගත්කම හුවා දක්වන බැනර් හා පෝසටර් ආදිය රැගෙන මාධ්‍ය පා ගමනක් යම් නිශ්චිත දුරක් පාසලේ සිට යාම. මෙම වැඩ සටහන සැලසුම් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු ය.)

( මාධ්‍ය අධ්‍යාපන සතිය වැඩ සටහන සම්බන්ධ සියලු උපදෙස් ඒ සම්බන්ධයෙන් සම්පාදනය කර ඇති මග පෙන්වීමේ අත්පොතේ ඇතුළත් ය. )

## 4. යුනෙස්කෝ ලෝක පොත් දින වැඩ සටහන

**1. හැඳින්වීම:** යුනෙස්කෝවේ විධායක සභාව විසින් 1995 වර්ෂයේ දී ගනු ලැබූ තීරණයකට අනුව, 1996 වර්ෂයේ සිට සෑම වර්ෂයක ම අප්‍රේල් මස 23 වන දින ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනය සමරනු ලබයි. ඒ අනුව 2009 වර්ෂයේ දී සමරනු ලැබුවේ 14 වන ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනයයි. පාසල් මාධ්‍ය සමාජ වැඩ සටහනක් ලෙස යුනෙස්කෝ ලෝක පොත් දිනය සැමරීම ආරම්භ කරන ලද්දේ 2008 වර්ෂයේ දී ය. භාවිතයේ පහසුව තකා පොත් දිනය යැයි නම් කරනු ලැබුවත්, එහි දී ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනයට අදාළ ව වැඩ සටහන් සැලසුම් කරනු ලැබේ. අප්‍රේල් 23 වන දිනය සාමාන්‍යයෙන් පාසල් නිවාඩුව අවසාන වී දෙවන වාරය ආරම්භ කරනු ලැබූ මුල් සතියට අයත් වේ. ඒ නිසා මැයි මාසයේ පළමු වන සතියේ බ්‍රහස්පතින්දා දිනය මේ සඳහා යොදා ගැනීමට යෝග්‍ය ය. එසේ නැතිනම් විදුහල්පතිතුමා / තුමිය ගේ අනුමැතිය ඇති ව වෙනත් පහසු දිනයක් යොදා ගත හැකි ය. යුනෙස්කෝ ලෝක පොත් දිනය සංවිධානය කරනු ලබන්නේ කෙසේදැයි ඔබ අසන ප්‍රශ්නයට හොඳ ම පිළිතුර වන්නේ, ලෝකයේ පාසල්වල ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩ සටහන් කිහිපයක් අධ්‍යයනය කිරීම ය.

**2. ආදර්ශ වැඩ සටහන්:**

1. තෝරා ගත් සිසු සිසුවියන් පිරිසක් එදිනට තෝරා ගත් කෘතීන්වල චරිත ලෙස හැඳ පැළඳ ගෙන පැමිණීම හා ඒ ආශ්‍රිත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
2. පාසල් සිසු සිසුවියන් අතර වඩාත් ජනප්‍රිය පොත් දහය ඡන්දයෙන් තේරීම
3. පොත්වල ඇති කතාන්දර කීමේ සම්භාෂණයක් පැවැත්විම
4. යම් පොතක /පොත් කිහිපයක හෝ කර්තෘන් පාසලට ගෙන්වා වැඩ සටහනක් පැවැත්වීම
5. පුස්තකාල පොත් ආශ්‍රිත ව පොත් සතියක් පැවැත්වීම
6. පාසලේ සිසු දරු දැරියන් තමන් කැමති පොතක කැමති චරිතයක විලාශයෙන් හැඳ පැළඳ පාසලට පැමිණීම හා තමා සතු පැරණි පොතක් රැගෙන ඒම (පොත දුර බැහැර පාසලක පුස්තකාලයට යැවීමට ය.)
7. පොත් කියවීමේ විවෘත කුඩාරමක් සතියක කාලයක් සඳහා පාසල් මිදුලේ සැකසීම
8. ළමා පොත් කර්තෘවරයකු හා චිත්‍ර ශිල්පියකු ආරාධිතයන් ලෙස පාසලට ගෙන්වා වැඩ සටහනක් පැවැත්වීම
9. පොත්වල චරිතවලට අනුකූලවන ලෙස මුහුණු වේශ නිරූපණය කිරීම / පින්තාරු කිරීම
10. ළමා පොත් කර්තෘ කෙනෙකු හා චිත්‍ර ශිල්පියකු ගෙන්වා වැඩ සටහනක් පැවැත්වීම
11. ළමා පොත් කර්තෘ කෙනෙකු සමග ආසන්න පොත් හලකට ළමයින් සමග චාරිකාවක් යාම
12. ප්‍රාථමික පන්තිවල දරුවන්ට කතන්දර පොත්වලින් කතන්දර කීමේ වැඩ සටහනක් පැවැත්වීම
13. කතා ලිවීමේ හා කතා කීමේ තරගයක් ළමයින් අතර පැවැත්වීම
14. යම් කර්තෘවරයකු තෝරා ගෙන ඔහුගේ/ ඇයගේ නිර්මාණ ඇගයීමේ වැඩ සටහනක් පැවැත්වීම
15. පාසලේ දරුවකුගේ කෘතියක් /දරුවන්ගේ කෘති කිහිපයක් එළි දැක්වීමේ වැඩ සටහනක් පැවැත්වීම
16. යම් කර්තෘවරයකු ගෙන්වා එම කෘති පිළිබඳ ඇගයමක් කිරීම
17. යම් කර්තෘවරයකු /වරියක ගේ අලුත් කෘතියක් දොරට වැඩීමේ උළෙලක් පාසලේ දී පැවැත්වීම
18. පුස්තකාලයේ පොත් හඳුන්වා දීමේ වැඩ සටහනක් පාසල තුළ පැවැත්වීමඳ
19. කවි ලිවීමේ හා කවි කීමේ වැඩ සටහනක් පාසලේ පැවැත්වීම
20. ලෝක පොත් දිනය .... වැනි සැමරුම් මාතෘකාවක් යටතේ පෝස්ටර් / චිත්‍ර තරගයක් පැවැත්වීම
21. කතන්දර කියවීම් ශාලාවක් අලුතෙන් විවෘත කිරීම හා කතන්දර චරිත ලෙස සිසු සිසුවියන් පෙනී සිටීම
22. කතන්දර චරිත ලෙස හැඳ ගත් දරුවන් කතන්දර කියන්නකු සමග එක් ව කතන්දර ඉදිරිපත් කිරීම
23. පාසලේ පුස්තකාලයට පොත් මිල දී ගැනීම සඳහා පොත් අලෙවි සැලක් පැවැත්වීම. එහි අලෙවි සේවකයන් ලෙස කටයුතු කරන්නේ කතන්දරවල සතුන් හෝ චරිත ලෙස වෙස් ගැන් වූ දරුවන් ය. මෙහි දී දෙමාපියන් හා ආදි ශිෂ්‍ය පිරිස පැමිණ පොත් මිල දී ගෙන පුස්තකාලයට පරිත්‍යාග කරයි.
24. ලෝක පොත් දිනය සැමරීමේ උපන් දින උත්සවයක් පුස්තකාලය තුළ පැවැත්වීම
25. ලෝකයේ විවිධ රටවල කතන්දර කීමේ වැඩ සටහනක් පැවැත්වීම
26. පොත් ආශ්‍රිත ප්‍රහේලිකා තරගයක් හා පොත් සළකුණු නිර්මාණය කිරීමේ තරගයක් පැවැත්වීම
27. බල්ලා, පූසා හා නරියා පිළිබඳ කතන්දර කීම හා ඒ ආකාරයෙන් දරුවන් හැඳ පැළඳ සිටීම
28. පොත් ආශ්‍රිත දැනුම මිනුම තරගයක් පාසල තුළ පැවැත්වීම හා ත්‍යාග වශයෙන් පොත් බෙදා දීම
29. කැමති වැඩ සටහනක් ඉදිරිපත් කිරීමට දරුවන්ට අවස්ථාව දීම හා පොත් ත්‍යාග වශයෙන් ලබා දීම
30. පොත් පිළිබඳ විචාරාත්මක හා රස වින්දනාත්මක වැඩ සටහනක් ආරාධිතයකු විසින් පැවැත්වීම
31. ගෘහස්ථ පුස්තකාල ආරම්භ කිරීමේ වැඩ සටහනක් ආරම්භ කිරීම

## 5. අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය

1. හැඳින්වීමඃ මෙම ක්‍රියාකාරකම මාධ්‍ය සමාජයේ පර්යේෂණ හා ගවේෂණ ව්‍යාපෘතියට සම්බන්ධය අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය මගින් සිදු කරනුයේ, පාසලේ උරුමය ගොඩ නැංවීමයි. එයට බොහෝ දේ අයත් වේ. පාසල් කිහිපයක් පමණක් තමන් ගේ පාසලේ උරුමය යම් පමණකට හෝ ගොඩ නංවා තිබෙනු දකින්නට ලැබේ. එහෙත් බොහෝ පාසල් තමන් ගේ උරුමය පිළිබඳ නිසි අවධානයක් යොමු කර නැත. මාධ්‍ය සමාජය ප්‍රවේශ විය යුත්තේ මෙම අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා ය. මේ මගින් සන්නිවේදනය හා මාධ්‍ය උගන්නා දරුවන්ට ඒ පිළිබඳ ගවේෂණය කරන්නට අත්දැකීමක් ලබා ගත හැකිය.

**පාසලේ උරුමය**

| | |
|---|---|
| ආරම්භය හා එයට සම්බන්ධ පුද්ගලයන් | විකාශනය හා විශේෂ කඩඉම් |
| හිටපු විදුහල්පතිවරුන් හා ගුරු භවතුන් | ආදි ශිෂ්‍යයන් |
| විශේෂ ජයග්‍රහණ | අධ්‍යාපන ක්‍රියාවලිය |
| .................................. | |

**ගමේ උරුමය**

| | | |
|---|---|---|
| සංස්කෘතිය | සමාජීය විශේෂතා | භූගෝලීය විශේෂතා |
| නිෂ්පාදන | විශේෂ ස්ථාන | වාරි මාර්ග |
| ජන ජීවිතය | ජනශ්‍රැති | .......................... |

ඉහත ආකාරයෙන් විවිධ තොරතුරු සොයා ගැනීම තනි තනිව හා කණ්ඩායම් වශයෙන් කළ හැකිය. ඒ සඳහා මූලික සැලැස්මක් සකස් කර ගත යුතු අතර. තොරතුරු ලබා ගන්නේ කොහෙන්ද? ඒවා රැස් කරන්නේ කවර ආකාරයෙන්ද? හා තොරතුරු ලබා ගන්නේ කාගෙන්ද? යන මූලික ප්‍රශ්නවලට පිළිතුරු සපයා ගත යුතුය.

අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුත්තක් නම්, එය දිගු කාලීන ක්‍රියාකාරකමක් බව ය. එසේම එහි අවසානයක්ද නැත. එබැවින් කෙටි කාලීන වශයෙන් එහි විවිධ කාර්යයන් වෙන් කර ගෙන, එක් එක් සිසු කණ්ඩායම් මගින් එම කාර්යයන් ඉටු කර ගැනීමෙන් කාලයක් ගත වන විට මධ්‍යස්ථානය ක්‍රමයෙන් සංවර්ධනය කර ගත හැකිය.

අපේ උරුමය පාසල් මධ්‍යස්ථානය සඳහා වෙනම ස්ථානයක් අවශ්‍යම නොවේ. මුලින් එය පුස්තකාලයේ කොටසක් ලෙස ගොඩ නැංවිය හැකිය. වෙනම ස්ථානයක් ලබා ගත හැකි නම් එසේ ආරම්භ කළ හැකිය. වඩාත් වැදගත් දෙය නම් මෙම ක්‍රියාකාරකම කුමන මට්ටමකින් හෝ ආරම්භ කිරීමය.